# දෙවැනි කොටස

# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

පිටුව


| | | |
|---|---|---|
| 1. | ගිණුම්කරණය සහ මූල්‍ය | I |
| 2. | බැංකු අධීක්ෂණ | XVII |
| 3. | බැංකු කටයුතු  අධ්‍යයන කේන්ද්‍රය | XXI |
| 4. | සන්නිවේදන<br>පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය | XXII |
| 5. | ව්‍යවහාර මුදල් | XXIV |
| 6. | දේශීය කටයුතු | XXV |
| 7. | ආර්ථික පර්යේෂණ | XXVIII |
| 8. | සේවක අර්ථ සාධක අරමුදල | XXX |
| 9. | විනිමය පාලන | XXXIII |
| 10. | මූල්‍ය බුද්ධි ඒකකය | XXXV |
| 11. | මූල්‍ය පද්ධති ස්ථායිතාවය | XXXVII |
| 12. | මානව සම්පත් කළමනාකරණය | XXXVII |
| 13. | තොරතුරු තාක්ෂණ | XLI |
| 14. | ජාත්‍යන්තර කටයුතු | XLII |
| 15. | නීති | XLIV |
| 16. | කළමනාකාරිත්ව විගණනය | XLIV |
| 17. | ගෙවීම් හා පියවීම් | XLV |
| 18. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | XLVIII |
| 19. | පරිශ්‍ර | XLIX |
| 20. | රාජ්‍ය ණය | XLIX |
| 21. | ප්‍රාදේශීය සංවර්ධන | LII |
| 22. | ලේකම් | LVII |
| 23. | ආරක්ෂක සේවා | LVII |
| 24. | සංඛ්‍යාන සහ ක්ෂේත්‍ර සමීක්ෂණ | LVIII |
| 25. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | LX |
| 26. | පුහුණු වැඩ කටයුතු | LXII |
| 27. | සුභසාධන | LXIII |

# I. ගිණුම්කරණ සහ මූල්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුව
## දෙසැම්බර් 31 වැනි දිනට ශේෂ පත්‍රය

| | සටහන | 2007 රු.'000 | 2006 රු.'000 |
|---|---|---|---|
| **බැරකම් සහ හිමිකරුවන්ගේ ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | 10 | **6,730,522** | 10,134,724 |
| ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල් | | **48,454,327** | 33,477,598 |
| ජා.මු.අ. සම්බන්ධ බැරකම් | 11 | **102,291,389** | 97,032,223 |
| අනිකුත් විදේශීය ගෙවිය යුතු මුදල් | | **1,615,652** | 1,544,545 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | **159,091,890** | 142,189,090 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතු | 12 | **91,053,024** | 82,615,387 |
| රජය හා රාජ්‍ය නියෝජ්‍ය ආයතනවල ශේෂ | 13 | **1,416,075** | 1,356,351 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අලෙවි කෙරෙන සුරැකුම්පත් | | **18,000** | 562,000 |
| සේවක සුභ සාධක යෝජනා ක්‍රමවල ශේෂ | 14 | **2,250,165** | 2,754,936 |
| අනෙකුත් දේශීය ගෙවිය යුතු මුදල් | | **1,923,545** | 1,231,476 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | **96,660,809** | 88,520,150 |
| **මුළු මූල්‍ය බැරකම්** | | **255,752,699** | 230,709,240 |
| **අනෙකුත් බැරකම්** | | | |
| සංසරණයෙහි පවත්නා මුදල් | | **173,363,722** | 157,239,605 |
| රජයේ විලම්භිත ප්‍රදාන | | **68** | 59,985 |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පසු සේවා ප්‍රතිලාභ | | | |
| යෝජනා ක්‍රමවල ශේෂ | | **324,183** | 1,121,818 |
| විවිධ වගකීම් | | **614,604** | 370,149 |
| **මුළු අනෙකුත් බැරකම්** | | **174,302,577** | 158,791,557 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| දායක ප්‍රාග්ධනය හා සංචිත | 15 | **131,389,367** | 103,349,515 |
| **මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | **561,444,643** | 492,850,312 |

| | සටහන | 2007 රු.'000 | 2006 රු.'000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමානයන් | 1 | **160,051,979** | 105,601,686 |
| මූල්‍ය වත්කම් : | | | |
| - ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 2 | **113,583,131** | 107,413,474 |
| - ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති රන්වලින් දක්වා ඇති සුරැකුම්පත් | 2 | **13,991,886** | 11,905,227 |
| - විකුණුම් සඳහා වන ආයෝජන | 2 | **79,541,928** | 68,211,989 |
| ජා.මු.අ. සම්බන්ධ වත්කම් | 3 | **71,899,462** | 67,276,214 |
| අනෙකුත් විදේශීය ලැබිය යුතු මුදල් | | **767,873** | 155,840 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **439,836,259** | 360,564,430 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ආයෝජන කළඹ - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | **43,612,184** | 67,507,503 |
| රජයට දෙන ලද අත්තිකාරම් | 4 | **60,679,200** | 49,015,400 |
| අනිකුත් ආයතනවලට දෙන ලද ණය | 5 | **2,093,650** | 2,487,446 |
| අනෙකුත් දේශීය ලැබිය යුතු මුදල් | | **706,767** | 1,173,461 |
| මූල්‍ය ආයතන හා අනිකුත් ආයතන වල ආයෝජන | 6 | **50,135** | 45,185 |
| අනෙකුත් වත්කම් | | **1,230,688** | 600,997 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **108,372,624** | 120,829,992 |
| **මුළු මූල්‍ය වත්කම්** | | **548,208,883** | 481,394,422 |
| **අනෙකුත් වත්කම්** | | | |
| තොග | 7 | **1,665,348** | 2,267,537 |
| රන් තොගය | | **59,766** | 59,766 |
| විවිධ වත්කම් | | **2,155,045** | 1,957,404 |
| දේපළ, පිරියත සහ උපකරණ | 8 | **9,354,648** | 7,171,183 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | **953** | - |
| **මුළු අනෙකුත් වත්කම්** | | **13,235,760** | 11,455,890 |
| **මුළු වත්කම්** | | **561,444,643** | 492,850,312 |

**විගණකාධිපතිතුමාගේ මතය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2007 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එම දිනයෙන් අවසන් වන වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, සටහන් 1.1 සිට 1.5 දක්වා පරිදි වූ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් අංක 01 සිට 24 දක්වා ඇති පරිදි වූ අනෙකුත් කරුණු පැහැදිලි කිරීමේ සටහන්, 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තිය සහ මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව එම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කර ඉදිරිපත් කර ඇති බවත්, එමගින් 2007 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වයත් සහ එදිනට අවසන් වර්ෂය සඳහා වූ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලවල සහ මුදල් ප්‍රවාහය සත්‍ය සහ සාධාරණ ලෙස පෙන්නුම් කරන බව මාගේ මතය වේ.

2008 මාර්තු 19 වැනි දින,
කොළඹ 07,
විගණකාධිපති දෙපාර්තමේන්තුවේදීය.

| | | |
|---|---|---|
| එස්. ස්වර්ණජෝති | අජිත් නිවාඩ් කබ්රාල් | කේ.එම්.ඒ.එන්. දවුලගල |
| විගණකාධිපති | අධිපති | ප්‍රධාන ගණකාධිකාරී |

## ශ්‍රී ලංකා මහ බැංකුව
## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් ප්‍රකාශනය

| | සටහන | 2007 රු '000 | 2006 රු '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | |
| **විදේශ මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොලී ආදායම | 16 | **13,240,762** | 10,786,599 |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/ (පාඩුව) | | **4,413,887** | (80,208) |
| මිල වෙනස්වීම් වලින් උපලබ්ධි වාසිය / (පාඩුව) | | **2,189,134** | 992,017 |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත සම්පූර්ණ ආදායම** | | **19,843,783** | 11,698,408 |
| **විදේශීය මූල්‍ය වගකීම් ආශ්‍රිත වියදම** | | | |
| පොලී වියදම් | 17 | **(2,226,270)** | (2,258,478) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත සම්පූර්ණ වියදම** | | **(2,226,270)** | (2,258,478) |
| විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ ලාභය/ (පාඩුව) | | **8,812,401** | 22,358,038 |
| **විදේශ මුදල් ආශ්‍රිත ආයෝජන ආදායම / (පාඩුව)** | | **26,429,914** | 31,797,968 |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොලී ආදායම | 16 | **9,516,837** | 5,330,970 |
| පොලී වියදම | 17 | **(551,596)** | (381,426) |
| | | **8,965,241** | 4,949,544 |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත සම්පූර්ණ ආදායම** | | | |
| අනිකුත් ආදායම | 18 | **421,396** | 710,411 |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම / (පාඩුව)** | | **35,816,551** | 37,457,923 |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | | | |
| - වේතන සහ වැටුප් | 19 | **(1,591,667)** | (1,292,044) |
| - නිශ්චිත දායක යෝජනා ක්‍රම පිරිවැය | 19 | **(187,834)** | (181,476) |
| - පශ්චාත් සේවා නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම පිරිවැය | 19 | **(1,671,606)** | (4,625,893) |
| | | **(3,451,107)** | (6,099,413) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **(270,040)** | (466,671) |
| තොග පිරිවැය | | **(1,052,160)** | (1,543,026) |
| පරිපාලන වියදම් | | **(1,172,964)** | (876,632) |
| බොල් හි අඩමාන ණය ශුද්ධ විවිධ කපාහැරීම් | | **(53)** | - |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **(5,946,324)** | (8,985,742) |
| **ආදායම් බදුවලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභය / (පාඩුව)** | | **29,870,227** | 28,472,181 |
| ආදායම් බදු | | **(1,044,842)** | (620,565) |
| **සාමාන්‍ය කටයුතුවලින් ලැබූ ශුද්ධ ලාභය / (පාඩුව)** | | **28,825,385** | 27,851,616 |

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සටහන | 2007 රු '000 | 2006 රු '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | |
| **ප්‍රභවය :** | | | |
| ලැබුණු පොලිය - විදේශීය මුදල් | | **13,091,488** | 9,777,792 |
| ලැබුණු පොලිය - දේශීය මුදල් - වෙනත් | | **380,567** | 22,783 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **2,189,134** | 991,682 |
| උපලබ්ධි වූ විනිමය ලාභ /(පාඩු) | | **89,345** | (352,657) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **348,438** | 474,810 |
| | | **16,098,972** | 10,914,410 |
| **වියපැහැදම් :** | | | |
| ගෙවන ලද පොලිය - විදේශීය මුදල් | | **2,234,300** | 2,130,611 |
| ගෙවන ලද පොලිය - දේශීය මුදල් | | **552,054** | 384,519 |
| සේවකයින්ට ගෙවීම් | | **1,782,510** | (470,892) |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **3,583,245** | 6,732,521 |
| ගෙවන ලද ආදායම් බදු | | **663,653** | 531,545 |
| | | **8,815,762** | 9,308,304 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | 21 | **7,283,210** | 1,606,106 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| **ප්‍රභවය :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම) /අඩුවීම | | **(822,393)** | (666,266) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම්වල මුල් මුදල් අයකිරීම් | | **393,795** | 110,982 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන අපහරණය /මුදා හැරීම | | **(4,950)** | 406 |
| දේපළ, පිරියත් සහ උපකරණ විකිණීම | | **-** | 15,025 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන ආශ්‍රිත ආදායම් | | **28,590** | 9,049 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **(544,000)** | (13,545,000) |
| | | **(948,958)** | (14,075,804) |
| **වියපැහැදම්** | | | |
| විදේශීය මූල්‍ය සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **6,186,179** | 40,459,822 |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **587,989** | 2,193,369 |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **(12,345,621)** | 924,448 |
| අනිකුත් දේශීය තැන්පතු හා ගෙවිය යුතු මුදල් වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **4,409** | 192,672 |
| ප්‍රදානයන් අඩු කළ, දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලට ගැනීම් | | **221,448** | 102,230 |
| රන් තොගයේ ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **(181,599)** | 1,273,645 |
| | | **(5,527,195)** | 45,146,186 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **4,578,237** | (59,221,990) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| **ප්‍රභවය :** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **209,034,025** | 188,483,464 |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **(192,909,909)** | (163,680,355) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **16,124,116** | 24,803,109 |
| **අඩුකිරීම්** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරන මුදල් ශුද්ධ නිකුතුව /(ආපසු ගැනීම්) | 22 | **(21,422,909)** | 19,243,588 |
| බැංකුව සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව /(ආපසු ගැනීම්) | 23 | **(8,564,417)** | (17,131,807) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව /(ආපසු ගැනීම්) | | **(29,987,326)** | 2,111,781 |
| | | **46,111,442** | 22,691,328 |
| **වියපැහැදම්** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **605,092** | (13,684,511) |
| අතිරික්තය රජයට ගෙවීම | | **4,015,090** | - |
| | | **4,620,182** | (13,684,511) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **41,491,260** | 9,006,817 |
| **වසර තුල මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම** | | **53,352,707** | (48,609,067) |
| මුදල් සහ මුදල් සමානයන් මත විනිමය අනුපාතයන් බලපෑම | | **1,097,586** | 8,081,942 |
| වසර ආරම්භක දිනට මුදල් සහ මුදල් සමානයන් | | **105,601686** | 146,128,811 |
| **2007 දෙසැම්බර් 31 දිනට ශුද්ධ මුදල් හා මුදල් සමානයන්** | 24 | **160,051,979** | 105,601,686 |

## ශ්‍රී ලංකා මහ බැංකුව

## 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| | ආයක ප්‍රාග්ධනය රු'000 | ප්‍රත්‍යාගණන සංචිතය රු'000 | අනිකුත් සංචිත රු'000 | සමුච්චිත ලාභ රු'000 | එකතුව රු'000 |
|---|---|---|---|---|---|
| **2006 ජනවාරි 01 දිනට** | 15,000 | 662,382 | 69,735,949 | 6,722,302 | 77,135,633 |
| ශුද්ධ ලාභය | - | - | - | 27,851,616 | 27,851,616 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිදන් | | | | | |
| අරමුදලට පැවරීම | - | - | 40,263 | (40,263) | - |
| උපලබ්ධි ප්‍රත්‍යාගණන වාසියට පැවරීම | - | (7416) | - | 7416 | - |
| ගැලපීම් හා ප්‍රතිවර්ගීකරණයන්ගේ ශුද්ධ බලපෑම | | (181,909) | | | (181,909) |
| ශ්‍රී.ලං.ම.බැ. නිශ්චිත සංචිත වලට පැවරීම | | | 221,903 | (34,540) | 187,363 |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසියට පැවරීම | | | 22,358,038 | (22,358,038) | |
| විකුණුම් සුරැකුම්පත් සඳහා ඇති ශුද්ධ සාධාරණ | | | | | |
| වටිනාකම (පාඩුව) | | | (1,643,188) | | (1,643,188) |
| **2007 ජනවාරි 01 දිනට** | 15,000 | 473,057 | 90,712,965 | 12,148,493 | 103,349,515 |
| තත්කාලීන තත්වයේ ඇති වූ බලපෑම | | | | (520) | (520) |
| ශුද්ධ ලාභය | - | - | - | **28,825,385** | **28,825,385** |
| තත් කාලීන දළ පියවුම් පද්ධතිය | | | | | |
| සඳහා වූ නිදන් අරමුදලට පැවරීම | - | - | **46,341** | **(46,341)** | - |
| ශ්‍රී.ලං.ම.බැ. නිශ්චිත සංචිතවලට පැවරීම | - | - | **100,914** | **(100,664)** | **250** |
| උපලබ්ධි ප්‍රත්‍යාගණන වාසිය පැවරීම | - | **2,233,010** | | | **2,233,010** |
| පොදු සංචිතයට පැවරීම | | | 1,478,488 | (1,478,488) | |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය පැවරීම | - | - | **8,812,401** | **(8,812,401)** | - |
| මහනුවර දේපළ විකිණීමෙන් ලත් මුදල පැවරීම | | | | (15,090) | (15,090) |
| 2006 වර්ෂය සඳහා ශුද්ධ ලාභය රජයට පැවරීම | | | | (4,000,000) | (4,000,000) |
| විකුණුම් සුරැකුම්පත් සඳහා ඇති | | | | | |
| ශුද්ධ සාධරණ වටිනාකම /(පාඩුව) | - | - | **996,817** | - | **996,817** |
| **2007 දෙසැම්බර් 31 දිනට** | **15,000** | **2,706,067** | **102,147,926** | **26,520,374** | **131,389,367** |

## ශ්‍රී ලංකා මහ බැංකුව
## මූල්‍ය වාර්තාවල කොටසක් ලෙස කියවිය යුතු සටහන්

| සටහන | | 2007 රු '000 | 2006 රු '000 |
|---|---|---|---|
| 1. | **මුදල් හා මුදල් සමානයන්** | **6,831,527** | 1,182,304 |
| | විදේශීය බැංකුවල ඇති ශේෂයන් | **130,280,290** | 86,968,117 |
| | විදේශීය බැංකුවල ඇති කාලීන තැන්පතු | **4,327,401** | 9,416,427 |
| | කාලීන තැන්පතු සඳහා කොන්ත්‍රාත්ගත බැඳීම් | **18,612,761** | 8,034,838 |
| | ප්‍රතිමිලදී ගැනීම් යටතේ ඇති තැන්පතු | **160,051,979** | 105,601,686 |
| 2. | **මූල්‍ය වත්කම්** | | |
| | ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **113,583,131** | 107,413,474 |
| | ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති රන් වලින් දක්වා ඇති සුරැකුම්පත් | **13,991,886** | 11,905,227 |
| | විකිණීමට ඇති ආයෝජන | **79,541,928** | 68,211,989 |
| | | **207,116,945** | 187,530,690 |
| 3. | **ජා.මු.අ. සම්බන්ධ වත්කම්** | | |
| | ජා.මු.අ. තැම්පතු | **135,516** | - |
| | විශේෂ ගැනුම් හිමිකම්වල දැරීම් | **740,172** | 291,772 |
| | ජා.මු.අ. පංගුව | **71,023,774** | 66,984,442 |
| | | **71,899,462** | 67,276,214 |
| 4. | **රජයට දෙන ලද අත්තිකාරම්** | | |
| | චක්‍රීය ණය | **60,679,200** | 49,015,400 |
| | රජයට දෙන ලද මුළු අත්තිකාරම් | **60,679,200** | 49,015,400 |
| 5. | **අනිකුත් ආයතනවලට දෙන ලද ණය** | | |
| | දැනට පවත්නා මුල් මුදල - සම්බන්ධිත පාර්ශව | **50,670** | 56,797 |
| | - අනෙකුත් | **2,152,116** | 2,141,818 |
| | සුසහන ණය ක්‍රමය යටතේ ලැබීම් - සම්බන්ධිත පාර්ශව | **1046,496** | 1,832,516 |
| | - අනෙකුත් | **1,022,861** | 634,807 |
| | ලැබිය යුතු පොලිය | **4,218,134** | 4,217,107 |
| | **දළ ලැබිය යුතු මුදල්** | **8,490,277** | 8,883,045 |
| | අඩු කළා : අඩමාන ණය සඳහා වෙන් කිරීම | **(2,178,492)** | (2,178,492) |
| | අත්හිටවූ පොලිය | **(4,218,135)** | (4,217,107) |
| | **ලැබිය යුතු ශුද්ධ මුදල** | **2,093,690** | 2,487,446 |
| 6. | **මූල්‍ය සහ අනෙකුත් ආයතනවල ආයෝජන** | | |
| | සීමාසහිත ණය තොරතුරු කාර්යාංශය | **12,135** | 12,185 |
| | සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | **29,500** | 29,500 |
| | සීමාසහිත ෆිච් රේටිංස් ලංකා | **3,500** | 3,500 |
| | ස්විෆ්ට් සර්විසස් බියුරෝ | **5,000** | - |
| | | **50,135** | 45,185 |
| 7. | **තොග** | | |
| | සංසරණය සඳහා ඇති නෝට්ටු | **1,155,948** | 1,757,198 |
| | සංසරණය සඳහා ඇති කාසි | **497,949** | 440,354 |
| | මාර්ගස්ථ කාසි | **41,155** | 96,600 |
| | | **1,695,052** | 2,294,152 |
| | **අඩුකළා : සෙමින් චලනය වන විෂයයන් සඳහා වෙන්කිරීම්** | **(55,300)** | (55,300) |
| | | **1,639,752** | 2,238,852 |
| | ලිපිද්‍රව්‍ය සහ විවිධ තොග | **25,596** | 28,685 |
| | **පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම මත මුළු තොගය** | **1,665,348** | 2,267,537 |

8. දේපළ, පිරියත සහ උපකරණ

| ශේෂය | ඉඩම් සහ ගොඩනැගිලි රු '000 | පිරියත හා පිරියත උපකරණ රු '000 | ලී බඩු සහ උපකරණ රු '000 | මෝටර් වාහන රු '000 | පරිඝනක දෘඩාංග රු '000 | අනිකුත් රු '000 | එකතුව 2007 රු '000 | එකතුව 2006 රු '000 |
|---|---|---|---|---|---|---|---|---|
| සමුච්චිත ක්ෂය අඩුකර 2007 ජනවාරි 01 දිනට | 6,026,600 | 831,397 | 195,916 | 24,479 | 82,177 | 10,614 | **7,171,183** | 7,717,108 |
| ප්‍රත්‍යාගණනයන් | 2,233,010 | - | - | - | - | - | **2,233,010** | - |
| එකතු කිරීම් | 961 | 1,301 | 50,882 | 101,000 | 21,454 | 44,579 | **220,177** | 102,233 |
| අපහරණයන් | - | - | - | - | - | - | **-** | (14,709) |
| නැවත ශ්‍රේණිගත කිරීම/ කපා හැරීමේ ශුද්ධ බලපෑම | - | - | - | - | - | - | **-** | (282,560) |
| වර්ෂය සඳහා ක්ෂය වීම් | (94,342) | (52,427) | (52,930) | (27,033) | (41,751) | (1,239) | **(269,722)** | (350,889) |
| **සමුච්චිත ක්ෂය අඩු කර 2007 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 8,166,229 | 780,271 | 193,868 | 98,446 | 61,880 | 53,954 | **9,354,648** | 7,171,183 |

| | | 2007 දිනට රු '000 | 2006 දිනට රු '000 |
|---|---|---|---|
| 9. | **අස්පෘශ්‍ය වත්කම්** | | |
| | පරිගණක මෘදුකාංග | | |
| | පිරිවැය: | | |
| | ජනවාරි 01 දිනට | **463,149** | 463,149 |
| | එකතු කිරීම් | **1,271** | - |
| | අපහරණයන් | **-** | - |
| | දෙසැම්බර් 31 දිනට | **464,420** | 463,149 |
| | ක්‍රමක්ෂය කිරීම සහ හාණිකරණය : | | |
| | ජනවාරි 01 දිනට | **463,149** | 347,362 |
| | වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **318** | 115,787 |
| | දෙසැම්බර් 31 දිනට | **463,467** | 463,149 |
| | ශුද්ධ පොත් අගය : | | |
| | ජනවාරි 01 දිනට | **-** | 115,787 |
| | දෙසැම්බර් 31 දිනට | **953** | - |
| 10. | **බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල්** | | |
| | විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **6,246,208** | 9,587,227 |
| | අනෙකුත් විදේශීය ආයතනවලට ගෙවිය යුතු මුදල් | **484,314** | 547,497 |
| | **බැංකු හා මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුළු මුදල්** | **6,730,522** | 10,134,724 |
| 11. | **ජා.මු.අ. සම්බන්ධ බැරකම්** | | |
| | පොලිය දරන ණය - ප්‍රවර්තන නොවන | **18,809,059** | 26,036,677 |
| | පොලිය දරන ණය - ප්‍රවර්තන | **8,501,764** | 279,102 |
| | වි.ගැ.හි වෙන්කිරීම් | **12,175,406** | 11,482,955 |
| | ජා.මු.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **38,417,617** | 33,689,353 |
| | පංගු බැරකම් | **24,387,543** | 25,544,136 |
| | | **83,482,330** | 70,995,546 |
| | **ජා.මු.අ. සම්බන්ධ මුළු බැරකම්** | **102,291,389** | 97,032,223 |

| | | 2007 රු '000 | 2006 රු '000 |
|---|---|---|---|
| 12. | **බැංකු සහ මූල්‍ය ආයතයන් විසින් තැන්පත් කිරීම්** | | |
| | **බැංකු විසින් තැන්පත් කිරීම්** | | |
| | - සම්බන්ධිත පාර්ශවයන් | **38,250,751** | 35,299,563 |
| | - අනිකුත් | **52,795,434** | 47,306,679 |
| | | **91,046,185** | 82,606,242 |
| | **මූල්‍ය ආයතනයන් විසින් තැන්පත් කිරීම්** | | |
| | - සම්බන්ධිත පාර්ශවයන් | **64** | 60 |
| | - අනිකුත් | **6,775** | 9,085 |
| | | **6,839** | 9,145 |
| | **අඩුකළා :** | | |
| | දිනක් තුළ සපයනු ලබන ද්‍රවශීල පහසුකම් යටතේ ලබාදුන් අත්තිකාරම් | **-** | - |
| | **බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු** | **91,053,024** | 82,615,387 |
| 13. | **රජය සහ රජයේ ඒකක සමග වූ ශේෂයන්** | | |
| | රජයේ තැන්පතු | **642,135** | 741,648 |
| | රජයේ නියෝජිත ආයතන සහ අරමුදල් | **773,940** | 614,703 |
| | රජය සහ රජයේ නියෝජිතයන් වෙත වූ මුළු ශේෂ | **1,416,075** | 1,356,351 |
| 14. | **සේවක ප්‍රතිලාභ සැලසුම් සමග වූ ශේෂයන්** | | |
| | අර්ථසාධක අරමුදල - සම්බන්ධ පාර්ශව | **713** | 2,137 |
| | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - සම්බන්ධිත පාර්ශවයන් | **437,867** | 1,558,055 |
| | වැන්දඹු / වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමය-සම්බන්ධිත පාර්ශවයන් | **829,215** | 693,479 |
| | පාරිතෝෂිත විශ්‍රාම වැටුප් යටතේ ගෙවිය යුතු මුදල් | **46,487** | 35,235 |
| | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු මුදල් | **935,883** | 466,030 |
| | | **2,250,165** | 2,754,936 |
| 15. | **ප්‍රාග්ධනය සහ සංචිත** | | |
| | දායක ප්‍රාග්ධනය | **15,000** | 15,000 |
| | මධ්‍ය සහ දිගුකාලීන ණය සංචිතය | **9,425,000** | 9,425,000 |
| | ප්‍රාග්ධන දායක ගිණුම | **577,859** | 577,859 |
| | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ගිණුම | **2,706,067** | 473,057 |
| | විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල වෙළෙඳපොළ ඇගයීම් සංචිතය | **(781,449)** | (1,778,265) |
| | වාර්ෂික ලාභය / (අලාභය) | **28,825,384** | 27,851,616 |
| | ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය | **61,422,435** | 52,610,034 |
| | අනෙකුත් සංචිත | **29,199,071** | 14,175,214 |
| | | **131,389,367** | 103,349,515 |
| 16. | **මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොලී ආදායම** | | |
| | **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොලී ආදායම** | | |
| | මුදල් හා මුදල් සමානයන් | **5,956,825** | 4,460,836 |
| | මූල්‍ය වත්කම් | **7,086,382** | 6,191,870 |
| | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වත්කම් | **169,872** | 133,893 |
| | අනෙකුත් විදේශීය ලැබිය යුතු දෑ | **27,683** | |
| | **විදේශීය මූල්‍ය වත්කම්වලින් සම්පූර්ණ පොලී ආදායම** | **13,240,762** | 10,786,599 |
| | **දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොලී ආදායම** | | |
| | ආයෝජන කළඹ - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **9,207,485** | 5,173,853 |
| | මූල්‍ය හා අනෙකුත් ආයතනවල ආයෝජන | **-** | - |
| | අනිකුත් ණය සහ අත්තිකාරම් | **309,352** | 157,117 |
| | **දේශීය මූල්‍ය වත්කම් වලින් සම්පූර්ණ පොලී ආදායම** | **9,516,837** | 5,330,970 |
| | **මූල්‍ය වත්කම් වලින් ඉපැයූ සම්පූර්ණ පොලී ආදායම** | **22,757,599** | 16,117,569 |

| | | 2007<br>රු '000 | 2006<br>රු '000 |
|---|---|---|---|
| 17. | **මූල්‍ය බැරකම් මත පොලී වියදම** | | |
| | **විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොලී වියදම** | | |
| | ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල් | **1,330,404** | 1,154,945 |
| | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම් | **828,182** | 1,064,836 |
| | ප්‍රති මිලදී ගැනීමේ එකඟත්වය මත අලෙවිකළ සුරැකුම්පත් | **67,684** | 36,188 |
| | වෙනත් විදේශීය ගෙවිය යුතු මුදල් | **-** | 2,509 |
| | **විදේශීය මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොලී වියදම** | **2,226,270** | 2,258,478 |
| | **දේශීය මූල්‍ය බැරකම් මත පොලී වියදම** | | |
| | ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අලෙවිකරණ සුරැකුම්පත් | **551,596** | 381,426 |
| | **දේශීය මූල්‍ය බැරකම් මත සම්පූර්ණ පොලී වියදම** | **551,596** | 381,426 |
| | **මූල්‍ය බැරකම් මත සම්පූර්ණ පොලී වියදම** | **2,777,866** | 2,639,904 |
| 18. | **අනිකුත් ආදායම්** | | |
| | ලාභාංශ ආදායම - සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් | **12,648** | 3,683 |
| | - අනිකුත් | **394** | 525 |
| | දේපළ, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලාභය / (අලාභය) | **(12)** | 316 |
| | මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන අපහරණයෙන් /(අලාභය) | **567** | 344 |
| | විලම්භිත ප්‍රදානය ක්‍රමක්ෂය වීම | **60,007** | 221,835 |
| | විවිධ ආදායම් | **347,792** | 483,708 |
| | **මුළු අනෙකුත් ආදායම්** | **421,396** | 710,411 |
| 19. | **සේවක මණ්ඩල වියදම්** | | |
| | උපයන විට ගෙවීම් බදු ඇතුළුව සේවායෝජක විසින් ගෙවන ලද වේතන සහ වැටුප් | **1,591,667** | 1,419,730 |
| | පශ්චාත් සේවක නිශ්චිත දායක සැලසුම් පිරිවැය | **1,671,606** | 3,834,000 |
| | නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | **187,834** | 181,476 |
| | අනෙකුත් ප්‍රතිලාභ | **-** | 664,207 |
| | | **3,451,107** | 6,099,413 |
| 20. | **පරිපාලන වියදම්** | | |
| | අළුත්වැඩියා සහ නඩත්තු | **341,234** | 337,176 |
| | සන්නිවේදන වියදම් | **78,564** | 76,059 |
| | මෙහෙයුම් ගමන් වියදම් | **20,099** | 16,876 |
| | බදුකුලී වියදම් | **1,239** | 1,547 |
| | මුද්‍රණ වියදම් | **23,982** | 17,732 |
| | විගණන ගාස්තු | **9,040** | 10,013 |
| | මුදල් මණ්ඩලයේ සාමාජිකයින්ට පාරිශ්‍රමිකය | **389** | 591 |
| | පොලී වියදම් - ශ්‍රී ලංකා මහ බැංකු අර්ථසාධක අරමුදල | **453,125** | 195,000 |
| | විවිධ | **245,292** | 221,638 |
| | | **1,172,965** | 876,632 |
| 21. | **මෙහෙයුම් ලාභය මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමග සැසඳීම** | | |
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වාර්තා කෙරුණු ශුද්ධ ලාභය /(අලාභය)** | **28,825,385** | 27,851,616 |
| | **මුදල් නොවන විෂයයන් එකතු කළා /(අඩු කළා)** | | |
| | ක්ෂයවීම් | **270,040** | 466,672 |
| | ලැබුණු පොලිය - දේශීය මුදල් - ආයෝජන කළඹ | **(9, 131,665)** | (5,313,769) |
| | බොල් ණය කපා හැරීම සහ ආපසු ලැබීම් | **-** | 9,960 |
| | නිශ්චිත සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ශුද්ධ ප්‍රතිපාදන | **-** | 4,625,893 |
| | උපලබ්ධි නොවූ ශුද්ධ විදේශ විනිමය (ලාභය) /අලාභය | **(8,723,055)** | (22,711,030) |
| | අනෙකුත් ප්‍රතිපාදන | **1,943,189** | 1,505,358 |
| | විලම්භිත ප්‍රදානයන් ක්ෂය වීම | **-** | (218,676) |

| | | 2007<br>රු '000 | 2006<br>රු '000 |
|---|---|---|---|
| | **එකතු කළා /(අඩු කළා) අනිකුත් කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ චලනය** | | |
| | තොගවල (වැඩිවීම) /අඩුවීම | **602,189** | (915,860) |
| | ලැබිය යුතු පොලිය (වැඩිවීම) /අඩුවීම | **(141,746)** | (1,010,442) |
| | විවිධ බැරකම්වල වැඩිවීම /(අඩුවීම) | **(2,304,419)** | (2,812,803) |
| | ගෙවිය යුතු පොලිය වැඩිවීම /(අඩුවීම) | **(36,171)** | 124,774 |
| | අනෙකුත් ලැබිය යුතු මුදල් වල වැඩිවීම /(අඩුවීම) | **450,759** | (66,088) |
| | **එකතුකළා /(අඩුකළා) ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| | ආයෝජන වලින් ආදායම | **15,549** | (4840) |
| | ලාභාංශ ලැබීම් | **(13,041)** | (4,208) |
| | දේපළ, යන්ත්‍ර උපකරණ විකිණීමෙන් ලාභය | **-** | (316) |
| | ආයෝජන අපහරණයෙන් ලාභය | **-** | (343) |
| | උපලබ්ධි නොවූ වෙළෙඳපොළ වටිනාකමෙහි ශුද්ධ වෙනස්වීම | **(4,413,887)** | 80,208 |
| | විලම්භිත ප්‍රදානයන් | **(59,917)** | - |
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **7,283,210** | 1,606,106 |
| **22.** | **රජයේ ගනුදෙනු මත සංසරණ මුදල් නිකුතු /(ආපසු ගැනීම්)** | | |
| | ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් කළඹ පරිණත වීම | **(236,406,730)** | (132,655,180) |
| | ආයෝජන කළඹ සඳහා ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම | **212,401,293** | 148,788,162 |
| | ලැබුණු පොලිය - දේශීය මුදල් - ආයෝජන කළඹ | **(9,021,548)** | (5,733,735) |
| | ශ්‍රී ලංකා රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් වැඩිවීම /(අඩුවීම) | **11,663,800** | 9,269,100 |
| | රජය සහ රජයේ ඒකක සමග ශේෂ (වැඩිවීම) /අඩුවීම | **(59,724)** | (424,759) |
| | රජයේ ප්‍රදාන ලැබීම් | **-** | - |
| | | **(21,422,909)** | (19,243,588) |
| **23.** | **බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු /(ආපසු ගැනීම්)** | | |
| | බැංකු හා මූල්‍ය ආයතන සමග ශේෂ (වැඩිවීම) /අඩුවීම | **(8,564,417)** | (17,131,807) |
| | බැංකු හා මූල්‍ය ආයතනයන්ට සලසන ලද දවස තුළ ද්‍රවශීලතා පහසුකමේ (වැඩිවීම) /අඩුවීම | **-** | - |
| | | **(8,564,417)** | (17,131,807) |
| **24.** | **වසර අවසාන දිනට මුදල් හා මුදල් සමානයන්** | | |
| | **විදේශීය මූල්‍ය වත්කම්** | | |
| | අනිකුත් විදේශීය බැංකු සමග මුදල් ශේෂ | **160,051,979** | 105,601,686 |
| | **වසර අවසාන දිනට මුදල් හා මුදල් සමානයන්** | **160,051,979** | 105,601,686 |

## 1.1 අරමුණු වලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් කටයුතුභාවය සහ මූල්‍ය කටයුතු කාර්ය සාධනය

ශ්‍රී ලංකාවේ මුදල් සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මූල්‍ය නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සාක්ෂාත් කරගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින් මහ බැංකුවේ ගිණුම් කටයුතුභාවය සහ එහි මෙහෙයුම්වල සාර්ථකභාවය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය අංශයේ ආයතන වලින් වෙන්කොට හඳුනාගැනීමේ මූලික ලක්ෂණයන්, මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන් වන්නේය. පොලී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහ බැංකුව සතු බැවින් එය ලාභදායීත්ව ප්‍රවේශයක් අනුගමනය කලේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් සිදුවනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායීතා සහ මූල්‍ය පද්ධති ස්ථායීතා පරමාර්ථයන්, ලාභදායීතා අරමුණු වලින් ව්‍යුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් විය යුතු වන්නේය.

මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමණාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාකාරකම් කිරීමේ ප්‍රතිඵල උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සටහන් කරන අතර මෙය රාජ්‍ය ගිණුම් කටයුතු භාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමෙන් මූල්‍ය ගිණුම් කටයුතු භාවය සඳහා පදනම සපයනු ලබන අතර මෙම ප්‍රකාශයන්හි වාර්තාකර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළ යුතුය.

## 1.2 වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

මෙම මූල්‍ය ප්‍රකාශනයන්, ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මූල්‍ය නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") මූල්‍ය ප්‍රකාශනයන් වන්නේ ය. ශ්‍රී ලංකා මහ බැංකුව, නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හා ප්‍රධාන ගණකාධිකාරී විසින් 2008 මාර්තු මස 18 වන දින මෙම මූල්‍ය ප්‍රකාශයන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

## 1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.3.1 පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් නිශ්චිත ගණකාධිකරණ ප්‍රතිපත්ති වලින් හඳුන්වාදී ඇති පරිදි සාධාරණ වටිනාකමට අගය කරන ලද ඉඩම්, ගොඩනැගිලි සහ ඇතැම් මූල්‍ය වත්කම් හැර මූල්‍ය ප්‍රකාශනයන් ඓතිහාසික පිරිවැය පදනමට මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කරන ලදී.

#### වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාළ ආදායම් සහ වියදම් මාර්ගද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. ශේෂ පත්‍රයෙහි වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේදී, පුළුල් වශයෙන් එක් එක් වර්ගය යටතේ ද්‍රවශීලවීමේ පිළිවෙලට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 1.5 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

#### අනුකූලතා ප්‍රකාශනය

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) ප්‍රකාර පිළියෙල කර තිබේ.

#### වාර්තාකිරීමේ මුදල් ඒකකය

අන් අන්දමකට දක්වා නොමැති නම් සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් දහස් වලින් දැක්වේ.

### 1.3.2 වැදගත් ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු

ගිණුම් ප්‍රතිපත්ති අදාළ කිරීමේදී බැංකුව විසින් ඇස්තමේන්තුවලට අමතරව පහත දැක්වෙන නිශ්චයන් කර ඇති අතර මෙම ගිණුම් ප්‍රකාශනයන්ගේ අගය හඳුනාගැනීම් මත ඒවා සැලකිය යුතු අන්දමින් බලපා ඇත.

#### විකිණීමට ඇති ආයෝජන හානිකරණය

වැදගත් හා නොනවත්වා සාධාරණ අගය එහි පිරිවැයට වඩා පහළ යන විට, විකිණීම සඳහා ඇති ආයෝජන හානි වී ඇති බව බැංකුව තීරණය කරයි. වැදගත් බව සහ නොනවත්වා යන්න තීරණය කිරීමේදී නිශ්චය කිරීම අවශ්‍ය වේ.

#### විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම්වල පිරිවැය, ආයුගණක ඇගැයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණක ඇගයීමකදී, වට්ටම් අනුපාත, වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදු කරනු ලැබේ. මෙම සැලසුම්වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ.

### 1.3.3 වර්ෂය තුළ, ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති (IFRS) අදළ කර ගැනීම.

යොදා ගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති, ඉකුත් වර්ෂයේ යොදාගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති සමග අනුරූප වේ. බැංකුව විසින් ජා.මූ.වා.ප්‍ර. 7: මූල්‍ය සාධන පත්‍රිකා: හෙළිදරව් කිරීම් හා ජා.ගි.ප්‍ර. 1, ප්‍රාග්ධන හෙළිදරව් කිරීම් හා ජා.ගි.මූ.1, ප්‍රාග්ධන හෙළිදරව් කිරීමට අදාළ අනුපූරක සංශෝධන යොදාගන්නා ලදී.

එම ප්‍රතිපත්ති වෙනස්වීම්වල ප්‍රධාන බලපෑම් පහත පරිදිවේ.

ජා.මූ.වා.ප්‍ර. 7 - මූල්‍ය සාධන පත්‍රිකා : හෙළිදරව් කිරීම්

මූල්‍ය ප්‍රකාශන භාවිතයට ගන්නා පාර්ශවයන් හට බැංකුවේ මූල්‍ය සාධන පත්‍රිකාවල වැදගත්කම සහ එහි ස්වරූපය හා එනයින් හටගන්නා අවදානමේ තත්වය ඇගැයීම සඳහා මෙම ප්‍රමිතිය මගින් දන්වා ඇති හෙළිදරව් කිරීම උපකාරී වේ. නව හෙළිදරව් කිරීම්, මූල්‍ය ප්‍රකාශන තුල අඩංගු කර ඇත. එසේම මූලය තත්ත්වය හෝ ප්‍රතිඵලයන්ට බලපෑමක් නොමැති අවස්ථාවන්හිදී, පසුගිය වර්ෂයේ කරුණු අවශ්‍ය පරිදි සංශෝධනය කර ඇත.

ජා.ගි.ප්‍ර-1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මෙම ප්‍රමිතියේ සංශෝධන මගින් සමූහ මූල්‍ය ප්‍රකාශන භාවිතයට ගන්නා පාර්ශවයන්හට එම සමූහයේ ප්‍රාග්ධනය පාලනය සඳහා යොදාගන්නා අරමුණු, ප්‍රතිපත්ති සැකසුම් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම පහසුවන පරිදි අවශ්‍ය නව හෙළිදරව් කිරීම දක්වා ඇත.

### 1.3.4. මෙතෙක් ක්‍රියාත්මක නොමැති එහෙත් ප්‍රකාශයටපත් කර ඇති ප්‍රමිතිවලට සංශෝධන ඇතුළු ප්‍රමිති සහ නිර්වචනයන්

2007 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භවන බැංකුවේ ගිණුම් කාලපරිච්ඡේදයන්ට අදාළ වන්නා වූ, එහෙත් බැංකු විසින් මින් ඉහත දී යොදා නොගත්, ඇතැම් නව ප්‍රමිති සහ පවත්නා ප්‍රමිතීන්ට සංශෝධන හා නිර්වචනය කිරීම් ප්‍රකාශයට පත්කර තිබුණි. ඒවා මෙසේ ය.

ජා.මූ.වා.ප්‍ර. 8 - මෙහෙයුම් කාණ්ඩ (2009 ජනවාරි 1 දින සිට බල පැවැත්වේ) ජා.මූ.වා.ප්‍ර. 8: ආයතනයක් විසින් තම මෙහෙයුම් කාණ්ඩයන්හි තොරතුරු, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කිරීමේ ආකාරය මෙමගින් තීරණය කෙරේ. ජා.මූ.වා.ප්‍ර. 8 සහ එය ස්වේච්ඡාවෙන් අදාළ කර ගැනීමේ බලපෑම බැංකුව විසින් තක්සේරු කෙරෙමින් පවතී.

## 1.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 1.4.1 විදේශීය මුදල් පරිවර්තනය

බැංකුවේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. විදේශීය මුදල් වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේදී පවතින විනිමය අනුපාතික ප්‍රකාර කෘත්‍යාත්මක මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල් වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, ශේෂ පත්‍ර දිනට පවත්නා විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේදී, ප්‍රධාන ව්‍යවහාර මුදල් වලට වූ ඉහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| ප්‍රධාන ව්‍යවහාර මුදල් | 2007<br>රු. | 2006<br>රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | 95.5807 | 85.2221 |
| කැනඩා ඩොලර් 1 | 111.0061 | 92.8256 |
| යුරෝ 1 | 160.2741 | 141.5844 |
| ජපන් යෙන් 1 | 0.9713 | 0.9050 |
| විශේෂ ගැනුම් හිමිකම් (විගැහි) 1 | 171.8040 | 162.0330 |
| බ්‍රිතාන්‍ය පවුම් 1 | 217.1507 | 211.2861 |
| එක්සත් ජනපද ඩොලර් 1 | 108.7194 | 107.7056 |

විදේශීය මුදල් වලින් ඓතිහාසික පිරිවැය මත මිනුම් කරනු ලබන මූල්‍ය නොවන විෂයයන්, මුල් ගනුදෙනුව සිදු වූ දිනයෙහි පැවති විනිමය අනුපාතය මත පරිවර්තනය කරනු ලැබේ.

### 1.4.2 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන් ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන් තුළින් ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මුදල් නිකුතු සහ බැංකු කටයුතු වලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිඹිබුවේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

සියළු මූල්‍ය වත්කම්, මූලිකව පිරිවැය මත හඳුනා ගනු ලබන අතර ආයෝජනයට අදාළ අත්පත් කර ගැනීමේ වියදම්ද ඇතුළුව, ඉදිරිපත්වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මෙම මූලික හඳුනාගැනීමෙන් අනතුරුව වන මිනුම් පදනම් පහත විස්තර කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වෙළඳාම් දිනයේදී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනුලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලී සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළඳ පොලෙහි පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළදී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ හෝ මූල්‍ය වත්කම් වන්නේ ය.

#### ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති සුරැකුම්පත්

වෙළඳාම සඳහා ගැනෙන මුදල් වත්කම්, ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති වත්කම් යටතේ ඇතුළත් කර ඇත. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, ශේෂ පත්‍රයෙහි සුරැකුම්පත්වල වටිනාකම යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගතවන වාසිය / (අවාසිය) ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාළ වාසිය / (අවාසිය) උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය / (අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම

මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම් එය මිල වෙනස්වීමෙන් උපලබ්ධි වාසිය / (අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ.

**අලෙවිය සඳහා ඇති විදේශ විනිමය සුරැකුම්පත්**

වෙළඳාම සඳහා ගැනෙන විදේශ මුදල් සුරැකුම්පත් පසුව වෙළඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළඳපොළ අගයෙහි වෙනස්වීම්, ශේෂ පත්‍රයෙහි සංචිත යටතේ, විකිණීමට ඇති සුරැකුම්පත් වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

වෙළඳාම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත්වල වෙළඳපොල අගය වෙනස් වීමෙන් උද්ගතවන වාසිය හෝ අවාසිය, එම ආයෝජන විකුණන, ප්‍රතිග්‍රහණය කරන හෝ වෙනත් අයුරකින් අපහරණය කරන තෙක් හෝ එම ආයෝජනය දුබල බවට නිරීක්ෂණය කරනතෙක් ගෙවූ හිමිකරු ප්‍රාග්ධනයේ වෙනම සංරචකයක් (ශේෂපත්‍රයේ වෙනත් සංචිත ලෙස දක්වා ඇති) හඳුන්වනු ලබන අතර එවැනි අවස්ථාවක් උද්ගත වීමේ දී හිමිකරු ප්‍රාග්ධනය ලෙස මූලිකව වාර්තා කල වාසිය හෝ අවාසිය ආදායමට එකතු කරනු ලැබේ.

**රන්වලින් නම් කළ සුරැකුම්පත්**

විදේශීය ගනුදෙනු පාර්ශවකරුවන් වෙතැති රන් සුරැකුම් ආරම්භයේ දී පිරිවැය මත වාර්තා කරනු ලැබේ. රන් සුරැකුම්වල වෙළඳපොල මිලෙහි වෙනස්කම් වලින් උද්ගතවන වාසිය හෝ අවාසිය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. රන් සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේනම්, වාසිය හෝ අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණයෙන් වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ. වාසිය හෝ අවාසිය (රන් සුරැකුම් විකිණීම මගින්) උපලබ්ධි වූ අවස්ථාවන්හිදී, එය මිල වෙනස්වීම් වලින් උපලබ්ධි වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ.

**මූල්‍ය ව්‍යුත්පන්න ලියවිලි**

මූල්‍ය ව්‍යුත්පන්න ලියවිලි පිළිබඳව බැංකුවේ සම්බන්ධතාවය ප්‍රධාන වශයෙන් ඉදිරි විදේශ විනිමය කොන්ත්‍රාත් වලට අදාළ වේ. එවැනි ව්‍යුත්පන්න මූල්‍ය ලියවිලි සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. ඉදිරි විනිමය කොන්ත්‍රාත්වල සාධාරණ වටිනාකම ගණනය කරනු ලබන්නේ, ඒවා සමාන පරිණත නියමයන් සහිත කොන්ත්‍රාත්වලට අදාළව පවත්නා ඉදිරි විනිමය අනුපාතයන්ට යොමු කරමින්ය. ලාභ හෝ පාඩු තත්ත්වයේ පවතින මිල ගිවිසගත් ලියවිලි තිබේනම්, ශේෂපත්‍රයෙහි විදේශීය මුදල් වෙළඳාම හෝ විකිණීමට තිබෙන සුරැකුම්පත් ශේෂය යටතේ වාර්තා කරනු ලැබේ.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)**

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මූ.අ. සමග සිදු කෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කර ඇත.

ජා.මූ.අ. සමග වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර එම පංගුව සඳහා ජා.මූ.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මූ.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත වි.ගැ.හි. ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මූ.අ. විසින් ශේෂ පත්‍ර දිනට ප්‍රකාශයට පත් කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මූ.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගතවන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙන් හඳුනා ගනු ලැබේ.

ජා.මූ.අ. සමග වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොලිය වහාම ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**මුදල් හා මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල් සහ කෙටිකාලීන තැන්පතු මුදල් හා මුදල් සමානයන්ට අයත් වේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී.ලං.ම.බැ. ඇතැම් ආදායම් ඉපයීමද ඇතැම්වියදම් දැරීමද සිදුකරන නමුත් එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් තුල නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල දායක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, අපහරණයන් හෝ ඒ මත පොලිය හුදෙක් පොත් සටහන් වශයෙන් ශ්‍රී ලං.ම.බැ. වාර්තාවල සටහන් කරනු ලැබේ.

මූල්‍ය නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත්කරනු ලැබේ. ශ්‍රී.ලං.ම.බැ. විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයන් ඉදිරිපත් කරන මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රීලංකාමහබැංකුවවිසින්මුදල් /ගෙවීම්නියෝගක්‍රියාවලියමගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී.ලං.ම.බැ. මත නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් මත විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සමග වන ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයන්ට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අරමුණු සඳහා වන මුදල් හා මුදල් සමානයන්ට මුදල් සහ මුදල් විධානයන්ගේ ශුද්ධ ගලා යෑම් හැරුණුවිට ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් අඩංගු වේ.

**ප්‍රති මිලදී ගැනීම් සහ ප්‍රති විකුණුම් ගනුදෙනු**

ප්‍රතිමිලදීගැනීමසඳහාගිවිසුම්යටතේවිකුණනුලබනසුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ.

ප්‍රති මිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හෙළිදරව් කරනු ලැබේ. ප්‍රති මිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම්වල සහ ප්‍රති මිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර එය ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

ප්‍රති විකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම් සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කමක් ලෙස ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රති මිලදී ගැනීමේ සහ ප්‍රති විකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වූයේ නම්, එයද ප්‍රති මිලදී ගැනීමේ සහ ප්‍රති විකුණුම් ගනුදෙනු වටිනාකම සමඟ වාර්තා කරනු ලැබේ.

**ආයෝජන කළඹ - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

බැංකුවේ ආයෝජන කළඹ ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවලින් සමන්විත වේ. ඒවායින් බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට සපයන ලද ණය නියෝජනය කෙරන බැවින්, එම කළඹ ක්‍රමක්ෂය පිරිවැයට ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ.

**රජයට දෙන ලද අත්තිකාරම්**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද තාවකාලික අත්තිකාරම්වලින් රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ.

**අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

අනිකුත් ආයතනවලට දෙන ලද ණය, අයකරගත නොහැකි ප්‍රමාණයක් සඳහා වූ මුදල අඩුකර, ආරම්භයේ දී ප්‍රදානය කළ මුදල අනුව හඳුනාගෙන දක්වා ඇත. අයකර ගත යුතු සියළු මුදල් බැංකුවට අයකරගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේ නම්, ඒ සඳහා (ණය අඩාල වීම) අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසනු ලැබේ. එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය ධාරණ මුදල සහ ඇස්තමේන්තු හා අයකරගත හැකි මුදල අතර වෙනස වේ. බොල් ණය හඳුනා ගත් අවස්ථාවේදී කපා හරිනු ලැබේ.

**සුරැකුම්පත් ණයට දීම**

ණය දීමේ ගනුදෙනු යටතේ සුරැකුම්පත් ප්‍රතිපාර්ශවයන් වෙත පැවරීමේ දී ඒවායේ අයිතිය හා සම්බන්ධ අවදානම සහ වාසියද පවරන්නේ නම් පමණක් ඒවා ශේෂපත්‍රයෙහි දක්වනු ලැබේ.

**මූල්‍ය වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇතිදැයි බැංකුව විසින් ශේෂ පත්‍ර දිනයන් හිදී තක්සේරු කරනු ලැබේ.

**ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ ණයක් හෝ ලැබිය යුතු මුදලක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එම අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්මේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල පොලී අනුපාතයෙන්, වට්ටම් කළ අගයන් අතර වෙනසය. වත්කමක ධාරණ අගය සෘජුව හෝ දීමනා ගිණුමක් මගින් හෝ අඩු කරනු ලැබේ. පාඩු වූ ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත් හා තනිව හා සාමුහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකර වි ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි විමර්ශනය කරනු ලබයි. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව විමර්ශනය කල මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යයි තීරණය කළ හොත් එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර එම වත්කම් හානිකරණය සඳහා සාමුහිකව විමර්ශනය කරනු ලැබේ. තනිව හානිකරණ පාඩු සඳහා තක්සේරුකල වත්කමකට අදාළව හානිකරණ පාඩු පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේනම්, ඒවා සාමුහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ. පසු කලකදී හානිකරණ අලාභය අඩුවන්නේ නම්, එසේ අඩුවීමට හානිකරණය හඳුනාගැනීමට පසු කාලයට අදාල සිද්ධියකට අදාළ කිරීමට නිශ්චිත සාක්ෂි හානිකරණ අලාභයේ නැවත ගලපනු ලැබේ. හානිකරණ අලාභයක් පසු කලකදී නැවත ගැලපීම් කරන්නේ නම්, එදිනට එම වත්කමේ ධාරණ අගය එහි ක්‍රමක්ෂය පිරිවැය නොඉක්මවන ප්‍රමාණයක් දක්වා පමණි.

**විකිණීමට ඇති ආයෝජන**

විකිණීමට අයත් වත්කමක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම සහ ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය හා එහි වර්තමාන සාධාරණ අගය) මීට පෙර ලාභය හෝ අලාභය යටතේ හඳුනාගත් හානිකරණ අලාභයක් වේ නම් එය අඩුකර, හිමිකරු ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. විකිණීමට ඇති ලියවිලි ලෙස වර්ග කර ඇති හිමිකම් ප්‍රාග්ධන ලියවිලි නැවත ගැලපීම් ලාභය සඳහා හඳුනා ගන්නේ නැත. ණය ලියවිලි හානිකරණ අලාභ, ලියවිල්ලෙන් සාධාරණ අගයෙහි වැඩිවීම හානිකරණ පාඩුව හඳුනාගැනීමට පසුව වූ සිද්ධියකට අදාළ වන බවට නිශ්චිත සාක්ෂි තිබේනම් පමණක් එය ලාභ හෝ පාඩු හරහා නැවත ගැලපිය හැකිය.

**විදේශීය මුදල් කාලින බැරකම්**

විදේශීය මුදල් කාලින බැරකම්, බැරකම්වල, ක්‍රමක්ෂය පිරිවැයට පසුව වාර්තා කරනු ලැබේ. මෙම බැරකම්වල අගය වෙනස්වීම කාලින බැරකම්වල වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස ශේෂ පත්‍රයෙහි දක්වනු ලැබේ. විදේශීය මුදල් කාලින බැරකම්වල වෙනස්වීම් වලින් උද්ගතවන වාසි හා අවාසි වහාම ආදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. බැරකමේ අයිතිය තවදුරටත් පවතී නම් වාසිය හෝ අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ. වාසිය

හෝ අවාසිය උපලබ්ධි වූ (බැරකම ආපසු ගෙවීම මගින්) අවස්ථාවන්හිදී, එය මිල වෙනස්වීම් වලින් උපලබ්ධි වූ වාසිය / (අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ.

#### මූල්‍ය ඇපකර

මූල්‍ය වර්තා වලදී මූල්‍ය ඇපකර මූලික වශයෙන් සාධරණ අගය මත අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ හඳුනාගනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව එක් එක් ඇපකරය යටතේ බැංකුවේ වගකීම ගණනය කිරීම, ඇපකරය හේතුවෙන් උද්ගතවන මූල්‍ය බැඳීම් බේරුම් කිරීම සඳහා වන හොඳම ඇස්තමේන්තුව ප්‍රකාර සිදු කරනු ලැබේ.

#### වෙනත් මූල්‍ය වත්කම් සහ බැරකම්

මුදල්, තැන්පතු සහ කෙටිකාලීන අත්තිකාරම් වශයෙන් වූ දේශීය සහ විදේශීය මුදල් වෙළඳ දිනයේ දී හඳුනාගනු ලැබේ.

### 1.4.3 අනිකුත් වත්කම් සහ බැරකම්

#### ආශ්‍රිත සමාගම්වල ආයෝජන

ආශ්‍රිත සමාගම් වල බැංකුවේ ආයෝජන, පසුව අපහරණය සඳහා රඳවාගෙන ඇති ඒවා ද පිරිවැය ක්‍රමයට ගිණුම් ගත කරනු ලැබේ.

#### රන් තොගය

ඉතාම දුවශීලි භාණ්ඩයක් වන රන් තොගය පිරිවැය මත පවත්වාගෙන යනු ලැබේ.

#### තොග

තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනමට පිරිවැය නිශ්චය කරනු ලැබේ. සෙමින් වැයවන තොග සඳහා වෙන්කිරීමක් සලසා ඇත.

#### දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර, සමුච්චිත ක්ෂය වීම සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකල පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපල, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය, එය දරන අවස්ථාවේදී හඳුනාගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම්වල එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත. ගොඩනැගිලි සඳහා වූ ක්ෂය සහ ප්‍රත්‍යාගණන දිනයන් පසුව අඩුකළ හානිකරණ පාඩු අඩුකර ඉඩම් සහ ගොඩනැගිලි ගණනය කර ඇත.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීව කාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීව කාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි | |
| ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාලපරිච්ඡේදය තුළ |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලීබඩු සහ උපකරණ | වර්ෂ 10ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරවා ගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක යන්ත්‍ර හා උපකරණ වල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය. පළමුව පිරිවැය මත හඳුනාගැනීමෙන් අනතුරුව, ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට පවත්වාගෙන යනු ලබන අතර එය වූ කලී පසුකාලීන සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ සාධාරණ අගය වේ.

ප්‍රත්‍යාගණනය කල වත්කම්වල සාධාරණ අගය, ඒවායේ ධාරණ අගයෙන් විශාල ලෙස වෙනස්වීම මගහරවා ගැනීමට නිරතුරුව අගය කිරීම් කරනු ලැබේ.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, ශේෂපත්‍රයේ ස්කන්ධයන් යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි වියදමක් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තන කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයේ දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමඟ ගලපනු ලැබේ. වත්කමක් අපහරණයේ දී කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වේනොත් එය රඳවාගත් ඉපයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් හෝ භාවිතා කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපල පිරියත සහ උපකරණ ලෙස හඳුනාගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගතවන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලැබෙන ශුද්ධ මුදල සහ සාධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීව කාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

#### අස්පෘෂ්‍ය වත්කම්

පරිගණක දෘඩාංගවලට සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘෂ්‍ය වත්කම් වර්ෂ 4 ක ජීවකාලයක් පදනම් කළ සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ ධාරණ අගයකට පවත්වාගෙන යනු ලැබේ.

#### ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම්, නිශ්චිත සාක්ෂි මත අඩමාන ණය සඳහා වෙන් කිරීම පිළිබඳ පසුව, අපේක්ෂිත උපලබ්ධි වටිනාකම මත හඳුන්වනු ලැබේ.

**විවිධ වත්කම්**

විවිධ වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකම මත දක්වනු ලැබේ.

**මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ සිද්ධීන් හෝ වෙනත් තත්ත්වයන් හේතුවෙන් ධාරණ අගය හානි විය හැකි බව පෙන්නුම් කරන්නේ නම්, බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි සලකුණක් පවතීනම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගතහැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම්, වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ.

**ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික සම්මුතියකින්) ඇති විටකදී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූරණය කිරීම බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූරණය නිසැකවම තහවුරු වන්නාවූ අවස්ථාවලදී එය, වෙනම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

**සංසරණයේ පවතින මුදල්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කරනු ලබන මුදල්, ඒවා දරන්නනට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයක් පවතින මුදල් සඳහා වූ බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ.

**විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

බැංකුව විසින් මෙහෙයවනු ලබන විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම පහත හෙළිදරව් කර ඇත.

**නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

බැංකු විසින් විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම පවත්වාගෙන යනු ලබයි. ඉන්, වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම තුනට බැංකුව සහ සුදුසුකම්ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණක ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ. ආයුගණක අගය කිරීම් වර්ෂ තුනකට වරක් මඟින් සිදුකරනු ලැබේ.

විශ්‍රාම සේවා වියදම්, ප්‍රතිලාභ හා අත්පත් කර ගන්නා තෙක් දක්වා සාමාන්‍ය කාල සීමාව තුළ සරළ මාර්ග ක්‍රමය ප්‍රකාර වියදම් ලෙස හඳුනා ගනු ලැබේ. ප්‍රතිලාභ, හඳුන්වා අන් අවස්ථාවේම එය අත්පත් කර ගෙන තිබේනම් හෝ වෙනස් වී ඇත්නම් හෝ විශ්‍රාම සේවා වියදම එසැනින්ම හඳුනා ගනු ලැබේ.

අනුභූති ගැලපීම් සහ ආයුගණන උපකල්පනයන් වෙනස්වීම් මත උද්ගතවන ආයුගණක ලාභ සහ පාඩු, නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ සහ සැලසුමේ වත්කම්වල සාධාරණ අගය හෝ වැඩි සංඛ්‍යාව සියයට 10 ඉක්මවන අවස්ථාවලදී ආයුගණක ආදායම් හෝ වියදම් ලෙස හඳුන්වනු ලැබේ. එකී ලාභ හෝ අලාභ, මෙම යෝජනා ක්‍රම සඳහා සහභාගිවන සේවකයන්ගේ අපේක්ෂිත ඉදිරි වැඩ කරන කාලය මත, ආයුගණක ලාභ හා අලාභ ක්ෂණිකව හඳුනාගැනීමට පහසුවන ලෙස විධිමත් ක්‍රමයක් ප්‍රකාර සටහන් කරනු ලැබේ.

**නිශ්චිත දයක යෝජනාක්‍රම**

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවා අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකම් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවානියුක්තියන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදල් නිශ්චිත දායක සැලසුම් ලෙස වෙනමම පරිපාලනය කරනු ලැබේ.

**ප්‍රදනයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයක් වියදම් විෂයකට අදාළ වන අවස්ථාවකදී වියදමට සරිලන කාලපරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදයම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමකට අදාලවන අවස්ථාවකදී එහි සාධාරණ අගය රජයේ විලම්බිත ප්‍රදාන ගිණුමකට බැර කර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය තුල ආදායම් ප්‍රකාශනයකට මුදා හරිනු ලැබේ.

**සේවක මණ්ඩල විදයම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම් අනිකුත් දේශීය ගෙවිය යුතු ගිණුම් යටතේ දක්වනු ලැබේ.

**ක්‍රියාත්මක කල් බදු**

බැංකුව කල් බදු ගැණුම්කරු වන අවස්ථාවන්හිදි කල්බදු ගත් වත්කම් වලින් අපේක්ෂිත ප්‍රතිලාභ පදනම් කරගෙන, ක්‍රියාත්මක කල්බදු සඳහා ගෙවිය යුතු කුලිය එය බලපවත්නා කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**ආදායම් බදු**

1949 අංක 58 දරණ මූල්‍ය නීති පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ආදායම ආදායම් බද්දෙන් නිදහස් වේ.

**ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිඵල ගලා ඒමේ හැකියාව සහ ආදායම නිසැකවම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම් ගත කරනු ලැබේ. දරණ ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් සහ වියදම් හැඳින්වීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීමේ උපමානයන්ද සපුරාලිය යුතුය.

**පොලිය**

පොලිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම් මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව සඵල ඵලදායිත්ව ක්‍රමයට උපචිත පදනම මත පොලි ආදායම සහ වියදම ආදායම ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම්, ආයෝජන සහ සුරැකුම්පත් මත උපයන කුපන් සහ භාණ්ඩාගාර බිල්පත් සහ අනිකුත් වට්ටම් ලියවිලි මත උපචිත වට්ටම් සහ අධිමිල පොලී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවලදී පොලි ආදායම අත්හිටුවන අතර ඒවා ලැබෙනතුරු පොලී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස් හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනා ගනු ලැබේ.

**විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ අපහරණයේ දී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම් අපහරණයෙන් ලද වියදම අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම් ගත කර ඇත.

ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකාරම්වලට ආනුශාංගික ක්‍රියාකාරකම් වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතු කොට ශුද්ධ පදනම මත වර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**ශේෂ පත්‍රයෙන් බාහිර විෂයයන් ඇතුළු අසම්භාව්‍යයන් සහ බැඳීම්**

ශේෂ පත්‍රයේ බාහිර විෂයයන් නියෝජනය කෙරෙන ණයගැතිකම් සහතික වීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල ශේෂ පත්‍රයෙන් බාහිර විෂයයන් ලෙස හඳුනාගෙන, අදාළ ශීර්ෂ යටතේ දක්වා ඇත.

## 1.5 ක්‍රියාකාරම්වල ස්වභාවය සහ විෂය පථය

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් හා කාර්යයන් පැවරෙන අතර, බැංකුවේ කළමනාකාරිත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- මුදල් නිකුත් කිරීම
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරඟ කාර්යයන් සහ ස්ථායිතාවය සැලසීම
- නිශ්චිත මූල්‍ය ආයතන වලට අවසර දීම සහ අධීක්ෂණය
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය හා කළමනාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකු වලට සහ මූල්‍ය ආයතනවලට ණය සහ අත්තිකාරම් සැපයීම
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියාකරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධිවිධාන යටතේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියාකිරීම

ශ්‍රී ලංකාවේ ඵලදායි සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සපුරාගැනීම සඳහා පවත්වාගෙන යන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ විදේශීය මුදල් ක්‍රියාකාරකම් පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශයනට අදාළව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

**විදේශීය මුදල් ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම් වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ,විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වලින් පවත්වනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් එක්සත් ජනපද ඩොලර්, යූරෝ, රන්පවුම්, සහ ජපන් යෙන් වලින් හඳුන්වා ඇත. මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් සෙවරී සුරැකුම්පත් ප්‍රතිවර්තිත ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනු යටතේ දරනු ලබන

සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන වෙත වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළඳපොලේ මෙහෙයුම් වලින් උද්ගත වන්නාවූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

**දේශීය මුදල් ක්‍රියාකාරකම්**

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(අ) ද්‍රවශීලතා කළමනාකරන මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළඳපලට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික විවෘත වෙළඳපල මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ආ) සංසරණයෙහි පවතින මුදල් නියෝජනය කෙරෙන බැරකම් ආධාරකව ශ්‍රී ලංකා රජයේ සුරැකුම් පත්‍රවලින් සමන්විත ආයෝජන කළඹක් පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

**භාර සහ භාරකාර ක්‍රියාකාරකම්**

භාරකාර සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන මුදල්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්ගේ අන්තර්ගත කොටසක් නොවන බැවින් ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර නොමැත.

## 2. බැංකු අධීක්ෂණ

බැංකු පද්ධතියේ මනා සහ යහපත් පැවැත්ම හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ශක්තිමත් කිරීම යනාදිය අරමුණු කරගෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී බැංකු නියාමනය හා අධීක්ෂණ කාර්ය ඉටුකරනු ලබන්නේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගිනි. 2007 වර්ෂය අවසාන වන විට බලපත්‍රලාභී බැංකු 38 ක් එනම්, බලපත්‍රලාභී වාණිජ බැංකු 23 ක් හා බලපත්‍රලාභී විශේෂිත බැංකු 15 ක්, මහ බැංකුවේ නියාමනය හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. මෙම බැංකුවල ලැයිස්තුවක් ඇමුණුම I හි දක්වා ඇත.

නියාමන හා අධීක්ෂණ අවශ්‍යතාවයන් බලගැන්වීම, නව නියාමන හා අධීක්ෂණ ක්‍රියාමාර්ග හඳුන්වාදීම, නියාමන අනුමැතීන් ලබාදීම හා බැංකු අඛණ්ඩව අධීක්ෂණය කිරීම හා පරීක්ෂාකිරීම තුළින් අවදානම් පාදක අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම යනාදිය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යයන් වලට ඇතුළත් වේ. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2007 වසර තුළදී කරනු ලැබූ ප්‍රධාන කාර්යයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

### 2.1 විචක්ෂණශීලී නියාමනය

2007 වර්ෂයේදී, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නව විචක්ෂණ නියාමනයන් හා මාර්ගෝපදේශ රැසක්ම නිකුත් කරන ලද අතර, පවතින විචක්ෂණ අවශ්‍යතාවයන් සඳහා සංශෝධනයන් සිදුකරන ලදී. මෙම වාර්තාවේ III කොටස මගින් මේ පිළිබඳ වැඩිදුර විස්තර දක්වා ඇති අතර, එහි සාරාංශයක් පහත දැක්වේ.

**(අ) බැංකුවල කොටස් හිමිකාරිත්වය පිළිබඳ සීමාවන් :**

යහපත් ආයතනික යහපාලනයක් ඇති කිරීමත්, විශාල කොටස් හිමිකාරිත්වය නිසා ඇතිවිය හැකි අහිමතාර්ථ අතර ගැටුම්වලට මුහුණදීමත් අරමුණු කරගනිමින්, ඡන්ද හිමි කොටස් වලට අදාළ කොටස් හිමිකාරිත්ව සීමා පිළිබඳ නව ක්‍රමයක් හඳුන්වාදෙන ලදී.

මේ අනුව, ඡන්ද හිමි නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් තබා ගත හැකි උපරිම හිමිකාරිත්ව සීමාව නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 15 ක් වේ. නමුත්, සියයට 10 ට වැඩි කොටස් ප්‍රමාණයක් අත්පත් කර ගැනීම සඳහා මුදල් මණ්ඩලයේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගත යුතු වේ.

ප්‍රාග්ධන ඌණතාවය, බුන්වත්භාවය හෝ අකර්මණ්‍යවීම හෝ වළක්වා ගැනීම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වන බැංකුවල සියයට 15 කට වඩා වැඩි කොටස් ප්‍රාග්ධනයක් අත්පත් කරගැනීම සඳහා මුදල් මණ්ඩලයට, කොන්දේසි වලට යටත්ව, අවසර දීමට හැකිවේ.

**(ආ) උපරිම ණය පහසුකම් ප්‍රමාණය:**

බැංකුවල ණය සංකේන්ද්‍රණය වීමේ අවදානම සමනය කිරීමේ අරමුණින් උපරිම ණය පහසුකම් ප්‍රමාණය තීරණය කිරීමේ නිර්ණායකයන් සංශෝධනය කරන ලදී. පුද්ගලයකුට සහ සමාගම් සමූහයකට ලබාදිය හැකි උපරිම ණය පහසුකම් ප්‍රමාණය ප්‍රාග්ධන පදනමින් පිළිවෙලින් සියයට 30 හා 33 වේ. බැංකුවල හා සමාගම්වල අවදානම් කළමනාකරණයේ මට්ටම, බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය හා ණයගැතියාගේ හා බැංකුවේ බාහිර ණය වර්ගීකරණය යනාදී සාධක පදනම් කරගනිමින් පාදක ප්‍රාග්ධනයෙන් සියයට 36 ත් 40 ත් අතර ඉහළ සීමාවන් බලපැවැත්වේ.

**(ඇ) නියාමන ප්‍රාග්ධනයට නව ප්‍රාග්ධන උපකරණ ඇතුළත් කිරීම:**

ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය ගණනය කිරීමේදී සළකා බලනු ලබන ප්‍රාග්ධන උපකරණ පුළුල් කරමින්, යම් යම් කොන්දේසි සපුරන නිත්‍ය ණය ප්‍රාග්ධන උපකරණ මූලික ප්‍රාග්ධනයේ කොටසක් ලෙස ඇතුළත් කිරීමට බැංකුවලට අවසර ලබා දෙන ලදී.

**(ඈ) ආයතනික යහපාලනය පිළිබඳ විධානයන් නිකුත් කිරීම:**

2008 ජනවාරි 1 දා සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී බැංකුවලට ආයතනික යහපාලනය පිළිබඳ මූලධර්ම පාදක කරගනිමින් සකස්කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ විධානයන් නිකුත්කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ පුළුල් වගකීම්, මණ්ඩලයේ සංයුතිය, අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය හා උචිතභාවය ඇගැයීමේ නිර්ණායක, මණ්ඩලය

විසින් බලය පවරා ඇති කළමනාකරණ කාර්යයන්, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි අතර කාර්යයන් පැහැදිලිව බෙදාහැරීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද කමිටු හා මූල්‍ය වාර්තා හෙළිදරව් කිරීම් යනාදිය මෙම විධානයන්ගෙන් ආවරණය වන ප්‍රධාන අංග වේ. නව ප්‍රමිතීන්ට සංක්‍රමණය වීම පහසුකිරීම සඳහා මෙම රීතීන්වල මූලික අංග කිහිපයක් සඳහා සංක්‍රාමික ප්‍රතිපාදන කිහිපයක්ම හඳුන්වා දී ඇත. මෙම විධානයන්ගේ අරමුණවන්නේ සමස්තයක් වශයෙන් බැංකුවල මනා පැවැත්ම පවත්වාගැනීම සඳහා බැංකුවල ව්‍යාපාරික කටයුතු සහ ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් වර්ධනය කිරීමේ වැඩි වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරීමයි.

**(ඉ) බාසල් II ක්‍රියාත්මක කිරීම:**

2008 ජනවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි බාසල් II ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවලට විධානයන් නිකුත් කරන ලදී. මේ අනුව බැංකු විසින් ප්‍රාග්ධන අනුපාතය ගණනය කිරීමේදී ණය අවදානම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශයද, වෙළෙඳපොළ අවදානම සඳහා ප්‍රමිතිගත මිණුම් ප්‍රවේශයද, මෙහෙයුම් අවදානම සඳහා මූලික දර්ශක ප්‍රවේශයද භාවිතා කළ යුතු වේ. බැංකුවල මූලික අවදානම් සමඟ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ තක්සේරු කිරීම යා කිරීම මගින් බැංකු පද්ධතියේ මනා හා යහපත් පැවැත්ම වර්ධනය කිරීම මෙම නව රාමුවෙන් අදහස් කෙරේ. තවද, බැංකු ආයතන සඳහා අවදානම් තක්සේරු කිරීම වර්ධනය කිරීම සඳහා ඉහළ දිරිගැන්වීමක් ලබාදීමද, බැංකු පිළිබඳ සැලකිල්ලක් දක්වන අනෙකුත් පාර්ශ්වයන්ට වැඩි වගකීමක් දීම සඳහා වෙළෙඳපොළ යාන්ත්‍රණය අනුපූරකයක් ලෙස යොදාගැනීමද එමගින් අදහස් කෙරේ.

**(ඊ) ගනුදෙනුකරු පිළිබඳ නිසි විමසිලිමත්භාවය සහ ගනුදෙනුකරු හඳුනාගැනීමේ ක්‍රියා පටිපාටි :**

සියලුම බැංකුවලට විදේශ මූල්‍ය ගනුදෙනුවල නිරතවන ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් නිසි විමසිලිමත් භාවයකින් කටයුතු කරන ලෙසත්, අදාළ අණපනත් වලට අනුකූලව සැක කටයුතු ගනුදෙනු පිළිබඳ තොරතුරු අදාළ බලධාරීන්ට දන්වා සිටින ලෙසත් ඉල්ලා සිටින ලදී.

**(එ) බැංකුවල විදේශීය කාර්ය මණ්ඩලය සේවයේ යොදවා ගැනීමේ මාර්ගෝපදේශ:**

බැංකු ක්ෂේත්‍රය සඳහා විදේශිකයන්ගේ සේවය ලබාගැනීම පිළිබඳව මාර්ගෝපදේශ නිකුත්කරන ලදී. විදේශීය බැංකුවල බැංකු කටයුතු සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීම, නව මූල්‍ය සේවාවන් හඳුන්වාදීමේ අවශ්‍යතාවය, දියුණු අවදානම් කළමනාකරණ පරිචයන් වැනි අංශ පිළිබඳ විශේෂඥතාවය අවශ්‍යවීම හා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල ශීඝ්‍ර වර්ධනය යනාදිය හේතුවෙන් මෙම ප්‍රතිපත්ති වෙනස්කිරීම අවශ්‍ය විය.

## 2.2 බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක සඳහා අනුමැතිය ලබාදීම :

2007 වර්ෂය තුළ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකු පනතට අනුව බැංකු බලපත්‍ර, බැංකු ශාඛා හා අනෙකුත් ඒකකයන් විවෘත කිරීම, වසා දැමීම හා ප්‍රතිස්ථානගත කිරීම සඳහා වූ ඉල්ලීම් පිළිබඳව කටයුතු කරන ලදී. සී/ස ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවට හා සී/ස එස්.එම්.ඊ බැංකුවට ඒකාබද්ධ වීමට අවසර ලබාදෙන ලදී. මෙම වර්ෂය තුළදී නව ශාඛා 72 කට සහ බැංකු ඒකක (ව්‍යාප්ති කාර්යාල, ජංගම බැංකු ඒකක හා ශිෂ්‍ය ඉතුරුම් ඒකක) 151 කට, ශාඛා ප්‍රතිස්ථානගත කිරීම් 37 කට සහ බැංකු ඒකක ප්‍රතිස්ථාපනගත කිරීම් 02 කට, ශාඛා වැඩිදියුණු කිරීම් 14 කට හා ශාඛා වලින් පිටත පිහිටුවන්නා වූ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 14 කට අනුමැතිය ලබාදී තිබේ. ඒ අනුව ශාඛා 1616, අනෙකුත් බැංකු ඒකක 2137 ක් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 1141 ක් 2007 වර්ෂයේ අවසානය වන විට ක්‍රියාත්මක වෙමින් පැවැතිණි.

තවද, බැංකු හා මූල්‍ය සේවාවන්ට ලබාගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල්කිරීම සඳහාද අවසර ලබාදෙන ලදී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සංවර්ධනයන් පාදක කරගනිමින්, තාක්ෂණය මත රැඳි ජංගම බැංකුකරණය වැනි සේවාවන් වෙළෙඳපොළට හඳුන්වාදීම සඳහා අවසර ලබා දෙන ලදී.

## 2.3 බලපත්‍රලාභී බැංකු අඛණ්ඩව අධීක්ෂණය කිරීම

බැංකු අඛණ්ඩව අධීක්ෂණය කිරීම යන්නෙන් අදහස් වනුයේ අන්තර්ජාල පාදක වාර්තා ක්‍රමය මගින් බැංකු විසින් කාලීනව ඉදිරිපත්කරන ලද තොරතුරු විශ්ලේෂණය කිරීම මගින් එම බැංකුවල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම වේ. තවදුරටත් විමර්ශණය හා පරීක්ෂාව අවශ්‍යවන බැංකුවල මූල්‍ය තත්ත්වයේ වැදගත් සහ තීරණාත්මක වෙනස්වීම් හඳුනාගැනීම සඳහා උපකාරී වන පූර්ව අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාවලියක් ලෙස අඛණ්ඩව අධීක්ෂණය කිරීම ක්‍රියාකරයි. මීට අමතරව, ණය කාඩ්පත් කටයුතු, අදාළ බැංකුවල හිමිකාරිත්ව සංයුතිය විශ්ලේෂණය කිරීම, අක්‍රීය ණය සඳහා වූ ප්‍රතිපාදන ඇගැයීම, අත්හරින ලද දේපළ සඳහා දත්ත පද්ධතියක් ගොඩනැංවීම සහ බාසල් II හි බලපෑම පිළිබඳ ඇගැයීමක් කිරීම යනාදී කටයුතු ද විමර්ශනයට භාජනය වන වසර තුළ සිදු කරන ලදී.

## 2.4 බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ

මූල්‍ය නීති පනතේ හා බැංකු පනතේ ප්‍රතිපාදනයන්ට අනුව සියලුම බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත බැංකු අවම වශයෙන් වර්ෂ දෙකකට වරක්වත් ව්‍යවස්ථාපිත පරීක්ෂණයන්ට යටත් වේ. බැංකුවල අවදානම් හඳුනාගැනීම, අවදානම් කළමනාකරණය සහ අවදානම් සමනය කරගැනීමට ඇති සම්පත්වල ප්‍රමාණවත් බව ඇගයීම ඉලක්ක කරගත් අවදානම මත පදනම් වූ පරීක්ෂණ ක්‍රමය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය.

වර්ෂය තුළදී අවදානම කෙරෙහි වැඩි නැඹුරුවීමක් ඇති පරීක්ෂණ ක්‍රියාවලියක් හඳුන්වාදෙන ලදී.

මෙම අලුත් ක්‍රියාවලිය පහත අංශ පිළිබඳ ඉතා ඉහළ බර තැබීමක් සිදුකරයි.

(අ) අවදානම් සංයුතිය සහ අවදානම් කළමනාකරණයේ ශක්තීන් හා දුර්වලතාවයන් හඳුනාගැනීම.

(ආ) පද්ධති හා පාලන ක්‍රමවල ප්‍රමාණාත්මකභාවය ඇගැයීම සහ

(ඇ) බැංකුවල හා බැංකු සමූහවල මූල්‍ය ක්‍රියාකාරිත්වය ඇගයීම.

මූල්‍ය පද්ධතියේ සමස්ත ස්ථායීතාවයට අනතුරු කළ හැකි බැංකු ක්ෂේත්‍රයේ මතුවන හානිකර තත්ත්වයන් හඳුනාගැනීමත් ඒවා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මෙම ක්‍රියාවලියේ සමස්ත අරමුණ වේ. 2007 වර්ෂයේදී එම වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ 13 ක් සහ 2006 වර්ෂයේ ආරම්භ කරන ලද පරීක්ෂණ 15 ක් ඇතුළුව ව්‍යවස්ථාපිත පරීක්ෂණ 28 ක් සිදුකරන ලදී. බැංකු 21 ක පරීක්ෂණ එම බැංකුවල කළමනාකාරිත්වය සමඟ පැවැත්වූ විධිමත් රැස්වීම් සහ මූල්‍ය මණ්ඩලයට වාර්තා පිළිගැන්වීමෙන් පසු සම්පූර්ණ කරන ලදී. පරීක්ෂණ 7 ක් සම්පූර්ණ කිරීමට නියමිතව පැවැතිණි. ආයතනික යහපාලනය පිළිබඳ අඩුපාඩු, පද්ධති හා පාලන ක්‍රම ප්‍රමාණවත් නොවීම, සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනුවලට විවෘත වීම්, අක්‍රීය ණය හා අක්‍රීය ණයවලට ප්‍රතිපාදන අඩුවෙන් ඇස්තමේන්තු කිරීම, ණය ගිණුම් හා වියහැකි ණය අවදානම් දුර්වල ලෙස පරිපාලනය කිරීම, නිරන්තරයෙන් නියාමන බලධාරීන්ට කාලීන වාර්තා සැපයීමේ ප්‍රමාද දෝෂයන් මේ කාලය තුළ සිදුවූ පරීක්ෂණවලදී අවධානයට ලක් වූ දුර්වලතාවයක් විය.

## 2.5 තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳ පරීක්ෂණයන් පැවැත්වීම

බැංකු පනතේ 83 (ඇ) වගන්තියට අනුව තහනම් වූ යෝජනා ක්‍රම පිළිබඳ පරීක්ෂා කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. මෙවැනි යෝජනා ක්‍රමවල ප්‍රවර්ධකයින් ලෙස කටයුතු කළ බවට සැක කළ පාර්ශ්වයන්ට විරුද්ධව ගොනුකළ නඩු 3 ක් සම්බන්ධයෙන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කළ අතර, විමර්ශණ කටයුතු කරගෙන යාමට අවශ්‍ය තාක්ෂණ සහයෝගය ලබාදීම මගින් පොලිසියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට පහසුකම් සැපයීමද සිදුකරන ලදී.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නීති විරෝධී හා වංචාකාරී පිරමීඩ ආකාරයේ හා බහුතර ආකාරයේ අලෙවිකරණ යෝජනා ක්‍රමවලට සම්බන්ධවීමේ අනතුරුදායක බව පිළිබඳ මහජනයා දැනුවත් කිරීම සඳහා වැඩසටහන් අඛණ්ඩව කරගෙන ගිය අතර, රටේ විවිධ ප්‍රදේශ වල ක්‍රියාත්මක වන එවැනි තහනම් යෝජනා ක්‍රම පිළිබඳව දෙපාර්තමේන්තුවට දැනුම්දීම සඳහා මහජනතාවගේ සහයෝගය ඉල්ලා සිටින ලදී.

## 2.6 අකර්මන්‍ය වූ සීමාසහිත පුමුබ ඉතිරිකිරීමේ සහ සංවර්ධන බැංකුව පිළිබඳ විසඳුම් ක්‍රියාමාර්ග

දෙපාර්තමේන්තුව විසින් සී/ස ශ්‍රී ලංකා සේවින්ස් බැංකුවට 2002 අගෝස්තු මසදී ව්‍යාපාරික කටයුතු අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස කළමනාකාරිත්ව කටයුතු බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත පැවරුණු ලැබූ සී/ස පුමුබ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ ව්‍යාපාරික කටයුතු පවරා ගැනීම සඳහා අවශ්‍ය වන මග පෙන්වීම සහ සහයෝගය ලබාදෙන ලදී. සංශෝධිත 1988 අංක 30 දරණ බැංකු පනතේ 76 (එම්) (3) වගන්තියට අනුව 2007 අගෝස්තු 1 දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය මණ්ඩලය විසින් සී/ස පුමුබ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ ව්‍යාපාරික කටයුතු සී/ස ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවට පවරන ලදී. ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ කැමැත්ත ඇතිව සකස් කරන ලද හා මූල්‍ය මණ්ඩලය විසින් 2007 නොවැම්බර් 5 දින අනුමත කරන ලද පුමුබ බැංකුවේ තැන්පත්කරුවන්ගේ සහ ණයකරුවන්ගේ හිමිකම සහ වගකීම් සපුරාලීම සඳහා වූ යෝජනා ක්‍රමය 2007 දෙසැම්බර් 3 දින පුවත්පත්වල පළ කරන ලදී.

අලුතින් ආරම්භකරන ලද බැංකුවට 2008 වර්ෂයේදී ව්‍යාපාරික කටයුතු ආරම්භ කරන ලෙස ඉල්ලා තිබේ.

## 2.7 ස්වේච්ඡා තැන්පතු රක්ෂණ ක්‍රමය පරිපාලනය කිරීම

1987 වර්ෂයේදී ආරම්භ කරන ලද ස්වේච්ඡා තැන්පතු රක්ෂණ ක්‍රමය පරිපාලනය කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. මෙම ක්‍රමය මහ බැංකුවේ ලියාපදිංචි බලපත්‍රලාභී බැංකු ආයතනවලට හා 1972 අංක 5 දරණ සමුපකාර සමිති නීතිය යටතේ තැන්පත් භාරගැනීම සඳහා ලියාපදිංචි සමුපකාර සමිති සඳහා විවෘතය. 2007 දී එක් විවිධ සේවා සමුපකාර සමිතියක් එහි ග්‍රාමීය බැංකුවල තැන්පත් වගකීම සඳහා මෙම ක්‍රමය යටතේ රක්ෂණ ආවරණය ලබාගෙන ඇත. රක්ෂණ වාරික මුදල් ලැබීම හා 1997 දී ශ්‍රී ලංකා මහ බැංකුව ලබාදුන් රුපියල් දශ ලක්ෂ 50 ද ඇතුලත් වූ මුළු තැන්පත් රක්ෂණ මුදල 2007 දෙසැම්බර් 31 වන දිනට රුපියල් දශ ලක්ෂ 223 ක් විය. මෙම අරමුදල් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත.

## 2.8 පොදු බැංකු සංසදය

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මූල්‍ය අංශයේ වත්මන් ගැටළු විවාදයට හා සාකච්ඡාවට භාජනය කිරීම සඳහා ඇතිකරන ලද ආයතනික වැඩපිළිවෙළවල් සඳහා දායකත්වය තවදුරටත් සපයන ලදී. මෙය පහත සඳහන් දේවලින් සමන්විත වේ.

### (අ) බැංකු වල ප්‍රධාන විධායක නිලධාරීන් සමග රැස්වීම් :

බැංකු කටයුතු හා සම්බන්ධ ගැටළු හා ප්‍රතිපත්ති පිළිබඳ අදහස් හුවමාරු කරගැනීමේ සංසදයක් ලෙස මෙය ක්‍රියාත්මක වේ. බැංකුවල අදහස් ලබාගැනීමේ අරමුණින් සියලු ප්‍රධාන ප්‍රතිපත්තිමය හා මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමට පෙර ඒ හා අදාළ ගැටලු මෙම රැස්වීම් වලදී සාකච්ඡාවට භාජනය කරනු ලැබේ. උපරිම ණය පහසුකම් ප්‍රමාණය පිළිබඳ නියාමනයන්, බාසල් II ක්‍රියාත්මක කිරීම, ආයතනික යහපාලනය පිළිබඳ නියාමනයන් හඳුන්වාදීම, අලුත් ප්‍රාග්ධන උපකරණ හඳුන්වාදීම හා ණය, අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කිරීම සහ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමට අදාළ ගැටළු යනාදිය සාකච්ඡාවට බඳුන් වූ ප්‍රධාන ප්‍රතිපත්තිමය හා මෙහෙයුම් ගැටළු වේ. රටේ ආර්ථිකමය හා මූල්‍යමය සංවර්ධනයන් පිළිබඳ සිදුකරන ලද නිරන්තර දැනුවත් කිරීම්වලට අමතරව 2007 පැවැති රැස්වීම්වලදී ද බැංකු ක්ෂේත්‍රයේ සංවර්ධනයන් පිළිබඳ දැනුවත් කිරීම් හඳුන්වා දෙන ලදී.

තවද, ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළේ සංවර්ධනයන් පිළිබඳවද ප්‍රධාන විධායක නිලධාරීන් දැනුවත් කරන ලදී.

**(ආ) අන්තර් නියාමන ආයතනික සභාව:**

2007 වර්ෂයේ ජනවාරි මාසයේදී පත්කරන ලද අන්තර් නියාමන ආයතනික සභාව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගේ සභාපතිත්වය සහිත වූ ඉහළ තලයේ කමිටුවකි.

එය ජාතික ගෙවීම් සමුළුව, ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිති පරීක්ෂා කිරීමේ මණ්ඩලය, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, කොළඹ කොටස් හුවමාරුව, සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යනාදී ආයතනවල ප්‍රධානීන්ගෙන් සමන්විත වේ.

මෙම කමිටුව පිහිටුවන ලද්දේ පුළුල් මූල්‍ය පද්ධති ස්ථායීතාවයන් ඇතිකිරීම සඳහා මූල්‍ය වෙළෙඳපොළ වල්වල ක්‍රමවත් සංවර්ධනයක් ඇතිකිරීමට යෝග්‍යවන්නා වූ ප්‍රතිපත්තිමය මග පෙන්වීම් ඇතිකිරීමත්, සියලුම නියාමන ආයතන අතර සහයෝගිතාවය සහ තොරතුරු හුවමාරුකරගැනීම සහතික කිරීමත් සඳහාය.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම කමිටුව සඳහා ලේකම් සහාය ලබාදෙන ලදී. 2007 වර්ෂයේදී කමිටුවේ රැස්වීම් 7 ක් පැවැත්වූ අතර, නියාමකයින් අතර තොරතුරු හුවමාරු කරගැනීම, මූල්‍ය ආයතනවල ආයතනික යහපාලනය වර්ධනය කිරීම, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් 32, 39 සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිත 7 ක්‍රියාත්මක කිරීම, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීම, ප්‍රාග්ධන වෙළෙඳපොළේ සංවර්ධනයන්, විනිවිදභාවය හා වගකීම ඉහළ නැංවීම සඳහා සමාගම් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීම් ලබාගැනීම සඳහා යොමුකිරීම හා සුරැකුම්කරණ පනතක් හඳුන්වාදීම යනාදිය කමිටුවේ කටයුතුවල අවධානයට භාජනය වූ විෂයයන් විය.

**(ඇ) මූල්‍ය සමූහායතන සඳහා වූ නියාමකයින්ගේ ක්‍රියාකාරී කමිටුව:**

2005 වර්ෂයේදී පත්කරන ලද මෙම කමිටුව වර්ෂය තුළදී රැස්වීම් 3 ක් පවත්වන ලද අතර, එම රැස්වීම් වලදී තොරතුරු හුවමාරු කරගැනීමේ ගැටළු, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය සහ බාසල් II ක්‍රියාත්මක කිරීම ඇතුළු වෙනත් ගැටළු සාකච්ඡා කරන ලදී. අන්තර් නියාමන ආයතනික සභාව පිහිටුවීමත් සමඟ මෙම කමිටුවේ විෂය පථය සංශෝධනය කරන ලදී.

මේ අනුව, මෙම ක්‍රියාකාරී කමිටුවේ අරමුණු වන්නේ මූල්‍ය සමූහායතනවලින් ඇතිවන්නාවූ පද්ධතිමය අවදානම් ඇගැයීම, ඒකාබද්ධිත ආකාරයකින් එම ආයතන නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා යෝජනා නිර්දේශ කිරීම සහ මූල්‍ය සමූහායතන නියාමනය හා අධීක්ෂණය කිරීමට අදාළව පවත්නා නීති රාමුව තුළ සීමාවක් තිබේ නම් ඒවා සඳහා අවශ්‍ය නීති සංශෝධනයන් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම යනාදියයි. තවද තොරතුරු අවශ්‍යතාවයන් හා නියාමකයින් අතර තොරතුරු හුවමාරු කරගැනීමේ බාධක පිළිබඳව සමීක්ෂණයක් සිදුකරන ලදී.

## 2.9 බාසල් II ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් වීම

2008 වර්ෂයේදී බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණතා රාමුව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2007 වර්ෂයේදී පියවර කිහිපයක්ම ගනු ලැබීය. රාමුවේ ප්‍රධාන අංශ සඳහා මාර්ගෝපදේශ ලබාදෙමින් 2007 ජූනි මාසයේදී බැංකුවලට උපදේශන පත්‍රයක් නිකුත් කරන ලදී. මෙම නව මාර්ගෝපදේශ මගින්, 2006 දී ප්‍රාග්ධන ප්‍රමාණතාවය සමාන්තරව ගණනය කිරීම සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශයන් අහෝසි විය. නව මාර්ගෝපදේශයන්ට අනුව ප්‍රාග්ධන ප්‍රමාණවත්තාවය සමාන්තරව ගණනය කිරීමේ ප්‍රතිඵල පාදක කරගනිමින් බැංකුවල ප්‍රාග්ධනයට බාසල් II හි බලපෑම 2007 ජූනි මාසයේ සිට නිරීක්ෂණය කිරීම සිදුකරන ලදී. සියලුම පාර්ශ්වයන්ගෙන් උපදේශන පත්‍රය සම්බන්ධයෙන් ලැබුණු ප්‍රතිචාර ඇතුළත් කරමින් බාසල් II පිළිබඳ විධානයන් 2007 දෙසැම්බර් මාසයේදී නිකුත් කරන ලදී.

මහ බැංකුව, බැංකු යන විගණන ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විතව 2005 වර්ෂයේදී පත්කරන ලද කමිටුව විසින් අර්ථ නිරූපනයන් සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ ප්‍රතිපත්ති තවදුරටත් වර්ධනය කිරීමේ කටයුතුවල අඛණ්ඩව නිරත විය.

තවද,නව නියාමන රාමුවට සංක්‍රමණය වීමට බැංකු සූදානම් කිරීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ඒවායේ නිපුණතාවයන් හා හැකියාවන් දියුණු කිරීමේ කටයුතු වලද අඛණ්ඩව නිරත විය. මේ අනුව, බැංකුවල නිලධාරීන් සඳහා දේශීය පුහුණු වැඩසටහන් කිහිපයක් සහ ජාත්‍යන්තර සමුළුවක්ද පවත්වන ලදී.

## 2.10 මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන්

ශ්‍රී ලංකා මහ බැංකුවේ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනේ කොටසක් වශයෙන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මූල්‍ය පද්ධතිය පිළිබඳ සහ මූල්‍ය ආයතන සමඟ සිදුකරන ගනුදෙනු සම්බන්ධයෙන් ඇති අවදානම් හා ඉපයීම් පිළිබඳ ප්‍රවේශම්කාරී වීමේ අවශ්‍යතාවය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් තොරතුරු බෙදාහැරීම තවදුරටත් සිදුකරන ලදී. මෙහිදී තහනම් යොජනා ක්‍රම වල අනතුරුදායක බව පිළිබඳව වැඩි අවධානයක් යොමුකරන ලදී.

පිරමීඩ ක්‍රම වැනි වංචාකාරී ක්‍රම සහ එවැනි තහනම් කරන ලද යෝජනා ක්‍රම සම්බන්ධවීමේ අවදානම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන් වලින් නිරන්තරයෙන් දැන්වීම් පළකිරීම සිදුකරන ලදී. මේ අනුව 2007 වර්ෂයේදී "ඔබ මුදල් තැන්පත් කොට ඇත්තේ තැන්පතු භාරගැනීමට අවසර ලත් ආයතනවලද? පහසුවෙන් මුදල් ඉපයීමට මාර්ගයක් ලෙස යෝජනා කරන පිරමීඩ ක්‍රම ප්‍රතික්ෂේප කර අමාරුවෙන් උපයාගත් අපගේ මුදල් ආරක්ෂා කරගනිමු" සහ "ඔබ විසින් මුදල් ආයෝජනය කර ඇත්තේ නීත්‍යානුකූල ආයෝජන ක්‍රමවල හෝ ආයතනවලද? ඔබගේ ආයෝජනයන්හි ඇති අවදානම හා ප්‍රතිලාභය පිළිබඳව ඔබ විසින් ඇගැයීමක් කර තිබේද?" යන මාතෘකාවලින් යුතුව

මාධ්‍යයන් තුනෙන්ම දැන්වීම් තුනක් ජාතික පුවත්පත්වල පළකරන ලදී.

තහනම් කරන ලද යෝජනා ක්‍රම වල ආයෝජනය කිරීමේ අනතුරු පිලිබඳ තොරතුරු ඇතුළත් පත්‍රිකාවක් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සකස්කර වාණිජ බැංකු මාර්ගයෙන් ඔවුන්ගේ ගනුදෙනුකරුවන් අතර බෙදාහරින ලදී.

තවද තහනම් කරන ලද යෝජනා ක්‍රම පිලිබඳ ග්‍රාම සේවා නිලධාරීන් මාර්ගයෙන් මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් එවැනි තහනම් යෝජනා ක්‍රම පිළිබඳව ග්‍රාමසේවා නිලධාරීන් දැනුවත් කිරීමටත්, ඒවා පිළිබඳව අත්පත්‍රිකා රටේ සියලුම පළාත්වල ග්‍රාමසේවා නිලධාරීන්ට බෙදාහැරීම සඳහාත් අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්තුමා සමග අදාළ කටයුතු කරන ලදී.

**ඇමුණුම I**

### 2007 වසර අවසාන වනවිට ක්‍රියාත්මක වූ බලපත්‍රලාභී බැංකු

**සංඛ්‍යා සටහන II-1**

**බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අයි.සී.අයි.සී.අයි බැන්ක් ලිමිටඩ්
2. ඉන්දියන් ඕවර්සීස් බැංකුව
3. ඉන්දියන් බැංකුව
4. එම්.සී.බී බැන්ක් ලිමිටඩ්
5. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්
6. ඩී.එෆ්.සී.සී වර්ධන බැන්ක් ලිමිටඩ්
7. ඩොයිෂ් බැංකුව ඒ.ජී.
8. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
9. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
10. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්
11. පබ්ලික් බැන්ක් බර්හාඩ්
12. පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
13. මහජන බැංකුව
14. යූනියන් බැන්ක් ඔෆ් කළඹ්බු ලිමිටඩ්
15. ලංකා බැංකුව
16. ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව
17. යුනියන් බැන්ක් (පාකිස්ථාන) ලිමිටඩ්
18. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
19. සිටි බැන්ක් එන්.ඒ
20. සීමාසහිත හබීබ් බැංකුව
21. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව
22. සීමාසහිත සම්පත් බැංකුව
23. සෙලාන් බැන්ක් පීඑල්සී.

**සංඛ්‍යා සටහන II-2**

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

1. ඌව සංවර්ධන බැංකුව
2. එස්.එම්.ඊ.බැන්ක් ලිමිඩට්
3. කඳුරට සංවර්ධන බැංකුව
4. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
5. ඩී.එෆ්.සී.සී බැංකුව
6. රජරට සංවර්ධන බැංකුව
7. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
8. රුහුණු සංවර්ධන බැංකුව
9. වයඹ සංවර්ධන බැංකුව
10. සණස ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
11. සබරගමුව සංවර්ධන බැංකුව
12. සෙලින්කෝ සේවින්ස් බැන්ක් ලිමිටඩ්
13. සී/ස ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
14. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

## 3. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය

පෙර වර්ෂයෙහි මෙන්ම 2007 වර්ෂය තුළදී ද බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය පුළුල් පරාසයකින් යුතු පුහුණු වැඩසටහන්, අධ්‍යාපනික සම්මන්ත්‍රණ සහ මහජන දේශන සමූහයක් පවත්වන ලදී. ඊට අමතරව කලාපය තුළ මූල්‍ය ක්ෂේත්‍රයේ පුහුණු කටයුතු පිළිබඳ විශිෂ්ඨ ආයතනයක් වීම සඳහා වූ එහි මෙහෙයුම් පරමාර්ථය වෙත ළඟාවීම සඳහා විශේෂ අවධානයකින් කටයුතු කරන ලදී.

අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වන ලද පුහුණු වැඩසටහන් වලට බැංකු හා මූල්‍ය, ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය, මූල්‍ය ආයතන වලට අදාළ රෙගුලාසි, තොරතුරු තාක්ෂණය, භාෂා හා සන්නිවේදන කුසලතා, කළමනාකරණය, ග්‍රාමීය අංශයේ සංවර්ධනය හා ක්ෂුද්‍ර මූල්‍යකරණය යන ක්ෂේත්‍රයන් ඇතුළත් විය. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ මෙහෙයුම් පරමාර්ථයට අනුකූලව සමහර මූල්‍ය ආයතන මගින් කරන ලද ඉල්ලීම් වලට අනුව විශේෂ පුහුණු වැඩසටහන් මාලාවක් ද පවත්වන ලදී. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය විසින් පසුගිය වර්ෂවල කරන ලද සාමාන්‍ය කටයුතු වලින් බැහැරව කලාපයේ පුහුණු අවශ්‍යතා වලට ගැලපෙන හා කාලීන වැදගත්කමක් ඇති ජාත්‍යන්තර පුහුණු පාඨමාලා ලොව විශිෂ්ඨතම සම්පත් දායකයින්ගේ සහාය ඇතිව පවත්වමින් කේන්ද්‍රයේ කාර්ය භාරය තවදුරටත් පුළුල් කරන ලදී.

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය විසින් දේශීය හා විදේශීය ප්‍රවීණ දේශකයින්ගේ සහභාගිත්වය ඇතිව කාලීන වැදගත් කමක් ඇති මාතෘකා යටතේ මහජන සම්මන්ත්‍රණ හා සමරු දේශන මාලාවක් පවත්වන ලද අතර, එම සම්මන්ත්‍රණ හා දේශන තුළින් නවතම මත වාදයන් මහජනයා අතරට ගෙනයාමට හා ඒවා වෘත්තිකයින්ගේ හා උගතුන්ගේ

සාකච්ඡාවට භාජනය වීමට ඉඩ ලැබෙන සාකච්ඡා මණ්ඩපයක් සකසන ලදී. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින්, 2007 වර්ෂයේ අධ්‍යාපනක වැඩසටහන් යටතේ අ.පො.ස. උසස් පෙළ සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා රූපවාහිනී වැඩසටහන් මාලාවක් ද පවත්වන ලදී. ක්ෂුද්‍ර මූල්‍යකරණයට සම්බන්ධ කටයුතු මෙහෙයවීම හා ඒ හා සම්බන්ධ පුහුණු වැඩසටහන් කොළඹ හා ඉන් පිටත ප්‍රදේශ වල පැවැත්වීම සඳහා 2007 වර්ෂය තුළ බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය විසින් ක්ෂුද්‍ර මූල්‍යකරණය සඳහා වෙනම අංශයක් පිහිටුවන ලදී. බැංකු අධ්‍යයන කේන්ද්‍රය වෙත ලැබුණු ඉල්ලීම් සහ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ වැදගත්කම සළකමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් හා ජනමාධ්‍යකරුවන් වැනි වෙනත් විශේෂිත වෘත්තිකයින් සඳහා සහතික පත්‍ර පාඨමාලා කිහිපයක් ද පවත්වන ලදී.

2007 වර්ෂය තුළ බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් පුහුණු වැඩසටහන් 145 ක් පවත්වන ලද අතර, කලින් සැලසුම් කරන ලද දේශීය වැඩසටහන් 57ක් ද, ජාත්‍යන්තර වැඩසටහන් 02ක් ද, විශේෂ වැඩසටහන් 30ක් ද, මහජන දේශන 14ක් ද, අධ්‍යාපනික වැඩසටහන් 16ක් ද, ක්ෂුද්‍ර මූල්‍යකරණය පිළිබඳ වැඩසටහන් 26ක් ද ඊට ඇතුළත් විය. එම වැඩසටහන් වලට සහභාගි වූ පුද්ගලයන් සංඛ්‍යාව පිළිවෙලින් 1493, 139, 911, 2160 හා 593 ක් වූ අතර, මුළු සංඛ්‍යාව 6657 ක් විය.

වර්ෂය තුළ අධ්‍යයන කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් අතුරින් මූල්‍ය ආයතනය සඳහා විනිමය පාලන රෙගුලාසි, බැංකු ණය හා මූල්‍ය ගණුදෙනු සඳහා බලපාන නීති, ණය සුරැකුම් හා සම්බන්ධ නීතිමය ප්‍රතිපාදන, රන් භාණ්ඩ උකස් ණය, ණය සුරැකුම්පත් වෙළෙඳපොළ, කුලී පිටම්ළදී ගැනීම් හා කල්බදු මූල්‍යකරණය, මූල්‍ය ආයතන වල ආපදා කළමනාකරණය හා ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමේ සැළසුම්, ආර්ථික මිථිය හා ඊ විව්ස් (E-Views), මුදල් නෝට්ටු හා ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීම, බාසල් II (Basel II) පිළිබඳ ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව, මහ බැංකු කටයුතු පිළිබඳ ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව, සහ ණය ඇගයීම් ලේඛන සැකසීම යන පාඨමාලාවන් සඳහා ඉහළ ඉල්ලුමක් පැවැතිණි.

ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යකරණය කරන ලද ග්‍රාමීය මූල්‍ය ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පහක් (05) සහ සාමාන්‍ය පුහුණු වැඩසටහන් 21 අධ්‍යයන කේන්ද්‍රය විසින් වර්ෂය තුළදී පවත්වන ලදී.

මෙම පුහුණු පාඨමාලා අතුරින් පාඨමාලා හතරක් (04) ඌව සහ මධ්‍යම පළාත්වල පවත්වන ලදී. සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍ය තුනෙන්ම මෙම වැඩසටහන් ඉදිරිපත් කරන ලදී.

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය පුහුණු වැඩසටහන් සංවිධානය කරමින් එහි පාර්ශ්වකරුවන් සමග එලදායී සම්බන්ධතාවන් පවත්වන ලදී. 2007 වර්ෂය තුළ වැඩි වශයෙන් ක්ෂේත්‍රයේ අවශ්‍යතා වලට ගැලපෙන ඉහළ ගුණාත්මක භාවයක් සහිතව වැඩසටහන් පැවැත්වීමට බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය උත්සාහයක් දරන ලදී. මේ සඳහා ප්‍රවීණ අන්තර් ජාතික සම්පත් දායකයන්ගේ සේවාවන් ලබාගැනීමටද අවධානය යොමුකරන ලදී.

## 4. සන්නිවේදන

මහ බැංකුවේ ප්‍රධාන පරමාර්ථයන් වන මිල සහ මූල්‍ය ස්ථායීතාවය විධිමත් ලෙස පවත්වාගැනීමට උපකාරී වන්නා වූ ස්ථාවර දැනුවත්භාවය සහ විශ්වසනීයත්වය අභ්‍යන්තර හා බාහිර වශයෙන් ගොඩනැගීමට ඉවහල් වන පරිදි, මහ බැංකුවේ සන්නිවේදන ක්‍රියාවලිය තවදුරටත් වැඩි දියුණු කර ගැනීමේ පරමාර්ථය පෙරදැරි කොටගෙන, අභ්‍යන්තර හා බාහිර සන්නිවේදන අවශ්‍යතා සපුරාලීමේ තම කාර්යභාරය සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් විධිමත් ලෙස නොකඩවා සිදු කළේය.

බාහිර සන්නිවේදන කටයුතු වෙනුවෙන් දෙපාර්තමේන්තුව නොකඩවාම දෛනික විනිමය අනුපාතික, සතිපතා හා මාසික ආර්ථික දර්ශක, පාරිභෝගික මිල දර්ශක, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වැනි රජයේ සුරැකුම්පත් පිළිබඳ තොරතුරු මුදාහරින ලදී. වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව පුවත්පත් නිවේදන හා දැන්වීම් 1188 ක් ද ගැසට් නිවේදන 11 ක් ද පුවත්පත් වෙළෙඳ දැන්වීම් 212 ක් ද පළ කළේය. මාධ්‍යවේදීන්ට ක්‍රියාශීලී ලෙස බැංකුව සමග සම්බන්ධවීමට අවස්ථාව සලසාලමින්, විවිධ වූ ආර්ථික ප්‍රවණතා සහ සංවර්ධන කාර්යයන් ගැන මාධ්‍ය සාකච්ඡා 18 ක් සංවිධානය කිරීමට ද දෙපාර්තමේන්තුව ක්‍රියාකළේය. මේ ක්‍රියාකාරකම්වලට අමතර වශයෙන් සන්නිවේදන දෙපාර්තමේන්තුව තම සන්නිවේදන සේවාව ඉහළ නංවාලීමට වසර තුළ දී නව සන්නිවේදන මෙවලම් කිහිපයක් ක්‍රියාවට නැංවූයේ ය. ඒවා අතුරින් යළි සැලසුම් කර අභිනවයෙන් දියත් කළ මහ බැංකුවේ වෙබ් අඩවිය වඩාත් ම සැලකිය යුතු ක්‍රියාමාර්ගය වෙයි. නව වෙබ් අඩවිය 2007 මාර්තු මාසයේ දී සාර්ථක ලෙස දියත් කළ අතර එය අන්තර්ජාලය හුරු ඕනෑම කෙනෙකුට පහසුවෙන් පිවිස සෝදිසි කිරීම් මඟින් වැඩි පරාසයක තොරතුරු සමුදායක් කාලීනව විමසා බැලීමට උපකාරී වෙයි. බැංකුවේ සියළුම මූලික ක්‍රියාකාරකම්වලට ද බැංකුව විසින් සිදු කරනු ලබන ආර්ථික සහ මූල්‍ය අංශයේ නවතම නිරීක්ෂණයන්ට ද අදාළ විස්තීර්ණ තොරතුරු සමුදායක් ඒ තුළ වෙයි. 2006 දී දිනකට පිවිසීම් 600 ක් ලැබූ එය විශ්මය දනවන අයුරින් 2007 දී දිනකට පිවිසීම් 88,000 ක් ලැබීම දක්වා ඉහළ පරිශීලනයක් අත්පත් කරගැනීම තුළින් ම ගත වූ වර්ෂය තුළ දී ලැබූ සාර්ථකත්වය මනාව නිරූපණය වෙයි. වසර මුළුල්ලේ නිරන්තරයෙන් ම වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබීය.

අභ්‍යන්තර සන්නිවේදනයේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීම අරභයා, දෙපාර්තමේන්තුව වසර තුළ දී "CBSL daily" නමින් ගතික වෙබ් පිවිසුමක් හඳුන්වා දුන්නේය. එදිනෙදා කටයුතුවල නිරතවන අතරතුර බැංකු සේවකයන් විසින් දැනගත යුතු අත්‍යාවශ්‍ය තොරතුරුවලින් බොහෝමයක් මෙම වෙබ් පිවිසුම තුළින් ලබාගත හැකිය. දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරමින් ද යාවත්කාලීන කරමින් ද පවත්වාගෙන යන මෙම වෙබ් පිවිසුමේ කාලගුණික වාර්තාවල පටන් බැංකු සහ මූල්‍ය අංශයට අදාල දේශීය, විදේශීය ප්‍රවෘත්ති, වැදගත් ආර්ථික දර්ශක, සමාජ ක්‍රියාකාරකම් සහ සේවකයන් සඳහා වන නිවේදන දක්වා ඉතා පුළුල් පරාසයක තොරතුරු සමුදායක්

අන්තර්ගතය. තවද එය තුළ අද්‍යතන මාතෘකා යටතේ සාධනීය සාකච්ඡාවන්ට සහභාගීවීම සඳහා සේවකයන් හට මංගත සභා මණ්ඩපයක පහසුකම ද සලසා ඇත. බැංකු කාර්යය මණ්ඩලය තුළ මෙහි ජනප්‍රියභාවය පෙන්නුම් කරමින් වර්ෂය තුළ දී දිනකට සාමාන්‍ය වශයෙන් පිවිසුම් 300 ක් පමණ මෙයට ලැබී තිබේ. අභ්‍යන්තර සන්නිවේදනය වෙනුවෙන් යොදා ගන්නා තවත් ප්‍රධාන මාධ්‍යයක් වනුයේ "කවුළුව" අභ්‍යන්තර ප්‍රවෘත්ති සහ විශේෂාංග සඟරාවයි. ඉඩකඩ සහ ආකර්ෂණීය බව වැඩිවන අයුරින් 2007 දී මෙය නව මුහුණුවරකින් පළකරනු ලැබීය. මෙම නව සංස්කරණය මගින් ප්‍රවෘත්ති සහ විශේෂාංග වැඩි ප්‍රමාණයකට ඉඩ සැලසීමට හැකි විය.

මහජන අවබෝධය වැඩිකිරීමේ සහ අධ්‍යාපනික ක්‍රියාකාරකම් යටතේ දෙපාර්තමේන්තුව විසින් 2007 වර්ෂය තුළ දී ආර්ථික විද්‍යාව, බැංකු සහ මූල්‍ය කටයුතුවලට අදාල මාතෘකා යටතේ පාසල් සම්මන්ත්‍රණ සහ මහජනයා දැනුවත් කිරීමේ වැඩමුළු 25 ක් සංවිධානය කරන ලදී. සාමාන්‍ය ජනයා හට ඔවුනගේ එදිනෙදා අත්දැකීම් ඇසුරෙන් උද්ධමනය පිළිබඳ සංකල්පය වටහා ගැනීමට උපකාරීවීම සඳහා අධ්‍යාපනික වීඩියෝ වාර්තා වැඩ සටහනක් ද නිෂ්පාදනය කරන ලදී.

මහජනයා අතර බැංකුව පිළිබඳව දැනුවත් කිරීමේ සහ බැංකුවේ ප්‍රකාශන බෙදාහැරීමේ අරමුණු දෙකම ඇතිව දෙපාර්තමේන්තුව විවිධ ප්‍රදර්ශන සහ පොදු අවස්ථා සඳහා සහභාගී විය. පෙර වසරවලදී මෙන්ම කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සහභාගීවීම අතිශය සාර්ථක කාර්යයක් විය. මෙම ප්‍රදර්ශනය සඳහා විවෘත කළ අලෙවි කවුළුව මගින් බැංකුවේ ප්‍රකාශන අතිවිශාල ප්‍රමාණයක් අලෙවි කිරීමට දෙපාර්තමේන්තුව සමත්විය. "දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය" වැනි අනෙකුත් ප්‍රදර්ශනයන්ට සහභාගීවීම ද විශේෂයෙන් සඳහන් කළ යුතුය.

දෙපාර්තමේන්තුව 2007 වසර තුළ දී ද තම ප්‍රකාශන පළකිරීමේ යෙදී සිටියේ ය. ද්විමාසිකව පළකරන "සටහන" සඟරාව ද එහි දෙමළ පරිවර්තනය වන "කුරිප්පේඩු" සඟරාව ද "නිව්ස් සර්වේ" කාර්තුමය ප්‍රකාශනය ද මාසික අභ්‍යන්තර ප්‍රවෘත්ති සඟරාව වන "කවුළුව" ද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රකාශනයන් වේ. බෙදාහැරීමේ ජාලය පුළුල්වීම හේතුකොට ගෙන "සටහන" අලෙවිය වසර තුළ දී පිටපත් 4000 සිට 12000 දක්වා ඉහළ ගියේය.

බැංකුවේ සියළුම මුද්‍රණ අවශ්‍යතාවන් සපුරාලීමට මහ බැංකු මුද්‍රණාලය නොකඩවා ක්‍රියා කළේය. නිත්‍ය මුද්‍රණ කාර්යයන්ට ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාතීන්, නිව්ස් සර්වේ, සටහන, කවුළුව, මාණ්ඩලික පත්‍රිකා සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පිළිබඳ වාර්තාව මුද්‍රණය කිරීම ඇතුළත් ය. එයට අමතරව 2007 වසරේ උපාය මාර්ගික සැලැස්ම සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය විශේෂ ප්‍රකාශනයන් ලෙස මුද්‍රණය කරන ලදී. මෙකී මුද්‍රණ කාර්යයන් සමඟ, මුද්‍රණාලය මහ බැංකු දිනපොත සහ සුභ පැතුම්පත් ද ඇතුළත්ව මුද්‍රණ කාර්යයන් 315 ක් සම්පූර්ණ කරන ලදී. තවද මුද්‍රණාලය 2006 වාර්ෂික වාර්තාවට කවර නිර්මාණය සහ පිටු සැලසුම් ලබාදීමටත් තවත් ප්‍රකාශන කිහිපයකට කවර නිර්මාණ සැපයීමටත් ක්‍රියා කළේය.

දෙපාර්තමේන්තුවේ ඡායාරූපකරණ අංශය වසර තුළදී බැංකුවේ සියළුම ඡායාරූප ආවරණ අවශ්‍යතාවයන් තනිව හසුරවමින් කාර්ය බහුලම අංශයන්ගෙන් එකක් ලෙස ක්‍රියා කළේය.

2008 ජනවාරි පළමුවන දින සිට භාවිතයට ගැනීමේ අරමුණ ඇතිව මහ බැංකුවේ වෘත්තීයමභාවය සහ පරිපූර්ණත්වයත් එහි විෂය පථයත් සැලකිල්ලෙන් සැලසුම් කළ ප්‍රකාශිතයක් මගින් සන්නිවේදනය කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා නව ආයතනික රූපාංකනයක් හඳුන්වාදීමට අත්‍යාවශ්‍ය පියවර දෙපාර්තමේන්තුව විසින් තබන ලදී. මෙම නව ආයතනික රූපාංකනය විසින් බැංකුව සඳහා මග පෙන්වනු ලබන සහ එය විසින් පිළිපදින අගයන් ප්‍රතිබිම්බනය කරනු ඇත.

## පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය

පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය විසින් බැංකු කාර්ය මණ්ඩලය හා වෙනත් ඉල්ලීම් සඳහා පුස්තකාල සේවා සැපයීම අඛණ්ඩව සිදුකරන ලදී. එහි මුළු පොත් සංඛ්‍යාව 19,792 සිට 20,585 දක්වාත්, වාර්තා 13,335 සිට 13,826 දක්වාත් සංයුක්ත තැටි 1,020 සිට 1,081 දක්වාත්, බඳින ලද සඟරා එකතුව 280 කින් ද වර්ෂය තුළදී වර්ධනය විය. බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ ඇති පුස්තකාලයේ පොත් එකතුව ද 5,144 සිට 5,272 දක්වා වැඩිවිය.

ආර්ථික විද්‍යාව, ආර්ථික මිතිය හා මූල්‍ය විෂයයන් ඇතුලත් වාර සඟරා 100 කට වඩා මංගතව *(Online)* සම්බන්ධ වීමට හැකියාව ලබාදෙන *"Science Direct Database"* නමැති දත්ත එකතුවට සම්බන්ධවීමට අවස්ථාව ලබාදීම නිසා එහි භාවිතය පුළුල් විය. මේ නිසා වාර සඟරා සඳහා වූ ආයකත්වය 172 සිට 120 දක්වා අඩුකර ගැනීමට පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානයට හැකිවිය.

මෙම වසර තුළදී *"Recent Additions", " List of Selected Articles", "News on Central Banking", "News Alert"* වැනි විද්‍යුත් ප්‍රකාශන සම්පාදනය කළ අතර ඒවා අන්තඃජාලය (Intranet) හරහා බෙදා හැරිණි. භාවිත කරන්නන්ගේ සුචියක් සකස් කිරීමෙන් සහ එය තොරතුරු පද්ධතිය සමග සැසඳීමෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සඳහා "තෝරාගත් තොරතුරු බෙදාහැරීමේ සේවය" ආරම්භ කෙරුණි. බැංකු කාර්ය මණ්ඩලය තුළ විද්‍යුත් පුස්තකාල පහසුකම් භාවිතය ධෛර්යමත් කිරීම සඳහා ඔවුන් දැනුවත් කිරීම පිණිස වැඩසටහන් 10 ක් දෙපාර්තමේන්තු 10 ක් සඳහා හඳුන්වාදෙන ලදී. මෙම පහසුකම් භාවිතා කරන බැංකු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා ගෙනහැර දැක්වීම් *(Presentations)* 03 ක් පවත්වන ලදී.

බැංකු හා මූල්‍ය පුස්තකාල ජාලය *(Ebank libnetSL)* නැවත ක්‍රියාත්මක කිරීමත් සමග විද්‍යුත් තැපැල මගින් තොරතුරු බෙදාගැනීම තුළින් එහි සාමාජික පුස්තකාල 22 ට විශාල වශයෙන් ප්‍රතිලාභ ලැබුණි.

ඔක්තෝබර් මාසයට යෙදී ඇති ජාතික පොත් කියවීමේ මාසය වෙනුවෙන් මිලදී ගත් අලුත් ග්‍රන්ථ 450 ක් ප්‍රදර්ශනය කරන ලදි. මෙම ප්‍රදර්ශනය සඳහා බැංකු කාර්ය මණ්ඩලයෙන් හොඳ ප්‍රතිචාරයක් ලැබුණි. පොත් විචාර ලිවීමේ තරගය,

හොඳම පාඨකයා තේරීමේ තරගය හා විද්‍යුත් තැපැල් මගින් ක්‍රියාත්මක කළ ප්‍රශ්න විචාරාත්මක තරගය ද ජාතික පොත් කියවීමේ මාසය තුළ ක්‍රියාත්මක වු ජනප්‍රිය අංග විය. පොත් විචාර ලිවීමට බැංකු කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම සඳහා "පොත් විචාරයක් යනු කුමක් ද?" යන මැයෙන් වු දේශනයක් පුස්තකාලය විසින් සංවිධානය කරන ලදී.

බැංකු කාර්ය මණ්ඩලයට පහසුවෙන් පිවිසීම සඳහා රාජගිරියේ බැංකු අධ්‍යයන කේන්ද්‍රයෙහි තිබූ ස්වයං පිවිසුම් භාෂා විද්‍යාගාරය *(Self Access Language Laboratory)* පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය වෙත ගෙන එන ලදී.

මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයේ *(Central Engineering Consultancy Bureau)* තාක්ෂණික උපදෙස් හා පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පුස්තකාලයේ විමර්ශන අංශයේ ඇති නොබඳින ලද තාක්ෂණික වාර සඟරා හා වාර්තා රාක්කගත කර සංරක්ෂණය කිරීම සඳහා සංයුක්ත රාක්ක *(Compact Shelves)* කට්ටල තුනක් සවිකරන ලදී. පුස්තකාල පරිහරණය දිරිමත් කිරීම සඳහා වාර්තා චිත්‍රපටයක් පුස්තකාලයේ ප්‍රදර්ශනය කරන ලදී.

## 5. ව්‍යවහාර මුදල්

### මුදල් නිකුත් කිරීම සහ කළමණාකාරිත්වය

ශ්‍රී ලංකාවේ දී නීත්‍යානුකූල මුදල් නිකුත් කිරීමේ එකම අධිකාරිය වන ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකා මුදලින් සිදු කෙරෙන ගනුදෙනු සහ ඊට අදාළ ගෙවීම් සහ පියවීම් පහසු කරලීම සඳහා 2007 තුළ ද මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමේ නියැලිණි.

වසර තුළදී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකුවලට නිකුත් කරන ලද අලුත් සහ භාවිතයට ගත හැකි මුදල් නෝට්ටුවල වටිනාකම පිළිවෙලින් රුපියල් බිලියන 37 ක් සහ 172 ක් විය. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 193 ක් වටිනා නෝට්ටු වාණිජ බැංකුවලින් තැන්පතු ලෙස භාර ගන්නා ලදී. ඒ අනුව වසර තුලදී සංසරණයට එකතු කළ නෝට්ටු ප්‍රමාණයේ ශුද්ධ වටිනාකම රුපියල් බිලියන 16 ක් විය. 2007 වසර අවසානයේ සංසරණය වූ මුලු මුදල් ප්‍රමාණයේ වටිනාකම රුපියල් බිලියන 173 ක් වූ අතර, එය 2006 වසරට සාපේක්ෂව 10%ක වැඩිවීමකි. සංසරණය වූ මුදල් ප්‍රමාණයෙන් සියයට 97 ක් මුදල් නෝට්ටු වූ අතර ඉතිරි සියයට 3 කාසි වලින් සමන්විත විය.

### මුදල් නිකුත් කිරීමට සහ කළමණාකරනයට පිරිවැය කාර්යක්ෂම ක්‍රියා මාර්ග

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මුදල් නිකුත් කිරීමේ පිරිවැය අඩුකිරීම සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග වසර තුළදී යොදා ගන්නා ලදී.

**(අ) සංසරණය නොවී පවතින කාසි සංසරණයට එකතු කිරීම**

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ලෝහ සහ බලශක්ති මිල ගණන් ඉහළයාම හමුවේ කාසි ටංකනය කිරීමේ පිරිවැය සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් නිවාසවල සහ ආගමික ස්ථානවල එක් රැස්ව ඇති මාරු කාසි සංසරණයට එකතු කිරීමේ වැඩ සටහනක් ආරම්භ කරන ලදී. එමගින් කාසි ටංකනය කිරීමට වාර්ෂිකව වැයවන එංගලන්ත පවුම් වලින් කොටසක් ඉතිරිකර ගැනීමට හැකිවේ. මෙම වසර තුළදී දිස්ත්‍රික්ක අටක් ආවරණය කරමින් රුපියල් මිලියන 28.6 ක් වටිනා සංසරණය නොවූ කාසි ප්‍රමාණයන් එක් රැස්කර ගැනීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව සමත් විය.

නිවාසවල එක් රැස්ව ඇති කාසි සංසරණයට එකතු කිරීම සඳහා පාසැල් පද්ධතිය යොදා ගන්නා ලදී. වාණිජ බැංකු, අනෙකුත් බැංකු, බැංකු නොවන ආයතන මෙම වැඩ සටහනට සහභාගි විය. පාසැල් පද්ධතිය යොදා ගැනීමෙන්, මුදල්, ව්‍යාජ මුදල් සහ පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ පාසැල් ශිෂ්‍යයන් තුළ ඇති අවබෝධය වැඩි දියුණු කිරීම, සිසුන් අතර ඉතිරිකිරීම හා බැංකු පුරුදු වඩා වර්ධනය කිරීම, ඔවුන්ට පාඨමාලාවට පරිබාහිර කටයුතුවල නියැලීමට අවස්ථාවක් ලබාදීම සහ මුදල් පිළිබඳ දැනුම සමාජයේ අනෙකුත් අංශ අතර ප්‍රචලිත කිරීමේ මාධ්‍යයක් ලෙස පාසැල් ළමුන් සහභාගි කරවා ගැනීම යනාදි ප්‍රතිඵල රාශියක් අත්කර ගැනීමට හැකිවේ.

**(ආ) අඩුවෙන් සංසරණයවන සහ අඩු වටිනාකමක් ඇති භාවිතයට ගත නොහැකි කාසි උණු කිරීම**

ඉතා අඩුවෙන් භාවිතාවන සත 10 සහ සත 5 වටිනා ඇලුමිනියම් කාසි විශාල ප්‍රමාණයක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ සුරක්ෂිතාගාරවල ඉඩ සැළකිය යුතු ප්‍රමාණයක් අහුරමින් තැන්පත්ව පැවතුනි. කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ උපකාර සහිතව ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මෙම කාසි තොගයෙන් කොටසක් උණුකරන ලද අතර, එම ඇලුමිනියම් කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් මිලදී ගන්නා ලදී. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 3.0 ක පමණ මුදලක් එම අලෙවියෙන් උපයා ගන්නා ලදී.

### ව්‍යාජ මුදල් හඳුනාගැනීම

මුදල් සම්බන්ධයෙන් පවතින මහජන විශ්වාසය ආරක්ෂා කිරීම මහ බැංකුවේ වගකීමකි. ඒ අනුව ව්‍යාජ මුදල් නිෂ්පාදනය කිරීම අපහසු කිරීමේ පියවරක් ලෙස ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වැඩි දියුණු කරන ලද ආරක්ෂණ සළකුණු මුදල් නෝට්ටුවලට හඳුන්වා දෙන ලදී. එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් කාර්යාංශය සමග ඉතා සමීප සම්බන්ධතාවක් පවත්වා ගන්නා ලදී. ඒ අනුව ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව ව්‍යාජ මුදල් සම්බන්ධ නඩු විභාග 26 කට මහ බැංකුවේ පාර්ශ්වයන් සම්බන්ධ විය. ඊට අමතරව අව්‍යාජ මුදල් නෝට්ටුවක ඇති ගුණාංග පිළිබඳව මහජන අවබෝධය පුළුල් කිරීම සඳහා පවත්වන වැඩ සටහන්වල විෂය සහ සහභාගි වන පිරිස පුළුල් කරන ලදී. මෙම වැඩ සටහන්වල ප්‍රතිඵලයක් ලෙස 2006 වවසරේ දී සංසරණයේ පැවති දී මුදල් නෝට්ටු මිලියන එකකට පැවති 2.23 ක් වූ ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව, 2007 වසරේ දී නෝට්ටු 2.05 දක්වා අඩු විය.

### පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය සහ මුදල් නෝට්ටු තේරීම සහ සංසරණය සඳහා සකස් කිරීම

සංසරණයේ පවතින මුදල් නෝට්ටුවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම මහ බැංකුවේ තවත් වගකීමකි. ඒ අනුව, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව භාවිතයට ගත නොහැකි මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත් කිරීම දිගටම සිදු කරන ලදී. මුදල් නෝට්ටු හඳුනා ගැනීම, තේරීම සහ ගණනය කිරීම සඳහා ඇති යන්ත්‍ර යොදා ගනිමින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මුදල් නෝට්ටු මිලියන 98.7 ක් සකසන ලද අතර ඉන් මිලියන 21.1 ක මුදල් නෝට්ටු ප්‍රමාණයක් වර්ෂය තුළ විනාශ කරන ලදී.

වාණිජ බැංකුවලින් තැන්පත් කරනු ලබන භාවිතයට ගත නොහැකි මුදල් නෝට්ටු විනාශ කිරීම සඳහා යන්ත්‍රයක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2007 මාර්තු වලදී ස්ථාපිත කරන ලදී. දිනකට භාවිතා කළ නොහැකි මුදල් නෝට්ටු 900,000 විනාශ කිරීමේ ධාරිතාවක් මෙම යන්ත්‍රයට ඇත. ඒ අනුව එම යන්ත්‍රය ස්ථාපිත කළ 2007.03.21 දින සිට 2007.12.31 දින දක්වා කාලය තුළ 2005 සිට එක්රැස්ව තිබූ භාවිතයට ගත නොහැකි මුදල් නෝට්ටු මිලියන 174 ක් විනාශ කරන ලදී.

### සමරු මුදල් නෝට්ටු සහ කාසි අලෙවි කිරීම

මහජනාවට සහ මුදල් එකතු කරන්නන්හට සමරු මුදල් නෝට්ටු සහ කාසි අලෙවි කිරීම දිගටම පවත්වාගෙන යන ලදී. මෙම මුදල් නෝට්ටු සහ කාසි පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු ජාලයේ අඩංගු වේ. 2007 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී දෙවෙනි තැනට ශ්‍රී ලංකාව පත්වීම සැමරීම සඳහා සමරු කාසි දෙකක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු ද ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී. මෙම කාසි දෙක 2008 වසරේදී නිකුත් කරනු ඇත.

VI වෙනි ජෝර්ජ් රජු, නිදහසට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය සහ නිදහසින් පසු ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය යන තේමා තුනක් යටතේ කාසි ඇසුරුම් තුනක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී. මෙම කාසි ඇසුරුම් පිළිබඳව සහ ඒවායේ ගුණාංග පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ගුවන් විදුලි සහ රූපවාහිනී වැඩ සටහන් දෙකක් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.

### පුහුණුව සහ දැනුම පිළිබඳව පුහුණු වැඩ සටහන්

මහජනතාව, බැංකු නිලධාරීන්, පොලිස් නිලධාරීන්, පාසැල් සිසුන් සහ රජයේ නිලධාරීන් අරමුණු කර ගනිමින්, විශේෂයෙන් ව්‍යාජ මුදල් හඳුනා ගැනීම, පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය සහ මුදල් සංසරණය පිළිබඳව දේශන, සම්මන්ත්‍රණ වැඩ මුලු, මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන් රාශියක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. 2007 දී පවත්වන ලද එවැනි වැඩ සටහන් ගණන 34 කි.

නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්තුමාගේ ඉල්ලීම පරිදි දිස්ත්‍රික්ක උසාවි නිලධාරීන් සඳහා විශේෂ වැඩ සටහන් මාලාවක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. ඒ අනුව දිස්ත්‍රික් උසාවි 10 වසර තුළ ආවරණය කරන ලදී. ඉතිරි දිස්ත්‍රික්ක 2008 වසරේදී ආවරණය කරනු ඇත.

එංගලන්තයේ ඩිලාරූ මුදල් නෝට්ටු මුද්‍රණ සමාගම විසින් ව්‍යාජ මුදල් හඳුනාගැනීම පිළිබඳව 2007 සැප්තැම්බර් මාසයේදී පවත්වන ලද වැඩ මුළුවකට සහභාගිවීමේ අවස්ථාවක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උදා විය.

මහජන අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා ජංගම මුදල් කෞතුකාගාර ප්‍රදර්ශන ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් පරිදි සංවිධානය කර පවත්වන ලදී.

1. 2007 පෙබරවාරි මස 2 සිට 7 දක්වා ඇයට කිරුල ප්‍රදර්ශනය, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව.
2. 2007 පෙබරවාරි 28 සිට මාර්තු 4 දක්වා ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයීය ප්‍රදර්ශනය.
3. 2007 මාර්තු 22 සිට 25 දක්වා අනුරපුර උද්‍යානය ප්‍රදර්ශනය.
4. 2007 අප්‍රියෙල් 3 සිට 7 දක්වා කෑගල්ල ශුද්ධ වූ කන්‍යාරාමයේ අධ්‍යාපන ප්‍රදර්ශනය.
5. 2007 මැයි 7 සිට 12 දක්වා වීරකැටිය රාජපක්ෂ මහා විද්‍යාලයේ අධ්‍යයන ප්‍රදර්ශනය.

මෙම ප්‍රදර්ශන සියල්ලකදීම මහජනතාවගෙන් සහ පාසැල් සිසුන්ගෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට ඉතා ඉහළ ඇගයීමක් ලැබුණි.

## 6. දේශීය කටයුතු

දේශීය කටයුතු දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමත් වාණිජ බැංකුවල සහ රජයේ බැංකුකරු ලෙස කටයුතු කිරීමත් යන කාර්යයන්හි තවදුරටත් නිරත විය. මීට අමතරව රටෙහි තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි කටයුතු නිසි ලෙස ක්‍රියාත්මක කරනු වස් උපකාරක සේවාවක් වශයෙන් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීමද දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

### මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

#### (අ) විවට වෙළෙඳ කටයුතු (වි.වෙ.ක.)

2003 දී මහ බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබූ වෙළෙඳපොලාභිමුඛ මූල්‍ය ප්‍රතිපත්ති රාමුව පදනම් කරගෙන මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයුම් තවදුරටත් සිදු කරන ලදී. සංචිත මුදල් ඉලක්කගත අගයන් තුළ පවත්වා ගැනීමේ ක්‍රමෝපායයක් ලෙස වි.වෙ.ක. මගින් ද්‍රවශීලතාවය අවශෝෂණය කිරීම වර්ෂය පුරාම සිදුකරන ලදී. ඒ අනුව තාවකාලික ද්‍රවශීලතා අතිරික්තය උකහා ගැනීම සඳහා දිනපතා ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු වෙන්දේසි පැවැත්වූ අතර, අතිරික්ත ද්‍රවශීලතාවය නිත්‍ය පදනමක් මත උකහා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සතු වූ භාණ්ඩාගාර බිල්පත් ද්විතීයික වෙළෙඳපොළෙහි ස්ථිර පදනමක් මත විකිණීම සඳහා වෙන්දේසි පවත්වන ලදී. නිත්‍ය පහසුකම් යටතේ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම් කටයුතු ද


තවදුරටත් සිදුකරන ලදී. මෙම ක්‍රමෝපායයට අනුකූල වෙමින් ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා වූ වෙන්දේසි නොපැවැත්වූ අතර ද්‍රවශීලතා හිඟයක් පැවති දිනවලදී ඇස්තමේන්තුගත හිඟය පමණක් සැපයීමට නිත්‍ය පහසුකම් යටතේ ප්‍රති විකුණුම් ගනුදෙනු සඳහා පහසුකම් සපයන ලදී.

වි.වෙ.ක. යටතේ ගනුදෙනු කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහභාගිත්ව ආයතන ලෙස තවදුරටත් කටයුතු කරන ලදී. මීට අමතරව 2006 ජූනි 19 වන දින සිට ඉවත් කරන ලදුව සිටි ප්‍රාථමික වෙළෙඳුන් 2007 අගෝස්තු 27 දින සිට බලපැවැත්වෙන පරිදි වි.වෙ.ක. යටතේ ගනුදෙනුකල හැකි සහභාගීත්ව ආයතන ලෙස නැවත ලැයිස්තුගත කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව එහි ප්‍රතිපත්තිමය පොලී අනුපාතිකයන් වන ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතයන් පාදක අංක 50 කින් පිළිවෙලින් සියයට 10.5 සහ සියයට 12.00 ක් වන ලෙස 2007 පෙබරවාරි මාසයේදී ඉහළ නංවන ලදුව වර්ෂය තුළදී එම අගයන් නොවෙනස්ව පවත්වාගෙන යනු ලැබිණි.

මෙම වසර තුළදී සාමාන්‍ය වශයෙන් බැංකු පද්ධතියෙහි ද්‍රවශීලතාවය අතිරික්ත මට්ටමක පැවතිණි. (රූප සටහන II-I) ප්‍රධාන වශයෙන් උත්සව සමයෙහි වූ ඉහළ ඉල්ලුම සඳහා ලබාගත් මුදල් නෝට්ටු නැවතත් තැන්පතු වශයෙන් ලැබීම සහ විදේශ ණය ලැබීම් හේතුකොටගෙන මැයි මාසයෙහි අතිරික්ත ද්‍රවශීලතාවය ඊට පෙර මාසයේ සාමාන්‍ය අගය වූ රුපියල් බිලියන 5 සිට රුපියල් බිලියන 12.5 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ඔක්තෝබර් මාසය අගදී නිකුත් කළ එ.ජ.ඩොලර් මිලියන 500 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කරයෙන් ලැබුණු විදේශ මුදල් හේතුකාටගෙන නොවැම්බර් මාසයෙහි අතිරික්ත ද්‍රවශීලතාවයෙහි දෛනික සාමාන්‍ය අගය රුපියල් බිලියන 8 ක් දක්වා ඉහළ නැගුණි. මේ අතර ප්‍රධාන වශයෙන් උත්සව සමයේ මුදල් නෝට්ටු සඳහා ඇති වූ ඉහළ ඉල්ලුම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශීය මුදල් විකිණීම සහ විදේශ ණය ආපසු ගෙවීම් නිසා අප්‍රේල්, සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් යන මාසවල බොහෝ දිනවලදී සැළකිය යුතු ද්‍රවශීලතා ඌනතාවයක් පැවතිනි.


**රූප සටහන II - 1**
**වෙළෙඳපොළ ද්‍රවශීලතාවය - 2007**




### (i) විවට වෙළෙඳපොළ කටයුතු යටතේ දෛනික ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු වෙන්දේසි

බැංකු ක්‍රමය තුළ පැවති තාවකාලික ද්‍රවශීලතා අතිරික්තය උකහා ගැනීම සඳහා දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු සඳහා දෛනික වෙන්දේසිය නොකඩවාම පවත්වාගෙන යනු ලැබීය. වර්ෂය තුළ බොහොමයක් දිනවල වාර්තා වූ අතිරික්ත ද්‍රවශීලතාවය දෛනිකව භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනුම් පදනමක් මත වෙන්දේසිය තුළින් විකිණීම මගින් උකහා ගනු ලැබීය. සාමාන්‍ය වශයෙන් රුපියල් බිලියන 7.4 ක් පමණ දෛනික වෙන්දේසි සඳහා ඉදිරිපත් කරන ලද අතර, එම වෙන්දේසිවලදී උකහාගත් ප්‍රමාණයේ සාමාන්‍ය අගය රුපියල් බිලියන 6.1ක් විය. මෙම උකහා ගත් ප්‍රමාණය ඇස්තමේන්තු කළ අතිරික්ත ද්‍රවශීලතාවයෙන් සියයට 80.2 ක් පමණ විය. වර්ෂය ආරම්භයේදී සියයට 11.35 ක්ව තිබූ දෛනික වෙන්දේසිවල සාමාන්‍ය ඵලදා අනුපාතිකය, පෙබරවාරි මාසයේදී මහ බැංකු ප්‍රතිපත්ති පොලී අනුපාතිකයන් ඉහළ දැමීමත් සමග පාදක අංක 50 කින් පමණ වැඩි වී, වර්ෂ අවසානයේදී සියයට 11.87 ක් පමණ වූ අගයක පැවැතිනි.

**රූප සටහන II - 2**
**වි.වෙ.ක. ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි - 2007**
**(මාසික සාමාන්‍යයන්)**




### ප්‍රති විකුණුම් ගනුදෙනු

2007 වසරේදී ප්‍රති විකුණුම් වෙන්දේසි නොපැවැත්වුනි.

### (ii) නිත්‍ය පහසුකම්

අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළෙහි ගනුදෙනු වලින් සහ විවට වෙළෙඳ කටයුතු යටතේ වූ දෛනික වෙන්දේසි තුළින් සිය කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සම්පූර්ණ වශයෙන් කළමනාකරණය කර ගැනීමට අපොහොසත් වූ සහභාගීත්ව ආයතන සඳහා පහසුකම් සැපයීමේ මාර්ගයක් ලෙස නිත්‍ය පහසුකම් තවදුරටත් ක්‍රියාත්මක කරනු ලැබීය. මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය හා ප්‍රතිවිකුණුම් අනුපාතිකය මත මෙම පහසුකම් සපයනු ලැබීය.

### ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු

වෙන්දේසින්හි දී සිය අවශ්‍යතාවයන් සපුරා ගැනීමට නොහැකි වූ හෝ සහභාගීවීමට නොහැකි වූ සහභාගීත්ව ආයතනයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය පහසුකම් තුළ ආයෝජනය කිරීමට පෙළඹේ. දෛනිකව පවත්වනු ලබන ප්‍රතිමිලදී ගැනීම්

වෙන්දේසි ගනුදෙනු තුළින් අතිරික්ත ද්‍රවශීලතාවයෙහි විශාල කොටසක් උකහා ගන්නා බැවින්, නිත්‍ය පහසුකම් යටතේ සිදුකරන ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල සාමාන්‍ය අගය රුපියල් මිලියන 0.75 ක් වැනි සීමිත අගයක් විය.

**ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය පහසුකම් යටතේ වූ ප්‍රති විකුණුම් පහසුකම සහභාගීත්ව ආයතන සඳහා සපයනුයේ ඔවුන්ගේ කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ අවසාන මූලාශ්‍රය ලෙසිනි. එනමුත් සමහරක් බැංකු මෙම නිත්‍ය පහසුකම් බැංකු පද්ධතියෙහි අතිරික්ත ද්‍රවශීලතාවයක් පවතින විටදී පවා මුදල් ලබා ගැනීම සඳහා නිරතුරුව මූලාශ්‍රයක් ලෙස යොදා ගන්නා බව පෙනීගියෙන්, නිත්‍ය පහසුකම් යටතේ වූ ප්‍රතිවිකුණුම් පහසුකම භාවිතා කිරිම සීමාකර, ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු පවත්නා සම්පත් ප්‍රමාණයට සීමා කර ගන්නා ලෙස අවවාද කරන ලදී.

ප්‍රතිවිකුණුම් පහසුකම භාවිතා කිරීම අධෛර්ය කරනු පිණිස 2007 ජනවාරි මාසයේ සිට බල පැවැත්වෙන පරිදි මෙම ප්‍රතිවිකුණුම් පහසුකම බැංකු පද්ධතියේ ද්‍රවශීලතාවයෙහි ඌනතාවයක් ඇති දිනවලදී පමණක් සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කරන ලදී. මීට අමතරව එවැනි දිනවලදී ප්‍රති විකුණුම් පහසුකම යටතේ ලබාදෙන මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇස්තමේන්තුවලට අනුව ඇති ද්‍රවශීලතා ඌනතාවයට සීමා කරනු ලැබීය. එමෙන්ම එම ප්‍රතිවිකුණුම් පහසුකම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රති විකුණුම් අනුපාතය මත එක් නියමිත බැංකුවකට ලබාදෙන වාර ගණන 2007 මාර්තු 31 වන දින දක්වා ලිත් මසකට 6 වරක් දක්වා සීමා කිරීමටත්, එතැන් සිට ලිත් මසකට 3 වරක් දක්වා සීමා කිරීමටත් තීරණය කරන ලදී. 2007 අගෝස්තු මස 23 දින සිට සහභාගීත්ව ආයතනයකට මෙම නිත්‍ය පහසුකම යටතේ ණය ලබා ගැනීම සඳහා මසකට පනවා තිබූ වාර ගණන සම්බන්ධ සීමාව ඉවත් කරන ලදී.

නිත්‍ය පහසුකම් යටතේ වූ ප්‍රති විකුණුම් පහසුකම අධික ලෙස භාවිතා කිරීම අධෛර්යමත් කිරීමටත්, සහභාගීත්ව ආයතනවල ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමත් තුලනය කිරීම සඳහා, 2007 දෙසැම්බර් 3 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිවිකුණුම් අනුපාතයට ප්‍රති විකුණුම් පහසුකම මසකට 4 වරක් දක්වා එක් සහභාගීත්ව ආයතනයකට ලබාදීමට තීරණය කරන ලදී. මෙම වාර ගණන ඉක්මවා ලබාගන්නා විටදී සියයට 19 ක දඬුවම් අනුපාතයකට එය ලබාදීමට ද මෙම තීරණය කලින් කලට පවත්නා මූල්‍ය තත්ත්වයන්ට අනුව සමාලෝචනය කිරීමට ද තීරණය කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ප්‍රමාණයන් හේතුකොටගෙන 2006 වසරේ රුපියල් බිලියන 382 ක් වූ නිත්‍ය පහසුකම් යටතේ වූ ප්‍රතිවිකුණුම් පහසුකම් භාවිතා කිරීම 2007 වසරේ දී රුපියල් බිලියන 173 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

**(iii) ස්ථිර පදනමක් මත වූ ගනුදෙනු**

නිත්‍ය පදනමක් මත අතිරික්ත ද්‍රවශීලතාවය උකහා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනමක් මත විකිණීමේ වෙන්දේසි සිදු කරන ලදී. මේ සඳහා භාණ්ඩාගාර බිල්පත් විකිණීමේදී කල්පිරීම් කිහිපයකින් යුත් වෙන්දේසි (Multiple Auctions) පැවැත්වීම 2007 වර්ෂයේ ජනවාරි මස සිට අරඹන ලදී. මෙම වෙන්දේසි මගින් මෙම වර්ෂය තුළදී විකුණන ලද භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම රුපියල් බිලියන 110.9 කි. මෙම භාණ්ඩාගාර බිල්පත් දින 10 සිට 157 දක්වා වූ කල් පිරෙන දිනැති කෙටිකාලීන ඒවා විය. මෙම විකිණීම් ප්‍රාථමික වෙළෙඳපොළෙහි දින 91 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සඳහා පැවති බර තබන ලද සාමාන්‍ය ඵලදායිතා අනුපාතයකට වඩා අඩු අගයන්ට සිදුකරන ලදී.

**(ආ) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය**

දෙපාර්තමේන්තුව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා නියමයන් ක්‍රියාත්මක කිරීම තවදුරටත් කරගෙන යනු ලැබූ අතර එය ශ්‍රී ලංකා රුපියල් වලින් වූ වාණිජ බැංකුවල තැන්පතු වගකීම්වලින් සියයට 10 ක් ලෙස පැවතුනි.

**(ඇ) බැංකු අනුපාතිකය**

මුදල් නීති පනතේ 87 වැනි වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවතුනි. කෙසේ වුවද, බැංකු අනුපාතිකය යටතේ බැංකු විසින් මහ බැංකුවෙන් ණය ලබා නොගත් හෙයින් මෙම අනුපාතිකය අක්‍රීයව පැවතුනි.

## 2. වාණිජ බැංකුවල සහ රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ ක්‍රියාකාරීත්වය

**(අ) මූල්‍ය ආයතනවල ගිණුම්**

මහ බැංකුවට බැංකුවල බැංකුකරු ලෙස ක්‍රියාත්මකවීමට අවශ්‍ය පහසුකම් සලස්වමින් කාර්යක්ෂම අන්තර් බැංකු ගෙවීම් සහ පියවීම් ක්‍රමයක් සහතික කරනු වස්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත ජංගම ගිණුම් පහසුකම් සැපයීමෙහි තවදුරටත් නිරත විය. මෙම ගිණුම් මහ බැංකුවේ ස්වයංක්‍රීය පොදු ලෙජර් පද්ධතිය තුළ, තත්කාලීන දළ පියවීම් පදනමක් මත ක්‍රියාත්මක විය.


**(ආ) රජයේ ගිණුම්**

මහ බැංකුවට රජයේ බැංකුකරු වශයෙන් සේවය කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදෙමින්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව රජයේ දෙපාර්තමේන්තු, රජයේ ආයතන සහ නියෝජිත ආයතන සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය බැංකු පහසුකම් සපයමින් ගිණුම් පවත්වාගෙන යාම අඛණ්ඩව සිදුකරන ලදී. 2007 වර්ෂය අවසානයේදී එසේ පවත්වාගෙන යනු ලැබූ ගිණුම් සංඛ්‍යාව 38 කි. වර්ෂය තුළදී රජයේ ඉල්ලුම පරිදි එක් නව ගිණුමක් විවෘත කළ අතර, එක් ගිණුමක් වසා දමනු ලැබීය. මුදල් නීති පනතේ 89 වන වගන්තියට අනුව, මහ බැංකුව රජයට කෙටිකාලීන අත්තිකාරම් ලබාදීම තවදුරටත් සිදුකරන ලදී. මෙවැනි අත්තිකාරම්වල සීමාව (රජයේ ඇස්තමේන්තුගත ආදායමින් සියයට 10) 2007 වසරේදී රුපියල් බිලියන 62 දක්වා රුපියල් බිලියන 12.2 කින් වැඩි විය. මෙම අත්තිකාරම් සඳහා පොලී අයකිරීම සිදු නොකෙරේ.

### 3. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම

තත්කාලීන දල පියවුම් ක්‍රමය තුළ මෙහෙයුම් කටයුතු සුමට හා කාර්යක්ෂම ලෙස සිදුවීම සහතික කරනු පිණිස බැංකුවලට සහ ප්‍රාථමික වෙළෙඳුන්ට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීමේ කාර්යයෙහි දෙපාර්තමේන්තුව තවදුරටත් නිරත විය. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම ගාස්තුවකින් තොරව රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් තවදුරටත් සිදු කරනු ලැබීය. සුරැකුම්පත්වල වටිනාකම ඒවායේ වර්තමාන වෙළෙඳපොළ මිල ගණන් අනුව ගණනය කරනු ලබන අතර, එයට වසර තුළ ඇතිවිය හැකි මිල උච්චාවචනයන් ආවරණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ගැලපීමක් කරනු ලැබේ. වර්ෂය තුළ ලබාගත් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්වල මුළු වටිනාකම පසුගිය වසරේ පැවති බිලියන 538.6 හා සසඳන විට මෙම වසරේ බිලියන 1,222 ක් විය. මෙය සාමාන්‍යයක් ලෙස ගත්කළ එක් දිනකට රුපියල් බිලියන 5.03 ක් විය. වර්ෂය තුළ දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගෙවීම් පැහැර හැරීම් වාර්තා නොවිය.

**රූප සටහන II - 3**
**2007 ලබාගත් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්**




මහ බැංකු අනුපාතිකය අනුව දඩ පොලියක් නියම කිරීම සහ නැවත නැවතත් ආපසු ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක මෙම පහසුකම අත්හිටුවීම වැනි පියවරයන් ගෙන තිබීම නිසා ලංකා සෙට්ල්හි ව්‍යාපාරික කටයුතු අවසන් කිරීමට පෙර දවස තුළ ද්‍රවශීලතා පහසුකම් ආපසු ගෙවීම නිසි ලෙස සිදුවීම සහතික වී ඇත.

## 7. ආර්ථික පර්යේෂණ

ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වාදීම සඳහා වන ආර්ථික පර්යේෂණ සිදුකිරීම යන තම ප්‍රධානතම කාර්යභාරය ඉටුකරමින් සහ මහජනතාවට තොරතුරු නිකුත් කරමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ "ආර්ථික බුද්ධි මණ්ඩලය" ලෙස අඛණ්ඩව කටයුතු කළේය. වසර තුළදී මෙම අතිශය වැදගත් වගකීම ඉටුකිරීම සඳහා ආර්ථික හා සමාජීය දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම සිදුකරමින් මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා සහ මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ තීරණ ගැනීමේ වගකීම දරන මුදල් මණ්ඩලයට එම තීරණ ගැනීමට මඟ පෙන්වීම සඳහා ප්‍රතිපත්ති මූලික කරගත් ආර්ථික පර්යේෂණ කටයුතු වල නිරතවිය. එම විශ්ලේෂණාත්මක පර්යේෂණයන් නව දැනුම ඉපදවීමට හේතු වූ අතර වඩාත් හොඳ ප්‍රතිපත්තීන් නිර්මාණය කරගැනීම සඳහා විවිධ ගැටළු නිවැරදිව හඳුනා ගැනීමට උපකාරී විය. මහ බැංකුව විසින් හඳුන්වාදෙන ලද නව මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් හා රජය විසින් ආරම්භ කරන ලද ක්‍රියාමාර්ග රාශියක් සඳහා තම විශේෂඥ ඥානය හා උපදෙස් ලබාදෙමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මෙම වසර තුළදීත් ක්‍රියාශීලීව තම සේවාව ඉටු කළේය. මීට අමතරව, විවිධ ආර්ථික ගැටළු පිළිබඳව රජයට සහ අනෙකුත් විවිධ පාර්ශවකරුවන් වෙත ප්‍රතිපත්තිමය උපදෙස් ලබාදීමද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. ව්‍යවස්ථාපිත ප්‍රකාශන හරහා මහජනතාව වෙත ආර්ථික සහ මූල්‍යමය දත්ත හා තොරතුරු නිකුත් කිරීම තවදුරටත් අඛණ්ඩව සිදුකරන ලදී. මෙය මූලික වශයෙන් මහ බැංකු නිල ප්‍රකාශන, කලින් කලට නිකුත් කරනු ලබන පුවත්පත් නිවේදන සහ සතිපතා හා මාසිකව නිකුත් කරනු ලබන ආර්ථික දර්ශක පුවත්පත් නිවේදනයන් මගින් හා මහ බැංකු අන්තර් ජාලය හරහා ප්‍රසිද්ධ කිරීම තුළින් සිදුකරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ සාක්ෂි පාදක පර්යේෂණයන් මූලික වශයෙන් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි යොමු විය. තවද, අනෙකුත් දේශීය හා ජාත්‍යන්තර ප්‍රවණතාවයන් හා ප්‍රතිපත්තීන්, ශ්‍රී ලංකාවේ පුළුල් සාර්ව ආර්ථික අරමුණු ඉටුකරගැනීමට යෝග්‍ය ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට සහය වනපරිදි විශ්ලේෂණය කිරීමද සිදුකරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ මෙම උත්සාහයන් ඊට අයත් ප්‍රධානතම කාර්යයක් වන මුදල් ප්‍රතිපත්ති කමිටුවට පහසුකම් සැලසීම හා එහි කටයුතු වඩාත් ශක්තිමත් කිරීම කෙරෙහි විශේෂයෙන් යොමුවිය. මුදල් ප්‍රතිපත්ති කමිටුවේ අදහස් හා විශේෂයෙන් අවධානය යොමු කරන කරුණු ඇතුළත් කොට දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද මුදල් මණ්ඩල පත්‍රිකා මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ තීරණ ගැනීම සඳහා මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

මීට අමතරව, ආර්ථිකයේ කාලීන ප්‍රවණතාවයන් පිළිබඳව මුදල් මණ්ඩලය දැනුවත් කිරීම සඳහා ආර්ථික තත්ත්වය පිළිබඳ නිතිපතා වාර්තාවන් ලබාදීමද සිදුකරන ලදී. කාලීන වැදගත්කමක් සහිත මාතෘකා පිළිබඳවද ආර්ථික පර්යේෂණ කටයුතු අඛණ්ඩව සිදුවිය. මේ අතුරින් 2007 වසරේදී සම්පූර්ණ කරන ලද හා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සංස්කරණය කරන ලද පහත සඳහන් පර්යේෂණ පත්‍රිකා "මාණ්ඩලික අධ්‍යයන පත්‍රිකා" යටතේ ප්‍රකාශයට පත්කිරීමට නියමිතය.

(අ) දෛනික ද්‍රවශීලතා පහසුකම් : මුදල් ප්‍රතිපත්තියට එයින් බලපෑමක් තිබේද? ආචාර්ය ඩී.එස්.විජේසිංහ.

(ආ) තෝරාගත් රටවල් කිහිපයක මුදල් තැරැව්කාර ව්‍යාපාරය පාලනය වන නියාමක රීතීන් : රූපා ධීරසිංහ මිය.

(ඇ) විදේශ විනිමය අනුපාතයේ විනිවිද යෑම : ශ්‍රී ලංකා ආර්ථිකයේ මිල ගණන් කොපමණ දුරකට වෙනස් වේද? එස්.එම්. විමලසූරිය මිය.

(ඇ) මූල්‍ය ප්‍රතිපත්තිය හා උද්ධමන ක්‍රියාකාරිත්වය : ශ්‍රී ලංකාවේ විදේශ විනිමය අනුපාත ක්‍රමවල අත්දැකීම් ඇසුරින් : පී.කේ.ජී.හරිස්චන්ද්‍ර මයා.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ ප්‍රසිද්ධ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "2007 සහ ඉදිරිය සඳහා මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙරදැක්ම" පිළියෙල කිරීමද සිදුකළ අතර එය 2007 ජනවාරි 2 වන දින අදාළ පාර්ශ්වකරුවන් වෙත ඉදිරිපත් කරන ලදී. ප්‍රතිපත්ති පුරෝකථනය හා විනිවිද භාවය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව 2006 වසරේ ආර්ථිකයේ ප්‍රවනතාවයන් හා මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශ්ලේෂණයක් සහ 2007 වසරේ මුදල් ප්‍රතිපත්තිය හා මූල්‍ය ස්ථායීතාවය ළඟාකර ගැනීමේදී මුහුණ දීමට සිදුවන අභියෝගයන් පිළිබඳව සවිස්තරාත්මක සාකච්ඡාවක් මෙම වාර්තාවට ඇතුළත් විය. එවැනිම ප්‍රතිපත්ති පෙර දැක්මක් 2008 වසර සඳහාද පිළියෙල කළ අතර, එය 2008 ජනවාරි මස 02 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

"ප්‍රතිපත්ති පෙරදැක්ම - 2007" හි සඳහන් පරිදි විදේශීය රාජ්‍යමූල්‍ය හා මූල්‍ය යන අංශයන්හි තෝරාගත් සාර්ව ආර්ථික විචල්‍යයන් අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් ආර්ථික පර්යේෂණ දෙපාරේතමේන්තුව විසින් හඳුන්වා දෙන ලදී. එමගින් අදාළ විචල්‍යයන් අපේක්ෂිත ඉලක්කයන්ගෙන් කැපීපෙනෙන ලෙස බැහැරවීම අවම කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කල් ඇතිව ගැනීමට අවස්ථාව සැලසේ. මහ බැංකුවෙන් පිටත විශේෂඥයන්ගේ දැනුම හා අවබෝධය ලබාගැනීම හරහා මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පිහිටුවා ඇති මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුවට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබීය. මහාචාර්ය ඒ.ඩී.වී ද එස් ඉන්ද්‍රරත්න (සභාපති), සෝලි කැප්ටන් මහතා, යෙහාන් පෙරේරා මහතා, මහේන් දයානන්ද මහතා, ආර්.එම්.බී. සේනානායක මහතා, එම්. පී. ජයවර්ධන මහතා සහ කබි විජේතුංග යන සාමාජිකන්ගෙන් සමන්විත වූ මෙම කමිටුව ආර්ථික ප්‍රවනතාවයන් විශ්ලේෂණය කිරීම සඳහාත් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහාත් මාසික පදනමක් මත රැස්විය. මෙම සාමාජිකයන්ගේ විශේෂඥතාවයන් තවදුරටත් ලබාගැනීමේ අරමුණින් මෙම සාමාජිකයන් 2008 වර්ෂයේදී නැවත එම කමිටුවට පත්කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව රජයේ ආර්ථික උපදේශකයා ලෙස උපදෙස් සැපයීමේ කාර්යයේදී මුදල් මණ්ඩලය වෙත ප්‍රතිපත්ති පත්‍රිකා කිහිපයක්ම ඉදිරිපත් කරනු ලැබීය. තවද, මෙම දෙපාර්තමේන්තුව විසින් ජාතික ආර්ථික සභාව වෙත ඉදිරිපත් කළ විවිධ විශ්ලේෂණ හා කරුණු දැක්වීම් වලදී ක්‍රියාශීලීව කටයුතු කරන ලදී. දෙපාර්තමේන්තුව වෙත පැවරුනු නව වගකීමක් වන ප්‍රතිපත්ති සම්බන්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා වලට අදාල ආර්ථික ප්‍රතිවිපාකයන් පිලිබඳව ස්වාධීන මත ඉදිරිපත් කිරීමද සිදුකරන ලදී. මීට අමතරව, බහුපාර්ශ්වීය හා ද්විපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් හා වාණිජ මූලාශ්‍ර යනාදිය වෙතින් රජය ලබාගත් සියලුම විදේශ ණයවල නීති හා කොන්දේසි වලින් සිදුවන ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳව ඇගයීම තවදුරටත් සිදුකරගෙන යන ලදී. තවද, කලින් කලට ආර්ථික ගැටළු පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් කරනු ලබන විමසීම් වලටද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පිළිතුරු සපයන ලදී.

වර්ෂය තුළදී මෙම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වැඩිදියුණු කිරීමේ හැකියාව පිළිබඳව සිදුකළ විවිධ විශ්ලේෂණයන් අනෙකුත් ආයතන කිහිපයක් වෙත ඉදිරිපත් කිරීම හා ඒවා සාකච්ඡා කිරීම කරන ලදී. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගවේෂණය සහ ආශ්‍රිත ක්ෂේත්‍රයන් සහ ධීවර කර්මාන්තය දියුණු කිරීමේ ක්‍රමවේදයක් ලෙස "විශේෂිත සාගර ආර්ථික කලාප" ප්‍රවර්ධනය කිරීම පිළිබඳව කරන ලද විශ්ලේෂණයන් මීට අයත්වේ. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් පත්කරන ලද "විදුලිබල උත්පාදනය පුළුල් කිරීමේ කමිටුව" හා "විදුලිබල මණ්ඩලයේ සමස්ත ගාස්තු ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම සඳහා වන කමිටුව" යන කමිටු තුලද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව කටයුතු කළේය. එමෙන්ම, ඛණිජතෙල් මිලගණන් වල පවතින අධික විචලතාවය තුලින් ඇතිවන අහිතකර බලපෑම අඩුකර ගැනීම සඳහා ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව විසින් ඉදිරි රැකුම් ගිවිසුම් ඇතිකර ගැනීමේදී මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ශ්‍රී ලංකා මහ බැංකුව හා මුදල් කොමිසම ඒකාබද්ධව සංවිධානය කළ "තුළිත ප්‍රදේශීය සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය" සංවිධානය කිරීමේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාශීලීව දායක විය.

අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද කමිටු කිහිපයකටම හා අනෙකුත් අභ්‍යන්තර හා බාහිර කමිටු හා මණ්ඩල සඳහාද දෙපාර්තමේන්තු නිලධාරීන් තම සේවාව ලබාදෙන ලදී. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ඉන්දියාව සමඟ යොජිත විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA) යටතේ වන මූල්‍ය සේවාවන් පිළිබඳ උප මණ්ඩලය සමඟ සාකච්ඡා වට කිහිපයකටද සහභාගි විය. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය (CBS) හා අනෙකුත් දේශීය හා විදේශීය ආයතන විසින් මෙහෙයවන ලද පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයන් ලෙස ද දෙපාර්තමේන්තු නිලධාරීහු සහභාගි වූහ. මහ බැංකුවෙහි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා යොමුවීමට අපේක්ෂිත නිලධාරීන්ගේ පර්යේෂණ කටයුතු වලට සහාය දීමත් ඔවුන් සිදුකළ පර්යේෂණ පත්‍රිකා ඇගැයීමට ලක්කිරීමත් මගින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් තම සේවය අනෙකුත් සහෝදර නිලධාරීන් හට ද ලබාදෙන ලදී. මීට අමතරව, බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය විසින් සංවිධානය කරනු ලැබූ විවිධ අධ්‍යාපනික රූපවාහිනී වැඩසටහන්, විශේෂයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන් සඳහා සංවිධානය කරනු ලැබූ කාලීන මාතෘකා රැගත් වැඩසටහන් සඳහා ද දෙපාර්තමේන්තු නිලධාරීහූ සහභාගි වූහ. තවද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රාජ්‍ය තාන්ත්‍රිකයන්, මාධ්‍යවේදීන්, රාජ්‍ය නිලධාරීන්, ආයෝජකයන්, විදේශීය පාර්ශ්වකරුවන් සහ මහජනතාවගේ දැනුම වර්ධනය කිරීම සඳහා සහ ශ්‍රී ලාංකීය ආර්ථිකය පිළිබඳව ඇති වැරදි මතවාද පැහැදිලි කිරීම සඳහා විවිධ වැඩසටහන් ඉදිරිපත් කරන ලදී.

2007 ඔක්තෝබර් මාසයේදී සාර්ථකව නිමාකළ ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සඳහා දෙපාර්තමේන්තුව විසින් මහඟු දායකත්වයක් ලබාදුනි. විශේෂයෙන්ම, අර්පණ පත්‍රිකාව පිළියෙල කිරීමේදී හා බැඳුම්කර නිකුතුවට සම්බන්ධව ආයෝජකයන් වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව සකස් කිරීමේදීත් දායකත්වය ලබාදෙන ලදී. තවද, එතෙර ආයෝජන ප්‍රවර්ධන කටයුතු මෙහෙය වූ නියෝජිත මණ්ඩලයෙහි සාමාජිකයන් වශයෙන්ද දෙපාර්තමේන්තු නිලධාරීහු කටයුතු කළහ.

මහ බැංකුවේ ව්‍යවස්ථාපිත හා අනෙකුත් විශේෂ වාර්තා භාෂා ත්‍රිත්වයෙන්ම යුතුව පිළියෙල කිරීම හා ප්‍රකාශයට පත්කිරීම තම මූලික වගකීමක් වශයෙන් මෙම වසරේදී ද ඉටුකරන ලදී. ඒ අනුව, 2006 මහ බැංකු වාර්ෂික වාර්තාව, මෑතකාලීන ආර්ථික ප්‍රවනතා - 2007 සුවිශේෂ සිදුවීම් හා 2008 අපේක්ෂාවන් සහ මාසික විවරණිකාවන් ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආයෝජකයන්හට ආර්ථිකයේ නව ප්‍රවනතාවයන් පිළිබඳ අවබෝධය පුළුල් කිරීමේ අරමුණින් "මෑතකාලීන ආර්ථික සංවර්ධනයන් සහ ණය උපනති" යන මැයෙන් වාර්තාවක් ප්‍රසිද්ධියට පත්කරන ලදී. මුදල් නීති පනත යටතේ මහ බැංකුව විසින් රජයේ අයවැය ලේඛනය පිළියෙල කිරීමට පෙර මුදල් අමාත්‍යවරයාට ලබාදිය යුතු රහස්‍ය වාර්තාවක් වන "සැප්තැම්බර් 15 වාර්තාව" පිළියෙල කර බාරදීමද තම වගකීමක් ලෙස ඉටු කළේය. 2007 වසර තුළදී තොරතුරු නිකුත් කිරීම සඳහා වන තම වගකීම ඉටුකරමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මුදල් ප්‍රතිපත්තිය හා ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳව මාසික පදනමක් මත පුවත්පත් නිවේදන නිකුත් කරන ලදී. මීට අමතරව, විවිධ ආර්ථික ගැටළු පිළිබඳව පැහැදිලි කිරීම සඳහා කලින් කලට පුවත්පත් නිවේදනයන් හා ප්‍රකාශයන් ඉදිරිපත් කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුව හා රජය වෙනුවෙන් ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව මෙම වසරේදීත් ඉටුකරන ලදී. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (ජා.මූ.අ.) IV වගන්තිය යටතේ මෙරටට පැමිණි දූත පිරිස, 24 වන අන්තර් රාජ්‍ය කණ්ඩායම (G-24), පර්යේෂණ හා පුහුණුව සඳහා වූ සියැසන් (SEACEN) මධ්‍යස්ථානය, සියැන්සා (SEANZA) කණ්ඩායම වැනි අංශ සහ මහ බැංකුව අතර වැඩකටයුතු සම්බන්ධීකරණය කිරීමද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. ෆිට්ච් රේටින් (Fitch Rating) හා එස්. ඇන්ඩ් පී. රේටින් සර්විසස් (S&P Rating Services) වැනි ස්වාධීන තක්සේරු නියෝජිතායතන සමගද සමීපව කටයුතු කරන ලදී. එසේම, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා අනෙකුත් ජාත්‍යන්තර බහුපාර්ශ්වීය හා ද්විපාර්ශ්වීය සංවර්ධන හවුල්කරුවන් අතර සම්බන්ධීකරණ කටයුතු වලදී මුදල් අමාත්‍යාංශයට අවශ්‍ය සහාය ලබාදීමද සිදුකරනු ලැබීය.

# 8. සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.)

සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් මුදල් මණ්ඩලය වෙත පවරා ඇති බලතල, කාර්යභාරයන් සහ ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ කටයුතු මගින් මනා සහයක් ලබා දෙයි. සාමාජික දායක මුදල් සහ අධිහාර රැස්කිරීම, සාමාජික ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම, පනත මගින් මුදල් මණ්ඩලය හා කම්කරු කොමසාරිස්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේ දී දරන පිරිවැය අරමුදලේ ආදායමින් අයකර ගැනීම, සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම, අරමුදල පිළිබඳව වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙල කිරීම සහ එම ගිණුම් වාර්තා සෑම වසරකම දෙසැම්බර් මස අවසානයේ සිට තෙමසක් ඇතුළත කම්කරු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම වැනි සේවක අර්ථසාධක අරමුදලේ කළමනාකරණය හා බැඳුණු බලතල සහ කාර්යභාරයන් ඉටු කිරීමේ වගකීම, පනත ප්‍රකාරව අරමුදලේ භාරකරු වශයෙන් මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. 2007 වසර තුළ දී ද, සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගින් ඉහත සඳහන් කරන ලද කටයුතු මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තීන්ට අනුකූලව සහ කම්කරු කොමසාරිස් සමග සමීප සම්බන්ධීකරණයකින් යුතුව පවත්වාගෙන යන ලදී.

## 8.1 සාමාජිකත්ව, සාමාජික ශේෂ සහ ප්‍රතිලාභ ගෙවීම්

2007 වසර අවසානයේ දී සේ.අ.අරමුදලෙහි මුළු වටිනාකම (සාමාජිකයන් වෙත වූ මුළු වගකීම) රුපියල් බිලියන 546.4 ක් වූ අතර, එය 2006 වසර අවසානයේ වූ රුපියල් බිලියන 477.6 ට සාපේක්ෂව සියයට 14 කින්, එනම් රුපියල් බිලියන 68.8 කින් ඉහළ ගොස් ඇත (සංඛ්‍යා සටහන II-3 බලන්න). සාමාජික සංඛ්‍යාවේ ඉහළයාම සහ වසර තුළ දී ඔවුන් විසින් ගෙවන ලද දායක මුදල්, අරමුදලේ මෙම වර්ධනයට හේතු විය. මේ වසරේ දී මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 11.9 දක්වා ඉහළ ගිය අතර, ඒවායින් මිලියන 2.1 ක් පමණ වර්තමානයේදී දායක මුදල් ගෙවනු ලබන ගිණුම් වේ. මේ අතර, වසරේ ශුද්ධ දායක මුදල්, එනම් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු ඉතිරිවන ශුද්ධ දායක මුදලෙහි වැඩිවීම රුපියල් බිලියන 18.8 ක් ලෙස වාර්තා වූ අතර, පසුගිය වසරේදී එම අගය රුපියල් බිලියන 17.5 ක් විය. පෙර වසර හා සසඳන කළ, සියයට 24.7 ක වර්ධනයක් පෙන්නුම් කරමින් මේ වසර තුළ දී සාමාජික ප්‍රතිලාභ ගෙවීම්

**සංඛ්‍යා සටහන II-3**

**අරමුදල පිළිබඳ මූලික දත්ත**

| අයිතමය | 2006 | 2007 | ප්‍රතිශත වෙනස්වීම % |
|---|---|---|---|
| 1. මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව '000 | 11,326 | 11,850* | 4.6 |
| 1.1 දැනට දායක මුදල් එවනු ලබන ගිණුම් '000 | 2,073 | 2,147* | 3.5 |
| 1.2 දැනට දායක මුදල් එවනු නොලබන ගිණුම් '000 | 9,252 | 9,703* | 4.9 |
| 2. දායක මුදල එවනු ලබන සේවායෝජකයන් | 57,996 | 60,496 | 4.3 |
| 3. මුළු දායක මුදල (රු. මිලියන) | 34,933 | 40,574 | 16.1 |
| 4. ආපසු ගෙවන ලද මුළු ප්‍රතිලාභ (රු.මිලියන) | 17,448 | 21,752 | 24.7 |
| 5. ප්‍රතිලාභ ලබාදුන් සංඛ්‍යාව | 97,620 | 97,936 | 0.3 |
| 6. සාමාජිකයන් වෙත වූ මුළු වගකීම (රු.බිලියන) | 477.6 | 546.4 | 14.4 |
| 7. අරමුදලේ මුළු වටිනාකම (රු.බිලියන) | 490.4 | 560.4 | 14.3 |
| ඇස්තමේන්තුගත* | | | |

මූලය : සේවක අර්ථ සාධක අරමුදල

වශයෙන් රුපියල් බිලියන 21.7 ක් ගෙවනු ලැබූ අතර, ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව වර්ධනය වී ඇත්තේ ඉතා සුළු වශයෙනි.

## 8.2 අරමුදල් ආයෝජන හා ප්‍රතිලාභ

### අ. ආයෝජන කළඹ

මෙම අරමුදල විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමයක් වන බැවින්, අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තියේ මූලික උපක්‍රමය වන්නේ දිගුකාලීන වර්ධනය සමඟ අරමුදලේ ආරක්ෂාව තහවුරු කිරීමයි. එබැවින්, පසුගිය වසරවලදී මෙන්ම, ආයෝජනයන් සිදුකරන ලද්දේ වඩාත් සුරක්ෂිත සුරැකුම්පත්වලය. 2006 වසර අවසානයේ දී රුපියල් බිලියන 472 ක්ව පැවති ආයෝජන කළඹ, 2007 වසර අවසානය වනවිට රුපියල් බිලියන 535 ක් දක්වා සියයට 13.4 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II-4 බලන්න). පසුගිය වසරේ දි මෙන්ම, සේ.අ.අරමුදලේ ආයෝජන කළඹින් වැඩිම ප්‍රතිශතයක් (සියයට 96.5) රජයේ සුරැකුම්පත්වලින් සමන්විත විය. අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තියට අනුකූලව, සාංගමික ණයකර සහ ව්‍යාපාර කොටස්වල කරන ලද ආයෝජන මුළු ආයෝජන කළඹින් සියයට 2.7 ක් විය. ද්‍රවශීලතාවය පවත්වාගෙන යාමේ අරමුණින්, ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් වැනි (සියයට 0.8) ද්‍රවශීලතාවය වැඩි වත්කම්වල ද සුදුසු ලෙස ආයෝජනයන් සිදු කර ඇත.

**සංඛ්‍යා සටහන II-4**
**ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2006 | | 2007 | |
|---|---|---|---|---|
| | රු.බිලියන | දායකත්වය % | රු.බිලියන | දායකත්වය % |
| භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් | 401.1 | 85.0 | 447.0 | 83.6 |
| රජයේ රුපියල් ණය | 56.1 | 11.9 | 68.9 | 12.9 |
| සාංගමික ණයකර | 7.0 | 1.5 | 7.9 | 1.5 |
| සමාගම් කොටස් | 3.6 | 0.8 | 6.7 | 1.2 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් සහ වෙනත් ආයෝජන | 4.0 | 0.8 | 4.3 | 0.8 |
| **එකතුව** | **471.8** | **100.00** | **534.8** | **100.0** |

මූලය : සේවක අර්ථ සාධක අරමුදල

### ආ. ආදායම

2006 වර්ෂයේදී රුපියල් බිලියන 46.4 ක් වූ මුළු ආයෝජන ආදායම, 2007 වසර තුළ දී රුපියල් බිලියන 59.4ක් දක්වා සියයට 28.1 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II -5 බලන්න). පසුගිය වසරවලදී මෙන්ම, අරමුදලේ ප්‍රධානතම ආදායම් මූලාශ්‍රය වූයේ ක්‍රමක්ෂය ලාභ ද ඇතුළත් වූ පොලී ආදායම්ය. පසුගිය වසරේ දී රුපියල් බිලියන 45.2 ක් වූ පොලී ආදායම, 2007 දී රුපියල් බිලියන 59.3 ක් දක්වා රුපියල් බිලියන 14.1 කින් වර්ධනය විය. වසර 2006 දී ආයෝජන කළඹෙහි පොලී ආදායම් උත්පාදනය කරන වත්කම් මගින් ඉපැයූ සාමාන්‍ය පොලී ආදායම සියයට 11 ක් වූ අතර 2007 වසර තුළ දී වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළයාමේ ප්‍රවණතාවට සමගාමීව, එය සියයට 12.6 ක් දක්වා වර්ධනය විය. කෙසේ වෙතත් ප්‍රාග්ධන

**සංඛ්‍යා සටහන II-5**
**ආයෝජන මගින් ලද ආදායම්**

| ආයෝජන වර්ගය | 2006 | | 2007 | |
|---|---|---|---|---|
| | රු. දශ ලක්ෂ | දායකත්වය % | රු. දශ ලක්ෂ | දායකත්වය % |
| පොලී | 44,104 | 95.1 | 49,885 | 84.0 |
| ලාභාංශ | 120 | 0.3 | 146 | 0.2 |
| ප්‍රාග්ධන ලාභ | 1,017 | 2.1 | 288 | 0.5 |
| ක්‍රමක්ෂය ලාභ (ශුද්ධ) | 1,073 | 2.3 | 8,945 | 15.0 |
| වෙනත් | 77 | 0.2 | 158 | 0.3 |
| **මුළු ආදායම** | **46,391** | **100.0** | **59,422** | **100.0** |

මූලය : සේවක අර්ථ සාධක අරමුදල

ලාභ සහ ලාභාංශ ඔස්සේ කොටස් උපලබ්ධිත ආදායම වසර 2006 දී රුපියල් මිලියන 440 ක් වුවද, 2007 වසර තුළ පැවති අයහපත් වෙළෙඳපොළ තත්ත්වයට අනුකූලව රුපියල් මිලියන 429 දක්වා පහත වැටුණි. එබැවින්, කොටස් ආයෝජන කළඹේ සාමාන්‍යය සැළකූ කළ, 2006 දී සියයට 13 ක් වූ ප්‍රතිලාභ අනුපාතිකය 2007 වසරේදී සියයට 8.3 ක් දක්වා අඩු විය. කෙසේ නමුත්, පසුගිය වසරේ දී සියයට 11.3 ක්ව පැවති ආයෝජන කළඹේ සමස්ථ ප්‍රතිලාභ අනුපාතිකය, 2007 දී සියයට 12.7 ක් එනම් සියයට 1.4 කින් වර්ධනය විය.

### ඇ. වියදම්

2006 දී රුපියල් මිලියන 425 ක් වූ මෙහෙයුම් වියදම්, 2007 වසරේ දී රුපියල් මිලියන 546 ක් දක්වා සියයට 28.5 කින් වර්ධනය වූවද, අරමුදලේ සමස්ථ මෙහෙයුම් වියදම දළ ආදායමින් සියයට 1 කට වඩා අඩු මට්ටමක පවත්වාගෙන යන ලදී (සංඛ්‍යා සටහනII -6 බලන්න).

**සංඛ්‍යා සටහන II-6**
**මෙහෙයුම් වියදම්**

(රු. දශ ලක්ෂ)

| වියදම් අයිතමය | 2006 | 2007 | ප්‍රතිශත වෙනස % |
|---|---|---|---|
| 1. සේවක පිරිවැය | 259.9 | 318.2 | 22.4 |
| 2. පරිපාලන වියදම් | 159.0 | 211.0 | 32.7 |
| 3. මූල්‍ය වියදම් | 6.2 | 16.9 | 172.6 |
| 4. මුළු පිරිවැය | 425.1 | 546.1 | 28.5 |
| 5. මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 0.92 | 0.90 | -0.02 |

මූලය : සේවක අර්ථ සාධක අරමුදල

2007 වසරේ අරමුදලේ සමස්ථ මෙහෙයුම් වියදම (රුපියල් මිලියන 13.1 ක් වූ නැවත ලියාපදිංචි කිරීමේ වියදම් හැර) දළ ආදායමින් සියයට 0.9 ක් වූ අතර, මෙම අගය 2006 දී සියයට 0.92 ක් විය.

## 8.3 සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්

අරමුදලේ සාමාජිකයන්ට පොලිය වශයෙන් ගෙවීම සඳහා 2007 වසරේ දී රුපියල් මිලියන 55,240 ක මුදලක් වෙන් කරන ලදී (සංඛ්‍යා සටහන II -7 බලන්න). ඒ අනුව, සමස්ථ

**සංඛ්‍යා සටහන II-7**
**සාමාජිකයන්ට ගෙවන ලද පොලී**

(රු. දශ ලක්ෂ)

| අයිතමය | 2006 | 2007 | ප්‍රතිශත වෙනස % |
|---|---|---|---|
| 1. දළ ආදායම | 46,391 | 59,422 | 28.1 |
| 2. මුළු මෙහෙයුම් වියදම් | 425 | 546 | 28.5 |
| 3. ආදායම් බදු | 2,761 | 4,451 | 61.2 |
| 4. බෙදාහැරීම සඳහා ඇති ශුද්ධ ආදායම | 47,710 | 54,612 | 14.5 |
| 5. බෙදාහැරීම | | | |
| 5.1 සංචිතවලට මාරුකර හැරීම | 3,100 | - | - |
| 5.2 වසර තුළ ප්‍රතිලාභ ගෙවීම මත ගෙවන ලද පොලී | 622 | 879 | 41.3 |
| 5.3 සාමාජික ශේෂ සඳහා ගෙවන ලද පොලී | 43,786 | 53,515 | 26.2 |
| 5.4 ඉදිරියට ගෙන යන ලද ශේෂය | 201 | 218 | 8.1 |
| 6. සාමාජික ශේෂවලට සංචිත වලින් ගෙවන ලද පොලී | - | 1,725 | - |
| 7. සාමාජික ශේෂ මත ගෙවන ලද පොලී ප්‍රතිශතය | 10.1 | 11.20 | 1.10 |

මූලය : සේවක අර්ථ සාධක අරමුදල

සාමාජික ශේෂය (2007 වර්ෂාවසානයේ දී රුපියල් මිලියන 493,211) මත සියයට 11.2 ක පොලී අනුපාතිකයක් ගෙවන ලද අතර, මෙය පසුගිය වසරේ සියයට 10.1 ක් වශයෙන් තිබූ පොලී අනුපාතිකයට වඩා සියයට 1.1 ක වැඩි අගයකි. කෙසේ වෙතත්, වර්ෂාවසානයේ ඇති සාමාජික ශේෂය මත පොලී අනුපාතිකය ගෙවීමේ ක්‍රියාපටිපාටියට අනුව, මෙමගින් 2007 වසර සඳහා සියයට 11.40 ක සඵල පොලී අනුපාතිකයක් ලබා දීමට ඇස්තමේන්තු කර ඇත.

සාමාන්‍යයක් වශයෙන් ගත් කළ, පසුගිය දශකයක කාලය තුළ දී සාමාජික ගිණුම් සඳහා සියයට 1.25 ක මූර්ත පොලී අනුපාතිකයක් (එනම් සාමාන්‍ය සඵල පොලී අනුපාතිකය[1] - අදාළ කාලපරිච්ඡේදය තුළ දී රටේ පවතින උද්ධමන අනුපාතිකය) ලබා දී ඇත.

## 8.4 සාමාජික ගිණුම් ප්‍රකාශන

2006 වසරේ දෙවන අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ අදාළ සාමාජිකයන් වෙත ඔවුන්ගේ සේවායෝජකයන් හරහා 2007 සැප්තැම්බර් මාසය තුළ දී නිකුත් කරන ලදී. 2007 වසරේ පළමු අර්ධ වාර්ෂිකයට අදාළ ගිණුම් ප්‍රකාශ, 2008 ජූනි මස අවසන් වීමට පෙර සාමාජිකයන් වෙත ලබාදීමට කටයුතු පිළියෙල කර ඇත.

## 8.5 නිවාස ණය පහසුකම

1998 දී හඳුන්වා දෙනු ලැබූ නිවාස ණය ක්‍රමය මෙම වසර තුළ දී ද ක්‍රියාත්මක කෙරුණි. මේ අනුව සේ.අ. අරමුදල මගින් සිය සාමාජිකයන් වෙනුවෙන් රුපියල් මිලියන 2,872 ක නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජික ශේෂ සහතිකපත් 12,969 ක් ණය දෙන ආයතන සඳහා නිකුත් කරන ලදී (සංඛ්‍යා සටහන II-8 බලන්න). මේ අතර ණය ආපසු ගෙවීම පැහැර හැරීමේ ප්‍රතිශතය ඉහළයෑම හේතුවෙන්, 2006 වසරේ දී ගෙවීම පැහැර හරිනල ලද රුපියල් මිලියන 1,078 ක ණය අදාළ සාමාජික ගිණුම් වලින් අඩුකර 2007 වසරේ ද ණය සහ නොගෙවූ පොලී මුදල් පියවීම වෙනුවෙන් ණය දුන් ආයතන වෙත ලබාදෙන ලදී.

**සංඛ්‍යා සටහන II-8**
**සේ.අ.අ සාමාජිකයන් සඳහා ඇති නිවාස ණය පහසුකම**

(රු. දශ ලක්ෂ)

| වසර | නිකුත් කරන ලද සාමාජික ශේෂ සහතිකපත් | අනුමත කරන ලද නිවාස ණය ප්‍රමාණය | පැහැර හරින ලද ණය වෙනුවෙන් සේ.අ.අ ගෙවූ ප්‍රමාණය |
|---|---|---|---|
| 2003 | 18,689 | 2,792 | 670 |
| 2004 | 14,307 | 2,452 | 735 |
| 2005 | 14,600 | 2,766 | 900 |
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |

මූලය : සේවක අර්ථ සාධක අරමුදල

## 8.6 මහජනතාව දැනුවත් කිරීම

මෙම වසර තුළ දී ද, සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගින් අරමුදල සම්බන්ධයෙන් මහජනතාවගේ දැනුවත් කිරීමේ කටයුතු ක්‍රියාවට නගන ලදී. මේ අනුව, ජංගම සේවා දෙකක් (රත්මලානේ ජලප්‍රවාහන මණ්ඩලයේ සහ මීගමුව ප්‍රදේශයේ හෝටල් සේවකයන් සඳහා) සහ සම්මන්ත්‍රණ දෙකක් (නුවරඑළිය හා කෑගල්ල) පවත්වන ලද අතර, ප්‍රදර්ශන 02 ක් (දැයට කිරුළ, නුවරඑළිය) හා පුද්ගල කළමනාකරණ ආයතනය මගින් සංවිධානය කරන ලද බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති මානව සම්පත් කළමනාකරුවන්ගේ සමුළුව සඳහා ද දායකත්වය ලබා දෙන ලදී. මේ අතර, අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම, නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය හා අරමුදලේ වාර්ෂික ගිණුම් වාර්තා පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අදාළ පුවත්පත් දැන්වීම් ද පළ කරන ලදී.

## 8.7 පද්ධති නවීකරණය

ගිණුම්කරණය, ආයෝජනය, භාණ්ඩ මිලදී ගැනීම් හා ද්‍රව්‍ය කළමනාකරණය මෙන්ම, අයවැය සහ අයවැය පාලනය සඳහා 2006 වසරේදී දෙපාර්තමේන්තුවට හඳුන්වා දුන් ආයෝජන මෘදුකාංගයන්හි (SAP) වැඩි දියුණු කිරීම් 2007 වසර තුළදී ද සිදු කෙරිණි. මෙම මෘදුකාංග 2007 වසර තුළ දී ද භාවිතයේ යෙදුණි. මෙයට අමතරව ජාතික හැඳුනුම්පතේ සඳහන්ව ඇති නමින් සාමාජිකයන් නැවත ලියාපදිංචි කර, ජාතික හැඳුනුම්පත් අංකය ඔවුන්ගේ සාමාජික අංකය වශයෙන් ලබාදීමටත්, ඒ අනුව ඔවුන්ගේ පෙර සාමාජික ගිණුම් පැවතියේ නම් ඒවා ඒකාබද්ධ කිරීම සඳහාත් සේ.අ.අ. දෙපාර්තමේන්තුව සහ කම්කරු දෙපාර්තමේන්තුව එක්ව 2007 ඔක්තෝබර් මස සිට

[1] සඵල පොලී අනුපාතිකය = සාමාජිකයන්ට ගෙවන ලද පොලී මුදල / [(වසර ආරම්භයේ සාමාජික ශේෂය + වසර අවසානයේ සාමාජික ශේෂය)/2]

ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, 2008 වසර අවසානය වනවිට දැනට පවත්නා සේවා යෝජකයන් කේන්ද්‍ර කොට ක්‍රියාත්මක වන ක්‍රමය සාමාජිකයන් කේන්ද්‍ර කරගත් ක්‍රමයක් (එනම් සාමාජිකයන්ට අනන්‍ය වූ අංකයක් ලබාදීම ඔස්සේ ක්‍රියාත්මක වන ක්‍රමයක්) බවට පරිවර්තනය කිරීමයි. සාමාජිකයින්ට වඩාත් උසස් සේවාවක් ලබාදීමේ අපේක්ෂාව ඇතිව සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගින් ලබා දී පැවති උපකාරක සේවාව සහ විමසීම් කවුළුව සඳහා යොදවා තිබූ මානව සම්පත් යටිතල පහසුකම් තවදුරටත් පුළුල් කරන ලදී. දෙපාර්තමේන්තුව මගින් විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සාමාජික දායක මුදල් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ පහසුව වැඩිදුරටත් ප්‍රචලිත කිරීමේ කටයුතු 2007 වසර තුළදී ද ක්‍රියාවට නගන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම ක්‍රමයට නව සේවායෝජකයන් 76 දෙනෙකු එක් වූ අතර, 2006 වසරේ දී ජාලය හා සම්බන්ධ වී සිටි සේවා යෝජකයන් 264, 2007 දී 340 ක් දක්වා වර්ධනය විය.

## 9. විනිමය පාලන

1953 අංක 24 දරන විනිමය පාලන පනත (සංශෝධිත) යටතේ රජයේ නියෝජිතවරයා වශයෙන් මහ බැංකුවට පවරන ලද විනිමය පාලන කටයුතු සම්බන්ධ කාර්යභාරයන් විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබයි. ඒ අනුව, 2007 වර්ෂය තුළදී විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වශයෙන් වූ, බලයලත් වෙළෙඳුන්ට හා අනෙකුත් අයට නියෝගයන්/මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම, විදේශ විනිමය ගනුදෙනු සඳහා අනුමැතිය ලබාදීම, විවිධාකාර වූ විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ පරීක්ෂා කිරීම හා විනිමය පාලන පනතේ වගන්ති උල්ලංඝනය කිරීම් හා සම්බන්ධ පරීක්ෂණ කටයුතු මෙහෙයවීම සිදුකරනු ලැබීය.

### 9.1 නව නියෝගයන්/මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම

2007 වර්ෂය තුළදී විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් බලයලත් වෙළෙඳුන්ට (බලපත්‍රලාභී වාණිජ බැංකු) සහ අනෙකුත් පාර්ශ්වයන්ට නව නියෝගයන්/මෙහෙයුම් උපදෙස් කිහිපයක් නිකුත් කරන ලදී. එසේ නිකුත් කරන ලද නියෝගයන්/මෙහෙයුම් උපදෙස්වල සාරාංශයක් පහත දැක්වේ. මෙම නියෝගයන්/මෙහෙයුම් උපදෙස්වල සවිස්තරාත්මක තොරතුරු මෙම වාර්තාවේ III වන කොටසින් දැක් වේ.

**(අ) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC) වලට මුදල් තැන්පත් කිරීම සඳහා තුන්වන පාර්ශ්වයට අනුමැතිය ලබාදීම:**

බලයලත් වෙළෙඳුන්ට හා අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම් පවත්වාගෙන යාමට බලය දී ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම් වලට තුන්වැනි පාර්ශ්වයෙන් තැන්පතු භාරගැනීමට අවසර ලබාදුන් අතර, එම ගිණුම් හිමියන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන්ගෙන් එක් ගනුදෙනුවකදී ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 1,000 ක් හෝ වෙනත් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඒ හා සමාන වූ අගයක සීමාවකට යටත්ව තැන්පතු භාරගත හැක. බැංකු හරහා සිදුකරන ආමුඛ ප්‍රේෂණ කටයුතු ප්‍රවර්ධනය සඳහා මෙම පහසුකම හඳුන්වා දෙන ලදී.

**(ආ) ද්විත්ව පුරවැසිභාවය සඳහා අයදුම්කරන්නන්ට ස්ථාවර තැන්පතු:**

අවුරුදු 3 ක අවම කාලයකට යටත්ව ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 50,000 ක් හෝ ඒ හා සමාන වෙනත් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ද්විත්ව පුරවැසිභාවයට අයදුම්කරන්නකු සඳහා ස්ථාවර තැන්පතු ගිණුමක් ආරම්භ කිරීමට බලයලත් වෙළෙඳුන්හට අවසර ලබාදී ඇති අතර, ඒ වෙනුවෙන්, එකී ද්විත්ව පුරවැසිලාභියාගේ පවුලේ සාමාජිකයන්හට ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීමේදී රජයට කළයුතු ගෙවීම් වලින් නිදහස් වීමේ වරප්‍රසාදය හිමි වේ.

**(ඇ) සංචාරක දීමනාවල අඩංගු විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය වැඩිකිරීම:**

විදේශ සංචාර සඳහා යන ශ්‍රී ලාංකිකයින් ඇතැම් විදේශ රටවලදී සංචාරක චෙක්පත් මුදල් කරගැනීමේදී මුහුණ දෙන දුෂ්කරතා මඟහැර එම කටයුතු පහසු කරලීම සඳහා, සංචාරක දීමනාවල කොටසක් ලෙස විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 500 සිට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 1,000 දක්වා වැඩිකරන ලදී.

**(ඈ) මුදල් හුවමාරු කරන්නන් විසින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම:**

විදේශ සංචාර සඳහා යන ශ්‍රී ලාංකිකයින්ට එක් ගනුදෙනුවකදී ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 1,000 ක් හෝ වෙනත් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඒ හා සමාන වූ අගයක සීමාවකට යටත්ව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීමට, ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 4 බැගින් අවම වාර්ෂික පිරිවැටුම සපුරන ලද මුදල් හුවමාරුකරන්නන් නව දෙනෙක් සඳහා අවසර ලබාදෙන ලදී.

**(ඉ) රුපියල් වලින් මිල කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනයන් සඳහා අනුමැතිය ලබාදීම :**

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කළ විදේශ රටවල අරමුදල්, ප්‍රාදේශීය අරමුදල් හා සහයෝගිතා අරමුදල්, ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කළ ආයතන සහ විදේශ රටවල පුරවැසියන්ට, යම් අවස්ථාවක නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල මුළු වටිනාකමින් සියයට 10 ක් නොඉක්මවන පරිදි, රුපියල් වලින් මිල කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවසර ලබාදෙන ලදී.

**(ඊ) ශ්‍රී ලංකා රේගුවට විදේශ ව්‍යවහාර මුදල් සීමාවන් පිළිබඳ ප්‍රකාශ කළයුතු සීමාව:**

- යම් පුද්ගලයෙකු ශ්‍රී ලංකාවට රැගෙන එන විදේශ ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ කළයුතු සීමාව ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 10,000 සිට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 15,000 ක් හෝ වෙනත් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඒ හා සමාන වූ අගයක් දක්වා වැඩිකරන ලදී.

- යම් පුද්ගලයෙක් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 5000 ඉක්මවන ප්‍රමාණයක් රටට ගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් නැවතත් රටින් පිටට ගෙනයාමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා ඔහු ලංකාවට පැමිණෙන විටදී රැගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු සියල්ල පිළිබඳව ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශයක් කර තිබීම අත්‍යාවශ්‍ය වේ.
- ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකුට, ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ නොකොට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 10,000ක් හෝ වෙනත් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඒ හා සමාන විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් රටින් පිටතට රැගෙන යා හැක. කෙසේ වෙතත්, ඔහු/ඇය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 5,000 හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඒ හා සමාන අගයකට වැඩි ප්‍රමාණයක් මුදල් නෝට්ටු වශයෙන් ලංකාවෙන් පිටතට රැගෙන යන්නේ නම්, ඒ පිළිබඳව ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශයක් කළයුතුය.

**(උ) නේවාසික ආගන්තුකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්:**

නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමය යටතේ වීසා බලපත්‍ර හිමි, විදේශිකයන් හට නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RGFCA) සහ නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් (RGRCA) යන නව ගිණුම් වර්ග 2 ක හඳුන්වා දෙන ලදී. පළමු ගිණුම (RGFCA) ආයෝජකයින් මෙරටට ආයෝජන අරමුදල් රැගෙන ඒමේ ප්‍රධාන ක්‍රමයක් ලෙස හඳුන්වා දෙන ලද අතර, දෙවන ගිණුම (RGRCA) එසේ පැමිණෙන නේවාසික ආගන්තුකයින්ගේ පවුලේ නඩත්තුව සඳහා ඔවුන් මෙරටට රැගෙන එන මුදල්වලින් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ගේ විය පැහැදම් දැරීම සඳහා හඳුන්වා දෙන ලදී.

## 9.2 විදේශයන්හි ආයෝජනය හා විදේශයන්ගෙන් ණය ලබාගැනීම සඳහා අනුමැතිය

විදේශයන්හි ආයෝජනයට හා විදේශීය ණය ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීම් අතුරින්, විනිමය පාලන පනතේ අදාළ වගන්තිවලට අනුකූලව පහත දැක්වෙන ඉල්ලීම් 47 සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අවසර ලබාදෙන ලදී.

(අ) නේවාසික සමාගම් 30 කට ප්‍රධාන වශයෙන් හෝටල් හා සංචාරක කර්මාන්තය, මුදල් හුවමාරු ආයතන (Exchange Houses) ස්ථාපිත කිරීම, භාණ්ඩ නැව්ගත කිරීම සහ සේවක කොටස් මනාප යෝජනා ක්‍රම යන ක්ෂේත්‍රයන්හි විදේශ රටවල ආයෝජනය සඳහා අවසර ලබාදෙන ලදී. එසේ අවසර ලබාදෙන ලද ආයෝජනයන්ගේ සම්පූර්ණ වටිනාකම ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 145.1 ක් විය.

(ආ) නේවාසික සමාගම් 17 ක් සඳහා දළ වශයෙන් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 126.1 ක ප්‍රමාණයක විදේශීය ණය මුදල් ලබාගැනීම සඳහා අවසර ලබාදෙන ලදී.

## 9.3 භාණ්ඩ නැව්ගත කරන්නන්, මුදල් මාරුකරන්නන් හා සීමිත බලයලත් වෙළෙඳුන්හට (Restricted Dealers) බලපත්‍ර නිකුත් කිරීම

පහත දැක්වෙන පරිදි භාණ්ඩ නැව්ගත කරන්නන්, මුදල් මාරුකරන්නන් හා සීමිත බලයලත් වෙළෙඳුන්හට (Restricted Dealers) බලපත්‍ර නිකුත් කිරීම විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී.

(අ) නව සමාගම් 38 ක් භාණ්ඩ නැව්ගත කරන්නන් ලෙස ලියාපදිංචි වූ අතර එමගින් 2007 වර්ෂය අවසානය වන විට භාණ්ඩ නැව්ගත කරන්නන් ලෙස ලියාපදිංචි වූ සමාගම්වල එකතුව 248 ක් විය.

(ආ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගම් දෙකකට මුදල් හුවමාරු කරන්නන් ලෙස කටයුතු කිරීම සඳහා බලපත්‍ර නිකුත් කළ අතර, එමගින් මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ නියුතු අවසරලත් සමාගම් ගණන 66 දක්වා ඉහළ යන ලදී. මුදල් හුවමාරු කරන්නන්ගේ බලපත්‍ර අළුත් කරගැනීමේ සුදුසුකම සපුරාලීම සඳහා අවශ්‍ය අවම වාර්ෂික පිරිවැටුම ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 120,000 සිට 600,000 දක්වා වැඩිකරන ලදී.

(ඇ) මෙම වර්ෂය තුළදී, තීරු බදු රහිත සාප්පු, සංචාරක හෝටල්, සංචාරක නියෝජිතයන් සහ මැණික් හා ස්වර්ණාභරණ සාප්පු ආදී වෙනත් සීමිත බලයලත් වෙළෙඳුන් (Other Restricted Dealers) 49 කට නව බලපත්‍ර ලබාදීම තුළින් සීමිත බලයලත් වෙළෙඳුන් සංඛ්‍යාව 3,398 දක්වා ඉහළ යන ලදී.

## 9.4 විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධ මෙහෙයුම් කටයුතු

අදාළ පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද කාලීන වාර්තා අනුව, ඔවුන් විසින් එකී කාර්යයන් විනිමය පාලන පනතේ වගන්තිවලට අනුකූලව සිදුකිරීම තවදුරටත් වර්ධනය කිරීම පිණිස විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධ මෙහෙයුම් කටයුතු පහත දැක්වෙන පරිදි තවදුරටත් ශක්තිමත්ව පවත්වාගෙන යන ලදී.

(අ) බලයලත් වෙළෙඳුන්, අනුමත සංචාරක නියෝජිතයින් සහ මුදල් මාරුකරන්නන් විසින් විදේශ ව්‍යවහාර මුදල් විකිණීම හා මිළදීගැනීම පිළිබඳ මාර්ගගත (On - Line), විද්‍යුත් ආකෘති (e-format) හා "පෝර්ම 1"(විදේශ විනිමය විකිණීම පිළිබඳ වාර්තා) හා "පෝර්ම 2"(විදේශ විනිමය මිළදී ගැනීම පිළිබඳ වාර්තා) වල මුද්‍රිත පිටපත් (Hard copies) මගින් එවනු ලබන කාලීන වාර්තා තුළින් විදේශ විනිමය ගනුදෙනු මෙහෙයවීම සිදුකරන ලදී. 2007 දී විද්‍යුත් ආකෘති (e-format) ක්‍රමය හඳුන්වා දීමත් සමගම කාර්යක්ෂම

දත්ත ලබාගැනීමක් සඳහා 100% ක් මාර්ගගතව (On - Line) තොරතුරු ලබාගැනීමට විනිමය පාලන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.

(ආ) මුදල් හුවමාරු කරන්නන් විසින් විදේශ විනිමය ගනුදෙනු වාර්තා කිරීම වර්ධනය කිරීම සඳහා මෘදුකාංග පැකේජයක් ස්ථාපිත කිරීම.

(ඇ) අනුමත නොවූ ප්‍රාග්ධන සංක්‍රාම, ත්‍රස්තවාදී ක්‍රියා මූල්‍යනය කිරීම සම්බන්ධයෙන් වූ අරමුදල් හෝ මුදල් විශුද්ධිකරණ කටයුතු අනාවරණය කරගැනීම පිණිස විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් (EFTCs) හරහා සිදුකරනු ලබන ගනුදෙනු මෙහෙයවීම.

(ඈ) අපනයන මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය සහ ප්‍රතිචාර වැඩිදියුණු කිරීම පිණිස විද්‍යුත් තැපැල් (e-mail) වාර්තා කිරීමේ පහසුකම අපනයනකරුවන්හට හඳුන්වාදීම.

(ඉ) මාර්ගගතව (On -Line) කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුම් (SIERA) සහ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුම්වල (TIERA) කටයුතු මෙහෙයවීම.

### 9.5 විනිමය පාලන ආඥා පනතේ වගන්ති උල්ලංඝනයවීම් සම්බන්ධ විමර්ශන කටයුතු

පසුගිය වර්ෂවලදී මෙන්ම, 2007 වර්ෂය තුළදීද විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයක් වූයේ බලයලත් වෙළෙඳුන්, තනි පුද්ගලයින් හා සංස්ථාපිත සමාගම් විසින් විනිමය පාලන ආඥා පනතේ ප්‍රතිපාදන උල්ලංඝනය කිරීම් සම්බන්ධ අවස්ථා විමර්ශනයට භාජනය කිරීමයි.

2007 වර්ෂයේදී විමර්ශන කටයුතු 110 කට ආසන්න ප්‍රමාණයක් සිදුකරන ලදී. මෙම වර්ෂය තුළදී අවසන් කරන ලද, විමර්ශනයන් 46 ක් සඳහා රුපියල් මිලියන 14.0 ක ප්‍රමාණයක් දඩ මුදල් වශයෙන්, එකී පාර්ශ්වයන්ගෙන් අයකරගන්නා ලදී. දේශීය සමාගම් විසින් කරන ලද අවසර නොලත් අරමුදල් සංක්‍රාම, අනේවාසිකයන් වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදල් පවත්වාගැනීම, පූර්ව අනුමැතියකින් තොරව විදේශ ණය මුදල් ලබාගැනීම සහ පූර්ව අනුමැතියකින් තොරව විදේශ සමාගම්වල ස්කන්ධ ප්‍රාග්ධනයෙහි ආයෝජනය යන ක්ෂේත්‍රයන් තුළ මෙකී උල්ලංඝනය වීම් හඳුනාගන්නා ලදී.

### 9.6 වෙනත් ක්‍රියාකාරකම්

වෙනත් රටවලට විගමනය වූ ශ්‍රී ලාංකිකයින් විසින් සිදුකරනු ලබන ප්‍රේෂණ කටයුතු බැංකු සහ වෙනත් නිත්‍යානුකූල අංශයන් හරහා යොමුවීම වර්ධනය කිරීමට විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් උත්සාහ කරන ලදී. ඒ අනුව මාතලේ සහ මාදම්පේ යන නගරවලදී වාණිජ බැංකු නිලධාරීන් සහ විදේශ රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ පවුලේ සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් පවත්වන ලදී. තවද, වෙනත් රටවලට විගමනය වූ ශ්‍රී ලාංකික සේවකයින් විසින් සිදුකරනු ලබන ප්‍රේෂණ වර්ධනය කිරීමේ උපාය මාර්ග වැඩිදියුණු කිරීම සහ නීත්‍යානුකූල නොවන මාර්ගවලින් සිදුකෙරෙන මුදල් ප්‍රේෂණ අධෛර්යමත් කිරීම සඳහා වාණිජ බැංකු හා විශේෂිත බැංකුවල නිලධාරීන්ට සහ බලපත්‍රලාභී විදේශීය රැකියා නියෝජිතයන්ගේ සංගමයේ නිලධාරීන්ට රැස්වීම් මාලාවක් පවත්වන ලදී.

## 10. මූල්‍ය බුද්ධි ඒකකය

අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි මහ බැංකුවේ තවත් අංශයක් ලෙස මූල්‍ය බුද්ධි ඒකකය 2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ 2006 මාර්තු මස ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ස්ථාපනය කරන ලදී. මූල්‍ය බුද්ධි ඒකකය ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවක් ලෙස 2007 පෙබරවාරි මස සිට ප්‍රතිසංවිධානය කලේ එහි කටයුතු වැඩිදියුණු කිරීමට හා ව්‍යවස්ථාපිතව ඉටුකළ යුතු කාර්යයන්, මහ බැංකුවෙහි ප්‍රතිපත්ති සැකසීමේ හා නියාමන කිරීමේ හැකියාවන් යොදාගනිමින් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහාය. මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන කාර්යයන් වන්නේ, මුදල් ගනුදෙනුවලට හා පනතේ දක්වා ඇති නිත්‍යානුකූල නොවන කටයුතු සම්බන්ධ තොරතුරු ලබාගැනීම හා එක්රැස්කිරීම, එවන් තොරතුරු පදනම් කරගෙන සැක කටයුතු ක්‍රියාකාරකම් හඳුනාගැනීමට අදාළ විමර්ශණ පැවැත්වීම, එවන් තොරතුරු හා විමර්ශණ වල විස්තර සැක කටයුතු පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා සහ එවන් පාර්ශ්වයන් මූල්‍ය ක්‍රමය යොදාගනිමින් නීති විරෝධී කටයුතුවල නිරතවීම වැළැක්වීමට උපකාර වන ලෙස නීතිමය බලාධිකාරී ආයතනවලට හා අදාළ නියාමන අධිකාරීන්ට ලබාදීමයි. 2007 වර්ෂය තුළදී මූල්‍ය බුද්ධි ඒකකයෙහි මෙහෙයුම් ප්‍රධාන වශයෙන් ත්‍රස්තවාදී කටයුතු වලට මුදල් ගලායාම වැළැක්වීමට හා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා යොමු කෙරුණි.

### 10.1 තොරතුරු රැස්කිරීම සහ විමර්ශණය

මූල්‍ය බුද්ධි ඒකකය විසින් පනවන ලද රෙගුලාසිවලට අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් විසින් රු.500,000/- ට හෝ ඊට සමාන විදෙස් මුදල් වල අගයට වැඩි මුදල් ගනුදෙනු හා විද්‍යුත් මුදල් පැවරුම් අඛණ්ඩව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළයුතු අතර, මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට සම්බන්ධිත යැයි සැක කරනු ලබන ගනුදෙනුද වාර්තා කළයුතු වේ. 2007 වසර අවසාන වන විටදී මූල්‍ය බුද්ධි ඒකකය සතු දත්ත ගබඩාවේ මූල්‍ය ආයතන විසින් මෙසේ වාර්තා කරන ලද මිලියන 3 ක පමණ ගනුදෙනු වාර්තා පැවැතිණ. ඒ අනුව මූල්‍ය ආයතන වල මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට සම්බන්ධ ගනුදෙනු හඳුනාගනු ලැබීම සඳහා මූල්‍ය ගනුදෙනු වලට අදාළ මූලික විශ්ලේෂණ කිරීම් සහ පරීක්ෂණ රාශියක් මූල්‍ය බුද්ධි ඒකකය විසින් අඛණ්ඩව සිදු කෙරුණි. ඊට අමතරව 2006 හා 2007 වසර තුළදී අත්හිටුවන ලද ගිණුම් වලට සම්බන්ධ සැකසහිත බැංකු ගනුදෙනු පිළිබඳව නීති බලාත්මක අධිකාරීන් මගින් කරනු ලබන පරීක්ෂණ තවදුරටත් කරගෙන යන ලදී. මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම පිළිබඳව පරීක්ෂණ වලට අදාළ තොරතුරු සැපයීම මගින් මූල්‍ය බුද්ධි ඒකකය තවදුරටත් දේශීය හා විදේශීය ආයතන රැසකටද සහාය විය.

## 10.2 රෙගුලාසි සහ නියෝග නිකුත් කිරීම

පහත සඳහන් රෙගුලාසි සහ නියෝග මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත්කර ඇති අතර ඒ පිළිබඳ විස්තර මෙම වාර්තාවේ තුන්වන කොටසෙහි දැක්වේ.

(I) බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ලියාපදිංචි මූල්‍ය සමාගම් සහ සුරැකුම්පත් ක්ෂේත්‍රය සඳහා වූ, ගණුදෙනුකරුවන් හඳුනාගැනීම පිළිබඳ සහ ගණුදෙනුකරු පිළිබඳ නිසි සුපරීක්ෂාකාරී බව, පිළිබඳ නියමයන්.

මෙම නියමයන්ට අනුව මූල්‍ය ආයතන ඔවුන්ගේ ගනුදෙනුකරුවන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සහ ඔවුන්ගේ මුදල් ගනුදෙනුවල ප්‍රභවයන් සහ ස්වභාවය පිළිබඳව තොරතුරු දැන සිටිය යුතු වේ. රක්ෂණ ක්ෂේත්‍රයේ සහ මුදල් හුවමාරු කිරීම් සේවාවේ යෙදී සිටින ආයතන සඳහාද නියමයන් මේ වන විටත් කෙටුම්පත් කර ඇත.

(II) ළමුන්ට එරෙහිව සිදුවන අපයෝජනයන් මැඩපැවැත්වීම සඳහා ළමයින් අයුතු ලෙස යොදාගන්නා අන්තර්ජාල අඩවි වලට අනුබද්ධිත විද්‍යුත් ගෙවීම් කිරීම වැළැක්වීමට ගනුදෙනුකරුවන් හඳුනාගැනීම/ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි සුපරීක්ෂාකාරී වීමට අදාල අතිරේක ක්‍රමෝපායන් ස්ථාපිත කිරීමට බැංකු වලට නියෝගයන් නිකුත් කරන ලදී. එමෙන්ම ළමුන්ට එරෙහිව සිදුවන අපයෝජන වලට සම්බන්ධිත ගනුදෙනුකරුවන්, ගනුදෙනු හෝ ව්‍යාපාරිකයන් පිළිබඳව සැක කටයුතු ගනුදෙනු වාර්තා කරන ලෙසට ද බැංකු වලින් ඉල්ලා සිටින ලදී.

(III) මේ අතර, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම වඩා ශක්තිමත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් වෙත නියෝගයන් කිහිපයක්ම නිකුත් කර තිබේ. විද්‍යුත් මුදල් ගණුදෙනු පැවරුම් වාර්තා කිරීම සහ කාලීන වාර්තා සැපයීම ඒවායින් සමහරකි.

## 10.3 වෙනත් ක්‍රියාකාරකම්

වසර තුළදී මූල්‍ය බුද්ධි ඒකකයෙහි කාර්යයන් සහ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් වල ද නිරත විය.

**(I) මැලේසියානු මහ බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.**

සැක කටයුතු ගනුදෙනු වලට අදාළ තොරතුරු හුවමාරු කරගැනීමට අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම අවශ්‍ය වන්නේ ජාත්‍යන්තරව සංවිධානය වූ පාර්ශ්වයන් හා ත්‍රස්තවාදී සංවිධාන දේශ සීමා හරහා මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී කටයුතු වලට මුදල් සැපයීම සිදුකරන බැවිනි. මෙය, එවන් ගනුදෙනු සඳහා මූල්‍ය ක්‍රමය යොදාගැනීම වැළැක්වීමට ඒකාබද්ධව, සහ සහයෝගයෙන් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය වේ. ඉදිරියේදී අනෙකුත් විදේශ රාජ්‍යයන් සමඟද මෙවන් අවබෝධතා ගිවිසුම් ඇතිකරගැනීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

**(II) විවිධ රැස්වීම් පැවැත්වීම**

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ පියවරයන් තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලියාපදිංචි මූල්‍ය ආයතන වල අනුකූලතා නිලධාරීන් සමඟ රැස්වීම් මාලාවක් පවත්වන ලදී. තවද, මූල්‍ය බුද්ධි ඒකකයේ කාර්යයන් වැඩිදියුණු කිරීම හා සහයෝගිතාව වර්ධනය කරගැනීම පිණිස ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන බලාධිකාරීන් සහ එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, මුදල් විශුද්ධිකරණය පිළිබඳව වූ ආසියා ශාන්තිකර කණ්ඩායම හා පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය යන විදේශ කණ්ඩායම් සමඟද රැස්වීම් පවත්වන ලදී.

**(III)** පවත්නා නීති සමාලෝචනය/ ප්‍රතිශෝධනය කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ කමිටුවක් පිහිටුවන ලද අතර එය නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති දෙපාර්තමේන්තුව හා මූල්‍ය බුද්ධි ඒකකයේ සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

**(IV)** හැකියාවන් වර්ධනය කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන්

2007 වසරේදී මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් වැළැක්වීමේ වැඩමුළු කිහිපයක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මින් සමහරක් මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ සංගමය, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ලෝක බැංකුව, පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කණ්ඩායම සමඟ එක්ව මූල්‍ය ආයතන, නීතිය ක්‍රියත්මක කරන ආයතන සහ යුක්තිය පසිඳිලන ආයතන වෙනුවෙන් සංවිධානය කරන ලදී. තවද, 2007 ඔක්තෝබර් මසදී කොළඹ දී අන්තර්ජාතික සබඳතා සහ උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳව වූ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය විසින් සංවිධානය කළ සමුළුව සඳහාද මූල්‍ය බුද්ධි ඒකකය සිය අනුග්‍රහය දක්වන ලදී. මෙයට අමතරව දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් බැංකු ඇතුළු මූල්‍ය ආයතන සහ අධ්‍යාපනික ආයතන උදෙසාද බස්නාහිර, මධ්‍යම, උතුරු මැද සහ දකුණු පළාත් වල ප්‍රසිද්ධ දේශනද පවත්වන ලදී. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් වල කොටසක් ලෙස පුවත්පත් දැන්වීම් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පළකරන ලදී. නිත්‍යානුකූල නොවන මුදල් ගනුදෙනු තුළින් මහජනතාවට හා ජාතික යහපතට, විශේෂයෙන්ම රටේ ආරක්ෂාවට ඇතිවිය හැකි තර්ජන පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම වැඩ සටහන්වල අරමුණ විය.

## 11. මූල්‍ය පද්ධති ස්ථායීතාව

මහ බැංකුවේ මූලික අරමුණුවලින් එකක් වූ මූල්‍ය පද්ධති ස්ථායීතාවය පවත්වාගෙන යාම සඳහා 2007 ජනවාරි මාසයේ දී මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතභාවය සහ මූල්‍ය ස්ථායීතාවන්ට එල්ලවිය හැකි තර්ජන හඳුනාගැනීම සහ ඒවා පහත දැමීම යන කාර්යයන් ඉටුකිරීමේ වගකීම එම දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඒ අනුව, ආරම්භක අවස්ථාවේ දී ම මූල්‍ය පද්ධතියට වන අවදානම් හඳුනාගැනීම, මූල්‍ය අස්ථායීතාවය වළක්වාලීම සඳහා නිවාරණ සහ ප්‍රතිකාරක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මෙන්ම අර්බුද අවස්ථාවේ දී ගනු ලබන පියවරයන් අසාර්ථක වන විට ඒවා විසඳීමට සහායවීම ද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වේ. මෙහි දී මූල්‍ය අසමතුලිතතා සහ හානිකර තත්වයන් හඳුනාගැනීම සඳහා ඉදිරි දැක්ම සහිත ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් කල්බදු සමාගම්, ප්‍රාථමික අලෙවිකරුවන්, රක්ෂණ සමාගම් සහ තැරැව්කරුවන්, කොටස් වෙළෙඳපොළේ තැරැව්කරුවන්, විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල්, මෙන්ම මූල්‍ය වෙළෙඳපළේ සූක්ෂම ණය ප්‍රදානය කරන්නන් වැනි මූල්‍ය ආයතනවලින් ද, මුදල් වෙළෙඳපොළ, බැඳුම්කර වෙළෙඳපොළ, විදේශ විනිමය වෙළෙඳපොළ සහ කොටස් වෙළෙඳපොළ යන වෙළෙඳපොළවලින් ද, ගෙවුම් සහ පියවීම් පද්ධතියකින් යුත් මූල්‍ය යටිතල පහසුකම්වලින් ද සමන්විතය.

මූල්‍ය පද්ධතිය තුළ සිදුවන සියළුම අංශයන්ගේ වර්ධනයන් අධීක්ෂණය සහ විශ්ලේෂණය කිරීම සඳහා මූල්‍ය පද්ධති දෙපාර්තමේන්තුව විසින් පද්ධතිමය ආකාරයේ ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබේ. ඒ අනුව, සාර්ව සහ මූර්ත ආර්ථිකය, දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ, පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ආයතන යනාදියේ වර්ධනයන් අවේක්ෂණය සහ ප්‍රධාන මූල්‍ය යටිතල පහසුකම් ක්‍රියාකරවීම මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

මූල්‍ය ක්‍රමයේ ශක්තිමත්භාවය සහ සිදුවිය හැකි හානිකර තත්ත්වයන් හඳුනාගැනීමට ඉවහල් වන සමස්ත මූල්‍ය සහ ආර්ථික දත්ත විශාල ප්‍රමාණයක් මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුව විසින් අගැයීම් කරනු ලැබේ. සාර්ව ආර්ථිකය, තැන්පතු භාරගන්නා ආයතන, අනෙකුත් මූල්‍ය ආයතන, සාංගමික සහ කුටුම්භ අංශයට සම්බන්ධ මූල්‍යමය ශක්තිමත්භාවය පෙන්වන දර්ශක රාශියක් මෙයට ඇතුලත් වේ. අදාළ බලධාරීන්ට සහ සහභාගිවන්නනට සිදුවිය හැකි අවදානම් කල්තියා හඳුනාගෙන ඊට සූදානම් වීම සඳහා මෙම දර්ශක උපකාරී වේ.

වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන මූල්‍ය පද්ධති ස්ථායීතා විමසුම පිළියෙල කිරීම මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුවේ තවත් වගකීමක් වේ. මෙම මූල්‍ය පද්ධති ස්ථායීතා විමසුම මගින් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සහ එය මුහුණ දෙන අවදානම් පිළිබඳ අගැයීමක් කරනු ලැබේ. මූල්‍ය පද්ධති ස්ථායීතාව වර්ධනය කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ගයන් ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

මෙම වාර්තාවේ මූලික අරමුණ වන්නේ මූල්‍ය ආයතන සහ වෙළෙඳපොළ සහභාගිවන්නන්ට අවදානම් සඳහා සූදානම් වීමට සහ එය කළමනාකරණයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මෙන්ම මූල්‍ය ස්ථායීතාව සඳහා බලපාන ගැටළු පිළිබඳ දැනුවත් කිරීම සහ ඒ සම්බන්ධ සංවාදයක් ගොඩනැගීම දිරිමත් කිරීමයි. 2007 වර්ෂයේ මූල්‍ය පද්ධති ස්ථායීතා විමසුම 2007 නොවැම්බර් මාසයේ දී නිකුත් කරන ලදී.

මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුව මූල්‍ය පද්ධති ස්ථායීතා අංශයට අදාළ නියෝජ්‍ය අධිපති සභාපතිත්වය දරන මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන් කටයුතු කරනු ලැබේ. මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව මාසිකව රැස්වන අතර, මූල්‍ය පද්ධති ස්ථායීතාව පිළිබඳව මුදල් මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

## 12. මානව සම්පත් කළමනාකරණය

බැංකුව තුළ හඳුනාගන්නා ලද නිපුණතා පරතරයන් සම්පූර්ණ කිරීම අරමුණු කරගෙන 2007 වර්ෂය තුළදී මානව සම්පත් දෙපාර්තමේන්තුව සිය බඳවාගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය පරිදි සිය සම්පත් යොදවන ලදී. මෙයට අමතරව දෙපාර්තමේන්තුවේ අනෙකුත් කටයුතු වන උසස්කිරීම්, පත්කිරීම්, කාර්යසාධන ඇගැයීම්, අනුප්‍රාප්තික සැලසුම් සැකසීම් හා මාරුකිරීම් යන කාර්යයන් බැංකුව විසින් හඳුනාගන්නා ලද මානව සම්පත් අවශ්‍යතාවයන්ට අනුකූලවන ලෙස සිදුකරනු ලැබීය. මෙම කටයුතුවලට සමගාමීව මහ බැංකුවේ අරමුණු හා පරමාර්ථ සාර්ථකව ඉටුකරගැනීමට හැකිවන පරිදි සේවක අභිප්‍රේරණය වැඩිදියුණු කිරීමට අදාළ කටයුතු සම්පාදනය කිරීම මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලදී.

### බඳවා ගැනීම්

හඳුනාගත් පුරප්පාඩු පිරවීම සහ විවිධ දෙපාර්තමේන්තුවල පැවැති නිපුණතා අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම අරමුණු කරගෙන 2007 වසරේදී නව බඳවාගැනීම් සිදුකරන ලදී. ඒ අනුව කළමනාකරණ පුහුණුවන්නන් වශයෙන් 59 ක් අවුරුදු 2 ක පුහුණු කාලයක් සඳහාද, නඩත්තු හා ව්‍යාපෘති ඉංජිනේරුවන් 2 ක්, මාණ්ඩලික පංතියේ II ශ්‍රේණිය සඳහා ද බඳවාගන්නා ලදී. තවද, කොන්ත්‍රාත් පදනම මත ලඝු / යතුරු ලේඛිකාවන් 8 ක් සහ තොරතුරු තාක්ෂණ ශිල්පීන් 2 ක් ද වර්ෂය තුළදී බඳවාගනු ලැබිණ.

### උසස් කිරීම්

2007 වර්ෂය තුළදී විවිධ ශ්‍රේණීන් සඳහා සහ තනතුරු සඳහා උසස් කිරීම් සිදුකිරීමේදී සේවකයින් හට තම වෘත්තීය වර්ධනය ළඟාකර ගැනීමට ඇති ඉඩකඩ සලකා බලන ලදී. ශ්‍රේණීන් අතර උසස් කිරීම් සඳහා නිර්ණායකයන් ලෙස සේවකයන්ගේ කාර්යසාධන ඇගැයීම් ලකුණු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශයන් යොදාගන්නා ලදී. 2007 දී මෙම නිර්ණායකයන් පදනම් කොටගෙන මාණ්ඩලික, මාණ්ඩලික නොවන හා සුළු

සේවක පංතීන්ට අයත් සේවකයන් 138 දෙනෙකුට උසස්වීම් ලබාදෙන ලදී. තනතුරු සඳහා කරන ලද උසස්වීම් යටතේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් 3 දෙනෙකු මාණ්ඩලික පංතියේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීමෙන් අනතුරුව ඔවුන් සහකාර අධිපතිවරුන් වශයෙන් පත්කරන ලදී. එමෙන්ම නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් 11 දෙනෙකු මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියට උසස් කරනු ලැබීය. එසේම, මාණ්ඩලික පංතියේ III ශ්‍රේණියේ නිලධාරීන් 53 දෙනෙකු නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස පත්කරන ලද අතර, මාණ්ඩලික නොවන පංතියේ IV සහ V ශ්‍රේණිවලට අයත් නිලධාරීන් 48 දෙනෙකු මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියට උසස් කරන ලදී. මීට අතිරේකව සුළු සේවකයින් 7 ක් මණ්ඩලික නොවන පංතියේ I ශ්‍රේණියට ද සුළු සේවකයින් 10 ක් මාණ්ඩලික නොවන පංතියේ II ශ්‍රේණියට ද උසස් කරන ලදී.

### සේව්‍ය සේවක සබඳතා

කළමනාකාරිත්වය හා වෘත්තීය සමිති අතර පැවැති සමීප සබඳතාවය තවදුරටත් මෙම වසර තුළදී ද පැවැතිණි. මේ තුළින් කළමනාකාරිත්වයට වසර පුරාම කාර්මික සාමය පවත්වාගැනීමට හැකි වූ අතර, එය බැංකුවේ අරමුණු හා පරමාර්ථ සාර්ථකව ඉටුකරගැනීමට ඉවහල් විය.

### කාර්යසාධන කළමනාකරණ ක්‍රමය

සියළුම සේවකයින්ගේ 2006 වර්ෂය සඳහා වූ කාර්යසාධන ඇගයීම් කටයුතු වසර තුළදී සාර්ථක ලෙස නිමකරන ලදී. තවද, බැංකුවේ උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සමගාමීව 2007 වසර සඳහා වූ දෙපාර්තමේන්තු සහ සේවක ඉලක්කයන් සකස් කිරීමද සිදු කරන ලදී.

### මිනිස්බල සැලසුම්කරණය

2007 වර්ෂය තුළදී සේවකයින් 15 දෙනෙක් සේවයෙන් විශ්‍රාම ගනු ලැබූහ. මෙයට අමතරව තවත් සේවකයින් 12 දෙනෙක් පෞද්ගලික හේතූන් මත සේවයෙන් ඉල්ලා අස්වූහ. ඒ අනුව, වර්ෂය අවසානයේදී මාණ්ඩලික නිලධාරීන් 558 ක් ද, මාණ්ඩලික නොවන නිලධාරීන් 481 ක් ද, සුළු සේවකයින් 92 ක් ද බැංකු සේවයේ නිරතව සිටියහ.

### ඉලෙක්ට්‍රොනික මානව සම්පත් තොරතුරු පද්ධතිය (e-HR System) ක්‍රියාත්මක කිරීම

2006 වර්ෂය තුළදී හඳුන්වාදෙන ලද ජාලගත මානව සම්පත් තොරතුරු තාක්ෂණ පද්ධතිය 2007 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. සේවකයින් සම්බන්ධ දත්තයන් තොරතුරු පද්ධතියට ඇතුළත් කරන ලද අතර ඒවා පරීක්ෂා කිරීමේ කටයුතු දැනට ආරම්භ කර ඇත. එය 2008 වර්ෂය තුළදී සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. මෙම පද්ධතිය තුළින් සේවකයන් හට ඔවුන්ගේ සේවයට අදාළ වෘත්තීමය තොරතුරු පහසුවෙන් ලබාගැනීමේ හැකියාව උදාකර ඇති අතර, කළමනාකාරිත්වයට මානව සම්පත් පිළිබඳ කාලීන තීරණ ක්ෂණිකව සහ කාර්යක්ෂමව ගැනීමේ හැකියාවද උදාකර ඇත. තවද, මෙම ඉලෙක්ට්‍රොනික මානව සම්පත් තොරතුරු පද්ධතිය මානව සම්පත් දෙපාර්තමේන්තුවට, බැංකුවේ උපාය මාර්ගික සැලැස්ම සමග අනුගත වීමට මනා පිටුවහලක් සපයා ඇත.

### උපායමාර්ගික කළමනාකාරිත්ව සැසිය

බැංකුවේ සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වූ උපායමාර්ගික කළමනාකාරිත්ව සැසියට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබීය. මෙම වැඩමුළුව තුළින් 2008-2012 කාලසීමාව සඳහා වූ බැංකුවේ උපායමාර්ගික සැලසුම හා දෙපාර්තමේන්තුමය සැලසුම් සාකච්ඡාවට භාජනය කොට එකඟත්වයට පැමිණීමට අවස්ථාව උදා විය.

### නව දෙපාර්තමේන්තු ස්ථාපනය කිරීම

වර්තමානයේ බැංකු පද්ධතියේ පවතින අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම අරමුණු කරගෙන 2007 වසර ආරම්භයේදී මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව **(FSSD)** සහ ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව **(PRM)** ස්ථාපනය කිරීමට පියවර ගන්නා ලදී.

### අධිපතිතුමා සහභාගි වූ රැස්වීම්

1. ජනවාරි මාසයේදී ඉන්දියාවේ පැවැති ප්‍රමුඛ ගෝලීය ප්‍රගමනික විශේෂඥයන්ගේ සමුළුවේ ප්‍රධාන දේශනය පැවැත්වීම.
2. පෙබරවාරි මාසයේදී සිංගප්පූරුවේ පැවැති ආසියාවේ නැගී එන වෙළෙඳපොළ "නව ප්‍රවනතාවයන්" පිළිබඳ දෙවන සමුළුවේ සාකච්ඡා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීම.
3. පෙබරවාරි මාසයේදී බංගලාදේශයේ පැවැති සාමය, සෞභාග්‍යය හා නව පරපුර කළමනාකරණය පිළිබඳ නව (9) වන දකුණු ආසියානු කළමනාකරණ රැස්වීමේ සමාරම්භක සැසිය ඇමතීම.
4. අප්‍රේල් මාසයේදී එංගලන්ත බැංකුවේ අධිපතිතුමා සමඟ හා ෆිච් ශ්‍රේණිගතකිරීමේ ආයතනයෙහි (Fitch-Rating) නිලධාරීන් සමඟ එංගලන්තයේදී පැවැති රැස්වීම්වලට සහභාගිවීම.
5. මැයි මාසයේදී බංගලාදේශයේ පැවැති 36 වැනි ආසියානු නිෂ්කාශන සංගමයේ (Asian Clearing Union) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීම.
6. ජූනි මාසයේදී ශ්‍රේණිගතකිරීමේ නිලධාරීන් හා ජාත්‍යන්තර පීආර් (PR) ආයතන සමඟ අමෙරිකා එක්සත් ජනපදයේදී පැවැති සාකච්ඡාවට සහභාගිවීම.
7. ජූනි මාසයේදී ෆීජී ගණකාධිකාරීන්ගේ ආයතනයේ 35 වන වාර්ෂික සම්මේලනයේ ප්‍රධාන දේශනය පැවැත්වීම හා නවසීලන්ත රිසව් බැංකුවේ නියෝජ්‍ය අධිපතිතුමා නවසීලන්තයේදී හමුවීම.
8. විචලනයන් සමඟ කටයුතු කිරීම: ආසියාවේ ප්‍රාග්ධන ප්‍රවාහයන් හා විනිමය අනුපාත කළමනාකරණය පිළිබඳව ජූලි

මස තායිලන්තයේ පැවැති 42 වන සියසන් අධිපතිවරුන්ගේ සමුළුවට හා 26 වන සියසන් අධිපතිවරුන්ගේ මණ්ඩලයේ රැස්වීම සඳහා සහභාගිවීම.

9. ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව පිළිබඳව ඒකාබද්ධ ලීඩ් කළමනාකරුවන් සමඟ සැප්තැම්බර් මාසයේදී එංගලන්තයේ පැවැති රැස්වීමකට සහභාගිවීම.

10. ගෝලීය බැංකුකරණයේ සුසමාදර්ශිය විතැන්වීම, නව නිපැයුම් සිදුකිරීම, කාර්යක්ෂම බෙදාහැරීම හා ගණුදෙනුකරුවන්ගේ වටිනාකම් කළමනාකරණය පිළිබඳව සැප්තැම්බර් මාසයේදී ඉන්දියාවේ පැවැති FICCI - IBA සමුළුවේ සාකච්ඡා මණ්ඩලයේදී විශේෂ දේශනයක් පැවැත්වීම.

11. ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද බැඳුම්කර පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සිංගප්පූරුව, හොංකොං, ලන්ඩන්, නිව්යෝක්, ලොස්ඇන්ජලීස් හා බොස්ටන්හි පවත්වන වැඩසටහන් වලටත්, වොෂින්ටන් හි පැවැති ජී-24 කණ්ඩායමේ රැස්වීමටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම් හා 2007 සංවර්ධන කමිටු රැස්වීම සහ දකුණු ආසියා කලාපීය සහයෝගිතා සංගමයේ මූල්‍ය අංශයේ රැස්වීමට සහභාගිවීම.

12. ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධව ඉන්දියාවේ ව්‍යාපාරිකයන් ඉන්දියාවේ නවදිල්ලියේදී හමුවීම.

13. දෙසැම්බර් මාසයේදී ඉරාන රජය හා ඉරාන මහ බැංකුව සමඟ ඉරානයේදී විශේෂ රැස්වීමක් පැවැත්වීම.

14. දෙසැම්බර් මාසයේදී ඉන්දියාවේ ගෝව ප්‍රාන්තයේ කර්මාන්තකරුවන්, ව්‍යාපාරිකයින්, වරලත් ගණකාධිකාරීවරුන්, බැංකුකරුවන් හා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ රැස්වීමක් පැවැත්වීම.

**පත්කිරීම් / උසස් කිරීම්**

1. මුදල් මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස නීතිඥ සහ සාමදාන විනිශ්චයකාර එම්. රාමනාදන් මහත්මිය 2007 දෙසැම්බර් මස 06 වැනි දින සිට පත්කරන ලදී.

2. පහත සඳහන් උසස් කිරීම් සහ පත්කිරීම් 2007 දෙසැම්බර් මස 03 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලදී.

   I. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එස්.එච්.ඒ.එම්. අබේරත්න මහතා මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණියට උසස් කර සහකාර අධිපති වශයෙන්.

   II. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරි සහ ලේඛකාධිකාරී සී. ප්‍රේමරත්න මහත්මිය මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණියට උසස් කර සහකාර අධිපති වශයෙන්.

   III. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ පී.සමරසිරි මහතා මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණියට උසස් කර සහකාර අධිපති වශයෙන්.

3. එස්.එන්.පෙරේරා මහත්මිය සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරි වශයෙන් 2007 ජනවාරි 01 දින සිට උසස් කර පත්කරන ලදී.

4. ආර්.ධීරසිංහ මහත්මිය ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් 2007 ජනවාරි 01 දින සිට උසස් කර පත්කරන ලදී.

5. බී. ඩී. ඩබ්. ඒ. සිල්වා මහතා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් 2007 ජනවාරි 01 දින සිට උසස් කර පත්කරන ලද අතර 2007 දෙසැම්බර් 03 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

6. සී. පී. ඒ. කරුණාතිලක මහතා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරි වශයෙන් 2007 ජනවාරි 01 දින සිට උසස් කර පත්කරන ලදී.

7. එස්. ලංකාතිලක මහතා මානව සම්පත් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් 2007 ජනවාරි 01 දින සිට උසස් කර පත්කළ අතර 2007 දෙසැම්බර් 03 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

8. සී.ජේ.පී. සිරිවර්ධන මහතා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරි වශයෙන් 2007 ජනවාරි 01 දින සිට උසස් කර පත්කළ අතර 2007 දෙසැම්බර් 03 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධිකාරි හා ලේඛකාධිකාරී වශයෙන් පත්කරන ලදී.

9. ආර්.ඒ.ඒ.ජයලත් මහතා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් 2007 ජනවාරි 01 දින සිට උසස් කර පත්කරන ලදී.

10. යූ.පී.අලවත්තගේ මහතා විනිමය පාලන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක විනිමය පාලක වශයෙන් 2007 ජනවාරි 01 දින සිට උසස් කර පත්කරන ලදී.

11. ආචාර්ය පී.එන්.වීරසිංහ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් 2007 ජනවාරි 01 දින සිට උසස් කර පත්කරන ලදී.

12. එස්.එස්. රත්නායක මහතා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් 2007 ජනවාරි 01 දින සිට උසස් කර පත්කරන ලද අතර 2007 නොවැම්බර් 10 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

13. එච්.ඒ. කරුණාරත්න මහතා වැඩ බලන අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානියකු ලෙස 2007 ජනවාරි 01 දින සිට උසස් කරන ලදී. පසුව, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් 2007 ජනවාරි 29 දින පත්කළ අතර 2007 මාර්තු 12 වැනි දින සිට මූල්‍ය බුද්ධි ඒකකයේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් හා 2007 ජූනි 01 වැනි දින

සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

14. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරි එන්.ජේ. පෙරේරා මහතා ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් 2007 ජනවාරි 01 දින පත්කරන ලදී.

15. සුභසාධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එල්.වයි. ධර්මසේන මහතා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරි වශයෙන් 2007 ජනවාරි 01 දින පත්කරන ලදී.

16. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරි එස්. සෝමපාල මහතා 2007 ජනවාරි 01 දින සිට සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් ද, 2007 ජූලි 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් ද පත් කරන ලදී.

17. සුභසාධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එම්.වී.එම්. ප්‍රනාන්දු මහතා 2007 ජනවාරි 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන්ද, 2007 ජූලි 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් ද පත්කරන ලදී.

18. සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ කේ. සරවනමුත්තු මෙනවිය 2007 ජනවාරි 01 දින සිට මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් ද 2007 ජූලි 01 දින සිට එම දෙපාර්ත්මේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්ද පත්කරන ලදී.

19. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ වැඩ බලන අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්.එම්.හේමචන්ද්‍ර 2007 පෙබරවාරි 01 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

20. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ පී.සමරසිරි මහතා 2007 පෙබරවාරි 14 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

21. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ඒ. කමලසිරි මහතා 2007 මැයි 15 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

22. සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සී. කේ. නානායක්කාර මහත්මිය 2007 මැයි 18 දින සිට ලේකම් දෙපාර්තමේන්තුවේ ලේකම් වශයෙන් පත්කරන ලදී.

23. එම්.එම්. අත්තනායක මහතා 2007 සැප්තැම්බර් 12 වැනි දින සිට ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යභාර නිලධාරි වශයෙන් හා 2007 දෙසැම්බර් 17 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

24. සන්නිවේදන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මාණ්ඩලික පන්තියේ III ශ්‍රේණියේ නිලධාරී එස්.ජේ.ඒ. හඳගම මහතා එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙනුවෙන් වැඩ බැලීම සඳහා 2007 ඔක්තෝබර් 01 වැනි දින සිට පත්කරන ලදී.

25. ජනාධිපති නීතිඥ පී.එම්.එම්. පීරිස් මහතා නීති උපදේශක වශයෙන් 2007 ජූලි 6 වෙනි දින සිට පත්කරන ලදී.

**විශ්‍රාම ගැනීම්**

1. මුදල් මණ්ඩලයේ පත්කළ සාමාජික සී. ෂන්මුගම් මහතාගේ සේවාකාලය 2007 ජූලි 17 දිනෙන් අවසන් විය.

2. සහකාර අධිපති ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මිය 2007 ඔක්තෝබර් 02 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

3. මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන විධායක ජෝර්ජ් එන්. ප්‍රනාන්දු මහතා 2007 අප්‍රේල් 15 දින සේවයෙන් ඉල්ලා අස්විය.

4. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එල්.කේ.ගුණතිලක මහත්මිය 2007 නොවැම්බර් 10 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

5. ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එන්.ජේ.පෙරේරා මහතා 2007 දෙසැම්බර් 16 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

**මුදාහරිනු ලැබ සිටි/ නිවාඩු ලබා සිටි නිලධාරීන්**

1. සහකාර අධිපති ආර්.ඒ.ජයතිස්ස මහතා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා ජ්‍යෙෂ්ඨ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ උපදේශක ලෙස මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

2. සහකාර අධිපති කේ.ජී.ඩී.ඩී.ධීරසිංහ මහතා විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

3. ලේකම් ජේ.ඒ.එන්.දිසානායක මහත්මිය අසාර්ථක වූ මූල්‍ය සමාගම් සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කොට විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති කොමිෂන් සභාව වෙත.

4. මාණ්ඩලික පංතියේ III ශ්‍රේණියේ එස්.ආර්.ආටිගල මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

5. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ බී.ලොකුරණමුක මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

6. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ එච්.පී.එම්.වසන්ත කුමාර මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

7. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ එම්.මහින්ද සාලිය මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

8. පෞද්ගලික ලේකම් ඒ.කේ.හෙට්ටිආරච්චි මහත්මිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

9. පෞද්ගලික ලේකම් එම්.සී.ජේ.ප්‍රනාන්දු මහත්මිය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

10. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඩී.ජී.ඩී.අයි.ඒකනායක මහත්මිය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

11. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඊ.ඩබ්.කේ.ජේ.බී. ඇහැලපොල මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

12. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ කේ.ඒ.යූ.එස්.කේ. තිලකරත්න මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

13. කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබූ නීති නිලධාරි එච්.එම්.එන්.එස්. ගුණවර්ධන මහත්මිය නීති සහ අධිකරණ ව්‍යාපෘතියේ II අදියරට

14. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ ඊ.ඒ.හෙට්ටිආරච්චි මහතා වැටුප් රහිත විදේශ නිවාඩු මත.

15. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ ආර්.ධීරසිංහ මහත්මිය වැටුප් රහිත විදේශ නිවාඩු මත.

## 13. තොරතුරු තාක්‍ෂණ

විමසුමට ලක් වූ වසර තුළ දී තොරතුරු තාක්‍ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ ඉලක්කය වූයේ වැඩි දියුණු කරන ලද තොරතුරු තාක්‍ෂණ සේවාවන් සැපයීමත් සමගම නව ශිල්පීය ක්‍රම යොදා ගනිමින් දැනට පවත්නා ස්වයංකෘත නොවන සහ අර්ධ ස්වයංකෘත පද්ධතීන්, වෙබ් තාක්‍ෂණය මත පදනම් වූ මෘදුකාංග බවට නැවත සකසා ගැනීමයි. ඒ අනුව, තොරතුරු තාක්‍ෂණ දෙපාර්තමේන්තුව මගින් නිර්මාණය කරන ලද පළමු වෙබ් මෘදුකාංග වන කේන්ද්‍රගත තොරතුරු පද්ධතිය පහත සඳහන් පරිශීලක අවශ්‍යතාවයන් ආවරණය කිරීම සඳහා තවදුරටත් ව්‍යාප්ත කරන ලදී.

- ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ලබන ගෙවීම් විවරණිකාව සඳහා අවශ්‍ය තොරතුරු එකතු කිරීම.
- ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්තුමය සමීක්‍ෂණය සඳහා බැංකුවල ණය, අත්තිකාරම් හා තැන්පතු පිළිබඳ තොරතුරු එකතු කිරීම.
- බැංකු අධීක්‍ෂණ දෙපාර්තමේන්තුව සඳහා බාසල් II යටතේ නව ප්‍රමාණාත්මක ප්‍රාග්ධන රාමුව ක්‍රියාවට නැංවීම.
- දේශීය කටයුතු දෙපාර්තමේන්තුව සඳහා වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවල තොරතුරු සතිපතා එකතු කිරීම.

බැංකුවේ සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපායනය සමඟ තොරතුරු තාක්ෂණ ක්‍රමෝපායනය පෙළ ගැස්වීම පිණිස, තොරතුරු තාක්‍ෂණ දෙපාර්තමේන්තුව විසින් කේන්ද්‍රගත පද්ධතියක් භාවිතයෙන් තනි තලයකට ගෙන ආ යුතු මෘදුකාංග කීපයක් හඳුනා ගන්නා ලදී. කේන්ද්‍රගත තොරතුරු පද්ධතිය සඳහා පළමුව ක්‍රියාවට නැංවූ මෙම ඒකාබද්ධ ව්‍යාපෘති සංකල්පය, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිමූල්‍ය පහසුකම් සහ ණය සහතික යෝජනා ක්‍රම කළමනාකරණය සඳහා මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම දක්වා ව්‍යාප්ත කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2007 වසර තුළදී ක්‍රියාත්මක කරනු ලැබීය. ව්‍යාපෘතියේ දෙවන අදියර වන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය පරිගණකගත කිරීම (NCRCS) ක්‍රියාත්මක වෙමින් පවතී. එමෙන්ම, විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් මෙම ඒකාබද්ධ සංකල්පය යටතේ සමාලෝචනය කළ අතර හඳුනාගත් පද්ධති දෙකක් සඳහා මෙම ව්‍යාපෘතියේ මුල් අදියර යටතේ ප්‍රමුඛතාවය දෙන ලදී. ඒ අනුව පහත සඳහන් ව්‍යාපාරික කටයුතු සඳහා වෙබ් මෘදුකාංග පද්ධතීන් හඳුන්වා දෙනු ඇත.

- දැනට පවත්නා විදේශ විනිමය අලෙවිය හා මිලට ගැනීම් පද්ධතියට පුළුල් ආවරණයක් සැලසීම.
- විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් මගින් සිදුවන විදේශ විනිමය ගනුදෙනු පරීක්ෂා කිරීම.

විනිමය පාලන දෙපාර්තමේන්තුව සඳහා වන මෙම ඒකාබද්ධ පද්ධතිය 2008 වසර මැද දී ආරක්‍ෂිත, පරිශීලක මිත්‍ර පද්ධතියක් ලෙස ක්‍රියාවට නැංවීමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු මුදුන් පමුණුවා ගැනීමටත්, නියෝජන කාර්යයන් වැඩි දියුණු කිරීමට සහ එහි ආයතනික සේවාවන්හි පිරිවැය අඩු කිරීම සඳහා ඒවා ස්වයංක්‍රීය කිරීමටත්, විමසුමට ලක් වූ වසර තුළ දී පහත දැක්වෙන සේවා සපයමින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

(I) බැංකු සහ මූල්‍ය සමාගම් විසින් විද්‍යුත් මාධ්‍ය තුළින් සපයන තොරතුරු වාර්තා ක්‍රමය පුළුල් කිරීම.

(II) ලිනක්ස් (Linux) මෙහෙයුම් පද්ධතිය පදනම් කොටගත් නව (Lotus domino) විද්‍යුත් තැපැල ක්‍රියාවට නැංවීම.

(III) දීප ව්‍යාප්ත මිල පිළිබඳ දත්ත රැස් කිරීමේ වැඩ සටහන ක්‍රියාවට නැංවීම.

(IV) ව්‍යවහාර මුදල් දෙපාර්තම්න්තුවේ ස්වයංකෘත ව්‍යාපෘතිය, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම සඳහා පුළුල් කිරීම.

(V) ආසියානු නිෂ්කාශණ සංගමයෙහි (Asian Clearing Union) ක්‍රියාකාරකම් ස්වයංකෘතකරණය කිරීම.

(VI) ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මුදල් හුවමාරු සංසදයේ (SWIFT) පණිවුඩ හුවමාරුව සඳහා ස්වයංකෘත ගොනු හුවමාරු පහසුකම සැලසීම.

(VII) ප්‍රාථමික වෙළෙඳුන් විසින් කරනු ලබන රජයේ සුරැකුම්පත්වල ද්විතියික වෙළෙඳපොළ විකුණුම් තොරතුරු විද්‍යුත් මාධ්‍ය මගින් වාර්තා කිරීම.

(VIII) දේශීය ණය කළමනාකරණය සඳහා ඒකාබද්ධ පද්ධතියක් නිර්මාණය කිරීම.

(IX) හදිසි ආපදා අවස්ථාවකදී ප්‍රධාන පරිගණක පද්ධති අක්‍රිය වූ විටක රජයේ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම සඳහා අතිරේක පද්ධතියක් නිර්මාණය කිරීම.

(X) වාණිජ බැංකු මගින් පුළුල් පැතුරුම් ජාලය ඔස්සේ මුදල් වෙළෙඳපොළ අනුපාත දිනපතා වාර්තා කිරිම සඳහා භාවිතා කළ පරිගණක යෙදුම ප්‍රති නිර්මාණය කිරීම.

(XI) ස්වයං ප්‍රතිවර්තන පහසුකම් සහිත පාරිභෝගික එක් දින ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු කළමනාකරණය කිරීම සඳහා වෙබ් මෘදුකාංගයක් ක්‍රියාත්මක කිරීම.

(XII) තොරතුරු තාක්ෂණ විගණකයින්ගේ නිර්දේශයක් මත ක්‍රියාවට නැංවූ, තොරතුරු තාක්ෂණ ආධාරක අංශයේ (IT Help Desk) සිදුවීම් වාර්තාකරණ සහ කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, ආපදා ප්‍රතිසාධන අංශයේ පහසුකම් වැඩි දියුණු කරමින් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා වූ පරිශ්‍රමයේ දිගටම නියැලුණි. සෑම තීරණාත්මක ව්‍යාපාරික යෙදුමකම වැඩ කරන දිනක මෙහෙයුම් කටයුතු අනෙකුත් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන්ගේ සහභාගීත්වය ඇතිව අවස්ථා තුනකදී ආපදා ප්‍රතිසාධන අංශයේ සිට මෙහෙයවන ලදී. ඒ සඳහාම වෙන් වූ අන්තර්ජාල සම්බන්ධයක් හදිසි අවස්ථාවකදී භාවිතා කිරීමට විකල්ප සේවා සපයන්නකුගෙන් අපතිකතා සැලසුමක් (Contingency arrangements) ලෙස ආපදා ප්‍රතිසාධන අංශයට සපයන ලදී. ව්‍යාපාරික අඛණ්ඩතා සැළසුම් ලේඛණය පසුගිය වසර තුළදී විමර්ශණය කොට යාවත්කාල කරන ලදී.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව හැකි සෑම අවස්ථාවකදීම විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිතා කිරීමට යොමු විය. මෘදුකාංග බලපත්‍ර වියදම් තවදුරටත් පහත හෙලීමේ උපක්‍රමයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව අඩු මිලකට බලපත්‍ර මෘදුකාංග ලබා ගැනීමට මයික්‍රොසොෆ්ට් සමාගම සමග ව්‍යාපාරික සහ සේවා ගිවිසුමකට ප්‍රවිෂ්ට විය. ශ්‍රී ලංකා මහ බැංකු පරිගණක ජාලය, ආරක්ෂණ බාධක (Firewalls) සහ ජාලයට අනවසර ප්‍රවිෂ්ට වීම් අනාවරණ/නිවාරණ පද්ධතීන් වැනි ආරක්ෂක උපකරණ පිහිටුවීම මගින් තවදුරටත් ශක්තිමත් කරන ලදී.

සැළසුම් කරනු ලැබූ SWIFTNET අදියර II මෙහෙයුම දියත් කිරීම සඳහා පහසුකම් සැලසීමට SWIFT Alliance සන්ධාන මෘදුකාංගය ඒ සඳහාම වෙන් වූ සේවාදායකයක (Server) පිහිටුවන ලදී. මෙම වෙනස්කම සමග ගැලපීමට, ලංකාසෙට්ල් සහ ලංකාසෙක්‍යු (LankaSettle and LankaSecure) පද්ධතීන් සඳහා භාවිතා කළ (CAS 3.3) මෘදුකාංගය, ජාතික පියවීම් පද්ධතිය හරහා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය සුරක්ෂිත කිරීම සඳහා CAS 3.4 මෘදුකාංගයට සාර්ථක ලෙස යාවත්කාල කරන ලදී. මූල්‍ය පද්ධතීන්ගේ ස්ථායිතාව තව දුරටත් පවත්වා ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව අනෙකුත් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන්ගේ ආපදා ප්‍රතිසාධන කටයුතු ඇගයීමට ද දායක විය.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ජාතික මට්ටමේ ව්‍යාපෘතීන්වලට තාක්ෂණික සහාය ලබා දීමේ කාර්යයේ නොකඩවා නියැලුණි. මෙයට ලංකා මූල්‍යමය සේවා කාර්යාංශය (Sri Lanka Financial Services Bureau) පිහිටුවීම, පොදු ගෙවීම් හුවමාරු පද්ධතියක් (Common Payment Switch) පිහිටුවීම සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය හා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට මෘදුකාංග නිර්මාණය කිරිම සඳහා ඉදිරිපත් කළ යෝජනා ඇගයීම වැනි දෑ, අඩංගු වේ. මීට අමතරව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පරිගණකගත කිරීම, ණය තොරතුරු කාර්යාංශය, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පද්ධතිය සහ ප්‍රාදේශීය බැංකු ව්‍යාපෘති වැනි ජාතික තලයේ ව්‍යාපෘතීන්වලට තොරතුරු තාක්ෂණයට අදාළ උපකරණ මිල දී ගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටු කීපයකට සහභාගි විය.

තවද, සම්පත්දායකයින් ලෙස ශ්‍රී ලංකා මහ බැංකු පුහුණු කටයුතු මධ්‍යස්ථානයට නිලධාරීන් මුදා හරිමින් සහ දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ සම්බන්ධතා නිලධාරීන්ට පුහුණු/දැනුවත් කිරීමේ සැසි පවත්වමින්, අනෙකුත් මූල්‍ය ආයතනවල මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් අතර තොරතුරු තාක්ෂණ නිපුණතා නිරන්තරයෙන් වර්ධනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව දායක විය. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව, තොරතුරු තාක්ෂණ ආරක්ෂණ ප්‍රතිපත්තියේ පරිශීලන අනුවාදය ඉංග්‍රීසි සහ සිංහල භාෂාවලට අමතරව දෙමළ භාෂාවෙන්ද ප්‍රකාශයට පත් කරන ලදී.

සේවක අර්ථසාධක අරමුදල් පද්ධතිය නඩත්තු කිරීම නොකඩවා සිදු කරන ලද අතර විමසුමට ලක් වූ වසර තුළ දී 100%කට ආසන්න පද්ධති උපයෝජ්‍යතාවයක් පවත්වා ගැනීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට හැකි විය. තොරතුරු තාක්ෂණ නිලධාරීන් විසින් විද්‍යුත් මාධ්‍ය මගින් දායක මුදල් රැස් කිරීමේ ප්‍රවර්ධන වැඩ මුළු පවත්වන ලදී. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, සේවක අර්ථසාධක අරමුදල් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ද ලබා දුන් අතර වෙබ් සේවාවන් හරහා සාමාජිකයින්ට අවශ්‍ය සේවාවන් ලබාදීම පුළුල් කිරීමේ ක්‍රියාවලියේ වර්තමානයේ නිරතව සිටී.

# 14. ජාත්‍යන්තර කටයුතු

## 1. විදේශ විනිමය සංචිත කළමනාකරණය

ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකා රුපියලේ ස්ථායීතාව පවත්වා ගැනීමටත්, හැකි උපරිම අයුරින් බාධාවකින් තොරව රටෙහි ජාත්‍යන්තර ගණුදෙනු ක්‍රියාවලිය සිදුවීම සහතික කිරීමටත්, ද්‍රවශීලතාවයෙන් ඉහළ විදේශ මුදල්වලින් හා අනිවාර්යයෙන් පැවැතිය යුතු අවම රත්‍රන් ප්‍රමාණයකින් සමන්විත ප්‍රමාණවත් විනිමය සංචිතයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගතයුතු බවටත් මුදල් නීති පනතින් නියම කර තිබේ. ඉහත දැක්වූ අරමුණු ඉටුකර ගැනීම සඳහා රටෙහි නිල විදේශ විනිමය සංචිතය කළමනාකරණය කිරීමේ වගකීම ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුවට (ජා.ක.දෙ.) පැවරී ඇත.

2007 වර්ෂයේ, විදේශ විනිමය සංචිතය එක්සත් ජනපද ඩොලර්, යූරෝ, ස්ටර්ලින් පවුම්, ඕස්ට්‍රේලියානු ඩොලර් යන විදේශ මුදල් වලින් හා රත්‍රන් වලින් සමන්විත වූ අතර ඒවා ප්‍රධාන වශයෙන් ස්ථාවර ආදායම් සුරැකුම්පත් හා මුදල් වෙළෙඳපොළ උපකරණ යන වත්කම් කාණ්ඩ දෙවර්ගයෙහි ආයෝජනය කරන ලදී. ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹ සමන්විත වූයේ ඉහළ ඇගයුමකින් යුත් ස්වෛරී රාජ්‍ය සුරැකුම්පත්, රාජ්‍ය ඇපවීමක් සහිත සුරැකුම්පත් සහ රාජ්‍ය ආයතන හා ප්‍රමුඛ ජාත්‍යන්තර ආයතන විසින් නිකුත් කළ සුරැකුම්පත් වලිනි. විදේශ සංචිත කළමනාකරණයේදී ද්‍රවශීලතා අවශ්‍යතාවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කැරිණි. මේ සඳහා සංචිත වලින් ප්‍රමාණවත් කොටසක් වත්කම් කාණ්ඩ දෙවර්ගයෙන්ම ඉහළ ද්‍රවශීලතාවක් ඇතිව කෙටි කාලීන පදනමකින් ආයෝජනය කැරිණි. සංචිත කළමනාකරණයට අදාල සියළුම ගණුදෙනු සිදු කරන ලද්දේ අනුමත කළ ගණුදෙනුකාර පාර්ශ්වයන් සමඟ

පමණි. කළමනාකාරිත්වය විසින් අනුමත කල සීමා ව්‍යුහයන් තුළ පමණක් එකී ගණුදෙනු සිදු කළ අතර වත්කම්වල සුරක්ෂිතභාවය, ද්‍රවශීලතාවය හා ලැබෙන්නා වූ ආදායම ගැන සැලකිලිමත් විණි.

සමස්තයක් වශයෙන් ගත් කළ, සංචිත කළමනාකරණය මුදල් මණ්ඩලය අනුමත කළ මෙහෙයුම් උපදෙස් වලට අදාළව සිදු කැරිණි. විදේශ විනිමය සංචිත කළමනාකරණ මෙහෙයුම් උපදෙස්වල දක්වා ඇති පරිදි විදේශ සංචිත කළමනාකරණ කමිටුව (වි.සං.ක.ක.) විසින් සංචිත කළමනාකරණ කටයුතු අඛණ්ඩව අධීක්ෂණය කරමින් අදාළ පරිදි ඒ සඳහා අවශ්‍ය උපදෙස් දෙන ලදී. බැංකුවේ අවදානම් දැරීමේ රුචි මට්ටම සනිටුහන් වන ලෙසින් සැකසූ මිණුම් දණ්ඩක් උපයෝගී කොට සංචිත කළමනාකරණ කාර්ය සාධනය කාල ආවර්තිතව නිර්ණය කැරිණි.

විශේෂයෙන් 2007 වර්ෂයේ දෙවන භාගයේ දී එක්සත් ජනපදයේ උප-පුමුඛ උකස් ණය වෙළෙඳපොළ අර්බුදය නිසා මුදල් වෙළෙඳපොළෙහි පැන නැගි අවුල් සහගත තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස ද්‍රවශීලතා සිඳීයාමක් හා ණය සංකෝචනයක් ජනිත විය. එ.ජ.ඩොලර් 51 සිට 99 දක්වා වූ පරතරයක් තුළ උච්ඡාවචනය වූ තෙල් බැරලයක මිල (නිර්ණායකය:West Texas Intermediate Brand) හා ලෝක ආහාර මිල ගණන්වල වැඩිවීම ගෝලීය මතුපිට උද්ධමනය ඉහළ නැගුමට බලපෑ අතර එකී වර්ධනයන් ප්‍රතිපත්ති සම්පාදකයන් හා ආයෝජකයන් ඉදිරියේ නව අභියෝග හා ගැටළු මතුකරන ලදී. එසේම එමගින් සංචිත කළමනාකරණයට අඛන්ඩවම අභියෝගාත්මක වටපිටාවක් ජනිත කෙරිණි.

ශ්‍රී ලංකාවේ නවමු ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුවෙන් ලැබූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 500 මගින් බැංකුවේ විදේශ සංචිත 2007 වසරේදී සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ නැගිණි. තෝරාගත් විදේශ මුදල් හා රටවල වෙළෙඳපොළ සහ ආර්ථිකයන්හි මූලිකාංගවල හැසිරීම අඛන්ඩව විමර්ශනය කරමින් හා බැංකුවේ අවදානම් දැරීමේ රුචි මට්ටම අනුව යමින් ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව සංචිතයේ වූ විදේශ මුදල් වර්ගයන් හා වත්කම්හි සංයුතිය විටින් විට අවශ්‍ය පරිදි වෙනස් කරන ලදී. ද්‍රවශීලතා අවශ්‍යතාවයන්, රාජ්‍ය ණය ආපසු ගෙවීම්, අවදානම් කළමනාකරණයේ පරාමිතීන් හා ආදායම් ඉපැයීමේ හැකියාවන් යන ප්‍රධාන කරුණු සංචිතයේ ආයෝජන හා මුදල් වර්ග සංයුතිය තීරණය කිරීමේදී සැලකිල්ලට භාජනය කරන ලදී.

2007 වසරේ බැංකුවේ විදේශ සංචිත එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,323 සිට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,881 දක්වා වැඩි විය.

වර්ෂය තුළදී සංචිත කළමනාකරණ කටයුතු වලින් ලත් ශුද්ධ විදේශ විනිමය ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 125.3 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 13,861.9 ක් විය. මෙය පසුගිය වසරේ ආදායම වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 100.5 ඉක්මවීය. සංචිතයේ වැඩිවීම හා පොලී අනුපාතයේ වැඩිවීම යන කරුණු දෙකම ආදායම ඉහළ යාමට හේතු විය.

ආදායම් ඉපැයීම වැඩිකර ගැනීම උදෙසා ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව විසින් බැඳුම්කර ණයට දීමේ වැඩසටහන 2007 දී වඩා සවිමත් කරන ලදී.

## 2. අවදානම් කළමනාකරණය

විදේශ විනිමය සංචිත හා එහි ආයෝජන හා බැඳී ඇති අවදානම් විවිධාකාරය. ඒවා අතුරින් විදේශ විනිමය අවදානම, පොලී අනුපාත අවදානම, ද්‍රවශීලතා අවදානම, ණය අවදානම සහ මෙහෙයුම් අවදානම ප්‍රධානය. ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුවේ මැදි කාර්යාලය, විදේශ විනිමය සංචිතය හා එහි ආයෝජන නිරාවරණය වී ඇති අවදානම් පිළිබඳව සුපරික්ෂාකාරීව සිට අවදානම් කළමනාකරණයට ඇවැසි නිසි පියවර ගනු ලබයි.

විදේශ විනිමය උච්ඡාවචනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධන හානියක් සිදුවීමේ අවදානම හෙවත් විදේශ විනිමය අවදානම විදේශ මුදල් විවිධාංගීකරණය මගින් කළමනාකරණය කෙරේ. සුදුසු පරිදි ආයෝජන කළඹේ කාල පැවතුම සකසා ගැනීම මගින් පොලී අනුපාත වල වෙනස්වීම් වලට සංචිත නිරාවරණය වීමෙන් ඇතිවන අවදානම හෙවත් පොලී අනුපාත අවදානම කළමනාකරණය කෙරේ. සංචිතවලට බලපාන ණය අවදානම අවම කරගනු ලබන්නේ ගනුදෙනුකාර පාර්ශ්වයන් ගේ ණය අවදානම නිර්ණය කිරීම සඳහා බැංකුව භාවිතා කරන සම්මත නිර්ණායකයන් යොදා ගැනීමෙනි. ද්‍රවශීල අවශ්‍යතා තහවුරු කරගැනීම මගින් ද්‍රවශීලතා අවදානම හෙවත් අනිවාර්ය උපලබ්ධි කිරීමක දී සිදුවිය හැකි ප්‍රාග්ධන හානි වීමේ අවදානම කළමනාකරණය කරගනු ලබයි. මානුෂීය අතපසුවීම්, පද්ධති තුළ සිදුවන ව්‍යාධීන් සහ පටිපාටීන් හා පාලන ක්‍රම ප්‍රමාණවත් නොවීම මගින් ඇති විය හැකි අවදානම පියවර රාශියක් අනුගමනය කිරීම මගින් කළමනාකරණය කරන ලදී.

## 3. දේශීය විදේශ විනිමය වෙළෙඳපොලේ වෙනස්වීම් පිළිබඳ අධීක්ෂණය කිරීම

ජා.ක.දෙ. විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොල මනා ක්‍රියාකාරිත්වයකින් පවත්වා ගැනීමත් ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකයේ විචලනයන් ක්‍රමවත්ව පවත්වා ගැනීමත් සඳහා, දේශීය විදේශ විනිමය වෙළෙඳපොලෙහි ගණුදෙනු සහ එක් එක් වාණිජ බැංකු දෛනිකව පවත්වා ගන්නා විදේශ විනිමය පරිමාවන් අධීක්ෂණය කිරීම වසර තුළදී අඛන්ඩව සිදු කැරිණි.

**සංඛ්‍යා සටහන II-9**

**අන්තර් බැංකු විදේශ විනිමය ගණුදෙනු පරිමාව - 2007**

එ.ජ.ඩොලර් දශ ලක්ෂ

| මාසය | එතැන් | පසුදින | එදින | ඉදිරි | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 352.70 | 48.92 | 62.85 | 205.95 | 670.42 |
| පෙබරවාරි | 278.25 | 64.20 | 63.15 | 164.63 | 570.23 |
| මාර්තු | 655.05 | 109.85 | 82.60 | 266.31 | 1,113.81 |
| අප්‍රේල් | 386.65 | 111.05 | 78.22 | 238.44 | 814.36 |
| මැයි | 350.80 | 101.20 | 75.35 | 202.39 | 729.74 |
| ජූනි | 248.65 | 90.25 | 59.37 | 259.00 | 657.27 |
| ජූලි | 93.45 | 89.30 | 61.35 | 111.01 | 355.11 |
| අගෝස්තු | 147.92 | 75.00 | 68.80 | 182.14 | 473.86 |
| සැප්තැම්බර් | 206.25 | 107.97 | 48.92 | 193.66 | 556.80 |
| ඔක්තෝබර් | 586.45 | 171.77 | 64.55 | 332.64 | 1,155.41 |
| නොවැම්බර් | 468.62 | 99.32 | 107.42 | 336.39 | 1,011.75 |
| දෙසැම්බර් | 581.45 | 147.30 | 105.90 | 331.81 | 1,166.46 |
| එකතුව | 4,356.24 | 1,216.13 | 878.48 | 2,824.37 | 9,275.22 |

**සංඛ්‍යා සටහන II-10**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය මිලදී ගැනීම් සහ විකුණුම් වල මාසික සාරාංශය - 2007**

එ.ජ.ඩොලර් දශ ලක්ෂ

| මාසය | මිලට ගැනීම් | විකුණුම් | ශුද්ධ මිලට ගැනීම් |
|---|---|---|---|
| ජනවාරි | 60.50 | 8.00 | 52.50 |
| පෙබරවාරි | 15.00 | - | 15.00 |
| මාර්තු | 112.50 | 83.00 | 29.50 |
| අප්‍රේල් | 97.00 | 33.55 | 63.45 |
| මැයි | 18.50 | 69.15 | (50.65) |
| ජූනි | 34.00 | 63.90 | (29.90) |
| ජූලි | 4.00 | 65.70 | (61.70) |
| අගෝස්තු | - | 105.60 | (105.60) |
| සැප්තැම්බර් | 24.78 | 48.60 | (23.82) |
| ඔක්තෝබර් | 131.20 | 77.00 | 54.20 |
| නොවැම්බර් | 46.65 | 121.90 | (75.25) |
| දෙසැම්බර් | 48.50 | 39.45 | 9.05 |
| එකතුව | 592.63 | 715.85 | (123.22) |

ජා.ක.දෙ. 2007 වසරේදී සිදුකළ කටයුතු, දේශීය විදේශ විනිමය වෙළෙඳපොල තුල විනිමය අනුපාතිකයේ තියුණු උච්ඡාවචනයන් වලකා ගැනීම සඳහා දායක විය. 2007 වසර අවසානයේ දී පැවැති විනිමය අනුපාතිකය වූ එ.ජ.ඩොලරයට රු. 108.72, වසර තුල දී සියයට 0.93 ක අව ප්‍රමාණය වීමක් සටහන් කළ අතර, 2006 දී එය සියයට 5.19 කින් අව ප්‍රමාණය විය. විනිමය අනුපාතිකයෙහි ස්ථායීතාව පවත්වා ගැනීමේදී මැදිහත්වීම් මගින් සිදුවූ ප්‍රවාහ, ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ රජයේ භාණ්ඩාගාර බැඳුම්කර වලින් 10% ක් විදේශ ආයෝජකයන් සඳහා විවෘත වීම ප්‍රධාන වශයෙන් දායක විය.

2006 වසරේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 10,792 ක් වූ අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව 2007 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 9,275 ක් වූ අතර, එය සියයට 14 ක අඩුවීමකි. 2007 වර්ෂය තුලදී ද ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය වෙළෙඳපොලෙන් මිලට ගත් සහ දේශීය වෙළෙඳපොලට විකුණු විදේශ විනිමය ප්‍රමාණය පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 593 ක් හා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 716 ක් විය.

## 15. නීති

සමාලෝචනයට යටත් වසර තුළදී නීති දෙපාර්තමේන්තුව, මහ බැංකුවට එහි පරමාර්ථ ප්‍රශස්ත වශයෙන් සාක්ෂාත් කරගත හැකි අන්දමේ සුදුසු නෛතික රාමුවක් සකස් කිරීම උදෙසා කටයුතු කරනු ලැබීය. එම රාමුව තුළ මහ බැංකුවේ කාර්යභාරයන් නොකඩවා කරගෙන යාම සඳහා ද නීති දෙපාර්තමේන්තුව පහසුකම් සැලසීය.

ඒ අනුව, දෙපාර්තමේන්තුව, නීතිය සම්බන්ධ කටයුතු වලදී බැංකුවට උපදෙස් දීම, අධිකරණ සහ වෙනත් විනිශ්චය සභා ඉදිරියේ බැංකුව වෙනුවෙන් පෙනී සිටීම හා බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ නීති ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දායකත්වය සැපයීම යන අංශවල එහි සේවය තවදුරටත් පවත්වාගෙන ගියේය.

2007 වසරේදී දෙපාර්තමේන්තුව විවිධ නීති සංශෝධනය කිරීමේ නියැළුනේය. එසේම දෙපාර්තමේන්තුව විසින් ක්ෂේත්‍රයට අදාල වන විවිධ ව්‍යවස්ථා යටතේ රීති, රෙගුලාසි හා අනෙකුත් නෛතික ලේඛන සකස්කිරීමේදී ක්‍රියාශීලී කාර්යභාරයක් ඉටුකරන ලදී. විශේෂයෙන් දෙපාර්තමේන්තුව බැංකු පනත, ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත සහ ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත යටතේ අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට සහභාගි විය.

## 16. කළමනාකාරිත්ව විගණනය

2007 වසර තුළදී කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව තම අභ්‍යන්තර විගණන හා කළමනාකරණ සේවා කටයුතු සිදු කරමින්, බැංකු කටයුතු හා ඒවාට අදාළ පාලන ක්‍රම විධි වැඩි දියුණු කිරීම සඳහා අවැසි වන යෝජනා ඉදිරිපත් කිරීම මගින් බැංකුවේ උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය සහාය කළමනාකාරිත්වය වෙත ලබාදෙන ලදී. එහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූයේ අවදානම මත පදනම් වූ විගණන ප්‍රවේශයක් හරහා විගණන කටයුතු කිරීමට ය. ඒ අතර, මුදල් මණ්ඩලයෙහි විගණන කමිටුවේ හා මහ බැංකු අවදානම් කළමනාකරණ කමිටුවේ ලේකම් කාර්යාලය ලෙස ද දෙපාර්තමේන්තුව ක්‍රියා කරන ලදී.

2007 විගණන සැළසුමට අනුව යමින් දැනට ස්ථාපිත අභ්‍යන්තර පාලන ක්‍රමයන්හි නිසි ක්‍රියාකාරිත්වය විමර්ශනය සඳහා අනුකූලතා විගණන කටයුතු නොකඩවා පවත්වාගෙන ගිය අතර, විය හැකි අවදානම් වලින් බැංකුව ආරක්ෂා කර ගැනීම සඳහා පවත්වාගෙන යන අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණවත් බව තහවුරු කර ගැනීම සඳහා වූ විගණන පැවරුම් ද රාශියක් ඉටුකරන ලදී. තවද, පසුගිය වසරේ මෙන්ම විගණන නිර්දේශ ක්‍රියාත්මක වීම තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් විමර්ශනයන් ද ඉටුකරන ලදී.

මෙම වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවලි විගණන පිළිබඳවද විශේෂ අවධානයක් යොමු කළ අතර විවිධ ක්‍රියාවලි හා සම්බන්ධ ගැටළු පිළිබඳව හා විගණන සැළසුම් ක්‍රියාවට නැංවීම පිළිබඳ ප්‍රගතිය සහ ඒවායේ ප්‍රතිඵල සම්බන්ධයෙන් ද කළමනාකාරිත්වය දැනුවත් කරන ලදී.

බැංකු කටයුතුවල කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය හා පිරිමැසුම් බව වර්ධනය කිරීම පෙරදැරිකොටගෙන කළමනාකාරිත්ව අගැයීම් අධ්‍යයනයන් කිහිපයක්ම 2007 විගණන සැළසුමට පරිබාහිරව කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලදී. එසේ කරන ලද ප්‍රධාන අධ්‍යනයන් වන්නේ ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුවේ විදේශ සංචිත කළමනාකරණයේ කාර්ය සාධනය, ස්ථායි වත්කම් පිළිබඳ සත්‍යාපනය හා අයිතිය, මහ බැංකුව තුළ කාර්යාලයීය ඉඩ බෙදී ඇති ආකාරය, නිවාඩු ලේඛනවල ඌනතා වර්ග කිරීම සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණය, බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලේ නවීකරණය සහ ව්‍යවහාර මුදල් සුරක්ෂිතාගාරවල ඇති පෞරාණික වටිනාකමින් යුත් මුදල් නෝට්ටු සහ කාසි පිළිබඳව කරන ලද අධ්‍යයනයන් වේ.

2007 වර්ෂය තුළදී ද දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු අවදානම් කළමනාකරණ ක්‍රමය වැඩි දියුණු කිරීමට අඛණ්ඩව

කටයුතු කරන ලදී. අවදානම් කළමනාකරණ ප්‍රශ්නාවලියක් හරහා අනෙකුත් දෙපාර්තමේන්තු අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ වී ඇති ආකාරය පිළිබඳ තොරතුරු රැස්කරන ලද අතර දැනුවත් කිරීමේ වැඩ සටහන් මගින් අවදානම් කළමනාකරණ නිලධාරීන්ගේ දැනුම වැඩි කිරීමට කටයුතු කරන ලදී. එසේම අවදානම් කළමනාකරණ නිලධාරීන් විසින් කරන ලද යෝජනා පදනම්කොට ගෙන අවදානම් ලේඛණය ව්‍යුහමය වශයෙන් තවදුරටත් වැඩි දියුණු කරන ලදී.

තවද, අවදානම් කළමනාකරණය වැඩි දියුණු කරනු වස් අවදානම් අවස්ථා/සිදුවීම් වාර්තා කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ඊට අමතරව දෙපාර්තමේන්තු කටයුතුවලට අදාළ අවදානම් දැරිය හැකි මට්ටම් සහ ඒවාට අදාළව ගතයුතු අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් ද හඳුනා ගැනීමට කටයුතු කරන ලදී.

මෙම වර්ෂය තුළදී, මහ බැංකුවට අදාළ අවදානම් හඳුනාගැනීම හා වාර්තා කිරීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, බැංකුවට පරිබාහිරව දේශීය හා විදේශීය වශයෙන් ඇතිවන අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම හා වාර්තා කිරීම පිණිස, "බැංකු ව්‍යාප්ත අවදානම් කළමනාකරණ නිලධාරියෙකු" පත් කිරීමට කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණ කමිටුවට සහාය වුණි. බැංකු ව්‍යාප්ත අවදානම් කළමනාකරණ ව්‍යුහය සමාලෝචනය කිරීම සඳහා සහකාර අධිපතිවරුන්ගෙන් සමන්විත උප කමිටුවක් පත් කිරීමට ද දෙපාර්තමේන්තුව අවදානම් කළමනාකරණ කමිටුවට සහාය වූ අතර බැංකු ව්‍යාප්ත සමස්ත අවදානමේ ඇතිවන වෙනස්කම් අවදානම් කළමනාකරණ කමිටුවට කාලීනව වාර්තා කිරීම සඳහා අවශ්‍ය ආකෘති සැකසීමට ද එම උප කමිටුවට සහාය විය.

ඉහත කරුණුවලට අමණතරව දෙපාර්තමේන්තුව, විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ සහ ව්‍යාපාර අඛණ්ඩතා සැළසුම් කමිටුවේ නිරීක්ෂකයෙක් වශයෙන් සහ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක් වශයෙන් ද මෙම වසර තුළ ක්‍රියාකරන ලදී.

අභ්‍යන්තර සහ කළමනාකාරිත්ව විගණනයේ වෘත්තීමය තත්ත්වය ගොඩ නැංවීම සහ පවත්වාගෙන යාම සඳහා, එක්සත් ජනපදයෙහි අභ්‍යන්තර විගණකයින්ගේ ආයතනයේ (IIA) විභාග ශ්‍රී ලංකාව තුළ පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන යෙදීම මහ බැංකුව විසින් අඛණ්ඩව කරගෙන යන ලද අතර, කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව, (IIA) පාඨමාලා ප්‍රවර්ධනය කිරීම සඳහා (IIA) ශ්‍රී ලංකා ශාඛාව සමග සක්‍රීය ලෙස සහයෝගයෙන් කටයුතු කරන ලදී. ඒ අනුව මහ බැංකුව සාර්ථක තෙවන වසරටත් එහි පාලක සභාව තුළ නියෝජනය විය.

# 17. ගෙවීම් සහ පියවීම්

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් පද්ධතිමය වශයෙන් වැදගත් ඉහළ වටිනාකම් සහිත ගණුදෙනු ගෙවීම් සහ පියවීම් පද්ධතිය වන තත්කාලීන දළ පියවීම් පද්ධතිය මෙහෙයවීම, තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා පියවන ශ්‍රී ලංකා මහ බැංකුවේ ගණුදෙනු වලට අදාළ විද්‍යුත් ප්‍රවේශ කවුළුව මෙහෙයවීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය සංචිත කළමනාකරණ කටයුතු හා විවට වෙළඳ කටයුතුවලට අදාළ ගෙවීම් සහ පියවීම් විධාන පිළියෙල කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්විෆ්ට් (SWIFT) සන්නිවේදන කටයුතු මෙහෙයවීම, ආසියානු නිශ්කාෂණ සංගමය හරහා ශ්‍රී ලංකාවට අදාළ ගණුදෙනු මෙහෙයවීම හා ගෙවීම් සහ පියවීම් පද්ධති අවේක්ෂණය හා ගෙවීම් ප්‍රතිපත්ති සම්පාදනය යන කාර්යයන් අඛණ්ඩව සිදුකරනු ලැබිණි.

## 1. තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS ) මෙහෙයවීම

තත්කාලීන දළ පියවීම් පද්ධති මෙහෙයුම් අංශය විසින් තත්කාලීන දළ පියවීම් පද්ධතිය මෙහෙයවීම සහ සහභාගිත්ව ආයතන සඳහා උපකාරක සේවා ලබාදීම 2007 වසර තුළදීද නොකඩවා සිදුකරනු ලැබිණ. තත්කාලීන දළ පියවීම් පද්ධතියේ කම්පනයන්ට ඔරොත්තු දීමේ හැකියාව සැලකිය යුතු පරිදි උසස් සහ ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාමට පද්ධති මෙහෙයුම් අංශය විසින් වැඩි අවධානයක් යොමුකරන ලදී. 2007 වර්ෂය තුළදී තත්කාලීන දළ පියවීම් පද්ධතිය සුමට ලෙස මෙහෙයුම් කටයුතු සිදුකරන ලද අතර 2006 වසරේදී සියයට 99.6 ක්ව පැවැති පද්ධතියේ ක්‍රියාකාරී පැවැත්ම 2007 වසරේදී සියයට 99.7 දක්වා වර්ධනය විය. අදාළ වර්ෂය තුළදී තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් පියවීම් කටයුතු කළ ගණුදෙනු සංඛ්‍යාව 194,614 ක් දක්වා සියයට 11 කින් වර්ධනය වූ අතර ගණුදෙනුවල වටිනාකම රුපියල් බිලියන 21,266 දක්වා සියයට 21 කින් වර්ධනය විය. 2007 වර්ෂය තුළදී තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් එක් දිනයකදී මෙතෙක් පියවන ලද වැඩිම ගණුදෙනු සංඛ්‍යාව සහ ගණුදෙනුවල වටිනාකම වාර්තා කළ අතර ඒවා පිළිවෙලින් ගණුදෙනු 1,217 සහ රුපියල් බිලියන 224 ක් විය. 2007 වර්ෂය තුළදී සිදුකළ ගණුදෙනු සංඛ්‍යාවේ සහ එම ගණුදෙනුවල වටිනාකමේ දෛනික සාමාන්‍යය පිළිවෙලින් ගණුදෙනු 801 ක් සහ රුපියල් බිලියන 88 ක් විය.

2007 වර්ෂය තුළදී ස්විෆ්ට් සන්නිවේදන යටිතල පහසුකම්වල සිදුකරනු ලැබූ වෙනස්කම්වලට අනුරූපව තත්කාලීන දළ පියවීම් පද්ධතිය සීඒඑස් 3.40 (CAS 3.40 Version) යටතේ වැඩිදියුණු මට්ටමට පත්කරනු ලැබිණ. ඒ අනුව තත්කාලීන දළ පියවීම් පද්ධතිය විසින් භාවිතා කරනු ලබන දත්ත පදනමද වින්ඩෝස් 2003 (Windows 2003) මෘදුකාංගයට පරිවර්තනය කරනු ලැබිණ.

2007 වර්ෂය අවසානය වන විට තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි ශ්‍රී ලංකා මහ බැංකුවද ඇතුළත්ව සහභාගිත්ව ආයතන 34 ක් වූ අතර එයට බලපත්‍රලාභී වාණිජ බැංකු 23 ද, ප්‍රාථමික වෙළෙඳුන් 8 දෙනාද, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවේ මධ්‍යම තැන්පතු පද්ධතියද අයත් විය.

## 2. විදේශ විනිමය සංචිත කළමනාකරණයට අදාළ ගණුදෙනු පියවීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ විදේශ විනිමය රන් හා විදේශ සුරැකුම්පත් පියවීම් අංශය විසින් භාණ්ඩාගාර

ගණුදෙනු කළමනාකරණ පද්ධතිය (Treasury Dealing Room Management System - TDRMS) හරහා ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබූ ගණුදෙනු වල පසු මෙහෙයුම් කාර්යාලයීය කටයුතු (Back Office Operations) නොකඩවා සිදුකරන ලදී.

මෙම අංශය මගින් 2007 වසර තුළදී පියවීම් උපදෙස් 7,320 ක් නිකුත් කළ අතර පියවීම් ගැටළු නිරාකරණය කිරීමේ කටයුතු වලද නිරත විය. තවද, භාණ්ඩාගාර ගණුදෙනු කළමනාකරණයට අදාළ පසු මෙහෙයුම් උප පද්ධතිය වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා මෙම වසර තුළදීද සහභාගි විය.

## 3. විවට වෙළෙඳ කටයුතු ගණුදෙනු පියවීම

ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ විවට වෙළෙඳ කටයුතු ගණුදෙනු පියවීම් අංශය 2007 වර්ෂය තුළදීද ලංකාසෙට්ල් සහභාගිත්ව ආයතන ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සිදුකළ විවට වෙළෙඳ ගණුදෙනු පියවීමේ කටයුතු වල අඛණ්ඩව නිරත වෙමින් රුපියල් බිලියන 1,234 ක් වටිනා ප්‍රති මිලදී ගැනීම් (Repo) ගණුදෙනු 3,260 කට, රුපියල් බිලියන 172 ක් වටිනා ප්‍රති විකුණුම් (Re- Repo) ගණුදෙනු 235 කට හා ස්ථිර පදනමක් මත සිදුවූ රුපියල් බිලියන 116 ක් වටිනා සුරැකුම්පත් විකිණීම් (Outright Sale) ගණුදෙනු 188 කට අදාළ පියවීම් උපදෙස් නිකුත් කරන ලදී. එමෙන්ම ලංකාසෙට්ල් සහභාගිත්ව ආයතන විසින් ලබාගන්නා ලද දෛනික ද්‍රවශීලතා පහසුකම් පියවීම පිළිබඳ නිරීක්ෂණ කටයුතු වලද මෙම අංශය නිරත විය.

## 4. ස්විෆ්ට් සන්නිවේදන කටයුතු මෙහෙයවීම

2007 වසර තුළදී ද ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ ස්විෆ්ට් සන්නිවේදන අංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්විෆ්ට් පණිවුඩ මෙහෙයවීමේ කටයුතු වල තවදුරටත් නියැලුණි. අදාළ කාලසීමාව තුළදී පසුගිය වසරට සාපේක්ෂව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබුණු ස්විෆ්ට් පණිවුඩ ප්‍රමාණය සියයට 22 ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර, ලැබුණු මුළු ස්විෆ්ට් පණිවුඩ ප්‍රමාණයෙන් සියයට 15 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගණුදෙනුවලට අදාළ විය. ඉතිරිය ලංකාසෙට්ල් පද්ධතියට අදාළ ඒවා විය. තවද 2006 වසරට සාපේක්ෂව මෙම වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්විෆ්ට් පද්ධතිය මගින් යවන ලද ස්විෆ්ට් පණිවුඩ ප්‍රමාණය ද සියයට 20 ක වැඩිවීමක් පෙන්නුම් කළේය.

තොරතුරු හා තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2007 වසර තුළදී කරන ලද ස්විෆ්ට් සන්නිවේදන පද්ධතියේ පහත දැක්වෙන නවීකරණයන් හා වැඩිදියුණු කිරීම් වලට ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව දායක විය.

- ස්විෆ්ට් එලයන්ස් ඇක්සස් (Swift Alliance Access) හි 6.0.0 වන නව අනුවාදය ස්ථාපනය කිරීම.
- ස්විෆ්ට් එලයන්ස් ඇක්සස් (S A A), ස්විෆ්ට් එලයන්ස් එන්ට්‍රි (S A E) හා සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංග වලට අදාළ 6.0.30 වන නව අනුවාදයන් යාවත්කාලීන කිරීම.
- ද්විපාර්ශවික යතුරු හුවමාරු සහතික (Bilateral Key Exchang Certificate) ක්‍රමය වෙනුවට අලුතින් හඳුන්වාදෙන ලද පොදු යතුරු යටිතල ව්‍යුහ (Public Key Infrastructure) ක්‍රමයට අනුගත වීම.
- ස්විෆ්ට්නෙට් දෙවන අදියර (SWIFTNet Phase 2) යටතේ හඳුන්වාදෙන ලද සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංගය (Relationship Management Application) ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්විෆ්ට් පද්ධතියේ පරීක්ෂණ හා පුහුණු කේත (Test and Training BICs) හරහා භාවිතයට ගැනීම.

## 5. ආසියානු නිශ්කාෂණ සංගමයේ (ආ.නි.සං.) ගණුදෙනු

ශ්‍රී ලංකාව ආසියානු නිශ්කාෂණ සංගම් යාන්ත්‍රණය හරහා කරන ලද මුළු ගණුදෙනුවල වටිනාකම 2006 වසරේදී රුපියල් බිලියන 268 සිට 2007 වසරේදී රුපියල් බිලියන 337 දක්වා සියයට 25.8 කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉන්දියාවෙන් සහ ඉරානයෙන් කරන ලද ඛනිජ තෙල් ආනයනයන් ඉහළ යාමයි.

2007 වසරේදී ආසියානු නිශ්කාෂණ සංගම් යාන්ත්‍රණය යටතේ කරන ලද ගණුදෙනුවල ශුද්ධ වටිනාකම රුපියල් බිලියන 293.5 ක් වෙමින් සියයට 24 ක වැඩිවීමක් පෙන්වීය.

ආසියානු නිශ්කාෂණ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ 36 වැනි වාර්ෂික රැස්වීම 2007 මැයි මාසයේදී බංග්ලාදේශයේ ඩකා නුවර දී පවත්වන ලදී. මෙම රැස්වීමේදී සෑම සාමාජික රටකම නියෝජිතයන්ගෙන් සමන්විත තාක්ෂණ කමිටුවක් පත්කිරීමට තීරණය කළ අතර එම කමිටුව විසින් ආසියානු නිශ්කාෂණ සංගමයේ ගණුදෙනු සඳහා එක් මුදල් වර්ගයකට වඩා භාවිතා කිරීමේ හැකියාව සලකා බැලීම සහ ආ.නි.සං. ගිණුම්වල ප්‍රමාණවත් ශේෂයන් පවත්වාගෙන යාමට වාණිජ බැංකු දිරිමත් කිරීමේ උපක්‍රමයක් ලෙස සෑම සාමාජික රටක් විසින්ම අනෙකුත් සාමාජික රටවලට අයත් වාණිජ බැංකු විසින් තම රටේ වාණිජ බැංකුවල පවත්වාගෙන යන ආ.නි.සං.ගිණුම්වල ශේෂයන් සඳහා පොලියක් ගෙවීමට ඇති හැකියාව සලකා බැලීමට යෝජනා කෙරුණි. ඒ අනුව, ආසියානු නිශ්කාෂණ සංගමයේ තාක්ෂණ කමිටු රැස්වීම 2007 ජූලි මස 5 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ පැවැත්වුණු අතර, එහිදී පහත සඳහන් ක්‍රියාමාර්ගයන් ගැනීමට තීරණය විය.

(අ) තාක්ෂණ කමිටුවේ නිර්දේශ සාමාජික රටවල අදාළ පාර්ශ්වයන්(බැංකු, අපනයනකරුවන් හා ආනයනකරුවන්, වෙළෙඳ හා වාණිජ මණ්ඩල) සමඟ සාකච්ඡා කිරීම;

**සංඛ්‍යා සටහන II-11**

**ආසියානු නිශ්කාෂණ සංගමයේ අනෙකුත් රටවල් සමඟ ශ්‍රී ලංකාවේ වෙළඳම් සහ ආ.නි.සං. ගණුදෙනු වටිනාකම (රුපියල් බිලියන)**

| අයිතමය | 2006 | 2007 |
|---|---|---|
| ආ.නි.සං.හරහා කෙරුණු මුළු ගණුදෙනු | 267.9 | 337.1 |
| ශ්‍රී ලංකාව ආ.නි.සං. රටවලට කරන ලද අපනයන | 67.9 | 78.7 |
| ශ්‍රී ලංකාව ආ.නි.සං.රටවලින් කරන ලද ආනයන | 321.2 | 403.7 |
| ශ්‍රී ලංකාව ආ.නි.සං.රටවල් සමඟ කරන ලද මුළු වෙළෙඳ ගණුදෙනු | 389.1 | 482.4 |
| ආ.නි.සං.ගණුදෙනුවල ශුද්ධ පියවීම් | 235.9 | 293.5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) ආසියානු නිශ්කාෂණ සංගම් යාන්ත්‍රණය යටතේ ශුද්ධ නිශ්කාෂණ ශේෂයන් පියවීම් සම්බන්ධව ගැටළු මුදල් ප්‍රතිපත්තිමය හා අධීක්ෂණ කෝණයන්ගෙන් සලකාබැලීම සඳහා මෙන්ම මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා ඒ ඒ රටවල මහ බැංකු තුළ මූලික සාකච්ඡා පැවැත්වීම;

(ඇ) ඉහත (අ) සහ (ආ) සඳහා ලැබෙන ප්‍රතිචාර තාක්ෂණ කමිටුව වෙත වාර්තා කිරීම සහ අවශ්‍ය නම් එම ප්‍රතිචාර මත නිර්දේශ සංශෝධනය කිරීම; සහ

(ඈ) එකඟතාවයකට පැමිණි පසු නිර්දේශයන් ආසියානු නිශ්කාෂණ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.

ඉහත සඳහන් තීරණයන් අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආසියානු නිශ්කාෂණ සංගමයේ සාමාජික රටවල අදාළ පාර්ශ්වකරුවන් (අපනයනකරුවන්, ආනයනකරුවන්, වාණිජ බැංකු සහ මහ බැංකු වලට) යොමුකිරීම සඳහා ප්‍රශ්නාවලීන් තුනක් පිළියෙල කොට අනෙකුත් සාමාජික රටවලටද යවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ආසියානු නිශ්කාෂණ සංගම් අංශය විසින් මෙම ප්‍රශ්නාවලි ශ්‍රී ලංකාවේ අදාළ පාර්ශ්වකරුවන් වෙත යොමු කොට ඒවා සඳහා පිළිතුරු ලබාගන්නා ලදී. 2008 වසරේ දී ඉන්දියාවේ පැවැත්වීමට නියමිත මීළඟ තාක්ෂණ කමිටු රැස්වීමේ දී ඉහත සඳහන් කළ නිර්දේශ පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට පහසුවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සියළුම සාමාජික රටවලින් ප්‍රශ්නාවලි සඳහා ලද පිළිතුරු තාක්ෂණ කමිටු සාමාජිකයන් වෙත යවන ලදී.

## 6. ගෙවීම් පද්ධති ප්‍රතිපත්ති සම්පාදනය හා අවේක්ෂණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැලැස්මට අනුරූපීව ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ ගෙවීම් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා අවේක්ෂණය කිරීමේ අංශය විසින් ගෙවීම් සහ පියවීම් පද්ධති අවේක්ෂණ රාමුව ශක්තිමත් කිරීම කෙරෙහි 2007 වසරේදී වැඩි අවධානය යොමුකරන ලද අතර ඒ සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. එනම්,

- මූල්‍ය පද්ධතිමය වශයෙන් වැදගත් ප්‍රධානතම ගෙවීම් සහ පියවීම් පද්ධතිය වන ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය තවදුරටත් ශක්තිමත් කිරීම;
- කාසි හා නෝට්ටු වලින් කරන හෝ පත්‍රිකා මත පදනම් වූ ගෙවීම් උපකරණ භාවිතයෙන් කරන සුළු පරිමාණ ගෙවීම් විද්‍යුත් මාධ්‍යයෙන් සිදුකිරීමට මූල්‍ය ආයතන වල හා ගණුදෙනුකරුවන්ගේ ඇති නැඹුරුව වඩාත් ප්‍රවර්ධනය කිරීම;
- සාපේක්ෂව අඩු අවදානම් සහිත ගෙවීම් මාධ්‍යයන් සහ ගෙවීම් පද්ධතීන් භාවිතය සඳහා බැංකු සහ ගණුදෙනුකරුවන් උනන්දු කරවීම; සහ
- වැඩිදියුණු කළ ගෙවීම් සහ පියවීම් පද්ධතීන් නිසා ලැබෙන පිරිවැය වාසි හා කාර්යක්ෂමතා ප්‍රතිලාභ ගණුදෙනුකරුවන්ටද ලබාදීමට බැංකු පෙළඹවීමට කටයුතු කිරීම.

ලංකාසෙට්ල් පද්ධතියේ යම් සහභාගිත්ව ආයතනයක මෙහෙයුම් ක්‍රියාකාරිත්වය අඩාලවීම මගින් සමස්ත ලංකාසෙට්ල් පද්ධතියටම අවදානම් ඇතිවිය හැකි බැවි සැලකිල්ලට ගත් ගෙවීම් පද්ධති ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා අවේක්ෂණය කිරීමේ අංශය සිය අවේක්ෂණ කටයුතු මගින්, යම් සහභාගිත්ව ආයතනයක මෙහෙයුම් ක්‍රියාකාරිත්වය බිඳවැටුණු අවස්ථාවක ගෙවීම් සේවා හා ප්‍රධාන බැංකු සේවා අඛණ්ඩව ලබාදීම සඳහා ඒ ඒ සහභාගිත්ව ආයතනයේ ඇති සූදානම පිළිබඳව සොයාබැලීමට විශේෂ අවධානය යොමුකරන ලදී. ඒ අනුව ගෙවීම් පද්ධති ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා අවේක්ෂණය කිරීමේ අංශය විසින් 2007 වර්ෂය තුළදී ලංකාසෙට්ල් සහභාගිත්ව ආයතනවල ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ලේඛන ඇගැයීමට ලක්කළ අතර, ඒවා වැඩිදියුණු කිරීම අවශ්‍ය යැයි හැඟුණු අවස්ථාවන්හිදී අදාළ සහභාගිත්ව ආයතන ඒ සඳහා යොමුකරන ලදී. එමෙන්ම 2007 සැප්තැම්බර් මසදී, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ හා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව ගෙවීම් පද්ධති ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා අවේක්ෂණය කිරීමේ අංශය විසින් ලංකාසෙට්ල් සහභාගිත්ව ආයතනවල ප්‍රතිප්‍රාප්ති වැඩබිම් වලට ගොස් ඒවා පරීක්ෂා කිරීමේ කටයුතු අරඹන ලදී.

ඡායාගත චෙක්පත් පිළිබිඹු නිශ්කාෂණ පද්ධතියේ නිසි ක්‍රියාකාරිත්වය තහවුරු කරනු වස්, එම පද්ධතිය සඳහා පැහැදිලි හා සවිස්තරාත්මක පද්ධති රීති සංග්‍රහයක් (CIT System Rules) සහ මෙහෙයුම් අත්පොතක් (Operational Manual) සකස් කොට පද්ධතියේ සහභාගිත්ව ආයතනවලට නිකුත් කිරීම සඳහා ගෙවීම් පද්ධති ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා අවේක්ෂණය කිරීමේ අංශය විසින් ලංකාක්ලියර් පුද්ගලික සමාගමට උපදෙස් හා සහයෝගය ලබාදෙන ලදී.

ඡායාගත චෙක්පත් පිළිබිඹු නිශ්කාෂණ පද්ධතිය යටතේ ගණුදෙනුකරුවෙකුට චෙක්පතක මුදල් T+1 (Tයනු චෙක්පත් නිශ්කාෂණය සඳහා ලංකාක්ලියර් සමාගම වෙත ලැබෙන දිනය වන අතර 1 යනු ඊට පසුව එළඹෙන වැඩකරන දිනයයි.) කාලය තුළදී ලබාදීමට පහසුකම් සැලසීමේ පොදු ප්‍රතිපත්තිමය අරමුණ සැලකිල්ලට ගෙන නිශ්කාෂණය කරන ලද චෙක්පත් වල මුදල් වාණිජ බැංකු විසින් අදාළ ගණුදෙනුකරුවන්ගේ ගිණුම් වලට T+1 කාලය තුළදී බැර කිරීම සහතික කිරීම පිණිස ඡායාගත චෙක්පත් පිළිබිඹු නිශ්කාෂණ පද්ධතියේ සහභාගිත්ව ආයතන වන වාණිජ බැංකු සඳහා විධානයක් කෙටුම්පත් කිරීමේ කටයුතු වල ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව නිරත වූ අතර, එම විධානය 2007 නොවැම්බර් මසදී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලදී.

තවද, ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධති යටිතල පහසුකම්වල සංවර්ධනය වේගවත් කිරීමේ අරමුණින් සකස් කොට ඇති 2007-2010 සිවු අවුරුදු කාලපරිච්ඡේදය සඳහා වන ගෙවීම් සහ පියවීම් පද්ධති ඉදිරි දැක්මේ සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා ද ගෙවීම් පද්ධති ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා අවේක්ෂණය කිරීමේ අංශය විසින් වැඩි කාලයක් කැපකරන ලදී. ඒ අනුව 2007 වර්ෂය තුළදී මෙම අංශය විසින් පහත කාර්යයන් ඉටුකරන ලදී.

- දේශීය ස්විෆ්ට් සේවා කාර්යාංශය වන ලංකා මූල්‍ය සේවා කාර්යාංශය (Lanka Financial Services Bureau Ltd.) පිහිටුවීම සඳහා උපරිම සහාය ලබාදීම. වාණිජ බැංකු

විසින් ලංකා මුල්‍ය සේවා කාර්යාංශය පිහිටුවන ලද අතර, එහි මූලික අරමුණ වනුයේ ලංකාසෙට්ල් සහභාගිත්ව ආයතනවලට තම ප්‍රතිප්‍රාප්ති වැඩබිම් වල සිට ලංකාසෙට්ල් පද්ධතිය සමඟ සම්බන්ධවීමට අවශ්‍ය සන්නිවේදන යටිතල පහසුකම වන ස්විෆ්ට් සබඳතාව වඩාත් ලාභදායී හා සුරක්ෂිත අයුරින් පොදුවේ ලබාගැනීමට ලංකාසෙට්ල් සහභාගිත්ව ආයතනවලට පහසුකම් සැපයීමයි.

- වේගවත් වෙනස්වීම් වලට බඳුන්වන මුදල්, ගෙවීම් හා නිශ්කාෂණය කිරීමේ සහ බේරුම් කිරීමේ සේවා සැපයුම්කරුවන් නියාමනය කිරීමේ කාලීන අවශ්‍යතාව සහ ඒ සම්බන්ධයෙන් 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරෙන බලතල පැහැදිලිව දක්වා නොතිබීම යන කරුණු ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අවධානයට යොමුකිරීම. ඒ අනුව ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ පැවැරී ඇති බලතල යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා ලෙස අතිගරු ජනාධිපතිතුමා විසින් 2007 අංක 1 දරණ මුදල්, ගෙවීම් හා නිශ්කාෂණය කිරීමේ සහ බේරුම් කිරීමේ සේවා සැපයුම්කරුවන්ගේ නියෝග නිකුත් කරන ලදී. මෙම නියෝග 2007 ජූනි මස 27 දිනැති අංක: 1503/11 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.
- උක්ත නියෝග මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇති බලතල ක්‍රියාවට නංවමින්, ගෙවීම් පද්ධති ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා අවේක්ෂණය කිරීමේ අංශය විසින් කාඩ්පත් මත පදනම් වූ ගෙවීම් උපකරණ සේවා සපයන්නන් සඳහා අවම නියාමන අවශ්‍යතා පැනවීමේ අරමුණින් විධානයක් කෙටුම්පත් කොට ඇත. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සියළුම කාඩ්පත් මත පදනම් වූ ගෙවීම් උපකරණ සේවා සපයන්නන් විසින් ගෙවීම් කාඩ්පත් වල හා එම කාඩ්පත් වලින් ගණුදෙනු කරන, එම ගණුදෙනු නිශ්කාෂණය කරන හා බේරුම් කරන පද්ධතීන්හි ආරක්ෂාදායී බව ඉහළ නැංවීම සඳහා පවත්වාගතයුතු අවම නියාමන අවශ්‍යතා මෙම විධානය මගින් දක්වා ඇති අතර 2008 මුල් භාගයේදී මෙම විධානය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධියට පත් කිරීමට නියමිතය.

සිය රටවල ජාතික ගෙවීම් සහ පියවීම් පද්ධතීන් ප්‍රතිසංවිධානය කිරීම සඳහා සාක් කලාපීය රටවල ඇති ඇඩි කැමැත්තත්, සාක් කලාපය තුළ ගෙවීම් සහ පියවීම් පද්ධති සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමට කලාපීය වශයෙන් සාමූහිකව කටයුතු කිරීමෙන් වඩාත් හොඳ ප්‍රතිඵල ලබාගත හැකිය යන පිළිගැනීමත් සැලකිල්ලට ගෙන 2007 ජූලි මස දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සාක් කලාපීය ගෙවීම් සංර්ධනයට ප්‍රවේශයක්, යන තේමාව යටතේ සාක් ෆිනෑන්ස් සමුළුවක් ශ්‍රී ලංකා මහ බැංකුවේදී පැවැත්වීමට කටයුතු සැලසුම් කරන ලදී. සාක් ෆිනෑන්ස් කණ්ඩායමට අයත් සියලු රටවල මහ බැංකු අධිපතිවරුන් හා මුදල් අධිකාරීන් හි ප්‍රධානීන් විසින් "සාක් කලාපීය ගෙවීම් සංවර්ධනයට ප්‍රවේශයක්" (SAARC Payments Initiative) නිර්මාණය කිරීමේ යෝජනාව අනුමත කරන ලදී. එබැවින් 2007 ජූලි මස කොළඹ දී පවත්වන ලද එම සාක් ෆිනෑන්ස් සමුළුව සාක් කලාපයේ ගෙවීම් සහ පියවීම් පද්ධති සංවර්ධන ක්‍රියාවලියේ ඉතා වැදගත් සංධිස්ථානයක් වනු ඇත. "සාක් කලාපීය ගෙවීම් සංවර්ධන ප්‍රවේශයට" අදාළ ලේකම් කාර්යාලය ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ස්ථාපිත කිරීමෙන් හා සාක් කලාපීය ගෙවීම් කවුන්සලයේ සභාපතිත්වය දැරීමෙන්, 2008 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව "සාක් කලාපීය ගෙවීම් සංවර්ධනයට ප්‍රවේශයක්" නිර්මාණය කිරීමේ කාර්යයෙහි මූලිකත්වය ගනු ඇත.

## 18. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව 2007 ජනවාරි 01 දින පිහිටුවන ලදී. ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු දෙකකි. එනම් බැංකුව ක්‍රියාත්මක කරන ප්‍රතිපත්තීන්හි ඵලදායීතාවය වැඩිදියුණු කිරීම අරමුණු කොටගෙන ඒවායේ බලපෑම සමාලෝචනය කිරීම හා තක්සේරු කිරීමත් මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුමෙහි ප්‍රගතිය, කළමනාකරණයේ අපේක්ෂිත ගුණාත්මක තත්ත්වයට අනුව නියමිත කාලපරාසයන් තුළ එය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සහතික කිරීම සඳහා එහි ප්‍රගතිය සමාලෝචනය කිරීමත්ය.

බැංකුව, 2007 සිට 2011 කාලපරිච්ඡේදය සඳහා මැදිකාලීන උපාය මාර්ගික සැලසුමක් සකස් කරන ලදී. මෙම සැලසුම අනුව උපාය මාර්ගික අරමුණු පදනම්ව බැංකුව විසින් අනුගමනය කිරීමට බලාපොරොත්තු වන ප්‍රධාන කාර්යභාරයන් හඳුනාගෙන ඇත. සැලසුම් කළ කාලරාමුවක් සමඟ කාර්යසාධනය මැනීමට හැකිවන සේ එකිනෙක කාර්යයන්හි ඉලක්ක හා අරමුණු සකස් කර ඇත. ඒ ඒ කාර්තුව සඳහා දෙපාර්තමේන්තු වලින් ලබාගන්නා ප්‍රගති වාර්තා ද ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර සහකාර අධිපතිගේ ප්‍රධානත්වයෙන් එකිනෙක දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමඟ කාලීනව පවත්වන රැස්වීම් මගින් ලබාගන්නා තොරතුරුද පදනම් කොටගෙන ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කෙරේ. අධිපතිගේ ප්‍රධානත්වයෙන් හා ඉහළ කළමනාකාරිත්වයෙන් සැදුම්ලත් උපාය මාර්ගික සැලසුම් කමිටුව වෙත මෙම ප්‍රගති වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. මෙම කමිටු රැස්වීම් වාර දෙකක් 2007 වසරේදී පවත්වන ලදී. විශේෂයෙන්ම සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී දක්නට ලැබුණු වෙනස්කම් හඳුනාගැනීම හා එහි ප්‍රගතිය අපේක්ෂිත මාර්ගයට යොමුකිරීම මගින් උපාය මාර්ගික සැලසුම නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සනාථ කිරීමෙහි ලා මෙම රැස්වීම් ඵලදායී විය.

බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහභාගිවීමෙන් 2007 නොවැම්බර් මාසයේ පවත්වන ලද කථිකාවක දී උපාය මාර්ගික සැලසුමෙහි පළමු වසරේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. සුදුසු වෙනස් කිරීම් සහිතව 2012 දක්වා එනම් 2008 සිට 2012 දක්වා නව උපාය මාර්ගික සැලසුමක් ඒ අනුව සකස් කරනු ලැබීය.

ප්‍රතිපත්ති සමාලෝචනය පිළිබඳව සළකා බලන විට දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් පත්‍රිකා සකස් කරන ලදී.

i. තෝරාගන්නා ලද පාරිභෝගික භාණ්ඩ සහ රථවාහන සම්බන්ධයෙන් ණයවර ලිපි විවෘත කිරීමේදී ආන්තික තැන්පතු අවශ්‍යතා,

ii. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සඳහා සුරක්ෂිතාගාරයෙහි මුදල් තබාගැනීමේ අවශ්‍යතාවය,

iii. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා භාණ්ඩ හුවමාරුව සහ අනාගත වෙළෙඳපොළක් පිහිටුවීම පිළිබඳ පූර්ව ශක්‍යතා අධ්‍යයනය.

මෙයට අතිරේකව, බැංකු ආයතන අධීක්ෂණයේ පිරිවැය සම්බන්ධ අධ්‍යයනයක් ද දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබීය.

## 19. පරිශ්‍ර

මහ බැංකුවේ නිලධාරීන් සඳහා ප්‍රවාහන සහ සන්නිවේදන පහසුකම් වැනි උපකාරක සේවාවන් සැපයීමට අමතරව මහ බැංකු පරිශ්‍රය නඩත්තු කිරීම සහ පවත්වාගෙන යෑම සඳහා දෙපාර්තමේන්තුව 2007 වර්ෂය තුළදී තවදුරටත් නිරත විය.

අවම පිරිවැයකින් හා වඩාත් කාර්යක්ෂමව සේවාවන් ලබාගැනීමේ අරමුණු ඇතිව නඩත්තු කටයුතුවලින් වැඩි කොටසක් හා ප්‍රවාහන සේවාවල කොටසක් සඳහා බාහිර ආයතන වලින් සේවා ලබාගැනීම තවදුරටත් කරනු ලැබීය.

බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ පිහිටි නේවාසිකාගාරයේ ඉදිකිරීම් වැඩ කටයුතු කරගෙන යන අතරතුර එහි පවත්නා කාමර 66 සඳහාම වායුසමීකරණ සවිකිරීම, උණු ජලය සැපයීම හා දුරකථන පහසුකම් ලබාදීම ආදිය තුළින් තරු තුනක හෝටලයක මට්ටමට පහසුකම් වැඩිකිරීමට මහ බැංකුවට අවශ්‍ය වූ අතර එය "සවරින් රෙසිඩන්සීස්" යනුවෙන් නැවත නම් කිරීමට තීරණය විය. මෙම ව්‍යාපෘතිය 2008 මාර්තු මස අග භාගයේ දී නිම කිරීමට අපේක්ෂා කරන අතර, ප්‍රථම වරට නේවාසික පහසුකම් සහිතව පුහුණු පාඨමාලා පැවැත්වීමේ හැකියාව බැංකු අධ්‍යයන කේන්ද්‍රයට හිමිවනු ඇත.

මාතර අනගාරික ධර්මපාල මාවත පුළුල් කිරීම හේතුවෙන් මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කොටසක් කඩා දැමීමට සිදුවූ අතර, ඒ සමගම සම්පූර්ණ කාර්යාලය රුපියල් මිලියන 30 ක වියදමින් ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය කෙරුණි. එහි ඉදිකිරීම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

මහල් සහිත රථ ගාලක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් දීර්ඝකාලීන බදු අයිතිය යටතේ දැනට හිමිකර ගෙන ඇති පර්චස් 134 ක බිම් කොටස පිහිටි කොළඹ කොටුවේ ට්‍රාන්ස් වර්ක් චතුරශ්‍රයේ සංවර්ධන කටයුතු 2007 වර්ෂය තුළ ආරම්භ කෙරුණි. මෙම ඉඩමේ අයිතිය වෙනුවෙන් මෝටර් රථ 400 ක්, බස් රථ 10 ක් සහ වර්ග මීටර 3,000 ක කාර්යාල ඉඩකඩ ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීමකින් තොරව ලැබෙනු ඇත.

මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයට යාබදව ඇති ඓතිහාසික මෙන්ම පෞරාණික වටිනාකමින් යුත් ප්‍රදීපාගාර ඔරලෝසු කණුව මනා ක්‍රියාකාරිත්වයෙන් පවත්වාගෙන යාමේ නඩත්තු කටයුතුවල දෙපාර්තමේන්තුව තවදුරටත් නිරත විය.

## 20. රාජ්‍ය ණය

රජයේ නියෝජිතයෙකු ලෙස රාජ්‍ය ණය නිකුත් කිරීම හා කළමනාකරණය කිරීමේ වගකීම, දරමින්, 2007 වර්ෂය තුළ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සැළකිය යුතු කාර්ය භාරයක් ඉටුකර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැළැස්මට අනුකූලව, 2007 වර්ෂය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මධ්‍යකාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයක් සැළසුම් කරන ලදී. මෙම ණය කළමනාකරණ උපායමාර්ගයෙහි, (අ) දීර්ඝකාලීනව පරිණත ණය ඒකරාශී වීම් ඉවත්කිරීම, (ආ) බැඳුම්කර වෙළෙඳපොළ විඝේදනයවීම (Fragmentation) අවම කිරීම, (ඇ) පාදක බැඳුම්කර ශ්‍රේණි හඳුන්වාදීම සහ පාදක ඵලදායිතා වක්‍රයක් වැඩිදියුණු කිරීම, (ඈ) විශ්වාසනීය සහ ද්‍රවශීලතා ණය වෙළෙඳපොළක් දියුණු කිරීම, (ඉ) විවිධාංගිකරණය වූ ණය උපකරණ හඳුන්වාදීම, (ඊ) ආයෝජක පදනම පුළුල් කිරීම සහ (උ) ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම යන මධ්‍යකාලීන උපාය මාර්ග ඇතුළත් වේ.

නොපියවූ දේශීය ණයෙහි පරිණත ව්‍යුහය මගින් කල් පිරුණු කෙටි ණයවල සැළකිය යුතු ඒකරාශිවීමක් පෙන්නුම් කරයි. මෙම ඒකරාශිවීමේ ගැටළුව සඳහා ණය ඒකාබද්ධ කිරීමේ වැඩ සටහනක් සැළසුම් කරන ලද අතර, ඒ බලපෑම තක්සේරු කිරීම සඳහා තත්ත්ව පරීක්ෂාවක් වසර තුළදී දියත් කෙරිණි. පසුගිය වසරේදී මෙන්ම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළේ පවතින අධික විඝේදනය අඩු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. නව භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ වෙළෙඳපොළට හඳුන්වාදීම සීමා කරමින් පවතින භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ නැවත විවෘත කොට නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය දෙපාර්තමේන්තුව මගින් නොකඩවා ක්‍රියාත්මක කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2006 අවසානයේදී 53 ක් වූ මුළු භාණ්ඩාගාර බැඳුම්කර සංඛ්‍යාව 2007 අවසානයේදී 42 ක් දක්වා අඩු කිරීමට හැකි විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ශක්තිමත් කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, එහි කටයුතු විවිධාංගිකරණය සඳහා ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට ද 2007 වසර තුළ පියවර ගන්නා ලදී.

2007 වර්ෂය තුළ සිදු වූ තවත් වැදගත් සිදුවීමක් වන්නේ, ප්‍රථම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සාර්ථක ලෙස දියත් කිරීමයි. මෙම බැඳුම්කරය සියයට 8.25 ක කූපන් අගයකින් සහ වසර පහක පරිණත කාලයක් සහිතව ඇ.ඩො.500 ක පාදක වටිනාකමකින් යුතුව නිකුත් කෙරිණි. මෙම ප්‍රථම ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිකුතුව, ඉතා විශිෂ්ඨ සාර්ථකත්වයක් පෙන් වූ අතර, ඒ සඳහා තුන් ගුණයකටත් වැඩි අධි දායකත්වයක් ලැබිණි. දේශීය වෙළෙඳපොළෙහි පොලී අනුපාතිකවල පීඩනය අවම කිරීමට මෙන්ම රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ආයෝජක පදනම පුළුල් කිරීමේ අරමුණින්, විදේශිකයන් සඳහා විවෘත කළ රුපියල් අගයෙන් යුත් භාණ්ඩාගාර බැඳුම්කරවල නොපියවූ තොගය 2006 වසරේදී සියයට 5 ක් වූ අතර, එය 2007 වසරේදී සියයට 10 දක්වා වැඩි කිරීමට හැකි විය. බැඳුම්කර විකිණීමේදී පනවා තිබූ වසරක රඳවා ගැනීමේ කාල සීමාවද 2007 වසර මුලදී ඉවත් කරනු ලැබීය. වසරක කාල සීමාවක්

සඳහා පසුගිය වසරේදී හඳුන්වා දුන් ජාතිය ගොඩනැගීමේ බැඳුම්කර නිකුත් කිරීම 2007 පෙබරවාරි මාසයේදී අවසන් විය.

ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගේ සහ සහභාගිවන බැංකුවල රාජ්‍ය සුරැකුම්පත් වාර්තා කිරීම සම්බන්ධ ගනුදෙනු සඳහා වැයවන වියදම අඩුකර ගැනීම පිණිස රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, වෙළෙඳපොළ සහභාගීකරුවන් හට කුඩා අගයයන් සහිත ගනුදෙනු වාර්තා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකු පුළුල් පැතුරුම් ජාලය මත පදනම් වූ යෙදීමක් හඳුන්වා දෙන ලදී. මෙමගින් මහ බැංකුව මගින් පවත්වාගෙන යනු ලබන මධ්‍යම සුරැකුම්පත් තැන්පතු ක්‍රමය තුළ හැම ගනුදෙනුවක්ම වාර්තා කරනු ලබන බැවින් රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළේ කුඩා තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව වැඩි දියුණු වේ. මේ සමගම අනිවාර්ය වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් සමග එකඟ නොවන අයට දඩයක් පැවරීම සඳහා ලංකා සෙකියුරු පද්ධතියෙහි නීති සංශෝධනයන්ද සිදු කරන ලදී.

රජයේ සුරැකුම්පත්වල ආයෝජන පදනම පුළුල් කිරීමේ අරමුණින් මෙම වසර තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව පුවත්පත් දැන්වීම් ඇතුළු ආයෝජකයන් මනා ලෙස දැනුවත් කිරීමේ වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙම දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලත් සමගම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් සහ ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම යන ආයතනවල සහයෝගය ඇතිව ප්‍රාදේශීය අලෙවි කවුළු තුළින් රජයේ සුරැකුම්පත් පාරිභෝගිකයන්ට අලෙවි කිරීමට කටයුතු කරන ලදී. 2007 අගෝස්තු 01 වැනි දින දිවයින පුරා එවැනි අලෙවි කවුළු 13 ක් විවෘත කරන ලදී. රාජ්‍ය ණය ප්‍රමාණය සහ එහි කළමණාකරනය පිළිබඳව මහජනතාවට තොරතුරු ලබාදීමේ අරමුණින් 2007 වසරේ දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ ප්‍රථම වාර්ෂික වාර්තාව එළිදක්වන ලදී. එය රාජ්‍ය ණය කළමනාකරණ ක්‍රියාවලියේ විනිවිද භාවය ඉහළ මට්ටමක පවත්වා ගෙනයාම සඳහා උපකාරි වනු ඇත. ප්‍රතිපත්ති සැලසුම්කරන්නන්, අධ්‍යාපනඥයින් හා රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ කටයුතු සඳහා සහභාගිවන්නන්ගේ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව එක්සත් ජාතීන්ගේ ආසියා ශාන්තිකර සහයෝගිතා සංවිධානයේ සහයෝගය ඇතිව රජයේ සුරැකුම්පත් පිළිබඳ දැනුම වැඩි කිරීමේ වැඩ මුළුවක් ක්‍රියාත්මක කරන ලදී.

තවද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මෙම වර්ෂයේ පළමු කාර්තුව තුළ දී ෆිච් රේටිංග්ස් සහ ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (S&P) යන ආයතනවල නියෝජිතයින්ට රටෙහි ස්වෛරීත්ව ණය ශ්‍රේණි ගත කිරීම හා සම්බන්ධව අවශ්‍ය පහසුකම් සැලසීමද සිදු කරන ලදී.

## 2007 වසර තුළ සංවර්ධනය

### ණය එක්රැස් කිරීමේ ඉලක්ක සහ ක්‍රමෝපායය

2006 අංක 47 දරන විසර්ජන පනත යටතේ 2007 වසර වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ණය සීමාව රුපියල් බිලියන 655 කි. මෙයින් රුපියල් බිලියන 433 ක් දේශීය මූලාශ්‍රවලින් සහ රුපියල් බිලියන 202 ක් විදේශීය මූලාශ්‍ර වලින් රැස් කිරීමට තක්සේරු කෙරිණි. තවත් රුපියල් බිලියන 20 ක් හදිසි අවශ්‍යතා සඳහා වෙන් කරන ලදී.

2007 වර්ෂය තුළ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මුළු ණය එක් රැස් කිරීම මුල් ඉලක්කය තුළ පවත්වා ගෙන යන ලද අතර පොත් අගය අනුව රුපියල් බිලියන 411 ක ණය ප්‍රමාණයක් දේශීය මූලාශ්‍ර වලින්ද රුපියල් බිලියන 199.7 ක් විදේශීය මූලාශ්‍ර වලින්ද රැස්කර ගන්නා ලදී. කෙසේ වුවද, දේශීය වෙළෙඳපොළෙහි පවතින ඉහළ ඵලදායිතා අනුපාතය, උද්ධමනයේ ඒකාකාරි ඉහළ යාම සහ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට ආරම්භයේදී වූ දේශීය ණය රැස් කිරීමේ සැළසුමෙන් තරමක් දුරට ඉවත්ව කෙටි කාලීන ණය උපකරණ, වෙළෙඳපොළ නොවන උපකරණ, විදේශීය මුදල්වලින් වූ ණය උපකරණ සහ භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශ ආයෝජන කෙරෙහි යොමු වීමට සිදු විය. එබැවින් පිළිවෙලින් රුපියල් බිලියන 10 ක් සහ රුපියල් බිලියන 5 ක් වූ මූලික එක්රැස් කිරීමේ ඉලක්ක අභිබවා රුපියල් ණය ලෙස රුපියල් බිලියන 23.3 ක් සහ භාණ්ඩාගාර බිල්පත් ලෙස රුපියල් බිලියන 37 ක් එක්රැස් කෙරිණි. මීට අමතරව රුපියල් බිලියන 10.5 ක් වූ මූලික ඉලක්කයට සාපේක්ෂව රුපියල් බිලියන 23.6 ප්‍රමාණයක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වලින් එක්රැස් කර ගන්නා ලදී. ණය එක්රැස් කිරීමේ මූලික ඉලක්කය වූ රුපියල් බිලියන 356 කට (පොත් අගයෙන්) සාපෙක්ෂව භාණ්ඩාගාර බැඳුම්කර තුළින් ණය එක්රැස් කිරීම රුපියල් බිලියන 302 ක අගයක් දක්වා අඩු විය. කෙසේ වුවද, ආකර්ෂනීය පොලී අනුපාත හේතුකොටගෙන දීර්ඝකාලීන භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීමට විදේශීය ආයෝජකයින් වැඩි කැමැත්තක් පෙන්වීම නිසා මෙම භාණ්ඩාගාර බැඳුම්කරවලින් 61 ක් අවුරුදු 3 කට වඩා වැඩි කල්පිරීමේ කාලසීමාවකින් යුක්ත ඒවා විය. භාණ්ඩාගාර බැඳුම්කරවල මුළු විදේශීය ආයෝජනය වූ රුපියල් බිලියන 49.7 ක ප්‍රමාණයෙන් සියයට 54 ක් අවුරුදු 3 ට වඩා වැඩි කල් පිරීමේ කාලසීමාවක් සහිත විය.

දේශීය රුපියල් වෙළෙඳපොළෙහි පීඩනය ඉවත් කිරීම සඳහා 2007 වර්ෂය තුළදී විදේශීය මුදල් එක්රැස් කිරීම කෙරෙහි වැඩි විශ්වාසයක් තබනු ලැබීය. රුපියල් බිලියන 156 ක අගයෙන් යුත් ව්‍යාපෘති/වැඩසටහන් ණය මෙම වසර තුළදී ලබා ගැනීමට බලාපොරොත්තු විය. කෙසේ වුවද වසර අවසාන වනවිට ලබාගත හැකි වූයේ, රුපියල් බිලියන 91.8 ක වටිනාකමකින් යුතු ණය ප්‍රමාණයක් පමණි. මෙයට ප්‍රතිවිරුද්ධව, 2007 වර්ෂය තුළ වෙළෙඳ ණය ප්‍රමාණය මූලික ඉලක්කය වූ රුපියල් බිලියන 46 ක විශාල ලෙස ඉක්මවා යමින් රුපියල් බිලියන 116.3 ක් දක්වා වැඩි විය. රුපියල් බිලියන 56 ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු, විදේශිකයින් සඳහා නිකුත් කළ රුපියල් බිලියන 36.8 ක වටිනාකමකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර සහ ලංකා බැංකුව හරහා පිළියෙල කළ රුපියල් බිලියන 23 ක් වූ ඒකාබද්ධ ණය මෙහි අන්තර් ගතවිය. ඊට අමතරව ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතු (රුපියල් බිලියන 23.6) සහ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් ලබා ගන්නා ලද ණය (රුපියල් බිලියන 12.1 ක්) හරහා රුපියල් බිලියන 35.7 ක් උපයා ගන්නා ලදී.

**ණය උපකරණ නිකුත් කිරීම**

2007 වසර තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි 52 ක් පවත්වා එමගින් දළ වශයෙන් රුපියල් බිලියන 817.2 ක (මුහුණත වටිනාකම්වලින්) බිල්පත් නිකුත් කරන ලදී. වෙළෙඳපොළෙහි ආයෝජන අභිරුචිය කෙටිකාලීන බිල්පත් සඳහා බව පිළිබිඹු කරමින් නිකුත් කරන ලද බිල්පත්වල මුළු දල අගය සියයට 67 ක් ම සමන්විත වූයේ දින 91 ක් හෝ ඊට අඩු කාලයකදී පරිණත වන බිල්පත් වලිනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සියයට 54 ක නොගෙවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් 2007 වසර අවසාන වනවිට මාස 3 ක් හෝ ඊට අඩු කල් පිරීමේ කාලයක් සහිතව ඉතිරිව තිබිණි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි 70 ක් සහ ඍජු නිකුතු මගින් රුපියල් බිලියන 401 ක් (මුහුණත වටිනාකම් වලින්) උපයා ගන්නා ලදී. මෙහි විදේශ ආයෝජන රුපියල් බිලියන 52.1 ක ප්‍රමාණයක් ද අන්තර් ගත විය. ඊට අමතරව රුපියල් බිලියන 23 ක්වූ රුපියල් ණය ද නිකුත් කරන ලදී.

මෙම වසර තුළදී, වසර දෙකක කල් පිරීමේ කාලයකින් යුතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, තරඟකාරි ලංසු තැබීමේ ක්‍රියාවලියක් මගින් නිකුත් කරන ලදී. මෙම වෙන්දේසිය,

**සංඛ්‍යා සටහන II-12**

**සංඛ්‍යා සටහන : 2007 වසර තුල දේශීය ණය නිකුතුව හා කල්පිරීම**

රු. දශ ලක්ෂ

| මාසය | කල් පිරීම | නිකුතුව | නැවත ගෙවීම | ශුද්ධ නිකුතුව |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | දින 91 | 358,882 | 354,834 | 4,048 |
| | දින 182 | 75,716 | 52,165 | 23,551 |
| | දින 364 | 97,810 | 74,454 | 23,356 |
| | වෙනත් | 284,780 | 286,455 | -1,675 |
| | එකතුව | 817,188 | 767,908 | 49,280 |
| භාණ්ඩාගාර බැඳුම්කර | අවුරුදු 1 | 41,884 | 15,957 | 25,927 |
| | අවුරුදු 2 | 75,614 | 64,531 | 11,083 |
| | අවුරුදු 3 | 37,436 | 55,900 | -18,464 |
| | අවුරුදු 4 | 39,623 | 37,100 | 2,523 |
| | අවුරුදු 5 | 88,909 | 45,170 | 43,739 |
| | අවුරුදු 6 | 85,937 | - | 85,937 |
| | අවුරුදු 7 | 17,105 | - | 17,105 |
| | අවුරුදු 11 | 14,677 | - | 14,677 |
| | එකතුව | 401,185 | 218,658 | 182,527 |
| රුපියල් ණය | අවුරුදු 2 | 4,461 | - | 4,461 |
| | අවුරුදු 3/4 | 1 | - | 1 |
| | අවුරුදු 3/6 | 6 | - | 6 |
| | අවුරුදු 4/6 | 2 | - | 2 |
| | අවුරුදු 3/7 | 2 | - | 2 |
| | අවුරුදු 7/8 | - | 8,500 | -8,500 |
| | අවුරුදු 3/10 | 18,824 | - | 18,824 |
| | එකතුව | 23,296 | 8,500 | 14,796 |
| ශ්‍රී ලංකා සංවර්ධන | අවුරුදු 2 | 23,592 | - | 23,592 |
| බැඳුම්කර | එකතුව | 23,592 | - | 23,592 |
| විදේශ මුදල් බැංකු | අවුරුදු 1 | 11,637 | 11,077 | 560 |
| ඒකක මගින් ගත් ණය | අවුරුදු 2 | 443 | - | 443 |
| | අවුරුදු 3 | - | 3,401 | -3,401 |
| | එකතුව | 12,081 | 14,478 | -2,398 |
| මුළු එකතුව | | 1,277,341 | 1,009,544 | 267,797 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඇ.ඩො.මිලියන 215.25 ක ලංසු වටිනාකමක් සහිතව අවස්ථා 4 කට වැඩි වාර ගණනකදී අධි දායකත්වයකින් යුක්තව පැවැත්වුනු අතර සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පන අනුපාතිකයට සහ පාදකාංක 155.24 ක අගයකට යටත්ව ඉදිරිපත් වූ ලංසු බාර ගන්නා ලදී.

මීට අමතරව වසර තුනක කාලයක් සඳහා සම්මිලිත ණයක් ලෙස ඇ.ඩො. මිලියන 210 ක විදේශීය වාණිජ ණය රැස් කිරීමක් සිදු කළ අතර එහි පොලී අනුපාතය වූයේ තුන් මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පන අනුපාතිකය (LIBOR) හා පාදකාංක 155 ක එකතුවකි. මෙම ණය මුදල පිළියෙල කරන ලද්දේ ලංකා බැංකුව මගිනි.

### ණය සේවා ගෙවීම්

වර්ෂ 2007 දී, රුපියල් බිලියන 482 ක දේශීය හා විදේශීය ණය රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් සේවාකරණය කරන ලදී. මේ සඳහා බිලියන 176 ක පොලී ගෙවීම් ද රුපියල් බිලියන 306 ක කාලීන ණය නිදහස් කිරීමේ ගෙවීම් ද අන්තර්ගත ය. දේශීය ණය මත මුළු ණය සේවා ගෙවීම් රුපියල් බිලියන 390 ක් වූ අතර විදේශීය ණය සේවා ගෙවීම් රුපියල් බිලියන 92 ක් විය.

### ඵලදා අනුපාතය සහ ද්විතීයික වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය

මෑත කාලයේ දක්නට ලැබුණු රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතවල ඉහළ යාමේ නැඹුරුව, 2007 වර්ෂය තුළද එලෙසම පැවතිණ. රුපියල් වෙළෙඳපොළේ ඵලදා අනුපාත ඉහළ යාමේ ප්‍රවණතාවයන්ට හේතු වූ ප්‍රධාන සාධක ලෙස, දැඩි මුල්‍ය ප්‍රතිපත්ති සහ අධික රාජ්‍ය ණය ගැනීමේ වැඩ සටහන් නිසා ඇති වූ ඉහළ උද්ධමනය හා උද්ධමන අනුපාතික පිළිබඳව අපේක්ෂා සහ දැඩි ද්‍රවශීලතා තත්ත්ව දැක්විය හැක. 2007 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලයේදී දින 91, 182 සහ 364 කල් පිරීමේ කාලයක් සහිත භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාත පිළිවෙලින් පාදකාංක 737,720 හා 697 බැගින් වැඩි විය. එම කාල සීමාව තුළදීම වසර 2-3 කල් පිරීමේ කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාත පාදකාංක 422 කින් වැඩි විය. මෙම වසර තුළ ප්‍රාථමික වෙළෙඳපොළේ පොලී අනුපාතික ව්‍යුහයේ වූ සෘජු ඉහළ යාම සමගම ද්විතීයික වෙළෙඳපොළ ඵලදා වක්‍රයේ ද ඉහළ යාම සිදු විය. 2007 වර්ෂයේදී කෙටි කාලීන පරිණතවීම් සඳහා වෙළෙඳපොළ තුළ වැඩි ඉල්ලුමක් ඇතිවීම මගින් ද්විතීයික වෙළෙඳපොළ තුළ භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනුවල ඉහළ වර්ධනයක් පෙන්නුම් කෙරිණ. හිමිකම් පවරනු ලබන වෙළෙඳපොළ තුළ භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනු සියයට 66 කින් ඉහළ නැංවී ඇති අතර ප්‍රතිමිලදී ගැනුම් වෙළෙඳපොළ තුළ භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනු සියයට 102 ක අගයකින් ඉහළ නැංවී ඇත. විදේශ ආයෝජකයන්ගේ ඉහළ සහභාගීත්වය හේතුකොටගෙන භාණ්ඩාගාර බැඳුම්කරවල හිමිකම් පවරනු ලබන ගනුදෙනුවල සියයට 30 ක ඉහළ යාමක් ද්විතීයික වෙළෙඳපොළ තුළ දක්නට ලැබිණ. නමුත් වෙළෙඳපොළ හවුල්කරුවන් ඔවුන්ගේ භාණ්ඩාගාර බිල්පත්, ප්‍රතිමිලදී ගැනීම සඳහා රඳවා තබා ගැනීම හේතුවෙන් ප්‍රතිමිලදී ගැනීම් වෙළෙඳපොළෙහි භාණ්ඩාගාර බැඳුම්කර ගනුදෙනුවල සියයට 10 ක පහත වැටීමක් ඇති විය.

### නිර්ලේඛන සුරැකුම්පත් පියවුම් ක්‍රමය (SSSS) සහ මධ්‍යම සුරැකුම් තැන්පතු ක්‍රමය (CDS) - ලංකා සෙකියු (LankaSecure)

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වර්ෂ 2007 දී, එහි සහභාගිකරුවන්, බලපත්‍රලාභී වාණිජ බැංකු 23 ක් ඇතුළුව සේවක අර්ථසාධක අරමුදල, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 8 දෙනෙකු, සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සීමාසහිත මධ්‍යම සුරැකුම් තැන්පතු ක්‍රමය (පෞද්ගලික) සමග ලංකා සෙක්‍යු මෙහෙයුම් නොකඩවා පවත්වාගෙන යන ලදී. වර්ෂ 2006 දී මධ්‍යම සුරැකුම් තැන්පතු ක්‍රමයෙහි මෙහෙය වූ හා ලියාපදිංචි වූ තැන්පතු ගිණුම් සංඛ්‍යාව 26,936 සිට 41,953 දක්වා සියයට 56 කින් කැපී පෙනෙන ලෙස වැඩි වී ඇති අතර වර්ෂ 2007 දී නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය තුළින් සිදු වූ මුළු ගනුදෙනු සංඛ්‍යාව 184,476 සිට 295470 දක්වා සියයට 60 කින් වැඩි විය. මේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නිරන්තරයෙන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලවල් රාජ්‍ය සුරැකුම්පත් අලෙවි කිරීම සඳහා නව අලෙවිහල් විවෘත කිරීම, කුඩා අගයන්ගෙන් යුත් ආයෝජන ප්‍රතිස්ථාන ගත කිරීමේ ගනුදෙනු ශ්‍රී ලංකා මහ බැංකු පැතුරුම් ජාලය මත පදනම් වූ යෙදුමක් තුළින් නොමිලයේ සිදු කිරීම, සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ අනෙකුත් මෙහෙයුම් උපදෙස් ආදියයි.

### ප්‍රාථමික වෙළෙඳපොළ කටයුතු අධීක්ෂණය

එතැන් පරීක්ෂණ සහ දුරස්ථ පරීක්ෂණ මගින් ප්‍රාථමික වෙළෙඳ කටයුතු අධීක්ෂණය පවත්වාගෙන යන ලදී. 2007 වසරේදී, එතැන් පරීක්ෂණ හයක් සිදු කරන ලද අතර මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීම සහ ප්‍රාථමික හා ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු ඇගයීම මගින් අඛණ්ඩ දුරස්ථ පරීක්ෂණ සිදු කරන ලදී.

## 21. ප්‍රාදේශීය සංවර්ධන

කෘෂිකාර්මික අංශය සහ සුළු හා මධ්‍ය පරිමාණ සහ කුඩා ව්‍යවසාය අංශය වෙත මූල්‍ය පහසුකම් සැපයීම වැඩිදියුණු කිරීමේ අරමුණින් තිරසාර හා අඩු වියදම් ණය මුදාහැරීමේ හා ණය සම්පාදනය කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2007 වර්ෂයේදීද ක්‍රියාත්මක කරනු ලැබිණි. 2008 වර්ෂයේදී අළුතින් ආරම්භ කිරීමට අපේක්ෂිත වූ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් පිළිබඳ වූ සාකච්ඡා අවසන් කෙරිණි. තවද, පසුගිය කාලය තුළ ක්‍රියාත්මක වූ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රමයෙහි ණය ආපසු අයවීම් උපයෝගී කොටගෙන, 2007 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය, එහි ප්‍රතිලාභීන් වෙත උපරිම ලෙස ප්‍රතිලාභ ගලායන ආකාරයට සැලසුම් කෙරිණි. කෘෂිකාර්මික අංශය මුහුණ දෙන මිල අවදානම කළමනාකරණය කිරීම හා එම අංශය වෙත තවදුරටත් ප්‍රතිලාභ සැලසීම අරමුණු කොට භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථානයක් පිහිටුවීමේ හැකියාව පිළිබඳව 2007 වර්ෂයේදී සොයා බලන ලදී. තවද, නැගෙනහිර පළාත නිදහස් කර ගැනීමට සමගාමීව එම පළාත සඳහා තුන් අවුරුදු සංවර්ධන සැලැස්මක් සකසීම හා ක්‍රියාත්මක කිරීමට

පත්කරන ලද කමිටුවේ සාමාජිකයෙකු ලෙසද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහභාගි විය. එමෙන්ම විශේෂයෙන් 2008 අයවැය ලේඛනයේ ඇතුලත් කාෂිකාර්මික හා කිරි නිෂ්පාදන සැකසුම් කටයුතු සඳහා සහනදායී ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම ඇතුළු ප්‍රාදේශීය සංවර්ධනයට අදාළ කරුණු සම්බන්ධයෙන් රජයට අවශ්‍ය උපදෙස් ලබාදීම තවදුරටත් සිදුකරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කිරීමට සහාය වූ අතර එම ණය මුදාහැරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම, ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය ප්‍රවර්ධනය කිරීම හා ප්‍රාදේශීය වශයෙන් වැදගත් වන තොරතුරු රැස්කිරීම සම්බන්ධයෙන් පුළුල් කාර්යභාරයක් ඉටුකරන ලදී.

සහභාගිත්ව ණයදෙන ආයතන වෙත ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සහ පොලී සහනාධාර සපයන පහත සඳහන් ණය යෝජනා ක්‍රම 2007 වර්ෂයේදී ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීම/සම්බන්ධීකරණය කිරීම සිදුකරන ලදී.

### ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම

**කෘෂිකාර්මික අංශය**

- දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SPCDPRF)
- තේ සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (TDPRF)

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය**

- මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය (MREAP)
- සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (SPIRIDP)

**ක්ෂුද්‍රමූල්‍ය අංශය**

- සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SFLCPRFS)
- දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (PAMPRFS)
- වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩසටහන

**පොලී සහනාධාර යෝජනා ක්‍රම**

- නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS)
- කෘෂි නවෝදය ණය යෝජනා ක්‍රමය (ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් ක්‍රියාත්මක කරන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොලී සහනාධාර සපයනු ලැබේ)

  ඉහත ණය යෝජනා ක්‍රම පිලිබඳ විස්තර පහත දැක්වෙන සංඛ්‍යා සටහනෙහි සාරාංශගත කොට ඇත.

**කෘෂිකාර්මික අංශය**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත 2007 වර්ෂයේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ආවරණය වන බෝග සංඛ්‍යාව තවදුරටත් පුළුල් කිරීමට එකඟ වන ලදී. ඒ අනුව අන්නාසි, උක්, බුලත්, ඉඟුරු හා අපනයන සඳහා උඩවැඩියා හා ඇන්තූරියම් වගා කිරීම සහ මී පැණි හා බිත්තර වී නිෂ්පාදනය සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගි වන ණය දෙන ආයතන වෙත පොලී සහනාධාර පහසුකම් ලැබෙනු ඇත. දැනට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ආවරණය වන බෝග / නිෂ්පාදන සංඛ්‍යාව 37 කි. 2006 / 2007 මහ සහ 2007 යල කන්නයන්හිදී පිළිවෙලින් රුපියල් මිලියන 967.0 ක හා රුපියල් මිලියන 869.4 ක ණය ප්‍රමාණයක් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කර තිබුණි.

කෘෂි නවෝදය ණය වැඩසටහන 2007 මාර්තු මාසයේ සිට ක්‍රියාකාරී තත්ත්වයට පත්වූ අතර, පොලී සහනාධාර මුදල් ගෙවීමේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය සහිතව ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් එය ක්‍රියාත්මක කරන ලදී. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය මගින් කෙටිකාලීන බෝග වගාව සඳහා ණය පහසුකම් සපයනු ලබන අතර, කෘෂි නවෝදය ණය වැඩසටහන යටතේ කෘෂිකාර්මික උපකරණ මිලදී ගැනීම, කෘෂිකර්මය පදනම් කොටගත් කර්මාන්ත හා ක්ෂුද්‍ර වාරි ජල පද්ධති සංවර්ධනය වැනි කෘෂිකාර්මික අංශයට අදාල පුළුල් සංවර්ධන කටයුතු සඳහා සහනදායී පොලී අනුපාතිකයන් යටතේ මැදි හා දිගුකාලීන ණය මුදල් සම්පාදනය කෙරුණි. ක්ෂුද්‍ර වාරි පද්ධති සංවර්ධනය සඳහා රු.350,000/-ක උපරිම ණය මුදලක් මේ යටතේ ලබාගත හැකි වූ අතර අනෙකුත් කටයුතු සඳහා ලබාගත හැකි උපරිම ණය මුදල රු. 100,000/- ක් විය. කෘෂිකාර්මික අංශයෙහි සංවර්ධනය සඳහා කෘෂි නිෂ්පාදන සැකසුම් කිරීමේ කටයුතු ද ඇතුලත් එම නිෂ්පාදන ක්‍රියාවලියට අදාල සෑම අංශයක් සඳහාම ණය පහසුකම් ගලායාම අවශ්‍ය වන අතර කෘෂි නවෝදය ණය වැඩසටහන මගින් එම අවශ්‍යතාවය යම්දුරකට ඉටුකරනු ලැබූ බව පෙනීයයි. 2007 සැප්තැම්බර් මස අවසානය වන විට මෙම ණය ක්‍රමය යටතේ රුපියල් මිලියන 297 ක වටිනාකමකින් යුත් ණය ප්‍රමාණයක් ණයලාභීන් 4,573 දෙනෙකු වෙත ප්‍රදානය කර තිබුණි. අදාළ වර්ෂය තුලදී තේ සංවර්ධන ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය හා දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය යටතේ ණය ගලායාම අපේක්ෂිත මට්ටම ඉක්මවා තිබූ අතර, දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය යටතේ සියළුම අරමුදල් 2007 පළමු කාර්තුව තුළදී ණය අයදුම්කරුවන් වෙත වෙන්කර අවසන් වී තිබුණි. තේ සංවර්ධන ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය හා දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය යටතේ වර්ෂය තුළදී මුදාහල ප්‍රතිමූල්‍ය වටිනාකම පිළිවෙලින් රුපියල් මිලියන 414.4 ක් හා රුපියල් මිලියන 540.2 ක් විය. මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේම ප්‍රතිමූල්‍ය වශයෙන් ලබාදෙනුයේ මුළු ණය වටිනාකමින් 87% කි.

ලෝක වෙළෙඳපොලෙහි කිරි නිෂ්පාදන මිල ගණන් ශීඝ්‍ර ලෙස ඉහළයාමත් සමඟ ආනයනික කිරි පිටි පරිභෝජනය

වෙනුවට දේශීය වශයෙන් නිෂ්පාදනය වන දියර කිරි ආදේශ කිරීමේ කඩිනම් අවශ්‍යතාවයක් පැන නැගුණි. කිරි පිටි මිල ඉහළයාමත් සමඟ එය ජනතාවගේ පෝෂණ තත්ත්වය කෙරෙහි ඇතිකරන අහිතකර බලපෑම වළක්වා ගැනීම මෙන්ම විදේශ විනිමය ඉතිරි කරගැනීමේ අපේක්ෂාව මෙහිලා වැදගත් විය. දේශීය කිරි නිෂ්පාදනය නංවාලීම සඳහා කිරි නිෂ්පාදන සැකසුම් කටයුතු විශාල පරිමාණයෙන් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව සැළකිල්ලට ගෙන කිරි නිෂ්පාදනය සඳහා සහනදායී ණය යෝජනා ක්‍රමයක් දියත් කිරීමේ අවශ්‍යතාව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රජයට පෙන්වා දෙන ලදී.

තවද, කෘෂි නවෝදය ණය වැඩසටහන යටතේ ආවරණය කළහැකි ණය සීමාවන් ඉක්මවා යන ණය අවශ්‍යතාවයන් සහිත සුළු හා මධ්‍ය පරිමාණ කෘෂි නිෂ්පාදන සැකසුම් ව්‍යාපෘති සඳහා සහනදායී මූල්‍ය පහසුකම් සැපයීමෙන් ග්‍රාමීය අංශයෙහි ඵලදායීතාවය හා ආදායම් මට්ටම වැඩිකිරීම සඳහා උපකාරී වියහැකි බවද රජයේ අවධානයට යොමුකරන ලදී. රජය වෙත කරන ලද මෙම නිර්දේශයට අනුව ග්‍රාමීය අංශයේ ඵලදායීතාව හා ආදායම් තත්ත්වය වර්ධනය කිරීමේ අරමුණින් 2008 අයවැය යෝජනාවක් මගින් නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම ණය ක්‍රමය යටතේ අඩු සංවර්ධනයක් සහිත ප්‍රදේශවල පිහිටුවන කිරි නිෂ්පාදන ව්‍යාපෘති සහ කෘෂි නිෂ්පාදන හා දියර කිරි සැකසීමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සඳහා ණය ප්‍රදානය කරන සහභාගි වන මූල්‍ය ආයතනවලට පොලී සහනාධාර ලබාගැනීමට හැකියාව ඇත.

කෘෂි නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාදීමේ අරමුණින් හඳුන්වාදෙන ලද ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය මෙම වර්ෂයේදී ද තවදුරටත් ක්‍රියාත්මක විය. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය මගින් මේ යටතේ කෘෂි නිෂ්පාදන ගැණුම්කරුවන් වෙත ණය පහසුකම් සැලසිණි. කෙසේ වුවද, ඉදිරි වෙළෙඳ ගිවිසුම් වලට එළඹි ගොවීන්ට ඇතැම් අවස්ථාවලදී ගිවිසුම් වල සඳහන් මිලට වඩා අඩු මිලකට තම නිෂ්පාදන අලෙවිකිරීමට සිදුවූ අවස්ථා නිරීක්ෂණය විය. එවැනි තත්ත්වයක් ඇතිවීමට හේතු වී ඇත්තේ ගිවිසගත් මිල විවෘත වෙළෙඳපොළෙහි මිල ගණන් වලට වඩා බෙහෙවින් වැඩිවන අවස්ථාවලදී ගිවිසගත් මිලට කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීමෙන් ගැණුම්කරුවන් වැළකී සිටීමයි. එමෙන්ම ගිවිසගත් මිලට වඩා වෙළෙඳපොළෙහි මිල ගණන් වැඩිවන අවස්ථාවලදී තම නිෂ්පාදන ගිවිසගත් පරිදි අලෙවි කිරීමට ගොවීන් ඉදිරිපත් නොවීමද දක්නට ලැබුණි. එසේ හෙයින් මිල අවදානම් කළමනාකරණය සඳහා වඩාත් ශක්තිමත් යාන්ත්‍රණයක් ඇතිකිරීම අවශ්‍ය වන බව පෙනී ගොස් තිබේ. මිල අවදානම් කළමනාකරණය හා කෘෂිකාර්මික අංශයට වෙනත් ප්‍රතිලාභ සැලසීම අරමුණු කොටගෙන ශ්‍රී ලංකාවේ භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා ඇති ඉඩකඩ සොයා බැලීමට ඒ අනුව තීරණය කෙරිණි. මෙම අරමුණ ඉටුකරගැනීම සඳහා භාණ්ඩ වෙළෙඳපොළ පිළිබඳව පුළුල් අත්දැකීම් සහිත පුද්ගලයන්ගෙන් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායමක් පත්කරනු ලැබුණි. ආරම්භක කාර්යයක් ලෙස ඉන්දියාවේ ජාතික භාණ්ඩ හා භාණ්ඩ මත වන ගිවිසුම් හුවමාරුවෙහි විශේෂඥයින් දෙදෙනෙකු විසින් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකරන ලද අතර එම කටයුතු ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන ලදී.

### සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය

මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය යටතේ වූ ණය මුදල් සඳහා සැළකිය යුතු ඉල්ලුමක් අදාළ වර්ෂය තුළ පැවැති අතර රුපියල් මිලියන 77.0 ක් වූ එහි මුළු අරමුදල් ප්‍රමාණයම 2007 වර්ෂය තුළ ඉල්ලුම්කරුවන් වෙත වෙන්කොට අවසන්ව තිබුණි. යුරෝපීය ආයෝජන බැංකු පශ්චාත් සුනාමි ණය යෝජනා ක්‍රමය (ගිවිසුම බී ) යටතේ 2007 නොවැම්බර් මස අවසානය වන විට ණය අයදුම්පත් 39 ක් යටතේ අනුමත කර තිබූ ණය ප්‍රමාණය රුපියල් මිලියන 672.2 ක් වූ අතර, එයින් ණය මුදල් 18 ක් යටතේ වූ රුපියල් මිලියන 201.4ක් මුදාහැර තිබුණි. 2008 වර්ෂය හා ඉදිරි කාලය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා අළුතින් හඳුන්වාදීමට නියමිත ණය ක්‍රමයක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රාදේශීය සංවර්ධන ණය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුව සමඟ සිදුකෙරනු සාකච්ඡා වලට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවද සහභාගි විය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මූල්‍යකරණය සඳහා මේ යටතේ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 88.89 ක් වෙන් කෙරෙන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් ඊට එක්සත් ජනපද ඩොලර් මිලියන 50 කින් දායක වේ. එම ණය ක්‍රමය කළමනාකරණය කිරීම සඳහා පත්කෙරෙන මෙහෙයුම් කමිටුවට ශ්‍රී ලංකා මහ බැංකු නියෝජිතයකු ද ඇතුළත් කොට ඇත.

### ක්ෂුද්‍ර මූල්‍ය අංශය

දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනෙහි දෙවන අදියර (PAMP Phase 11) යනුවෙන් නම්කරනු ලැබූ දිළිඳුකම පිටුදැකීමේ නව ණය ක්‍රමයක් පිළිබඳව ජාත්‍යන්තර සහයෝගිතාව සඳහා වන ජපාන බැංකුව (JBIC) සමඟ පැවැති සාකච්ඡාවන් අවසන් කරන ලදී. මෙම ණය ක්‍රමයෙහි දෙවන අදියරෙහි පුළුල් අරමුණු වන්නේ දිළිඳුකම පිටුදැකීම, ප්‍රාදේශීය වශයෙන් පවතින අසමානතාවය අඩුකිරීම හා සාමය සඳහා සහාය වීමයි. ඒ අනුව මෙම ණය ක්‍රමයෙහි කටයුතු ප්‍රධාන වශයෙන් ගැටුම් වලින් හානියට පත් ප්‍රදේශ හා ආර්ථික වශයෙන් පසුගාමී ප්‍රදේශ ඉලක්ක කොට 2008 වර්ෂයේ සිට දිස්ත්‍රික්ක 14 ක් තුළ ක්‍රියාත්මක වනු ඇත.

ඒ අතර 2006 වර්ෂය අවසානයේ දී දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනෙහි පළමු අදියර අවසන් වූ බැවින් 2007 වර්ෂයේ සිට දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහනෙහි චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවිණි. ණය වැඩසටහනෙහි පළමු අදියරට වඩා භූගෝලීය වශයෙන් පුළුල් ප්‍රදේශයක් ආවරණය වන පරිද්දෙන් හා පවත්නා සම්පත් වලින් වැඩි කොටසක් ණය වශයෙන් ප්‍රදානය කෙරෙන ආකාරයෙන් මෙම චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය සැලසුම් කර ඇත. රජය විසින් හඳුනාගන්නා ලද වඩාත් දිළිඳු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට මෙම චක්‍රීය අරමුදල් ණය ක්‍රමයේදී ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ. 2008 වර්ෂයේදී දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනෙහි දෙවැනි අදියර ක්‍රියාකාරී තත්ත්වයට පත්වීමක් සමඟ එම වැඩසටහන ක්‍රියාත්මක වන ප්‍රදේශ හැර අනෙකුත් සියළුම දිස්ත්‍රික්කයන්හි චක්‍රීය අරමුදල් ණය වැඩසටහනෙහි කටයුතු ක්‍රියාත්මක කෙරෙනු ඇත. ඒ අනුව දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනෙහි දෙවැනි අදියර සමඟ චක්‍රීය අරමුදල්

## සංඛ්‍යා සටහන II-13

### ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය සංවර්ධන ණය යෝජනා ක්‍රමවල ප්‍රධාන ලක්ෂණ

| ව්‍යාපෘතිය හා එය ක්‍රියාත්මක වන කාලසීමාව | | අරමුදල් සපයන ලද ආයතනය | පුළුල් අරමුණ | අරමුදල් යෙදවීම | ණයකරුවන් ගෙවිය යුතු පොලී අනුපාතිකය | ආපසු අයවීමේ අනුපාතිකය |
|---|---|---|---|---|---|---|
| 1. | කෘෂිකාර්මික අංශය | | | | | |
| 1.1 | දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය (SPCDPRF) (2006 - 2014) | ශ්‍රී ලංකා රජය | බහුවාර්ෂික බෝග අංශයේ වාණිජකරණය, නිෂ්පාදනය දියුණු කිරීම, පැල තවාන් දැමීම, පසු අස්වනු මෙහෙයුම් කටයුතු, නිෂ්පාදන සැකසීම හා වෙළෙඳපොළ පහසුකම් ලබාදීම. | රුපියල් බිලියන1.2 | 9% | 90% (ආසන්න වශයෙන්) |
| 1.2 | තේ සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය (TDPRF) (2006 - 2018) | -එම- | කුඩා තේ වතු හිමියන්ගේ ආදායම තිරසාර ලෙස ඉහළ දැමීම සහ අපනයන වෙළෙඳපොළ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. මේ යටතේ මූලික වශයෙන් HACCP සහතිකය ලබාගැනීම සඳහා තේ කර්මාන්ත ශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයිය හැකිය. | රුපියල් බිලියන1.1 | 9% | 90% (ආසන්න වශයෙන්) |
| 1.3 | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) (අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනකි) | සහභාගිත්ව ආයතනවල අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | සුළු ගොවීන් සඳහා මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සැපයීම.<br>● කෙටිකාලීන නිෂ්පාදන ණය<br>● බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය<br>● ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය යටතේ කෘෂිකාර්මික ද්‍රව්‍ය මිලට ගැනීම. | සහභාගිත්ව මූල්‍ය ආයතන තමන්ගේම අරමුදල් මගින් ණය ප්‍රදානය කෙරේ. | 8% | 90% (ඉක්මවා ඇත.) |
| 1.4 | කෘෂි නවෝදය ණය වැඩසටහන (2007 මාර්තු සිට 2010 පෙබරවාරි අවසානය දක්වා) | සහභාගිත්ව මූල්‍ය ආයතනවල අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත,ක්ෂුද්‍ර හා බිංදු වාරි පද්ධති ඇතුළුව කෘෂිකාර්මික හා සත්ව පාලන අංශයට අදාළ කටයුතු වලට මැදිකාලීන ණය සැපයීම. | ණයදෙන ආයතන තම සම්පත් උපයෝගී කොටගෙන ණය ප්‍රදානය කරයි. ණය ක්‍රමය ක්‍රියාත්මක වන කාලය තුළදී රුපියල් මිලියන 3,000 ක් මුදාහැරීමට අපේක්ෂා කෙරේ. | 8% | - |
| 2. | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය | | | | | |
| 2.1 | මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන (චක්‍රීය අරමුදල්) ව්‍යාපෘතිය (MREAPRFS) (2007 - 2009) | ශ්‍රී ලංකා රජය | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ආධාර සැපයීමෙන් දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම ඉහළ නැංවීම. | 2007 වර්ෂය සඳහා රුපියල් මිලියන 77 ක් වෙන්කරඇත. 2008 වර්ෂය සඳහා අරමුදල් වෙන්කිරීමට අපේක්ෂිතය. | 10% | ණය මුදල් සහන කාලය තුළ පවතී. |
| 2.2 | සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්)ණය ව්‍යාපෘතිය (SPIRDPRF) (2006 - 2010) | ශ්‍රී ලංකා රජය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය තුළ ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වර්ධනය කිරීම හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම. | රුපියල් මිලියන 100 | 10% | ණය මුදල් සහන කාලය තුළ පවතී. |
| 2.3 | යුරෝපා ආයෝජන බැංකුවේ පශ්චාත් සුනාමි ණය යෝජනා ක්‍රමය (ගිවිසුම B)(EIB) (2006 - 2014) | යුරෝපා ආයෝජන බැංකුව (EIB) | සුනාමි ව්‍යසනයට ගොදුරු වූ ප්‍රදේශ වල මධ්‍ය හා විශාල පරිමාණයේ ව්‍යාපාර යළි නගා සිටුවීම. | යූරෝ මිලියන 20 | 9% | ණය මුදල් සහන කාලය තුළ පවතී |
| 2.4 | ඉදිකිරීම් අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය (2007 - 2015) | ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය (AFD) | පශ්චාත් සුනාමි ඉදිකිරීම් කටයුතුවල යෙදෙන ඉදිකිරීම්, වාණිජ හා සංවර්ධන ආයතනය විසින් අනුමත සමාගම් වෙත යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම. | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3.<br>3.1 | ක්ෂුද්‍ර මූල්‍ය අංශය<br>වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩසටහන (2006 - 2012) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | මොණරාගල, කුරුණෑගල, බදුල්ල හා අනුරාධපුර වැනි තෝරාගත් දිස්ත්‍රික්කවල දිළිඳු ගොවීන්ගේ ජීවන තත්ත්වය සහ ආදායම් ප්‍රවර්ධනය කිරීම | යූරෝ මිලියන 10<br>ශ්‍රී ලංකා රුපියල් මිලියන 200 | 9%<br>10% | -<br>- |
| 3.2 | කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (2007 - 2015) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | මැදරට ප්‍රදේශයේ තේ සහ බහු වාර්ෂික බෝග වගා කරන කුඩා වතු හිමියන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සහ මොණරාගල ප්‍රදේශයේ අන්තර් කලාපීය ප්‍රදේශයන්හි උස්බිම් වල ආහාර බෝග වගා කරන දිළිඳු ගොවීන් රබර් වගාව සඳහා යොමු කිරීම | ඇ.එ.ජ.ඩොලර් මිලියන 40.7 | 9% | - |
| 3.3 | සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) යෝජනා ක්‍රමය (SFLCPRF ) | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුභසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් මූල්‍යකරණ පහසුකම් සැපයීම සඳහා ඵලදායී ණය මුදාහැරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම. | ශ්‍රී ලංකා රුපියල් මිලියන 512.7 | 16%-20% | 90%<br>(ඉක්මවා ඇත). |
| 3.4 | දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘති ණය (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය (PAMPRF) | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුභසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් මූල්‍යකරණ පහසුකම් සැපයීම සඳහා ඵලදායී ණය මුදාහැරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම. | ශ්‍රී ලංකා රුපියල් මිලියන 1,250 | 16% | - |
| | | | හඳුනාගත් ණය ගැනුම්කරුවන් අතර ආදායම් ඉපැයීමේ ක්‍රම හඳුන්වාදීමෙන් දිළිඳුබව දුරුලීම. | - | - | - |
| | | | සංවිධිත මූල්‍ය අංශය හා සම්බන්ධවීම සඳහා අඩු ආදායම්ලාභී කුඩා කණ්ඩායම් සංවිධානය කිරීම | - | - | - |

ආපසු අයකර ගැනීමේ අනුපාතික දත්ත තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ණය යෝජනා ක්‍රමය මගින් දිවයිනේ සියළුම ප්‍රදේශ ආවරණය කෙරෙනු ඇත. මුලින් ක්‍රියාත්මක වූ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනට සහභාගි වන මූල්‍ය ආයතන වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකු 6 පමණක් ඇතුළත් වුවද ණය ලබාගැනීම සඳහා ප්‍රතිලාභී ජන කොටස් වලට ඇති හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් චක්‍රීය අරමුදල් ණය වැඩසටහන සඳහා සහභාගි වන මූල්‍ය ආයතන සංඛ්‍යාව 14 දක්වා වැඩි කරන ලදී. මේ අතර සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය 2007 වර්ෂයේදී සතුටුදායක ලෙස ක්‍රියාත්මක විය. ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් විසින්ම කළමනාකරණයේ ප්‍රධාන වගකීම් දරනු ලබන ප්‍රතිලාභී සංවිධානයන් වන ජනතා සමාගම් මගින් මෙම ප්‍රතිලාභීන්ගේ කටයුතු කළමනාකරණය කරන ලදී.

## ණය ඇප ආවරණ යෝජනා ක්‍රම

ආර්ථිකමය වශයෙන් වැදගත් වන්නා වූ එහෙත් අවදානම් අධික අංශ වෙත ණය ගලායාමේදී ණය දෙන බැංකු මුහුණ දෙන අවදානම අවම කිරීමේ අරමුණින් යුතුව ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 12 ක් ප්‍රදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. බොහෝ ණය යෝජනා ක්‍රමවලට අදාළ ණය ඇප ආවරණ සහතික නිකුත් කිරීම අවසන්ව පැවැති අතර 2007 වර්ෂයේදී නිකුත් කරන ලද්දේ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයට හා සුසහන ණය ඇප ආවරණ ක්‍රමයට අදාළ ණය ඇප ආවරණ සහතික පමණි. 2002 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද වගා ණය වලින් ණය මුදල් 56,579 ක් සඳහා ණය ඇප ආවරණ යටතේ මෙම වර්ෂය අවසාන වන විට පැවතිණි. එයට අමතරව වාර්ෂික ඇප ආවරණ වාරික මුදල් රැස්කිරීම, ඇප ආවරණ අයදුම්පත් පරීක්ෂා කිරීම, ඇප ආවරණ ඉල්ලීම් සඳහා අදාළ ගෙවීම් කිරීම හෝ ඒවා ප්‍රතික්ෂේප කිරීම සහ ගෙවා නිමකර ඇති ඇප ආවරණ මුදල් ආපසු අයකරගැනීම සඳහා පසුවිපරම් කිරීම් වැනි කටයුතු වර්ෂය තුළදී සිදුකරන ලදී. අදාල වර්ෂය තුළදී රුපියල් මිලියන 75 ක ආදායමක් ඇප ආවරණ වාරික වලින් රැස්කර ගෙන තිබේ.

මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව ක්ෂුද්‍ර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වෙනුවෙන් නව ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද අතර, එය 2008 වර්ෂයේ දී ක්‍රියාවට නැංවෙනු ඇත. ක්ෂුද්‍ර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වෙත ණය ලබාදීමේදී සුරැකුම් පදනම් කොටගෙන ණයදීම වෙනුවට ව්‍යාපෘතිය පදනම් කොටගෙන ණය ලබාදීම සඳහා බැංකු අංශය දිරිගන්වන සුළු කොන්දේසි ඇතුළත් කර මෙම නව ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය සකස් කර ඇත.

### ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල

අනුරාධපුර, මාතලේ හා මාතර පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලයන්හි කටයුතු වල ප්‍රගතිය සම්බන්ධයෙන්, අළුතින් ස්ථාපිත කෙරුණු ප්‍රතිපත්ති සමාලෝචන හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් මාසිකව සිදුකෙරෙන මෙහෙයුම් කටයුතු ආරම්භ කොට ඇති අතර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඒවායේ සංවර්ධනාභිමුඛ කාර්යයන් පිළිබඳව සොයාබැලීම තවදුරටත් සිදු කරගෙන යන ලදී. පසුගිය කාලය තුළ සිදුකරන ලද අයුරින්ම ප්‍රාදේශීය කාර්යාල විසින් ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට සහායවීම හා ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු සිදුකරන ලදී. ගොවීන් සංවිධානගත කිරීම හා ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය යටතේ ඔවුන්ට මූල්‍ය පහසුකම් ලබාදීමට කටයුතු සැලසීම මගින් විශාල පරිමාණයෙන් බඩ ඉරිඟු වගාව ප්‍රචලිත කිරීමට අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය කටයුතු කර ඇත. තවද, සියළුම ප්‍රාදේශීය කාර්යාල විසින් ඒ ඒ ප්‍රදේශයන්හි වෙසෙන ජනතාවගේ ජීවනෝපාය මාර්ගයන්ට සම්බන්ධිත අංශවලට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම ප්‍රතිලාභී පුහුණු කිරීම් මගින් ඔවුන්ගේ ව්‍යවසායක හැකියාවන් වර්ධනය කිරීම හා එමගින් ප්‍රාදේශීය වශයෙන් ව්‍යවසායයන් ආරම්භ කරන්නන්ගේ ආදායම් උත්පාදන හැකියාව වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරිණි. මෙවැනි නිපුණතා වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් වලට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු සමඟ ඒකාබද්ධව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලද අතර ඒවාට ශ්‍රී ලංකා මහ බැංකු කටයුතු පිළිබඳව කෙරුණු දැනුවත් කිරීම් මෙන්ම මහජනතාවට වැදගත් වන වෙනත් මාතෘකා යටතේ සිදුකෙරුණු වැඩසටහන් ද ඇතුළත් විය. රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ප්‍රාදේශීය වශයෙන්කෙරෙන ආයෝජන ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කිරීම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම ද ඉහත වැඩසටහන් වලට ඇතුළත් විය. පාසැල් සිසුන් සඳහා වන අධ්‍යාපනික වැඩසටහන් මෙහෙයවීම, පළුදු වූ මුදල් නෝට්ටු භාරගැනීම, කාසි රැස්කිරීම හා ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මගින් මුදල් කළමනාකරණ කටයුතු වලට පහසුකම් සැපයීම, මහ බැංකුවේ කටයුතු වලදී ප්‍රාදේශීය වශයෙන් අවශ්‍ය වන විවිධ සහායයන් ලබාදීම, ප්‍රාදේශීය වශයෙන් දත්ත රැස්කිරීම සහ මහ බැංකු ප්‍රකාශන අලෙවිය හෝ නොමිලේ බෙදාහැරීම මගින් තොරතුරු ප්‍රචලිත කිරීම ප්‍රාදේශීය කාර්යාල විසින් සිදුකරන ලද අනෙකුත් කටයුතු වේ.

## 22. ලේකම්

ලේකම් දෙපාර්තමේන්තුව 2007 වසරේ දී කලට වේලාවට භාණ්ඩ හා සේවාවන් සැපයීමෙන් ද, ක්‍රමවේදයන් සහ ක්‍රියා පිළිවෙත් නිරන්තර ඇගයීමකට ලක් කිරීමෙන් සහ වැඩි දියුණු කිරීමෙන් ද, නිවාඩු, විශ්‍රාම වැටුප් අරමුදල්, දේශීය හා විදේශීය ගමන් සම්බන්ධ නීති සහ නියෝග ක්‍රියාවට නගමින් ද බැංකුවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා දායක විය.

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව ටෙන්ඩර් 57ක් සම්බන්ධ කටයුතු නිම කරමින් රුපියල් දශ ලක්ෂ 73.7 ක වටිනාකමකින් යුත් භාණ්ඩ හා සේවාවන් ද රුපියල් දශලක්ෂ 54 ක වටිනාකමකින් යුත් ප්‍රාග්ධන නොවන අයිතමයන් ද ගුණාත්මක භාවයෙන් යුතුව තරඟකාරි මිළ ගණන් යටතේ කලට වේලාවට සපයන ලදී. බැංකුවේ සියළුම දේපල සඳහා වියදම් සඵල විස්තීර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී. ඒ අතරම පවත්නා රෙගුලාසි සහ ව්‍යවස්ථාවන්හි, ශක්තිමත් සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීමේ අදහසින් බැංකු අත්පොත යාවත්කාලීන කිරීමට මූලික පියවර ගන්නා ලද අතර, එය 2008 වසරේ දී නිකුත් කෙරේ. බැංකුවේ පරිපාලන පටිපාටිය පිළිබඳ අභ්‍යන්තර වෙබ් අඩවියක් වර්ෂය තුළදී දියත් කරන ලදී. මහ බැංකු විශ්‍රාම යෝජනා ක්‍රමයේ, වැන්දඹු සහ අනත්දරු අරමුදලේ සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු අරමුදලේ පාලන කටයුතු ද ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. මෙම යෝජනා ක්‍රමයන් යටතේ වර්ෂය අවසාන වනවිට විශ්‍රාමිකයන් 1945 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

2007 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ සේවා තිළිණ ප්‍රදානය, නිදහස් දින උත්සවය වැනි වාර්ෂික උත්සවයන් ද විවිධ ආගමික උත්සවයන් ද සම්බන්ධීකරණය සහ සංවිධානය කරන ලදී.

## 23. ආරක්ෂක සේවා

ශ්‍රී ලංකා මහ බැංකු කාර්‍යය මණ්ඩලය, එහි ගොඩනැගිලි ඇතුලු දේපළ, අමුත්තන්, මුදල් සහ මුදල් ප්‍රවාහනය යන අංශවල ආරක්ෂාව සම්බන්ධව 2007 වසර තුළද ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සක්‍රීයව දායක විය.

එසේම මහ බැංකු අත්‍යවශ්‍ය කාර්‍යයන්, හදිසි අවස්ථාවකදී අඛණ්ඩව පවත්වා ගෙන යෑමට හැකිවනු පිණිස "බැංකු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමේ සැලැස්ම" සහ හදිසි අවස්ථාවකදී මහ බැංකු සේවකයින් කටයුතු කළයුතු ආකාරය දැක්වෙන "හදිසි අවස්ථා සැලැස්ම" ද සකස් කිරීමට සහ එය අත්හදා බැලීමට ද ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 2007 වසර තුළ තම දායකත්වය පිරිනමනු ලැබීය.

තවද හදිසි අවස්ථාවකදී ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව ගිනි පෙරහුරු වාර හතක් ද ප්‍රථමාධාර පිළිබඳ පුහුණු වැඩ මුළු දෙකක්ද පවත්වනු ලැබූ අතර, වාර්ෂිකව පවත්වනු ලබන ජීව වෙඩි පුහුණුවද අදාළ වසර තුළ සාර්ථකව සිදු කෙරිණ.

තවදුරටත් බැංකු පරිශ්‍රය හා කාර්‍යය මණ්ඩලයේ ආරක්ෂාව තහවුරු කිරීමට හැකිවනු පිණිස එහි පරීක්ෂාවන් වැඩි දියුණු

කිරීමේ අරමුණින් ආරක්ෂක උපකරණ (ලෝහමය සහ පුපුරණ ද්‍රව්‍ය අනාවරණ යන්ත්‍ර) බැංකු පරිශ්‍රයන් තුළ ස්ථාපිත කිරීමට පියවර ගත් අතර, එම යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක් ආරක්ෂක නිලධාරීන්ට ලබා දීමට ද කටයුතු කෙරින. එසේම දැනට සවිකර ඇති පාර්සල් සහ ගමන් මළු පරීක්ෂා කිරීමේ යන්ත්‍ර වෙනුවට නව යන්ත්‍ර ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු ද 2007 වසර තුළ සිදු කරන ලදී.

## 24. සංඛ්‍යාන හා ක්ෂේත්‍ර සමීක්ෂණ

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව ජාතික ගිණුම් සහ මිල ගණන්, වැටුප්, ශ්‍රම බලකාය, සේවා නියුක්තිය හා වෙනත් සමාජ, ආර්ථික අංශ පිළිබඳව දත්ත එක්රැස් කිරීම, සම්පාදනය කිරීම හා බෙදාහැරීමේ කටයුතු 2007 වසරේදී ද අඛණ්ඩව සිදුකළේය. ශ්‍රී ලංකාව සහ එහි පළාත් සඳහා සෞභාග්‍යය මැනීමේ දර්ශකයක් සම්පාදනය කිරීම හා විධිමත් පදනමක් මත අපේක්ෂිත උද්ධමනය පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම 2007 වසරෙහි දෙපාර්තමේන්තුව සිදුකළ සුවිශේෂ කාර්යයන් විය. ඊට අමතරව, දෙපාර්තමේන්තුව වර්ෂය තුළ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා මාධ්‍ය සාකච්ඡාවලට සම්පත් දායකයන් සැපයීමෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාව දැනුවත් කිරීම සඳහා පවත්වන වැඩසටහන්වලට ක්‍රියාශීලීව සහභාගී විය. දෙපාර්තමේන්තුවේ වැඩකටයුතු වල ගුණාත්මක භාවය හා ඵලදායිතාව වර්ධනය කිරීමෙහිලා ඉවහල් වන පරිද්දෙන් තම දැනුම හා කුසලතාවයන් තවදුරටත් වර්ධනය කරගැනීමට මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් රැසක් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූහ.

### සංඛ්‍යාන සමීක්ෂණ

මුල්‍ය ප්‍රතිපත්ති වඩාත් ඵලදායි ආකාරයෙන් මෙහෙයවීමට අනාගත උද්ධමනය පිළිබඳ පාරිභෝගික, ආයෝජන හා ව්‍යාපාරික ප්‍රජාවගේ අපේක්ෂා පිළිබඳ විධිමත් ආකාරයෙන් විමසා බැලීමේ වැදගත්කම සලකා, 2006 වසරේ ආරම්භ කරන ලද උද්ධමන අපේක්ෂණ පිළිබඳ සමීක්ෂණය 2007 වසරේ මාසික පදනමක් මත සිදුකරන ලදී. දුරකථන සාකච්ඡා, සේවා ස්ථානයන්හි සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා හා විද්‍යුත් තැපැල යන විවිධ මාර්ග වලින් ලබාගන්නා ලද ප්‍රතිචාර 300 ක පමණ නියැදියකින් මාසික සමීක්ෂණය සමන්විත විය.

මාසික සමීක්ෂණයෙහි ප්‍රතිඵල, ඊට පසු මාසයේ මුල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ සහ මුල්‍ය ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ මාසික රැස්වීම්වලට ඉදිරිපත් කරන ලදී. ඊට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණ කමිටුවේ ඉල්ලීම මත, විවිධ වටිනාකම් වලින් යුත් මුදල් නෝට්ටු සහ කාසි භාවිතයට ඇති ලැදියාව හා මහජනතාව මුදල් ගෙවීමේ ක්‍රමයෙන් විද්‍යුත් ගෙවීම් වලට මාරුවීම පිළිබඳ සමීක්ෂණයක් දෙපාර්තමේන්තුව සිදුකළේය. මහජනතාව විවිධ අගයන්ගෙන් යුත් ව්‍යවහාර මුදල් වලට ඇති කැමැත්ත පිළිබඳ විමසා බැලීමත්, ණය කාඩ්පත්, හර කාඩ්පත් හා ටෙලි බැංකු කටයුතු වැනි විකල්ප ගෙවීම් මාර්ග පිළිබඳ ඔවුන්ගේ කැමැත්ත විමසාබැලීමත් මෙම සමීක්ෂණයේ අරමුණ විය.

සමීක්ෂණය කොළඹ අවට උප නාගරික ප්‍රදේශවල, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් අහඹු ලෙස තෝරා ගන්නා ලද ග්‍රාම නිලධාරි වසම් 16 කට සීමා වූ අතර, එය ප්‍රතිචාර දැක්වූ 1250 ක නියැදියකින් සමන්විත විය. තවද, 2006 වසරෙහි ආරම්භ කරන ලද ඉඩම් මිල ගණන් පිළිබඳ සමීක්ෂණය, 2007 වසරේ සැප්තැම්බර් මස සිට යළිත් ආරම්භ කරන ලද අතර, කොළඹ නගරය අවට උප නගරවල ඉඩම් විකිණීම සඳහා සතිපතා පුවත්පත් වල දැන්වීම් පළකළ විකුණුම්කරුවන්ගේ මිල ගණන් විමසා, මාසික පදනමක් මත මෙම සමීක්ෂණය සිදු කළේය. මෙම මිල ගණන් පිළිබඳ විශ්ලේෂණ වාර්තා මුල්‍ය පද්ධති ස්ථායිතා කමිටුවේ ඉල්ලීම මත එයට ඉදිරිපත් කෙරිනි.

### ජාතික ආදායම් ගිණුම්

2006 වසර අවසාන වන තෙක් ශ්‍රී ලංකා මහ බැංකුව හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව යන දෙකම ජාතික ආදායම් ගිණුම් ඇස්තමේන්තු සකස් කිරීමේ හා බෙදාහැරීමේ නිරත විය. මෙයින් එකම කටයුත්ත දෙවරක් සිදු කෙරුනු අතර රටේ ආර්ථික වර්ධනය පිළිබඳ රාජ්‍ය ආයතන දෙකක් එකිනෙකට වෙනස් තොරතුරු ඉදිරිපත් කිරීම, මහජනතාවගේ සිත් ව්‍යාකූල කරවන්නක් ද විය. ජාතික ගිනුම් සම්පාදනයෙහි ලා ලොව බොහෝ රටවල් අනුගමනය කරන ජාත්‍යන්තර පරිචය නම්, රටේ ජාතික සංඛ්‍යාන ආයතනය මගින් එය සිදුකිරීමයි. ශ්‍රී ලංකාව ද මෙම පරිචයම අනුගමනය කිරීම යෝග්‍ය යයි සලකනු ලැබිණි. ඒ අනුව 2007 වසරේ සිට රටේ ආර්ථික ක්‍රියාකාරීත්වය පිළිබඳ තම විශ්ලේෂණයේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන ජාතික ආදායම් ගිණුම් ඇස්තමේන්තු භාවිතා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කළ අතර, අනාගත ආර්ථික වර්ධන ක්‍රියාකාරීත්වයන් ඇගයීම සඳහා සහ සාර්ව ආර්ථික කළමනාකරණය සඳහා දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීම පමණක් අඛණ්ඩව කරගෙන යාම සිය කාර්යය වශයෙන් සළකන ලදී. ඒ අනුව දෙපාර්තමේන්තුව මහ බැංකු ප්‍රකාශන මගින් ආර්ථික වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය අඛණ්ඩව සිදුකළ අතර, අවශ්‍ය වූ විට ආර්ථික වර්ධන පුරෝකථනයන් සැපයීමද සිදුකළේය. මෙය, මිල දර්ශක ගණනය කිරීම, උද්ධමනය මිණීම සහ පුරෝකථනය කිරීම සඳහා අනුගමනය කරන පරිචයටම සමාන වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තථ්‍ය මිල දර්ශක හා උද්ධමනය පිළිබඳ ගණන් බැලීම සිදුකළ අතර, මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්ති තීරණ උදෙසා උද්ධමනයෙහි වෙනස්වීම විමසාබැලීමට හා පුරෝකථනය කිරීමට ඒවා භාවිතා කළේය.

### දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල

1978 ආරම්භ කරන ලද දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ ක්‍රමය මගින් පරිභෝජන භාණ්ඩවල සිල්ලර මිල ගණන්, කෘෂිකාර්මික භාණ්ඩවල නිෂ්පාදන මිල ගණන් හා අවිධිමත් අංශයට අදාළ වැටුප් අනුපාත පිළිබඳ දත්ත එක්රැස් කිරීම අඛණ්ඩව සිදුකළේය. දත්ත රැස්කිරීම, දත්ත රැස්කිරීමේ සමීක්ෂකයන් ලෙස කටයුතු කරනු ලබන රජයේ පාසැල්වල ගුරුවරුන්ගෙන් සමන්විත දීප ව්‍යාප්ත ජාලයක් මගින් දිවයින පුරා ක්‍රියාත්මක වන දත්ත

රැස්කිරීමේ මධ්‍යස්ථාන 103 ක් මගින් සිදුකරන ලදී. මෙම ක්‍රමය යටතේ එක්රැස් කළ දත්ත මිල දර්ශක සැකසීමට, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා මිල ගණන් වල හැසිරීම පුරෝකථනය කිරීමට, ප්‍රතිපත්තිමය තීරණ මිල ගණන් වෙනස්වීම් කෙරේ බලපෑ ආකාරය විමසීමට සහ ජාතික වියදම් හා ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමට පුළුල් වශයෙන් යොදාගන්නා ලදී. මිල සහ වැටුප්වල කාලීන වෙනස්වීම් විශ්ලේෂණය කිරීමට සහ ප්‍රාදේශීය වශයෙන් පවත්නා වෙනස්කම් විශ්ලේෂණය කිරීම සඳහා මෙම දත්ත ප්‍රයෝජනවත් විය. වැටුප් තොරතුරු එක්රැස් කිරීම වී, තේ, රබර් සහ පොල් වගාවන්, කුඩා පරිමාණ ඉදිකිරීම් සහ සේවා යන උප අංශයන්ගෙන් ආවරණය විය. වසර ආරම්භයේදී සකස් කරන ලද වාර්ෂික කාලසටහනකට අනුව දත්ත රැස්කිරීමේ මධ්‍යස්ථාන විධිමත්ව අධීක්ෂණය කිරීම තුළින් දත්ත එක්රැස් කිරීමේ නිරවද්‍යතාවය තහවුරු කරන ලදී. දත්ත රැස්කිරීමේ නිරවද්‍යතාව, ගුණාත්මක භාවය, කාර්යක්ෂමතාවය හා කාලීන බව වැඩිදියුණු කිරීම සඳහා දත්ත සමීක්ෂකයන් වැඩිදුරටත් පුහුණු කිරීම සඳහා ඊට පෙර වසරවල මෙන් 2007 වසරෙහිද කොළඹ, මාතර, අනුරාධපුර හා මහනුවර ප්‍රාදේශීය සම්මන්ත්‍රණ පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණවලදී, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ වැනි ආර්ථිකයේ ඇති වූ සමකාලීන සංවර්ධනයන් පිළිබඳ විශේෂ සැසිද පවත්වන්නට යෙදුනි. එබඳු වැඩසටහන්වල ඵලදායිතාව, සමීක්ෂකයන් ලෙස සහභාගී වූ ගුරුභවතුන්ගේ දැනුවත් බව වැඩිවීම හා ඔවුන් දැක්වූ උද්යෝගය තුළින් පිළිබිඹු විය.

### මිල, වැටුප් හා සේවානියුක්තිය

වඩා වැඩි නියෝජනයක් සහිත පාරිභෝගික මිල දර්ශකයක අවශ්‍යතාව හඳුනාගනිමින් සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පැවති දුර්වලතාවලට පිළියම් ලෙස 2007 නොවැම්බර් මස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.(නව)) නමින් නව මිල දර්ශකයක් සකස් කළේය. සමකාලීන මිලදීගැනීම් ස්වභාවය පිළිබිඹු වන පරිදි මෙම දර්ශකය සම්පාදනය හා බර තැබීමේ ව්‍යුහය තීරණය කිරීම, කොළඹ දිස්ත්‍රික්කයේ සියළු නාගරික කුටුම්භයන්හි වියදම් පිළිබඳව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2002 දී සිදුකරන ලද කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය පදනම් කරගනිමින් සිදුකරන ලදී. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරනු ලබන දර්ශක පදනම් කර ගනිමින්, පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් වෙනස්වීම් විශ්ලේෂණය කිරීමත්, මාසිකව පුවත්පත් නිවේදන නිකුත් කිරීමත් දෙපාර්තමේන්තුව අඛණ්ඩව සිදුකළේය.

සිල්ලර මිල මට්ටමේදී සමස්ත මිල ගණන්වල වෙනස්වීම් මණිනු ලබන ප්‍රාදේශීය මිල දර්ශක 4 ක් අනුරාධපුර, මාතලේ, මාතර හා කොළඹ දිස්ත්‍රික්ක සඳහා සම්පාදනය කිරීම සහ විශ්ලේෂණය කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. පළාත්බද සංවර්ධනය සම්බන්ධයෙන් පළාත් මට්ටමින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ප්‍රාදේශීය දර්ශක වෙනුවට පළාත් සඳහා වූ පාරිභෝගික මිල දර්ශක ආදේශ කරන ලදී. 2003/2004 නවතම පාරිභෝගික, මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය පදනම් කර ගනිමින්, දෙපාර්තමේන්තුව විසින් මෙම පළාත් පාරිභෝගික මිල දර්ශක සම්පාදනය කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. මෙම දර්ශක සැකසීම සඳහා අවශ්‍ය මිල ගණන්, දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ ක්‍රමය යටතේ හෝ පුහුණු කරන ලද සහ දෙපාර්තමේන්තුව විසින් මනාව අධීක්ෂණය කළ බාහිර විමර්ශකයන් මගින් ලබා ගැණින. ඒ අතර, නිෂ්පාදන මිල හෝ ප්‍රාථමික වෙළඳපොල මට්ටමේදී තොග මිල ගණන්වල වෙනස්වීම් විශ්ලේෂණය කිරීම සඳහා තොග මිල දර්ශකය සම්පාදනය කිරීමද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී.

2003/2004 පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණය මත පදනම් වෙමින්, නවතම බර තැබීම් සමග ඉතාමත්ම මෑතකාලීන පරිභෝජන රටාවන්ද ඇතුලත් වන සේ මුළු රටම ආවරණය වන පරිදි සංයුක්ත පාරිභෝගික මිල දර්ශකයක් සැකසීම වසර තුළ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. 2007 ආරම්භයේ සිට මෙම දර්ශකය මාසිකව සකස් කරන ලද අතර, ජාතික මට්ටමේදී මිල මට්ටම්වල චලනයන් පිළිබඳ වඩාත් යථාර්ථවාදී චිත්‍රයක් ඒ මගින් සැපයිනි. එමෙන්ම, දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ ක්‍රමයේ වැටුප් දත්ත පදනම් කර ගනිමින්, ශ්‍රී ලංකාව සඳහා අවිධිමත් අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයක් සැකසීමද දෙපාර්තමේන්තුව සිදුකළේය.

2001 වසරෙහි ආරම්භ කරන ලද රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සහ කාර්තුමය සමීක්ෂණ, කාර්තුමය ජාතික ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම, සේවා නියුක්තියේ මට්ටම සහ එහි ප්‍රවණතා පිළිබඳව විමසාබැලීම සඳහා මෙම වර්ෂය තුළදීද, දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. 2006 වර්ෂයේදී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණයේදී වාර්තා කරන ලද දහසකට වැඩි සේවක සංඛ්‍යාවකින් යුක්ත අනෙකුත් මධ්‍යම රජයේ හා රාජ්‍ය අංශයේ ආයතන "පළාත් සභා හැර", මෙම සමීක්ෂණයට ඇතුළත් විය.

ශ්‍රම බලකාය සහ ශ්‍රම වෙළඳපොල පිළිබඳ එක්රැස් කරන ලද තොරතුරු, විදේශ සේවා නියුක්තිය, සේවක සම්බන්ධතා සහ ශ්‍රම වෙළඳපොල ප්‍රතිසංවිධාන යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විශ්ලේෂණය කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

### සංඛ්‍යාන තොරතුරු බෙදාහැරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, එහි වාර්ෂික ප්‍රකාශන දෙක වන "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2007-xxx වන වෙළුම" සහ "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2007-xxi වන වෙළුම" වසර තුළ ප්‍රකාශයට පත් කළේය. බැංකුවෙහි 2008 සාක්කු දිනපොතෙහි සංඛ්‍යාන වගු ද නව තොරතුරු වලින් යාවත්කාලීන කරන ලදී.

බැංකුවේ ව්‍යවස්ථාපිත සහ අනෙකුත් ප්‍රකාශන සඳහා ද වසර මුළුල්ලේම දෙපාර්තමේන්තුවේ දායකත්වය සැපයීය. ජාතික ගිණුම්, උද්ධමනය, මිල, වැටුප් හා ශ්‍රම වෙළෙඳපොලේ පවත්නා සංවර්ධනයන් සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී මුදල් මණ්ඩලය දැනුවත් කරනු ලැබීය. බැංකුවේ අවපැතුරුම් ජාලය තුළ (StaNet) දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන

කිරීමද, වසර පුරා බැංකුවේ වෙබ් අඩවිය සඳහා දායකවීමද දෙපාර්තමේන්තුව අඛණ්ඩව සිදුකළේය.

## 25. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද මුදල් සමාගම් සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් නියාමනය සහ අධීක්ෂණය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන අතර, 2007 වර්ෂය තුළ දී ද එම කටයුතු නොකඩවා සිදුවිය.

කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචිව තිබූ සමාගම් තුනක් 2007 වර්ෂය තුළ දී මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි වීමත් සමග වර්ෂය අවසානය වන විට ලියාපදිංචි මුදල් සමාගම් මුළු සංඛ්‍යාව 32 ක් දක්වා වැඩිවිය. එමෙන්ම නව සමාගම් හතරක් කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ අතර, ඒ අනුව කල්බදු මූල්‍යකරණ ආයතන ලෙස ලියාපදිංචි මුළු ආයතන සංඛ්‍යාව 76 ක් දක්වා ඉහළ ගියේය.

### 25.1 ලියාපදිංචි මුදල් සමාගම්

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සිය අධීක්ෂණ හා නියාමන කටයුතු සිදුකිරීම සඳහා දුරස්ථ පරීක්ෂණ සහ එතැන් පරීක්ෂණ යන විධික්‍රම දෙකම භාවිතා කරනු ලැබේ. දුරස්ථ පරීක්ෂණ සියලුම මුදල් සමාගම් සඳහා මාසිකව සිදුකරනු ලබන අතර, එතැන් පරීක්ෂණ කලින් සකස් කරන ලද සැලසුමකට අනුව සිදුකරනු ලැබේ.

එමෙන්ම, එතැන් පරීක්ෂණ සඳහා භාජනය නොවන සමාගම්වල තෝරාගත් විශේෂිත ක්ෂේත්‍රයන් ද ආවරණය වන පරිදි සීමිත එතැන් පරීක්ෂණ කටයුතු සෑම වර්ෂයකම සිදුකරනු ලැබේ.

**(අ) දුරස්ථ පරීක්ෂණ ක්‍රමය**

දුරස්ථ පරීක්ෂණ සඳහා මූලික වශයෙන් උපයෝගී කරගන්නේ ලියාපදිංචි මුදල් සමාගම් විසින් කාලීනව මෙම දෙපාර්තමේන්තුව වෙත සපයනු ලබන මූල්‍ය ප්‍රකාශන වන අතර ඒවා විශ්ලේෂණය කිරීම මගින් එකී ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලැබ ඇති විධානයන් සහ රීතීන් පිළිපදින්නේ ද යන්න විමසා බැලේ.

**(ආ) එතැන් පරීක්ෂණ ක්‍රමය**

එතැන් පරීක්ෂණ ක්‍රමය මගින් ලියාපදිංචි මුදල් සමාගම්වල වත්කම්වල තත්ත්වය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය, කළමනාකරණ කාර්යක්ෂමතාවය, ඉපැයීම්, ලාභදායිත්වය, පද්ධති හා පාලන විධි සහ ආයතනික යහපැවැත්ම සම්බන්ධව ඇගයීම් සිදුකරනු ලැබේ. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2007 වර්ෂය තුළ ලියාපදිංචි මුදල් සමාගම් 7 ක් සම්බන්ධව සම්පූර්ණ එතැන් පරීක්ෂණ සිදුකරනු ලැබීය. ඊට අමතරව, සම්පූර්ණ එතැන් පරීක්ෂණ සඳහා භාජනය නොවූ ලියාපදිංචි මුදල් සමාගම් 24 ක් සඳහා තෝරාගත් විශේෂ ක්ෂේත්‍රයන් එනම්, ද්‍රවශීලතාවය, ණය කළමනාකරණය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය සහ පද්ධති හා පාලන විධි ආවරණය වන පරිදි විශේෂිත එතැන් පරීක්ෂණ සිදු කර ඇත.

මෙම සම්පූර්ණ එතැන් පරීක්ෂණ හා විශේෂිත එතැන් පරීක්ෂණවලදී හඳුනාගන්නා දුර්වලතාවයන් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය උපදෙස් අදාළ මුදල් සමාගම් සහ කල්බදු මූල්‍යකරණ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට දැනුම් දීමට ද කටයුතු කර ඇත. ක්ෂණිකව අවධානය යොමුවිය යුතු සහ නිවැරදි කළ යුතු ක්ෂේත්‍ර එසේ නිවැරදි කිරීමටත් අනෙකුත් දුර්වලතාවයන් සඳහා නිශ්චිත කාලසීමාවක් තුළ කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලවල එකඟතාවය ලබාගැනීමට ද කටයුතු කර ඇත. මෙම නිවැරදි කිරීම් පිළිබඳව දෙපාර්තමේන්තුව සමීපව පසු විපරම් කරනු ලබන බව ද සඳහන් කළයුතු ය.

**(ඇ) විධාන නිකුත් කිරීම**

2007 වර්ෂය තුළ දී, පෙර වර්ෂවල දී නිකුත් කරන ලද විධානයන් දෙකක් වෙනුවට නව විධානයන් දෙකක් නිකුත් කරනු ලැබීය. ඊට අමතරව තීරණය කිරීම් එකක් සහ එක් උපදෙස් මාලාවක් ද වර්ෂය තුළ දී නිකුත් කරනු ලැබ ඇත. ඊට අමතරව 1995 අංක 1 දරන මුදල් සමාගම් (ආදායම් හඳුනාගැනීම සහ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම්) විධානය පසුගිය වර්ෂය තුළ දී අහෝසි කරනු ලැබීය.

- **2007 අංක 1 දරන මුදල් සමාගම් (ණය දීම) විධානය**

2006 අංක 5 දරන මුදල් සමාගම් (ණය දීම) විධානය අවලංගු කරමින් නිකුත් කරන ලද මෙම විධානයට අනුව කිසිම ලියාපදිංචි මුදල් සමාගමක් විසින්,

(i) එම මුදල් සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකුට සහ / හෝ ඔහුගේ ඥාතියෙකුට;

(ii) එහි පාලන සමාගමට;

(iii) එම සමාගමෙහි කොටස් හෝ එහි කවර හෝ පාලිත සමාගමක කොටස් සුරැකුම් ලෙස තබාගෙන;

(iv) එම සමාගමේ කොටස් මිලට ගැනීම පිණිස; හෝ

(v) මුදල් සමාගමේ අධ්‍යක්ෂවරයකුගේ, ඔහුගේ ඥාතියකුගේ හෝ මුදල් සමාගමේ යම් සේවකයකුගේ ඇපය හෝ හානි පූරණය මත කිසිදු ණය පහසුකමක් ප්‍රදානය නොකළ යුතුය.

කෙසේ වුවත්, මෙම විධානය මගින් කිසියම් මුදල් සමාගමක සේවා නියුක්තයන් විසින් දරනු ලැබීම පිණිස භාරකරුවන් විසින් මිල දී ගැනීමක් ලෙස එම සමාගමේ කොටස් මිල දී ගැනීම සඳහා ණය මුදල් නිකුත් කිරීමට ඉඩ ලබාදී ඇත.

- **මුදල් සමාගම් (අධ්‍යක්ෂවරුන් සහ ඔවුන්ගේ ඥාතීන් සමග ව්‍යාපාර ගනුදෙනු) විධානය**

මෙම විධානය නිකුත් කිරීමේ මූලික අවශ්‍යතාවය වූයේ 2006 අංක 6 දරන මුදල් සමාගම් (අධ්‍යක්ෂවරුන් සහ ඔවුන්ගේ ඥාතීන් සමග ව්‍යාපාර ගනුදෙනු) විධානය මගින් සමාගමේ අධ්‍යක්ෂවරුන් සහ ඔවුන්ගේ ඥාතීන් සමග සිදුකළ හැකි

ගනුදෙනු සම්බන්ධව පනවා තිබූ සීමාවන් ඉවත්කර ඔවුන්ගෙන් කාලීන හා ඉතුරුම් තැන්පතු ලබාගැනීමත් ඒ සඳහා පොලී ගෙවීමත් යන ගනුදෙනු සඳහා ඉඩකඩ සැලසීමයි.

**(ඈ) උපදෙස් හා තීරණ නිකුත් කිරීම**

2007 අංක 1 දරන (බාල වයස්කරුවන් සඳහා ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යාම) සම්බන්ධව උපදෙස් මාලාවට අනුව ලියාපදිංචි මුදල් සමාගමක් විසින් බාලවයස්කරුවකු වෙනුවෙන් පවත්වාගෙන යන ගිණුමක ශේෂය එහි මුල් තැන්පතුව සිදුකර මාස 60 ක් කල්පිරුණ පසුව එම බාලවයස්කරුගේ දෙමව්පියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකරුවකුගේ උපදෙස් මත මුදල් තැන්පතු භාරගැනීමට නීත්‍යානුකූල අවසරය ලත් ආයතනයක පවත්වාගෙන යන ගිණුමකට මාරුකරනු ලැබිය හැක.

තවද, අධ්‍යාපන කටයුතු හෝ වෛද්‍ය වියදම් දැරීම වැනි විශේෂිත කාර්යයක් සඳහා බාලවයස්කරුවන්ගේ ගිණුම්වලින් මුදල් ආපසු ගැනීමට ද මෙම උපදෙස් මාලාව මගින් ඉඩ සලසා ඇත.

තවද, මුදල් සමාගම් පනතේ 46 වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද තීරණයක් මගින්, විශේෂිත කොන්දේසි යටතේ, මුදල් සමාගම් විසින් නිකුත් කරන ලද අනාරක්ෂිත ණයකරවල මුහුණත අගය සිය ප්‍රාග්ධන අරමුදල්වල ඇතුළත් කිරීමට ලියාපදිංචි මුදල් සමාගම්වලට අවසර ලබාදී ඇත.

## 25.2 ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

**(අ) කල්බදු මූල්‍යකරණ ආයතන ලියාපදිංචි කිරීම**

2007 වර්ෂය තුළ දී, පොදු සමාගම් 4 ක් කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීය. ඒ අනුව, 2007 වර්ෂය අවසානය වනවිට, බලපත්‍රලාභී වාණිජ බැංකු 15 ක්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 9 ක්, ලියාපදිංචි මුදල් සමාගම් 32 ක් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 20 ක් වශයෙන් ලියාපදිංචි මුළු කල්බදු මූල්‍යකරණ ආයතන සංඛ්‍යාව 76 ක් ව පැවතිණි.

**(ආ) විධානයන් නිකුත් කිරීම**

කල්බදු මූල්‍යකරණ ආයතන විසින් ණය උපකරණ නිකුත් කිරීම මගින් මුදල් රැස්කිරීමට අදාළව සපුරාලිය යුතු අවශ්‍යතාවයන් නියම කරමින් වර්ෂය තුළ දී එක් විධානයක් එනම්, 2007 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (ණය උපකරණ) විධානය නිකුත් කරන ලදී.

**(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන අධීක්ෂණය කිරීම**

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2007 වර්ෂය තුළ දී ද විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන විසින් මාසිකව සපයනු ලබන මූල්‍ය ප්‍රකාශන උපයෝගී කරගෙන දුරස්ථ පරීක්ෂණ කටයුතු සිදුකරන ලදී. (අනෙකුත් ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන වන බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලියාපදිංචි මුදල් සමාගම් ඒවාට අදාළ පනත් යටතේ ව්‍යවස්ථාපිත අධීක්ෂණයන්ට ලක්වේ.) මීට අමතරව එතැන් පරීක්ෂණ 2 ක් සහ සීමිත එතැන් පරීක්ෂණ 17 ක් ද පසුගිය වර්ෂය තුළ දී සිදුකර ඇත. එතැන් පරීක්ෂණවල අරමුණ වූයේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල මූල්‍ය තත්ත්වය, එම ආයතන විසින් මුහුණ දිය හැකි අවදානම සහ එකී ආයතනවල පද්ධති සහ පාලන විධි පිළිබඳව ඇගයීමක් කිරීමයි. ඊට අමතරව විධානයන් පිළිපැදීම සහ දුරස්ථ පරීක්ෂණය සඳහා සපයනු ලබන මූල්‍ය තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම ද මෙම එතැන් පරීක්ෂණවල දී සිදුවිය. විධානයන් පිළි නොපැදීම සම්බන්ධව හෙළිවන තොරතුරු අනුව එම විධානයන් පිළිපැදීම සඳහා නිශ්චිත කාලසීමාවක් ද සහිතව උපදෙස් දීමත් ඒ සම්බන්ධව පසු විපරම් කිරීමත් සිදු කරනු ලැබිණ.

## 25.3 අසාර්ථක වූ මුදල් සමාගම්

අසාර්ථක වූ මුදල් සමාගම් නවයක පරිපාලනය සහ කළමනාකරණය මුදල් සමාගම් පනත යටතේ 1988 සිට මුදල් මණ්ඩලය වෙත පවරා ගෙන ඇත. මෙම සමාගම් අතුරින් එකක් 2007 වර්ෂය තුළ ගනුදෙනු බේරා වසා දැමීමත් සමග එසේ වසා දමන ලද මුළු මුදල් සමාගම් සංඛ්‍යාව හතරක් බවට පත්විය. තවත් 4 ක් සඳහා ඈවර කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. අනෙක් සමාගම සඳහා ඈවරකරුවකු පත්කරන ලෙස කොළඹ දිසා අධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇත.

අසාර්ථක වූ මුදල් සමාගම් සම්බන්ධයෙන් පරීක්ෂාකර ගතහැකි ඉදිරි පියවර සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කරන ලද විගණන සහ නීති ආයතන, 2007 වර්ෂය තුළ සිය නිර්දේශ ඇතුළත් වාර්තාව මහ බැංකුවට භාර දෙනු ලැබිණ. එම වාර්තා සහ අදාළ නිර්දේශ සලකා බලා එකී ආයතන සම්බන්ධව ගතහැකි ඉදිරි පියවර සම්බන්ධව උපදෙස් ලබාගැනීම පිණිස අදාළ බලධාරීන් වෙත යොමු කර ඇත.

## 25.4 අනවසරයෙන් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම

නීත්‍යානුකූල අවසරයකින් තොරව මුදල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන බවට තොරතුරු ලද ආයතන සම්බන්ධයෙන් මුදල් සමාගම් පනතේ 11(2) වගන්තිය යටතේ අදාළ පරීක්ෂණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. නීති විරෝධී ලෙස මුදල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන බවට මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරන ලදුව මුදල් සමාගම් පනත යටතේ එම සමාගම් වෙත නිකුත් කරන ලද විධානයන් කඩකිරීම සම්බන්ධව ගොනුකර ඇති නඩුවලට අදාළ කටයුතු ද තවදුරටත් සිදුකරගෙන යනු ලැබීය.

නීති විරෝධී ලෙස මුදල් ව්‍යාපාර කටයුතු කරනු ලබන ආයතන සම්බන්ධව ලැබෙන පැමිණිලිවල සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබේ. මහ බැංකුව විසින් මෙවැනි ආයතන සම්බන්ධව නීතිමය පියවර ගැනීම නොකඩවා සිදුකරගෙන යාම සහ මහජනයා දැනුවත් කිරීමේ කටයුතු මේ සඳහා හේතු වන්නට ඇත.

## 25.5 මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන්

නීති විරෝධී ලෙස මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සම්බන්ධව මහජනයා දැනුවත් කිරීමේ කටයුතු මහ බැංකුව විසින් දිගින් දිගටම සිදුකරගෙන යනු ලැබීය. ඒ සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග පහත සඳහන් පරිදි වේ.

**(අ) පුවත්පත් නිවේදන**

(i) නීත්‍යානුකූල අවසරයක් නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යන ආයතන නීතිමය විධි විධාන යටතට ගෙන ඒමේ අභිලාෂයෙන්, සිය විගණකවරුන් සහ නීතිඥයන් සමග සාකච්ඡා කර මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන ලෙස දන්වා 2007 පෙබරවාරි මස පුවත්පත් දැන්වීමක් පළකරන ලදී. මේ සම්බන්ධයෙන් ආයතන කිහිපයකින් කරන ලද ඉල්ලීම් සම්බන්ධව පරීක්ෂණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදුකරගෙන යයි.

(ii) තැන්පතු යන්නට අදාළ නිර්වචනය ද සහිතව තැන්පතු භාරගැනීමට විවිධ නීති යටතේ මහ බැංකුවේ අනුමැතිය ලැබූ ආයතනවල නම් ඇතුළත් ලේඛනයක් මාස්පතා පුවත්පත්වල පළකරන ලදී. මෙම දැන්වීම පළකරනු ලැබුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේද සහය ඇතිවයි.

(iii) අරමුදල් කළමනාකරණය, ආයෝජන ආදී නම් භාවිතා කරමින් වක්‍ර මාර්ගයෙන් මහජනයාගෙන් මුදල් තැන්පතු රැස්කිරීම සඳහා කරන ලද උත්සාහයන්ට එරෙහිව විශේෂ පුවත්පත් දැන්වීම් ද පළකරන ලදී.

**(ආ)** "මහජනයා වෙත කෙරෙන නිවේදනයයි" යන හිසින් යුතුව මුද්‍රණය කරන ලද අත්පත්‍රිකාවක් ලියාපදිංචි මුදල් සමාගම් සහ ග්‍රාමීය සංවර්ධන බැංකු මාර්ගයෙන් මහජනයා වෙත බෙදා හරින ලදී.

### 25.6 සුළු මූල්‍යකරණ ආයතන නියාමනය කිරීම

සුළු මූල්‍යකරණ ආයතන විශාල සංඛ්‍යාවක් රටපුරා ක්‍රියාත්මක වන බවට තොරතුරු ලැබී ඇත. මෙම ආයතන දැනට කිසිදු ආකාරයක නියාමනයකට හෝ අධීක්ෂණයකට ලක් නොවන බැවින් මෙම ආයතනවලට අදාළව කිසියම් විචක්ෂණ නියමයන් පැනවීමට තීරණය කරනු ලැබ ඇත. මේ සඳහා සුළු මූල්‍යකරණ පනත නමින් පනත් කෙටුම්පතක් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සකස් කර මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබීය. මුදල් මණ්ඩලයේ උපදෙස් පරිදි එම පනත් කෙටුම්පත මගින් යෝජිත නියාමන හා අධීක්ෂණ කටයුතු අදාළ රාජ්‍ය ආයතනවලට පැවරීමට ඇති හැකියාව සලකාබලා ඒ අයුරින් පනත් කෙටුම්පත සංශෝධනය කිරීමේ කටයුතු ද 2007 වර්ෂය තුළ දී සිදුකරනු ලැබීය.

## 26. පුහුණු වැඩකටයුතු

2007 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත්තේ එහි කාර්ය මණ්ඩලයේ බහුවිධ කුසලතා වර්ධනය කිරීම සඳහායි. මෙවැනි බහුවිධ දක්ෂතාවයන්ගෙන් පිරිපුන් කාර්ය මණ්ඩලයක වැදගත්කම හඳුනා ගනිමින්, ඒ සඳහා දේශීය මෙන්ම විදේශීය පිළිගත් ආයතන මගින් සම්පාදනය කරන ලද පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන්ට සහභාගිවීමට අවස්ථාව සලසා දෙන ලදී. මෙම නව ප්‍රතිපත්තිය, කාර්ය මණ්ඩලයේ කුසලතා හා ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීම තුළින් ඔවුන්ගේ වගකීම් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට බෙහෙවින් ඉවහල් විය.

2007 වසර තුළ දී විදේශ පුහුණු වැඩ සටහන් සඳහා නිලධාරීන් 162 දෙනෙකුට අවස්ථාව සලසා දුන් අතර, දේශීය වශයෙන් බැංකුව විසින් පිළිගත් ආයතන මගින් නිලධාරීන් 1,455 කට පුහුණු අවස්ථාවන් උදා කර දුනි. ඊට අමතරව බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 127 ක් සඳහා කළමනාකරණ සංවර්ධන වැඩ මුළු 05 ක් පුහුණු වැඩකටයුතු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. තවද දෙපාර්තමේන්තුව විසින් එහි ව්‍යුහාත්මක පුහුණු වැඩ සටහන් වැඩ පිළිවෙල යටතේ සංවිධානය කරන ලද, 'ක්ෂුද්‍ර මූල්‍ය පුහුණු වැඩමුළුව', සඳහා මහ බැංකු නිලධාරීන් සහ අනෙකුත් වාණිජ බැංකු නිලධාරීන් 25 දෙනකුට ද ණය සංරචක පුහුණු වැඩමුළුව' සඳහා 24 දෙනෙකුට සහ 'අවදානම් කළමනාකරණ පුහුණු වැඩමුළුව සඳහා 79 දෙනෙකුටද පුහුණු අවස්ථා ලබා දෙමින් ඒ ඒ දෙපාර්තමේන්තුවල විශේෂිත පුහුණු අවශ්‍යතාවයන් ඉටු කරන ලදී. බැංකු නිලධාරීන්ගේ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු කොට ගනිමින් දෙපාර්තමේන්තුව විසින් බ්‍රිතාන්‍ය කවුන්සිලය ආධාරයෙන් නිලධාරීන් 40 දෙනෙකු සඳහා ඉංග්‍රීසි භාෂාවේ ව්‍යාකරණ සහ රාජකාරි ලිපි ලිවීම පිළිබඳ පුහුණු වැඩ මුළු 02 ක් පවත්වන ලදී. එමෙන්ම විශේෂයෙන් මාණ්ඩලික පංතියේ 3 සහ 4 ශ්‍රේණිවල 25 දෙනෙකු සඳහා සන්නිවේදන හා දේශන පැවැත්වීමේ කුසලතාවයන් වර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් "Speech Craft" පුහුණු වැඩ සටහන Colombo Toastmasters Club ආධාරයෙන් පවත්වන ලදී.

එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව සහ ඕස්ට්‍රේලියාව යන රටවල පිළිගත් විශ්ව විද්‍යාල වලින් බැංකු නිලධාරීන්ට පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගැනීම සඳහා මහ බැංකු ශිෂ්‍යත්ව ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණ. ඒ අනුව 2007 වසර තුළදී නිලධාරීන් 04 දෙනෙකු සිය අධ්‍යයන කටයුතු ආරම්භ කළ අතර, සාර්ථක ලෙස සිය අධ්‍යයන කටයුතු අවසන් කොට 05 දෙනෙකු නැවත සේවයට වාර්තා කරන ලදී.

විදේශ පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණවලට සහභාගි වීමෙන් ලද දැනුම හා අත්දැකීම් අනෙකුත් අය අතර බෙදාහැරීමෙන් තම කාර්ය මණ්ඩලයට ලැබෙන බහුවිධ ප්‍රයෝජන හඳුනා ගැනීම අරමුණු කර ගනිමින් සතිපතා සංවිධානය කෙරෙන සම්මන්ත්‍රණ මාලාව 2007 වසර තුළදී ද අඛණ්ඩව පවත්වා ගැනින. සතියේ බදාදා සහ බ්‍රහස්පතින්දා දිනයන්හි සම්මන්ත්‍රණ 34 ක් පවත්වා ඇත. මීට අමතරව කාර්ය මණ්ඩලයට අවශ්‍ය දැනුම වර්ධනය කර ගැනීම අරමුණු කර ගනිමින් දේශන පැවැත්වීම සඳහා ඒ ඒ විෂයන්හි කෘතහස්ත දැනුමක් ඇති ආරාධිත දේශකයන් 04 දෙනෙකු ලවා ආරාධිත දේශන සංවිධානය කරන ලදී.

ස්වීඩනයේ මහ බැංකුව වන රික්ස් බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති උද්ධමනය සහ දළ ජාතික නිෂ්පාදිතය ඇස්තමේන්තුගත කිරීම සඳහා පිළිපදින හා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ දැනුවත් කිරීම සඳහා පිළිවෙළින් මහ බැංකු නිලධාරීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම් 02 ක් සඳහා අධ්‍යයන චාරිකාවක නියැලීමට අවශ්‍ය පහසුකම් ද දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී.

## 27. සුභසාධන

මහ බැංකුව තුළ සෞඛ්‍ය සම්පන්න සේවක පිරිසක් පවත්වා ගැනීමේ අදහස ඇතිව බැංකු කාර්ය මණ්ඩලය සඳහා සලසා ඇති පහසුකම් ඵලදායී හා කාර්යක්ෂම ලෙස සැපයීම සුභසාධන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. සේවකයන්ගේ හා විශ්‍රාමිකයන්ගේ යැපෙන්නන්හටද ඔවුන්ගේ යහපැවැත්ම වර්ධනය සඳහා මෙම පහසුකම් ව්‍යාප්ත කර ඇත. වෛද්‍ය පහසුකම් ක්‍රමය, නිවාස ණය ක්‍රමය සහ අර්ථසාධක ණය, වෛද්‍ය සායනය සහ නිදහස් දුම්රිය බලපත්‍ර ලබාදීම ඇතුළු අනෙකුත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ ක්‍රමයන් යටතේ මෙකී පහසුකම් සපයනු ලැබේ. සලකා බලනු ලබන වර්ෂය තුළ සුභසාධන දෙපාර්තමේන්තුවේ ඉලක්කයන් වූයේ ණය දෙනු ලබන ක්‍රියා මාර්ග සරල කිරීම, සුභසාධන කාර්යයන් පරිගණකගත කිරීම, වෛද්‍ය පහසුකම් ක්‍රමය සංශෝධනය කිරීම සහ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන්නන් සඳහා සමාජ ප්‍රතිලාභ ක්‍රමයක් හඳුන්වා දීමත් වේ. කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගන්නා ලද ආරක්ෂක කාර්ය මණ්ඩලය සඳහා සමාජ ප්‍රතිලාභ ක්‍රමය යටතේ රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට මෙම වර්ෂය තුළ දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණි. සුභසාධනය අරමුණ කරගත් උපාය මාර්ගික ක්‍රියාවලියේ කොටසක් වශයෙන් ණය ක්‍රමය සරල කිරීමේ මාර්ගයන් සලකා බැලීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර, අදාල වසර තුළ එම කාර්යයේ යම් ප්‍රගතියක් දක්නට ලැබිණ.

දෙපාර්තමේන්තුව විසින් කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා සපුරාලීම කාර්යක්ෂම කිරීම් වශයෙන් ඉතා කෙටි කාල සීමාවක් තුළ ණය නිකුත් කිරීම මගින් නිවාස ණය 121 ක් අනුමත කරන ලද අතර, කාර්ය මණ්ඩල ප්‍රතිලාභ ණය, පරිගණක ණය, වාහන ණය ද ඇතුළුව අර්ථ සාධක ණය නිකුත් කිරීම් 1,046 ක් විය. සේවකයන්, වෘත්තීය සංගම් සහ විශ්‍රාමිකයන්ගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් පවතින වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය සඳහා සිදු කළහැකි සංශෝධනයන් සම්බන්ධයෙන් ඊට අදාල පාර්ශ්වයන් සමග දෙපාර්තමේන්තුව විසින් සාකච්ඡා වාර කිහිපයක් පවත්වන ලදී. දායකත්ව වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල පුළුල් කිරීමත් විශ්‍රාමිකයන්ට සහ ඔවුන්ගේ කලත්‍රයන් සඳහා එම ප්‍රතිලාභ ව්‍යාප්ත කිරීමත් අරමුණු කර ගනිමින් විශ්‍රාමිකයන්ගෙන් මාසිකව අයකරනු ලැබූ දායක මුදල එක් අයකු වෙනුවෙන් රු. 100/- සිට රු. 150/- දක්වා වැඩිකරන ලදී.

වඩා යහපත් වූ ආපනශාලා සේවාවක් සැපයීමටත්, සේවක පාර්ශ්වය සඳහා තමන්ට අභිමත තෝරා ගැනීමකටත් ඉඩ සලසමින් ආපනශාලා තුළ ස්වයං සේවා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. සේවක යහපත සඳහා විවිධ මාතෘකා යටතේ දේශන මාලාවක් පැවැත්වීමට දෙපාර්තමේන්තුව කටයුතු කළ අතර, බැංකු කාර්ය මණ්ඩලයේ යහපත උදෙසා සේවා වනිතා ඒකකය මගින් දියත් කරනු ලබන සෞඛ්‍ය සහ පොදු කරුණු පදනම් කරගත් වැඩ පිළිවෙලකට ද සහයෝගය දක්වන ලදී.